# සිංහල
# සාහිත්‍ය රසාස්වාදය

## 10 - 11 ශ්‍රේණිය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



**සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට www.edupub.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.**

පළමුවන මුද්‍රණය 2014
දෙවන මුද්‍රණය 2015
තෙවන මුද්‍රණය 2016
සිව්වන මුද්‍රණය 2017
පස්වන මුද්‍රණය 2018
හයවන මුද්‍රණය 2019

සියලු හිමිකම් ඇවිරිණි

ISBN 978-955-25-0392-4

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
පානළුව, පාදුක්ක පිහිටි රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදි.

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා
ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති
අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ
අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ
අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජීවත් වන අප මෙම නිවසේ
සොඳින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දමිනී
රන් මිණි මුතු නො ව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

ආනන්ද සමරකෝන්



"අලුත් වෙමින්, වෙනස් වෙමින්, නිවැරැදි දැනුමෙන්
රටට වගෙ ම මුළු ලොවට ම වෙන්න නැණ පහන්"

<u>ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවුඩය</u>


ගෙවී ගිය දශක දෙකකට ආසන්න කාලය ලෝක ඉතිහාසය තුළ සුවිශේෂී වූ තාක්ෂණික වෙනස්කම් රැසක් සිදුවූ කාලයකි. තොරතුරු තාක්ෂණය, සන්නිවේදනය ප්‍රමුඛ කරගත් සෙසු ක්ෂේත්‍රවල ශීඝ්‍ර දියුණුවත් සමඟ වත්මන් සිසු දරු දැරියන් හමුවේ නව අභියෝග රැසක් නිර්මාණය වී තිබේ. අද සමාජයේ පවතින රැකියාවල ස්වභාවය නුදුරු අනාගතයේ දී සුවිශේෂී වෙනස්කම් රැසකට ලක් වනු ඇත. එවන් වටපිටාවක් තුළ නව තාක්ෂණික දැනුම සහ බුද්ධිය කේන්ද්‍ර කරගත් සමාජයක වෙනස් ආකාරයේ රැකියා අවස්ථා ද ලක්ෂ ගණනින් නිර්මාණය වනු ඇත. ඒ අනාගත අභියෝග ජයගැනීම වෙනුවෙන්, ඔබ සවිබල ගැන්වීම අධ්‍යාපන අමාත්‍යවරයා ලෙස මගේත්, අප රජයේත් ප්‍රමුඛ අරමුණයි.

නිදහස් අධ්‍යාපනයේ මාහැඟි ප්‍රතිලාභයක් ලෙස නොමිලේ ඔබ අතට පත් වන මෙම පොත මනාව පරිශීලනය කිරීමත්, ඉන් අවශ්‍ය දැනුම උකහා ගැනීමත් ඔබේ ඒකායන අරමුණ විය යුතු ය. එමෙන් ම ඔබේ මවුපියන් ඇතුළු වැඩිහිටියන්ගේ ශ්‍රමයේ සහ කැපකිරීමේ ප්‍රතිඵලයක් ලෙස රජය විසින් නොමිලේ පාසල් පෙළපොත් ඔබ අතට පත් කරනු ලබන බව ද ඔබ වටහා ගත යුතු ය.

ලෝකය වේගයෙන් වෙනස් වන වටපිටාවක, නව ප්‍රවණතාවලට ගැළපෙන අයුරින් නව විෂය මාලා සකස් කිරීමටත්, අධ්‍යාපන පද්ධතිය තුළ තීරණාත්මක වෙනස්කම් සිදු කිරීම සඳහාත් රජයක් ලෙස අප කටයුතු කරන්නේ රටක අනාගතය අධ්‍යාපනය මතින් සිදු වන බව අප හොඳින් ම අවබෝධ කරගෙන සිටින බැවිනි. නිදහස් අධ්‍යාපනයේ උපරිම ප්‍රතිඵල භුක්ති විඳිමින්, රටට පමණක් නොව ලොවට ම වැඩදායී ශ්‍රී ලාංකික පුරවැසියකු ලෙස නැඟී සිටින්නට ඔබ ද අදිටන් කරගත යුතු වන්නේ එබැවිනි. ඒ සඳහා මේ පොත පරිශීලනය කිරීමෙන් ඔබ ලබන දැනුම ද ඉවහල් වනු ඇති බව මගේ විශ්වාසයයි.

රජය ඔබේ අධ්‍යාපනය වෙනුවෙන් වියදම් කරන අතිවිශාල ධනස්කන්ධයට වටිනාකමක් එක් කිරීම ද ඔබේ යුතුකමක් වන අතර, පාසල් අධ්‍යාපනය හරහා ඔබ ලබා ගන්නා දැනුම හා කුසලතා ඔබේ අනාගතය තීරණය කරන බව ද ඔබ හොඳින් අවබෝධ කර ගත යුතු ය. ඔබ සමාජයේ කුමන තරාතිරමක සිටිය ද සියලු බාධා බිඳ දමමින් සමාජයේ ඉහළ ම ස්තරයකට ගමන් කිරීමේ හැකියාව අධ්‍යාපනය හරහා ඔබට හිමි වන බව ද ඔබ හොඳින් අවධාරණය කර ගත යුතු ය.

එබැවින් නිදහස් අධ්‍යාපනයේ උපරිම ප්‍රතිඵල ලබා, ගෞරවනීය පුරවැසියකු ලෙස හෙට ලොව දිනන්නටත් දේශ දේශාන්තරවල පවා ශ්‍රී ලාංකේය නාමය බබළවන්නටත් ඔබට හැකි වේවා! යි අධ්‍යාපන අමාත්‍යවරයා ලෙස මම ශුභ ප්‍රාර්ථනය කරමි.



**අකිල විරාජ් කාරියවසම්**

අධ්‍යාපන අමාත්‍ය

## පෙරවදන

ලෝකයේ ආර්ථික, සමාජීය, සංස්කෘතික හා තාක්ෂණික සංවර්ධනයත් සමඟ අධ්‍යාපන අරමුණු වඩා සංකීර්ණ ස්වරූපයක් ගනී. මිනිස් අත්දැකීම්, තාක්ෂණික වෙනස්වීම්, පර්යේෂණ සහ නව දර්ශක ඇසුරෙන් ඉගෙනීමේ හා ඉගැන්වීමේ ක්‍රියාවලිය ද නවීකරණය වෙමින් පවතියි. එහිදී ශිෂ්‍ය අවශ්‍යතාවලට ගැළපෙන ලෙස ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කරමින් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාම සඳහා විෂය නිර්දේශයේ දැක්වෙන අරමුණුවලට අනුකූලව, විෂයානුබද්ධ කරුණු ඇතුළත්ව පෙළපොත සම්පාදනය වීම අවශ්‍ය ය. පෙළපොත යනු ශිෂ්‍යයාට ඉගෙනීමේ උපකරණයක් පමණක් නොවේ. එය ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීමටත් නැණ ගුණ වර්ධනයටත් චර්යාමය හා ආකල්පමය වර්ධනයක් සහිතව ඉහළ අධ්‍යාපනයක් ලැබීමටත් ඉවහල් වන ආශීර්වාදයකි.

නිදහස් අධ්‍යාපන සංකල්පය යථාර්ථයක් බවට පත්කරමින් 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සියලු ම පෙළපොත් රජයෙන් ඔබට තිළිණ කෙරේ. එම ග්‍රන්ථවලින් උපරිම ඵල ලබන අතර ම ඒවා රැක ගැනීමේ වගකීම ද ඔබ සතු බව සිහිපත් කරමි. පූර්ණ පෞරුෂයකින් හෙබි, රටට වැඩදායී යහපත් පුරවැසියකු වීමේ පරිචය ලබා ගැනීමට මෙම පෙළපොත ඔබට උපකාරී වෙතැයි මම අපේක්ෂා කරමි.

මෙම පෙළපොත් සම්පාදනයට දායක වූ ලේඛක, සංස්කාරක හා ඇගයුම් මණ්ඩල සාමාජික මහත්ම මහත්මීන්ටත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තුතිය පළ කර සිටිමි.

**ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක,**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
ඉසුරුපාය,
බත්තරමුල්ල.
2019.04.10

| | |
|---|---|
| **නියාමනය හා අධීක්ෂණය** | ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක<br>අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |
| **මෙහෙයවීම** | ඩබ්. ඒ. නිර්මලා පියසීලි<br>අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |
| **සම්බන්ධීකරණය** | ප්‍රගීතිකා ජයසේකර<br>සහකාර කොමසාරිස්<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |
| **සහාය සම්බන්ධීකරණය** | ඒ.වී. දිලේකා හර්ෂණි අමරසේන<br>සංවර්ධන නිලධාරී<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

**ලේඛක මණ්ඩලය**

| | |
|---|---|
| 1. ඩබ්ලියු. ඒ. අබේසිංහ | ප්‍රවීණ ලේඛක |
| 2. සරත් නිතලව | ගුරු සේවය<br>කුලි/කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලය, කුලියාපිටිය |
| 3. උපෙකලා අතුකෝරළ | සහකාර කථිකාචාර්ය<br>සිංහල අංශය, කොළඹ විශ්වවිද්‍යාලය |

**සංස්කාරක මණ්ඩලය**

| | |
|---|---|
| 1. ආචාර්ය ස්වර්ණා ඉහළගම | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>කැලණිය විශ්වවිද්‍යාලය |
| 2. ඩී. ඩබ්ලිව්. දිසානායක | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| 3. පී.ටී.එම්. රත්නායක | කථිකාචාර්ය<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| 4. ප්‍රගීතිකා ජයසේකර | සහකාර කොමසාරිස්<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

**සෝදුපත් කියවීම**

| | |
|---|---|
| කල්‍යාණි විජේසුන්දර | කථිකාචාර්ය<br>කොළඹ විශ්වවිද්‍යාලය |

**පිටකවර නිර්මාණය**

| | |
|---|---|
| 1. ජේ.එච්. මනෝරිකා ප්‍රියංගනී | පරිගණක තාක්ෂණික සහායක,<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

**පරිගණක අක්ෂර සංයෝජනය**

| | |
|---|---|
| 1. එස්.වී.ජී. එරංගා දිල්රුක්ෂි | පරිගණක තාක්ෂණික සහායක,<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |
| 2. නෙල්කා ප්‍රසාදිනි | පරිගණක තාක්ෂණික සහායක,<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

# සංස්කාරක සටහන

භාෂාව උපයෝග කර ගනිමින් රසය ජනනය කරන කලාව, සාහිත්‍යය ලෙස හැඳින්වෙයි. එය හුදෙක් භාෂා වික්‍රමයක් පමණක් නොව මානව ජීවිතයේ විවිධ පැතිකඩ නිරූපණය කරන මාධ්‍යයකි. සාහිත්‍යය නිර්මාණය, රස වින්දනය හා විචාරය යන ක්ෂේත්‍ර තුනකින් සමන්විත බව ඇතැම් විචාරකයෝ පවසති. රස වින්දනය සාහිත්‍යය පරිශීලනයෙන් ලැබිය හැකි ප්‍රතිලාභයකි.

2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරෙන නව විෂය නිර්දේශයට අනුකූලව 10-11 ශ්‍රේණි සඳහා සම්පාදනය කෙරෙන මේ සාහිත්‍ය රසාස්වාදය පෙළපොත ඔබට එම ප්‍රතිලාභය අත් පත් කර දීම අරමුණු කර ගෙන ඇත. ජාතික අධ්‍යාපන ආයතනය විසින් සම්පාදිත ඉගැන්වීම් අනුක්‍රමය පදනම් කර ගෙන මෙහි ලේඛන පෙළ ගස්වා තිබේ.

නිර්දිෂ්ට සාහිත්‍යමය උද්ධෘත ද ඒ උද්ධෘත පිළිබඳ සහ ඒවායේ කතුවරුන් පිළිබඳ සංක්ෂිප්ත විස්තර ද මෙහි අන්තර්ගත වේ. එමෙන් ම පළමුවන පරිච්ඡේදය ලෙස නූතන සාහිත්‍යාංග වන කෙටිකතාව, නවකතාව සහ නූතන සිංහල කවිය පිළිබඳ හැඳින්වීම් කිහිපයක් ඔබගේ අධ්‍යයන පහසුව පිණිස එකතු කර ඇත. ආරම්භයේ දී ම සාහිත්‍ය රසාස්වාදය පිළිබඳ සංක්ෂිප්ත විග්‍රහයක් ද මෙහි ඇතුළත් වේ. අදාළ සාහිත්‍යමය උද්ධෘත රස වින්දනයට මඟ පෙන්වන අභ්‍යාස කිහිපයකින් ද සමන්විත මේ පෙළ පොත, අධ්‍යයනයේ දී ඔබේ ගුරුවරුන්ගේ සහ වැඩිහිටියන්ගේ සහාය අවශ්‍ය අවස්ථාවල විටෙක ලබා ගැනීම වැදගත් වේ. උද්ධෘතවල අන්තර්ගත ඇතැම් දුරවබෝධ වචන සඳහා අරුත් පැහැදිලි කිරීම් ඇතුළත් කර තිබීම ඔබට පහසුවක් වෙතැයි අදහස් කරමු.

සාහිත්‍ය රසවින්දනය  ඇසුරෙන් මනස දියුණු කර ගෙන සංවේදී මිනිසකු ලෙස සමාජයට පිවිසෙන්නට ඔබට හැකි වේවා'යි සුභාශංසනය කරමු.

මේ පොත සම්පාදනයේ දී සහාය දැක් වූ සියලු දෙනා ගෞරවයෙන් සිහිපත් කරන අතර මහාචාර්ය රෝහිණී පරණවිතාන මහත්මියට අපගේ විශේෂ ස්තුතිය හිමි වේ.

**සංස්කාරක මණ්ඩලය**

# පටුන


| | | පිටු අංක |
|---|---|---|
| | සාහිත්‍ය රසාස්වාදය | 1 |
| 1 | නූතන සාහිත්‍යාංග කිහිපයක් | 4 |
| | • කෙටිකතාව | 4 |
| | • නවකතාව | 7 |
| | • නූතන පද්‍ය | 10 |
| 2 | කුස ජාතකය | 13 |
| 3 | සුභාෂිතය | 52 |
| 4 | වෙසක් පහන | 61 |
| 5 | තුංමං හංදිය | 69 |
| 6 | ජන කවි | 71 |
| 7 | යුතුකම | 77 |
| 8 | උතුරෙන් | 79 |
| 9 | ආගන්තුක සත්කාරය | 81 |
| 10 | ඇත් ගාලේ දරු පෙම | 83 |
| 11 | වැහි වලා කුළ | 87 |
| 12 | අලුත ගෙනා මනාලිය | 89 |
| 13 | නන්ද තෙරුන් වහන්සේගේ වස්තුව | 91 |
| 14 | වැලපීම | 102 |
| 15 | උදය | 110 |
| 16 | වැස්ස | 112 |
| 17 | පුතු ඉපදුණු මේ දෙරණේ | 114 |
| 18 | දිසාපති කාමරේ දී ය | 116 |
| 19 | මඟ | 118 |
| 20 | කාන්තාර ගමක උපත | 120 |

# 1 නූතන සාහිත්‍යාංග කිහිපයක්

## කෙටිකතාව

කෙටිකතාව යනු මූලික අදහසක් ඉදිරිපත් වන සේ අත්දැකීමක් හා බැඳුණු සංසිද්ධියක් ඉස්මතු කරන කලා නිර්මාණයකි. සාමාන්‍ය වශයෙන් කෙටිකතාවක විවරණය වන්නේ, සීමිත චරිත සංඛ්‍යාවක් පමණි. එක් සිද්ධියක් හෝ සිද්ධි කිහිපයක් හෝ පාදක කර ගෙන නිර්මාණය කෙරෙන කෙටිකතාවක මුඛ්‍ය පරමාර්ථය වනුයේ, කිසි යම් විශේෂිත එක් කාරණයක් හුවා දැක්වීම ය.

කෙටිකතාව හැඳින්වීම සඳහා දිය හැකි නිර්වචන බොහෝ ය. ඒ අතර, කෙටිකතාව චූකලී ජීවිතයෙන් පෙත්තකැයි (A slice of life) යන ඇන්ටන් චෙකොෆ්ගේ විවරණය, අතිශය අර්ථසම්පන්න වේ.

ප්‍රමාණයෙන් කෙටි වූ නිර්මාණ කෙටිකතා යනුවෙන් හැඳින්වීම සාවද්‍ය වේ. ලෝක සාහිත්‍යයෙහි එන ශ්‍රේෂ්ඨ කෙටිකතා හැම එකක් ම කෙටි නො වේ. ඒවා අතර පිටු සියය ඉක්මවන දීර්ඝ කෙටිකතා දක්නට ලැබේ. ඇන්ටන් චෙකොෆ්ගේ පළඟැටියා, හයේ වාට්ටුව වැනි කෙටිකතා ඊට නිදසුන් ය.

ප්‍රතිභාපූර්ණ නූතන සිංහල කෙටිකතාකරුවකු වන දයාසේන ගුණසිංහ කෙටිකතාව නිර්වචනය කෙළේ මෙපරිදි ය.

"කෙටිකතාව යනු කවරේ දැයි එක ම වැකියකින් පවසන ලෙස යමකු මට කිව හොත්, කෙටිකතාව යනු ජීවිතයේ සමීප රූපයකැයි මම කියන්නෙමි. නිර්වචනයක් වශයෙන් ඒ කියමන කිසිසේත් ම පරිපූර්ණ නො වන බවට විවාදයක් නැත. එහෙත් කෙටිකතාවේ සමස්ත ස්වභාවය පිළිබඳ ඉඟියක්, ඒ තුළ ගැබ් වී ඇතැයි මම සිතමි."

(දයාසේන ගුණසිංහ - **කේතුමතී හෝටලයේ රාත්‍රියක්** - 1990)

එමෙන් ම සමාජ ජීවිතයෙන් අංශු මාත්‍රයක් නිරූපණය කරන රචනය කෙටිකතාව බව කේ. ජයතිලක මහතා පවසයි. එමතු නොව අර්ථවත් ලෙස චරිතාංගයක් හෝ චරිතයක් මතු කරන ප්‍රබල අවස්ථාව කෙටිකතාව බව ඒ.වී. සුරවීර මහතා පවසයි.

වර්තමාන කෙටිකතාව, ලොවෙහි පැරණිතම කතා කලාවක නවීනතම ස්වරූපය වෙයි. බෞද්ධ ජාතක කථා ද, හිතෝපදේශයේ එන උපදේශ කථා ද, පංචතන්ත්‍රයේ උපමා කථා ද, ක්‍රිස්තු පූර්ව දෙදහසටත් පෙර මිසරයේ බිහි වුණු කතාන්තර ද, ක්‍රිස්තු පූර්ව හය වැනි සියවසෙහි විසූ ග්‍රීක ජාතික වහලෙකැයි සැලකෙන ඊසොප්ගේ උපමා කතා ද, එමෙන් ම ග්‍රීසියෙහි ලියවුණු කෙටි ප්‍රේම වෘත්තාන්ත ද, අරාබි නිසොල්ලාසයෙහි දැක්වෙන කතාන්තර ද, වර්තමාන කෙටිකතාවේ පූර්වගාමී අවස්ථා ලෙස සැලකීම විවාද රහිත ය. ඉනුත් මෑත කාලයෙක, ඉංග්‍රීසි සාහිත්‍යයේ ජෙෆ්රි චෝසර්ගේ **කැන්ටබරි කතා** සහ ඉතාලි ජාතික ජියෝවන්නි බොකැසියෝගේ **දිකැමරන්** කතා පන්තිය ද වර්තමාන කෙටිකතාවේ සමීපතම ඥාතීහු වෙති.

සිංහල කෙටිකතාවේ උත්පත්ති ස්ථානය ගැන අදහස් දක්වන මහ ගත්කරු මාර්ටින්

වික්‍රමසිංහ, ස්වකීය **වහල්ලු** (1951) නමැති කෙටිකතා සංග්‍රහයට 'කෙටිකතාව' යන මාතෘකාව යටතේ ලියූ දීර්ඝ ලේඛනයෙහි මෙසේ පවසයි.

"අපගේ කවිකොළකාරයා, බටහිර හෝ පෙරදිග හෝ කථා කලාව නො දැන කෙටිකතා රචනා කළ ලේඛකයෙකි. එකල උගත්තු ග්‍රන්ථාරූඪ පැරණි බණ කතා ද පැරණි කවීන් රචනා කළ කව්සේකරය, ගුත්තිලය, කුසදාව ආදි කවි කතා ද කියවීමෙන් ආස්වාදයක් ලැබූහ. එයින් ආස්වාදයක් නො ලැබිය හැකි පොදු ජනයාගේ කථා ඇසීමේ කුහුල දුටු කවිකොළකාරයා, සංවේගජනක පුවත් වස්තු කොට ගෙන, ඔවුන් උදෙසා කවියෙන් කෙටිකතා රචනා කෙළේ ය. අලංකාර ශාස්ත්‍රය හා ව්‍යාකරණය විසින් තළා පෙළා බැඳීමෙන් සීමා නො කරන ලද කල්පනාවත් ශක්තියත් ඇති කවිකොළකාරයා, පණ්ඩිත කවීන්ට වඩා හොඳ කථාකාරයෙක් විය. ඔහු යම් කිසි උගැන්මක් හා ආවේශයක් ලැබී නම්, එය ජන කථාවෙනි. ජන කවියෙනි."

බටහිර ලෝකයේ බිහි වූ කෙටිකතාව ද නීතිරීතිවලින් නො බැඳුණු සාහිත්‍යාංගයකැයි ඔහු තව දුරටත් පෙන්වා දුන්නේ ය.

"බටහිර කෙටිකතාව බෙහෙවින් වෙනස් වූයේත්, විකාසනය වූයේත් එය විචාරකයන්ගේ නීතිරීතිවලින් නො බඳිනු ලැබූ නිසාය. අපූරු රටවල් සොයා යාත්‍රා කළ නැවියන් මෙන් බටහිර ලේඛකයෝ ද, ගතානුගතික නීතිරීතිවලින් නො බඳිනු ලැබූ කල්පනාව ඇත්තෝ වූහ."

ඉනික්බිති ව, එසමයෙහි (ඉකුත් සිය වසේ මැද භාගයේ දී පමණ), සිංහල කෙටිකතාව වැඩුණු හා විකාසනය වූ ආකාරය ගැන ඔහු මෙසේ ද සඳහන් කරයි.

"සිංහල කෙටිකතාව ද මෙකල හැඳින්විය යුත්තේ, අතු ඉතිවලින් දිය ලබමින් නගින නදියක් ලෙසිනි. එය බටහිර කථාව ආශ්‍රයෙන් ම උපන්නක් ලෙස සලකා විවේචනය කිරීම වූ කලී එහි වැඩීම, බටහිර එක ම පරම්පරාවක විචාරකයන් ටික දෙනෙකුන් එල්බ ගත් නීතිරීතිවලින් පිට නො පැන්නීමට කරන වෑයමක් වෙයි. හැම අතින් දිය ලබන නදිය වඩාත් වේගයෙන් බසියි. ඒ බැසීම නිසා එහි දිය පිරිසිදු වෙයි. ගැඹුරු වෙයි. ඉවුරු පළල් වෙයි.

ඉංගිරිසි කථාවක් ආශ්‍රයෙන් ලියන ලද සිංහල කථාව වුව ද බස, රීතිය, ලේඛකයාගේ ගති, ප්‍රතිභාව හා පරිසරය ද නිසා ගන්නේ පැරණි සිංහල කථාවට මඳක් හුරු ස්වරූපයකි."

බටහිර විචාරකයන් පොදුවේ පහත දැක්වෙන සියලු ම රචනා, කෙටිකතා ලෙස හඳුන්වතැ යි, ඔහු පෙන්වා දුන්නේ ය.

1. එක ම සිදුවීමක් මුල් කොට ගෙන රචිත කථාව
2. චරිතාංගයක් නිරූපණය සඳහා ලියන ලද ආඛ්‍යායිකාව
3. සිදුවීම් කිහිපයක් ඇසුරින් රචිත කථාව
4. කිසියම් අවස්ථාවක මිනිසකුගේ සිතට නැගුණු හැඟීමක් විවරණය කරනු සඳහා කරන ලද රචනය
5. කෙනකුගේ යටි සිතෙහි සැඟවුණු හැඟීමක් හෙළි කෙරෙන විවරණය
6. උපහාසය හා මායා කථාව (fantasy)

**ජෝසෆ් බර්ග් එසන්වීන්** නම් විචාරකයා, කෙටි කතාවක් නො වන්නේ කවර ලක්ෂණවලින් යුතු ප්‍රබන්ධ නිර්මාණයක් දැයි පැහැදිලි කරන්නේ මේ අයුරිනි.

1. කෙටිකතාව සංක්ෂිප්ත නවකතාවක් නො වේ.
2. එය උපාඛ්‍යානයක් ද නො වේ.
3. එය කෙටුම්පතක් හෝ දළ සටහනක් හෝ නො වේ.
4. එය චරිත කථාවක් ද නො වේ.
5. එය හුදු චරිතාලේඛයක් ද නො වේ.
6. එය හුදු කතාන්තරයක් ද නො වේ.

ඒ කිසිවක්, ඒ ලෙසින් ම කෙටිකතාවක් නො වන්නේ නම්, කෙටිකතාවක මූලික ගුණාංග කවරේ දැයි විමසා බලමු. ජෝසප් බර්ග් එසන්වීන් නමැති විචාරකයා, කෙටිකතාවක තිබිය යුතු අංග හතක් ගැන සඳහන් කරයි.

ඔහු පවසන ආකාරයට, හොඳ කෙටිකතාවක් තුළ

1. සියල්ල අබිබවා සිටින එක් ප්‍රබල සිද්ධියක් තිබිය යුතු ය.
2. ඉස්මතු වී පෙනෙන එක් ප්‍රධාන චරිතයක් ද තිබිය යුතු ය.
3. නිර්මාණකරුගේ පරිකල්පනයෙන් බිහි වන නිර්මාණයක් විය යුතු ය.
4. කථා වින්‍යාසයක් තිබිය යුතු ය.
5. කතාවේ සිද්ධි මාලාව එකට කැටි වී තිබිය යුතු ය.
6. කතාවේ සංවිධානාත්මක බව තිබිය යුතු ය.
7. ධාරණාවේ ඒකීයත්වයක් තිබිය යුතු ය.

කෙටිකතාවක තිබිය යුතු එකී අංග ලක්ෂණ දැක්වීමෙන් පසුව, ජෝසප් බර්ග් එසන්වීන් නමැති එම විචාරකයා, කෙටිකතාව නිර්වචනය කොට දක්වන්නේ මතු දැක්වෙන ලෙසිනි.

"කෙටිකතාව වූ කලි අනෙක් සියලු සිද්ධීන් අබිබවා සිටින එක් ප්‍රබල සිද්ධියක් සහ ඉස්මතු වී පෙනෙන එක් ප්‍රධාන චරිතයක් අනාවරණය කෙරෙන්නා වූ ද, එකට කැටි වී සිටින කථා වින්‍යාසයකින් යුක්ත වූ ද, මනා අවයව සංවිධානයක් ඇත්තා වූ ද, ඒකත්වයෙන් යුක්ත ධාරණාවක් ඇත්තා වූ ද කෙටි, කල්පිත ආඛ්‍යානයකි."

වර්තමාන කෙටිකතාව, කතා වින්‍යාසය අනුව, අතිශය විදග්ධ සංයුතියකින් යුතු සාහිත්‍ය නිර්මාණයක් බවට පත් ව තිබෙනු දැකිය හැකි ය. මේ සම්බන්ධයෙන් සාර්ථක කෙටිකතාවක පැවතිය යුතු ඒකීයත්වය පිළිබඳව ලියොන් සර්මෙලියන් (Leon Surmelian) නමැති විචාරකයා ස්වකීය Techniques of Fiction Writing නමැති කෘතියෙහි දක්වන අදහසක්, මතු සඳහන් ය.

"එක් සිද්ධියක් අනෙක් තැනකට දැමූ කල්හි හෝ ඉවත් කළ කල්හි හෝ, කතාවේ ඒකීයභාවය හෝ පරිසමාප්තිය පලුදු වන පරිද්දෙන් කථා වින්‍යාසයේ අවයව සංස්ථානය සිද්ධ කළ මනා ය. යම් සිද්ධියක් ඇතුළු වීම හෝ නො වීම හෝ හේතු කොට ගෙන, කතාවේ ප්‍රකට ලෙස වෙනසක් ඇති වන්නේ නම්, ඒ සිද්ධිය සමස්තයේ නියම ඉන්ද්‍රියයක් නො වන්නේ ය."

කතාවක් ඉදිරිපත් කිරීමේ ක්‍රම දෙකකි. මුල් ක්‍රමය, කතාන්තරයක ස්වරූපයෙන් කතාව ඉදිරිපත් කිරීම ය. අනෙක් ක්‍රමය කතාව කීමෙන් වැළකී පාඨකයාට එය දැක ගන්නට සැලැස්වීම ය. පළමු වන ක්‍රමය කථනය නමින් ද, දෙවැන්න රූපණය නමින් ද හැඳින්වෙයි. කෙටිකතාවක දී ලේඛකයා විසින් අනුගමනය කළ යුත්තේ, රූපණ මාර්ගය යි. යම් ලේඛකයකු රූපණ මාර්ගය ග්‍රහණය කරගන්නා තෙක් ම, ඔහුගේ කතා කලාව පූර්ණත්වයට පත් වූයේ යයි කියනු බැරි ය.

# නවකතාව

නවකතාව යනු ගද්‍යමය ප්‍රබන්ධයකි. එය කිසි යම් කතාවස්තුවක රාමුවක් තුළ සිදු වන අවස්ථාවන්ගේ සහ චරිතයන්ගේ නිරූපණයක් වේ. ඒ අනුව,

1. චරිත හා අවස්ථා නිරූපණය
2. ප්‍රබන්ධ හෙවත් කල්පිත කතාන්තර ස්වරූපය
3. ගද්‍ය ලේඛනයක් වීම.

යන අංග, වර්තමාන නවකතාවේ මූලික අංග වශයෙන් හඳුනා ගත හැකි ය. ලෝක සාහිත්‍ය ඉතිහාසය දෙස බලන විට, සංකල්පනාත්මක හෙවත් කල්පිත ප්‍රබන්ධකරණයේ තුන්වැනි අවස්ථාව සේ ගැනෙන්නේ, නවකතාව ය. මුලින් ම බිහි වූයේ, වීර කාව්‍ය යි. ඉන්දියාවේ ව්‍යාස ඍෂීන් විසින් විරචිත සේ සැලකෙන **මහා භාරතයත්**, වාල්මීකි ඍෂීන් විසින් රචිත **රාමායණයත්**, ග්‍රීසියේ හෝමර් විසින් පබඳින ලදැයි සැලකෙන **ඉලියඩ්** සහ **ඔඩිසි** යන මහා කාව්‍ය ද්වයයත් ප්‍රබන්ධ සාහිත්‍යයේ මුල් අවස්ථා සේ හඳුනා ගෙන ඇත. ඉන් අනතුරුව ආවේ, ප්‍රේම කාව්‍ය යි. එය ප්‍රබන්ධ ගණයෙහි ම ලා සැලකෙයි.

මේ අනුසරින් ලෝකයේ ප්‍රබන්ධ සාහිත්‍යය තුළ පැනෙන තුන්වැනි ප්‍රබන්ධ අවධිය ලෙස, නවකතාව බිහි විය. අලුත් ප්‍රබන්ධකරණය "නවකතාව" සේ හැඳින්වීමට පටන් ගැනිණි. එය නවල් (Novel) හෙවත් නවකතාව වනුයේ, "අලුත්" යන අරුතිනි. ඉංග්‍රීසි බසට ඒ පදය එක් වන්නේ, ලතින් Novellus යන වදනිනි. පුනර්ජීවන යුගයේ මුල් අවධියේ දී, මේ වදන වහරට එන්නේ, "අලුත් කතාන්තරය" යන අරුත සහිතව ය. සුප්‍රකට ඉතාලි ජාතික ජියෝවන්නි බොකාෂියෝ විසින් ලියන ලද 'දිකැමරන්' කෘතිය හඳුන්වන ලද්දේ, "නොවෙලා" (Novella) යන වදනිනි. 'දිකැමරන්' කතන්දර ඉංග්‍රීසි බසට නැඟීමත් සමඟ ම, Novel යන පදය, ඉංග්‍රීසි බසෙහි වහරට පැමිණියේ ය.

ගද්‍යයෙන් ලියැවෙන ප්‍රබන්ධ කලා විශේෂයක් ලෙස, නවකතාව ලෝක සාහිත්‍ය වහරට එක් වන්නේ එලෙසිනි.

ගද්‍යයෙන් කරන ලද කල්පිත ප්‍රබන්ධ රචනය, පුරාණ ලෝකය පුරා ම පැතිර ගිය කලාවක් බව පෙනේ. ඒ කෘතීන් හඳුන්වනු සඳහා නවකතාව යන වචනය නො යෙදුණු නමුදු, නවකතාවේ මූලාවස්ථාව සේ සැලකිය යුතු වන්නේ, එකී ප්‍රබන්ධ ය. පසු කාලීනව යුරෝපීය සාහිත්‍ය සම්ප්‍රදායේ කොටසක් බවට පත් වූ බොහෝ කතාන්තර ආරම්භ වූයේ මිසරයේ ය. ඉන්දියාවේ දී නවකතාවේ පෙර ගමන්කරු සේ හඳුනා ගත හැක්කේ, හයවැනි සිය වසේ අපර භාගයේ විසූ සංස්කෘත පඬිවරයකු වන දණ්ඩීන් විසින් විරචිත දශ කුමාර චරිතය යි. බොහෝ සාහිත්‍ය විද්වතුන් විසින් සැබෑ ම මුල් නවකතාව ලෙස සලකනු ලබන ගෙංජි කතාන්තරය, ජපන් ජාතික කතුවරියක වන මුරසකි ෂිකිබු ආර්යාව විසින් එකළොස් වැනි සිය වසේ දී ලියනු ලැබිණි. 1935 දී ඒ කෘතිය ඉංග්‍රීසි බසට නැගුණේ, The Tale of Genji යන නමිනි.

ශ්‍රී ලංකාවේ සිංහල පාඨකයන්ට "නවකතාව" නමැති කලා මාධ්‍යය පිළිබඳව පළමු වරට දැන ගැනීමට ලැබෙන්නේ, දහ නව වැනි සියවසේ දී ය. ආදි ම සිංහල නවකතාකරුවන්ට ස්වකීය මාධ්‍යය අවබෝධ කර ගැනීමට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදු විණි. එසේ ම, සිංහල පාඨක ජනයාට ද නවකතා මාධ්‍යය වටහා ගැනීමට මහත් ව්‍යායාමයක යෙදීමට සිදු විය. මුල් ම සිංහල නවකතාකරුවෝ ඉංග්‍රීසි නවකථාවේ ස්වරූපය ඒ හැටියෙන් ම අනුගමනය කිරීමට අසමත් වූහ. කෙසේ

වුව ද, සිංහල නවකතාවේ විකාශනය ගැන සිතා බලන විට, මුල් ම අවධියේ පහළ වූ නවකතාකරුවන්ගෙන් ඉමහත් සේවයක් සිදු වූ බව නම් පැහැදිලි ය. ඔවුන් අතින් මෙකී නව කලා මාධ්‍යයට ස්ථිරසාර පදනමක් වැටුණි.

සිංහල නවකතාවේ වර්තමාන ස්වරූපයෙහි මූල බීජය දක්නට ලැබෙන්නේ 1905 වසරේ දී අලුත්ගමගේ සයිමන් ද සිල්වා විසින් ලියා පළ කරන ලද **මීනා** නමැති කෘතිය තුළ ය. ඔහුගේ සෙසු නවකතා අතර, **තෙරීසා** සහ **අපේ ආගම** නමැති කතා දෙක ද දක්නට ලැබෙයි.

මීනා පළ වන්නේ 1905 වසරේ දී ය. එනම්, පියදාස සිරිසේනගේ ඉතා සුප්‍රකට, එමෙන් ම අතිශයින් ම ජනප්‍රියත්වයට පත් වූ **ජයතිස්ස සහ රොස්ලින්** යන නවකතාව පළවන්ට අවුරුද්දකට පෙර ය.

ඇතැම් සාහිත්‍යවේදීන් පවසන ආකාරයට, ඉංග්‍රීසි නවකතාවේ ආදි කර්තෘවරයා ලෙස සැලකෙන සැමුවෙල් රිචඩ්සන්ට, නවකතාව කුමක් දැයි ඉංග්‍රීසි පාඨකයනට හඳුන්වා දීමේ ගෞරවය හිමි වන්නාක් මෙන් ම, පියදාස සිරිසේනට සිංහල නවකතා ඉතිහාසයෙහි විශේෂ ස්ථානයක් හිමි වෙයි. මුල් ම සිංහල නවකතාව ලියූ ඒ. සයිමන් සිල්වා ලියූ **මීනා, තෙරීසා** හා **අපේ ආගම** යන නවකතා තුනෙන් ම, සිංහල පාඨකයන්ට මෙම අලුත් සාහිත්‍යාංගය පිළිබඳව, පියදාස සිරිසේනගේ නවකතාවලින් පමණ අවබෝධයක් ලබා ගත හැකි වී යයි සිතනු උගහට ය.

පියදාස සිරිසේනගේ දෙවැනි නවකතාව නිකුත් වූයේ **අපට වෙච්ච දේ** යන නමිනි. ඉනික්බිති ව ඔහු විසින් ලියන ලද නවකතා **තරුණියකගේ ප්‍රේමය, ඩිංගිරි මැණිකා, වලව්වක පළහිලව්ව, විමලතිස්ස හාමුදුරුවන්ගෙ මුදල් පෙට්ටිය, මහේශ්වරී, ඩෙබර කෙල්ල** ආදිය වේ.

පියදාස සිරිසේන නවකතාකරණයට පිවිසීමෙන් මඳ කලකට පසුව, සිංහල ප්‍රබන්ධ ඉතිහාසයෙහි දර්ශනය වන මීළඟ කතුවරයා ඩබ්ලියු. ඒ. සිල්වා ය. ඔහුගේ නවකතාකරණය පිළිබඳව මැදහත් විමර්ශනයක යෙදෙන මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර, ස්වකීය **සිංහල නවකතා ඉතිහාසය හා විචාරය** නමැති සුප්‍රකට ග්‍රන්ථයෙහි මෙසේ සඳහන් කළේ ය.

“වර්තමාන නවකතාවන් අතර විශාල සංඛ්‍යාවක්, සිල්වා මහතාගේ කෘති ය; ඔහුගේ සෑම කෘතියක් ම මහජනයා විසින් ඉතා ආශාවෙන් කියවනු ලැබේ. ඔහුගේ කෘති මෙපමණ ජනප්‍රිය වූයේ, ඒවා සියල්ලක් ප්‍රේම කථා වන හෙයිනි. ඒ මතු ද නො වේ. ධර්මිෂ්ඨයා සෑම විට ම ජය ගන්නා, දුෂ්ටයා පරාජය වන, අවසානයේ දී පෙම්වතුන් එක් වන, මනෝ රාජ්‍යයකට ඔහු පාඨකයා ඇතුළු කරවයි. පාඨකයා හමුවෙහි ඔහු මවා පාන මනෝමය ලෝකය, සිරිසේන මහතාගේ ලෝකය තරම් අභව්‍ය නො වන අතර ම, තාත්ත්වික ලෝකය තරම් දුක් පීඩා ආදියෙන් ගහණ වූවක් ද නො වේ. එය ඉතා රමණීය ලෝකයකි. එබඳු ලෝකයක තාවකාලික වශයෙන් වුව ද විසීමට බොහෝ දෙනා කැමති ය. සැබෑ ලෝකයෙහි මෙන් නො ව, සිල්වා මහතාගේ මායා ලෝකයෙහි පෙම්වත්හු සියලු ම බාධා මැඩ ගෙන තම මනෝරථය ඉෂ්ට කර ගනිති. ඔවුහු ජීවිතාන්තය දක්වා වාසනාවෙන් වෙසෙති. ඔවුන්ට බාධා පමුණුවන්ට තැත් කළ දුෂ්ටයාට නිසි දඬුවම් ලැබේ.”

ඩබ්ලියු. ඒ. සිල්වාගේ මුල් ම නවකතාව වන **සිරියලතා නොහොත් අනාථ තරුණිය** පළ වන්නේ 1909 වසරේ දී ය. ඒ වන විට කතුවරයාගේ වයස අවුරුදු දහනවයක් විය. ඉන් අනතුරුව ලියන ලද කෘතීන් අතර, **ලක්ෂ්මි හෙවත් නොනැසෙන රජිනිය,**

**කැලෑ හඳ, හිගන කොල්ලා, සුනේත්‍රා නොහොත් අවිචාර සමය, දෛවයෝගය, විජයබා කොල්ලය** යන කෘතීන් ද **ජූලි හත සහ රිදී හවඩිය** යන රහස් පරීක්ෂක නවකතා දෙක ද පාඨකයින්ගේ විශේෂ ප්‍රසාදයට ලක් විය.

මාර්ටින් වික්‍රමසිංහ සිංහල නවකතා ක්ෂේත්‍රයට අවතීර්ණ වන්නේ, 1914 වසරේ දී රචනා කළ **ලීලා** කෘතියෙනි.

ජනතාව අතර පැවති මිථ්‍යා මත හා ළාමක අදහස් මුලිනුපුටා දැමීමෙන්, සමාජයේ පැවැත්මට ද පාරම්පරික කුල ධර්මවලට ද හානි නො වන ආකාරයේ ප්‍රේම කතාවක් ගොඩ නැගීම, ඔහුගේ අරමුණ වූ බැව් පැහැදිලි ය.

සිංහල ප්‍රබන්ධ කලාව නව දිසාවකට යොමු කිරීමේ ද, එයට සුවිශේෂ වූ මානුෂික අර්ථයක් දීමේ වාසනා මහිමය ඇති ප්‍රතිභාමත් නවකතාකරුවකු ලෙස මාර්ටින් වික්‍රමසිංහ නැඟී සිටින්නේ, 1925 දී පළ වූ **මිරිඟුව** නවකතාවෙනි. මෙම නවකතාව මුලින් ම පළව ඇත්තේ, **මිරිඟු දිය** යන නමිනි.

සිංහල නවකතාව කලාත්මක මඟකට පිවිසුණේ 1944 දී නිකුත් වුණු වික්‍රමසිංහගේ **ගම්පෙරළිය** කෘතියෙන් බැව් අවිවාදයෙන් පිළිගැනෙන කරුණකි. නවකතාවේ විෂයය පුළුල් කිරීමත්, එය සියුම් කලාත්මක නිර්මාණයක් වශයෙන් අගය කිරීමට සැලැස්වීමත් මෙම නවකතාවෙන් සිදු වූ මහත් ම සේවය වෙයි. නවකතාවක් මගින් කතුවරයකු කිසි යම් ජීවන දෘෂ්ටියක් පළ කිරීමට ගත් ප්‍රථම සාර්ථක වෑයම ද, මාර්ටින් වික්‍රමසිංහගේ ගම්පෙරළිය වෙතැයි සැලකීම, සාවද්‍ය නිගමනයක් නො වෙයි. “තුන් ඈඳුතු නවකතාවෙහි” දෙ කෙළවරෙහි වන **ගම්පෙරළිය** හා **යුගාන්තය** එකට ඈඳෙන්නේ, පසුව රචනා කරන ලද, **කලියුගයෙනි.**

ගම්පෙරළිය, කලියුගය හා යුගාන්තය යන තුන් ඈඳුතු නවකතාව එකක් වශයෙන් ගත් කල, එය මාර්ටින් වික්‍රමසිංහ පරිණාම වාදය පිළිබඳ දැරූ දාර්ශනික මතාන්තර නිර්මාණාත්මක ලෙස ප්‍රකාශ කරන ලද අවස්ථාවක් සේ ද සැලකෙයි.

1956 දී නිකුත් වුණු මාර්ටින් වික්‍රමසිංහගේ **විරාගය** බොහෝ විචාරකයන්ගේ අවධානයටත් විමර්ශනයටත් ලක් වූයේ ය. සිංහල නවකතා වංසය තුළ අරවින්ද වැනි චරිතයක් බිහි වූ මුල් ම වතාව එය විය. ඊට පෙර එවන් චරිත ලක්ෂණවලින් ද, එවන් ආකල්පයන්ගෙන් ද හෙබි චරිතයක් සිංහල නවකතාව තුළ දර්ශනය නො වී ය. එහෙයින් අරවින්දගේ චරිතය අපූර්වයක් සේ ඉස්මතුව පෙනිණි.

ගම්පෙරළියෙන් පසුව සමාජයත්, මිනිස් ජීවිතයත් දෙස සියුම් අන්දමින් බැලීමට සමත් ප්‍රතිභා සම්පන්න නවකතාකරුවන් කිහිප දෙනකු ම බිහි වූ අයුරු දැක ගත හැකි විය. විශේෂයෙන් ම, ගුණදාස අමරසේකරගේ **කරුමක්කාරයෝ** (1955) හා මාර්ටින් වික්‍රමසිංහගේ **විරාගය** (1956) ලියැවීමෙන් අනතුරුව, සිංහල නවකතා කතුවරුන් වඩාත් උත්සුක වූයේ, ජීවිතයේ ඇතැම් ගුඪ ස්ථාන දෙස බලා, ඒ අනුව ජීවිතය යථාර්ථවත්ව විවරණය කිරීමට ය. ඇතැම් ලේඛකයකු මේ ප්‍රශ්න තම නිර්මාණයන්හි දී සාධාරණීයත්වයට පත් කිරීමට සමත් වූ අතර, ඇතැමෙක් ඒ කාර්යයෙහි දී අසාර්ථක වූහ. ගුණදාස අමරසේකරගේ **යළි උපන්නෙමි** (1960), මඩවල එස්. රත්නායකගේ **පානෙන් අඳුරට** (1963) වැනි කෘතීන් එසේ අසාර්ථක වූ කෘතීන් හැටියට විචාරකයෝ පෙන්වා දෙති.

මෙම කතුවරුන් විෂයය කර ගත් අනෙක් ප්‍රශ්නය නම්, සංස්කෘතික ගැටීම් ය. සංස්කෘතික ගැටීම් යනුවෙන් මෙහි අදහස් කෙරෙන්නේ, ගැමි සමාජයෙන් නාගරික

සමාජයට සංක්‍රමණය වීම, ගමෙන් විශ්වවිද්‍යාලයට යාම, ලංකාවෙන් පිටරටකට යාම වැනි අවස්ථා ආශ්‍රයෙන් පැන නැගුණු ගැටීම් සමුදාය යි. මෙම ප්‍රශ්නවලට පොදු ස්වරූපයක් දීමට ගත් ප්‍රයත්න අතර, එදිරිවීර සරච්චන්ද්‍රගේ **මළගිය ඇත්තෝ** (1959) **වල්මත් වී හසරක් නුදුටිමි** (1962), සිරි ගුනසිංහගේ **හෙවනැල්ල** (1960), කේ. ජයතිලකගේ **අප්‍රසන්න කතාවක්** (1963) වැනි කෘතීන් සඳහන් කළ යුතු වන්නේ ය. කලින් සමාජ හා සංස්කෘතික වෙනස් වීම් විෂය කොට ගත් සිංහල නවකතාව, පසුව ලිංගික ජීවිතය ම පදනම් කොට ගෙන නැගී සිටින්නට තැත් කළේ වන. එ දවස නවකතා කතුවරුන් ජීවිතයේ එක් ප්‍රදේශයක් ම බලන්නට ගත් තැත නිසාත්, ලිංගික ජීවිතය අද්භූතයක් කොට ඉදිරිපත් කිරීම නිසාත් පසු යුගයේ ඇතැම් කතුවරු නවකතාවේ නව ක්ෂේත්‍ර සොයා යාමට පෙලඹී ඇත. මඩවල එස්. රත්නායකගේ **අක්කර පහ** (1959), ලීල් ගුණසේකරගේ **පෙත්සම** (1961), **අත්සන** (1963) සහ කේ. ජයතිලකගේ **චරිත තුනක්** (1963) වැනි කෘතීන්ගෙන් හෙළි වන්නේ ඒ ප්‍රතික්‍රියාව යි. ඉන් අනතුරුව, සිංහල නවකතා ලෝකයට එක් වූ මාර්ටින් වික්‍රමසිංහගේ **කරුවල ගෙදර** (1963), ජී.බී. සේනානායකගේ **මේධා** (1964), **චාරුමුඛ, වරදත්ත** සහ කේ. ජයතිලකගේ **දෙලොවට නැති අය** (1964) වැනි කෘතීන් පෙන්වන්නේ, ප්‍රමාද වී හෝ සිංහල නවකතාවේ ක්ෂේත්‍රය, තව තවත් පුළුල් වීමට දරන ලද ප්‍රයත්නය යි.

ඉකුත් දශක පහක තරම් කාලය තුළ සිංහල නවකතාව විවිධ දිසාවනට නැඹුරු වෙමින් සංඛ්‍යාත්මක වශයෙන් අතිවිශාල නවකතා කතුවරුන් පිරිසක් ද, නවකතා අතිමහත් ප්‍රමාණයක් ද අපගේ සාහිත්‍යයට එක්ව ඇති බැව් විශේෂයෙන් සැලකිය යුතු කරුණකි. එතෙකුදු වුවත්, එකී කෘතීන් අතර විශිෂ්ට නිර්මාණ සේ හඳුනාගත හැක්කේ අතිශයින් ම ස්වල්පයක් බැව් ද අමතක නො කළමනා ය.

## නූතන සිංහල කවිය

සම්භාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍යයේ නිමාවත් සමඟ තත්කාලීන දේශපාලනික, සමාජයීය හා සංස්කෘතික පසුබිම පාදක කර ගනිමින් 19 වන සිය වසේ අග හා 20 වන සියවසේ මුල් භාගයේ දී පමණ 'නූතන සිංහල කවියේ' සමාරම්භය සිදු වෙයි. පුරාතන පද්‍ය සාහිත්‍යයෙහි වූ ආගමික මුහුණුවර පූර්ව නිශ්චිත කාව්‍ය ආකෘතිය, භාෂාව හා අලංකාර භාවිතයෙහි වූ නියමයන් ක්‍රමයෙන් වෙනස් වී මෙම යුගයේ දී කවිය සමකාලීන දේශපාලන, ආර්ථික, සමාජීය හා සංස්කෘතික වෙනස් වීම්වලට සමගාමීව බිහි වූයේ ය. කවියේ ආගමික මුහුණුවර, පොදු ජනයාගේ ලෞකික අත්දැකීම් හා හැඟීම් ප්‍රතිනිර්මාණය කරා විතැන් වෙද්දී භාෂාවේ වූ පණ්ඩිත ප්‍රිය වූ විදග්ධ භාවය ක්‍රමයෙන් ව්‍යවහාරික භාෂාවට සමීප විය. කවිසමයානුගත අලංකාර හා රීතීන් වෙනුවට පොදු ජන සුබාවබෝධය හා අරමුණු සාධනය උදෙසා වූ අලංකාර හා රීතීන් වෙත කවීහු නැඹුරු වූහ. මුද්‍රණ තාක්ෂණයේ ආගමනයත් සමග කවිය පොදු ජන සමාජය අතර ජනප්‍රිය සාහිත්‍ය මාධ්‍යයක් බවට ක්‍රමයෙන් පත් විය. එතෙක් පැවතියා වූ සම්භාව්‍ය පද්‍ය සාහිත්‍යයේ හා ඉන් පසු පොදු ජන සාහිත්‍යයක් කරා විතැන් වූ කවියේ නො මඳ පෝෂණයත් බටහිර සාහිත්‍යයේ ප්‍රබල ආභාසයත් ලබමින් එය සිදු විය.

නූතන කවියේ ප්‍රථම භාගයේ කවීන් අතර පියදාස සිරිසේන, ආනන්ද රාජකරුණා, ජී. එච්. පෙරේරා හා එස්. මහින්ද හිමි ප්‍රමුඛ වෙති. එවකට යටත්

විජිතකරණයට ලක්ව සිටි ශ්‍රී ලාංකේය ජනතාව එම මානසිකත්වයෙන් මුදවා ගනු වස් 'ජාත්‍යනුරාගය' කුළුගැන්වෙන කාව්‍ය බන්ධනය කිරීමට මෙම යුගයේ දී ප්‍රමුඛත්වය හිමි විය. ඒ සඳහා කේන්ද්‍රය වශයෙන් ළමයා යොදා ගත් බව ඉහත කවීන්ගේ කාව්‍ය සමුච්ච නිරීක්ෂණය කිරීමේ දී විශද වෙයි. එම යුගයේ කවිය වෙසෙසින් ම මෙහෙය වූයේ යුගයේ අවශ්‍යතාව වෙනුවෙනි. එහෙයින් මෙම කාව්‍ය අධ්‍යයනය කළ යුත්තේ ඒ ඒ කවි හුදෙකලාව ගනිමින් නොව යුගයේ සමාජ පසුබිම කෙරෙහි සවිඥානික වෙමිනි.

මින් පසු අවධිය ඉතා ප්‍රබල ලෙස කවිය පොදු ජනයාට සමීප වූ කාල වකවානුවක් ලෙස සැලකිය හැකි ය. සාගර පලන්සූරිය (කේයස්), විමලරත්න කුමාරගම, පී.බී. අල්විස් පෙරේරා, බී. එච්. අමරසේන, මීමන ප්‍රේමතිලක, එච්.එම්. කුඩලිගම, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ යන කවීහු මෙම යුගය නියෝජනය කළහ. ප්‍රමාණාත්මකව ඉතා විශාල සංඛ්‍යාවක් කවි ලියැවුණු මෙම යුගයේ කවිය ජනතාව අතර පතළ වීම කෙරෙහි මුද්‍රණ ශිල්පයේ දියුණුව ඍජුව බල පෑවේ ය. කවි පොත්, කවි සඟරා, කවි කොළ සුලබ වූ මෙම යුගයේ බොහෝ කවීහු බටහිර රොමැන්ටික් කවීන්ගේ ආභාසය නො මඳව ලදහ. ඒ අනුව ඔවුන්ගේ කවිය ඊට පූර්ව යුගයේ කවීන් ගෙන් බෙහෙවින් වෙනස් විය. වස්තු විෂය විවිධ වීමත් භාෂාව සරල හා සුගම වීමත් භාව ගෝචර උපමා රූපකවලින් සමන්විත වීමත් මෙහි විශේෂ ලක්ෂණ ලෙස දැක්විය හැකි ය. ස්ත්‍රිය හා ස්ත්‍රීපුරුෂ ප්‍රේමය සෞන්දර්යාත්මකව චිත්‍රණය කිරීමට බොහෝ කවීන් පෙලඹුණු අතර පුද්ගල හා සමාජ අත්දැකීම් මානව දයාවෙන් යුක්තව ප්‍රතිනිර්මාණය කිරීමට මොවුහු නිබඳව ම උත්සාහ ගත්හ.

නූතන කවිය සම්බන්ධව සලකා බැලීමේ දී 'හෙළ හවුල' සාකච්ඡාවට භාජනය කළ යුතු වෙයි. කුමාරතුංග මුනිදාස පඬිවරයාගේ පුරෝගාමීත්වයෙන් ඇරඹුණු ව්‍යාකරණ ශාස්ත්‍රය සම්බන්ධ දැඩි මතධාරී ගුරු කුලයක් වන මෙහි සිංහල කවිය කෙරෙහි සැලකිය යුතු දායකත්වයක් සැපයූ කවීහු කිහිප දෙනෙක් ද වෙති. ස්වකීය භාෂා මතවාද නිර්මාණ කාර්යයේ දී පවුරක් වුව ද සූක්ෂ්මව නිරීක්ෂණයේ විශිෂ්ට නිර්මාණශීලී ප්‍රතිභාවක් කුමාරතුංග මුනිදාස, අරිසෙන් අහුබුදු, රැයිපියල් තෙන්නකෝන් වැනි කවීන්ගේ නිර්මාණවලින් පිළිබිඹු වෙයි.

ඉහත අවධීන්හි කවියේ වූ දුබලතා හඳුනා ගනිමින් මානව හා සමාජ අත්දැකීම් ප්‍රතිනිර්මාණය කරනු වස් නවමු කාව්‍ය ප්‍රස්තුත, භාෂා හා රීතීන් මෙන් ම අලංකාර සම්ප්‍රදායක කාලීන අවශ්‍යතාව කාලීනව පැන නගිමින් තිබූ යුගයක ජී. බී. සේනානායක **පලි ගැනීම** (1948) නම් වූ ස්වකීය කෙටි කතා සමුච්චයට අන්තර්ගත කොට "ගද්‍යයත් පද්‍යයත් අතර රචනා විශේෂයක්" ලෙස නම් කරමින් 'නිදහස් පද්‍ය' ආකෘතිය කවියට හඳුන්වා දෙයි. සිරි ගුනසිංහ ඔහු විසින් ම 'බුද්ධි ගෝචර කාව්‍ය' ලෙස හඳුන්වා දෙන නිසඳැස් කාව්‍ය සම්ප්‍රදාය ද බිහිවන්නේ මීට තදාසන්න කාලයක දී ය. 1956 දී **මස් ලේ නැති ඇට** යනුවෙන් කාව්‍ය ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කළ සිරි ගුනසිංහ "කවියෙහි ඇත්තේ බුද්ධියෙන් ග්‍රහණය කර ගත යුතු හැඟීම් හා අදහස් ය" යන මතයෙහි තරයේ එල්බ සිටියෙකි. ඔහු කවිය නවමු මාවතකට ප්‍රවේශ කිරීමේ නැති නම් සිවු පද ආකෘතියෙන් මිදී නව්‍ය කාව්‍ය සම්ප්‍රදායකට ප්‍රවේශ කිරීමේ කාර්යයේ දී ප්‍රබල මැදිහත්කරුවා ලෙස හැඳින්වීම සාවද්‍ය නො වේ. මෙසේ ආරම්භ වූ 'නිසඳැස් කාව්‍ය' සම්ප්‍රදායෙහි ඇතැම් දුබලතා පැවතුණත් කවි රස විඳින ජනයාට එය ආගන්තුක අත්දැකීමක් විය.

නොම්ලේ බෙදා හැරීම සඳහා ය.

ඒ අනුව නිසඳැස් කවියෙහි නිෂේධනීය ලක්ෂණ බැහැර කරමින් සාධනීය ලක්ෂණ උකහා ගනිමින්, සම්භාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍යයෙන් ද ජන කාව්‍ය සම්ප්‍රදායෙන් ද, විදේශීය කවියෙන් ද නො මඳ ආභාසය ලබමින් නූතනය දක්වා කවිය රැගෙන ආ පුරෝගාමීන් ලෙස ගුණදාස අමරසේකර හා මහගම සේකර යන කවීන් දෙ පළ සැලකිය හැකි ය. මහගම සේකර ගත් මාර්ගය අනුව ගිය රත්න ශ්‍රී විජේසිංහ, දයාසේන ගුණසිංහ, පරාක්‍රම කොඩිතුවක්කු, මොනිකා රුවන්පතිරණ වැනි කවීන්ට හා කිවිඳියන්ට නූතන කවි කෙතෙහි ප්‍රමුඛස්ථානයක් හිමි වේ. නූතනයෙහි දී කවිය අර්ථපූර්ණ හා භාවපූර්ණ මාධ්‍යයක් බවට පත් කිරීමෙහි ලා නන්දන වීරසිංහ, යමුනා මාලිනී පෙරේරා, එරික් ඉලයප්ආරච්චි වැනි කවියෝ හා කිවිඳියෝ පුරෝගාමී වූහ. ඒ අතර ලක්ශාන්ත අතුකෝරළ, මංජුල වෙඩිවර්ධන, මහින්ද ප්‍රසාද් මස්ඉඹුල, සුහර්ෂණී ධර්මරත්න වැනි තරුණ කවීහු ද වෙති.

# 2 කුස ජාතකය

## කුරුණෑගල අවධිය

භාග්‍යවතුන් වහන්සේගේ පූර්ව උත්පත්ති කතා කියන්නා වූ වෘත්තාන්ත හෙවත් පූර්ව චරිත කතා ජාතක කතා නම් වේ.

ජාතක කතා සැකසී ඇත්තේ පැරණි භාරතීය සමාජය ආශ්‍රය කර ගෙන ය. එහෙත් කාලවකවානුව පිළිබඳ විවිධ මත පවතී. බුද්ධෝත්පාද කාලයටත් පෙර පටන් ම පැවැති කතා පසු කලක ජාතක කතා බවට පත් වූ බව එක් මතයකි. බුදුන් වහන්සේගේ ශ්‍රී මුඛ දේශනා ලෙස ජාතක කතා සියල්ල බිහි වූ බවට ද මතයක් පවතී. කෙසේ වෙතත් ත්‍රිපිටකයේ සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායේ පොත් 15 අතරට ජාතක කතා අයත් වේ. බුදුන් වහන්සේ කෙරේ තිබූ අචල භක්තිය නිසා අනාදිමත් කාලයක් පුරා මුඛ පරම්පරානුගතව මේවා පැවතිණි.

මහින්දාගමනයත් සමග ලක්දිවට ගෙන එනු ලැබූ මේ කතා ජනතාව අතර ජනප්‍රිය විය. මේ හේතුව නිසා කුරුණෑගල රාජධානි සමයේ හතරවන පැරකුම්බාවන්ගේ අනුග්‍රහයෙන් පාලියෙන් පැවති එම කතා සරල සිංහලයට පරිවර්තනය කර ඇත. එතෙක් පාලි භාෂාවෙන් තිබූ "පාලි ජාතකට්ඨ කථාව" සිංහලයට නැඟීම වීරසිංහ ප්‍රතිරාජ අමාත්‍යතුමාගේ මැදිහත් වීමෙන් සිදු වූ බව මහා වංසයේ සඳහන් වේ. පන්සිය පනස් ජාතක පොතෙහි ඇත්තේ කතා 547කි. එය කතා 550ක්ව පැවැති බවට ද විද්වත් මතයක් පවතී.

මෙම කතා සියල්ලේ ම ආකෘතිමය වශයෙන් සමානත්වයක් තිබේ. වත්මන් කතාව, අතීත කතාව හා සමෝධානය පිළිවෙළින් ඇතුළත්ව තිබීම එම ලක්ෂණය යි. වත්මන් කතාවේ බුදුන් වහන්සේ වැඩ සිටින අතර අතීත කතාවේ බෝසතාණන් වහන්සේගේ චරිතය හමු වේ. සමෝධානය යනු වත්මන් අතීත කතා ගැළපීම යි. බෝසතාණන් වහන්සේගේ ශීලය, ඥානය, වීර්යය, ඉවසීම, ත්‍යාගවන්ත බව ආදිය අතීත කතාවෙන් නිරූපිත ය. එමගින් උපදෙස් සැපයීම, සුචරිතයෙහි අගය පෙන්වා දීම සිදු කෙරේ. දෙවි මිනිස් සත්ත්ව චරිත අතීත කතාවෙන් හමු වේ. කර්මය, පුනර්භවය පිළිබඳ පෙන්වාදීමත් ජාතක කතාවලින් සිදු කෙරේ. ඒ නිසා සර්වකාලීන බවක් තිබේ.

මෙම කතා වස්තුවල සාහිත්‍යමය වටිනාකමක් ද ඇත. ගූඪ මිනිස් සිත විවරණය කිරීම එහිලා වැදගත් වේ. ඒ කතා ඇසුරෙන් ලියා ඇති පොත-පත බොහෝ ය. විහාර චිත්‍ර, මූර්ති, කාව්‍ය, නාටක, ළමා කතා, සිනමා පට සඳහා ද ජාතක කතා පසුබිම් කර ගෙන ඇත. ජාතක කතා බාල මහලු පණ්ඩිත කවරකුට වුව ද කියවීමෙන් ද ඇසීමෙන් ද රස විඳිය හැකි ය. ජාතක පොත කියවීමෙන් මිනිසෙකුට වසර 200ක් ජීවත් වී ලබන අත්දැකීම් ලබාගත හැකි බව මහා ගත්කරු මාර්ටින් වික්‍රමසිංහ සඳහන් කර තිබේ. "කුස ජාතකය" ජාතක පොතේ ඇති 523 වන කතාංගය යි.

ශාසනය කෙරේ කලකිරුණු භික්ෂූන් වහන්සේ කෙනකුන් අරබයා එය දේශනා කර ඇත.

ස්ත්‍රීන් කෙරේ දැඩි රාග සිත් ඇති කර ගැනීම තේජසින් පිරිහී නොයෙක් විනාශයන්ට මුහුණ පෑමට හේතු වන බව වත්මන් කතාවෙන් පෙන්වා දෙයි. එම සංසිද්ධිය තහවුරු කිරීම සඳහා කුස රජු පිළිබඳ අතීත කතාව ඉදිරිපත් කර ඇත. ස්ත්‍රිය පිළිබඳ පැරණි සමාජයේ පැවති ආකල්පයත් මෙම අදහසට පාදක වී ඇත. කුස ජාතකය අතුරු කතාවකින් ද සමන්විත වේ. පබාවතියගේ රූප ශෝභාවෙන් මත්ව තේජාන්විත කුස බැලමෙහෙවර කිරීමට පවා පෙලඹෙන අයුරු හාස්‍ය රසය මුසු කරමින් මෙහි විස්තර කෙරේ. කුස ජාතකය වත්මන් සමාජයට පවා ගුරු කොට ගත හැකි වේ. ඉන් දැක්වෙන දහම් පණිවිඩයටත් වඩා ඉන් ජනිත වන සාහිත්‍ය රසය නිසා ම ලාංකික ජන සමාජයේ මුල් බැස ගෙන ඇති බව සඳහන් කළ හැකි ය.

තව ද දසබලධාරී වූ සුරාසුරවරචක්‍රවාරු චූඩාමණිමරීචිසඤ්චයපරිචුම්බිත චරණයුගල ඇති සර්වඥයන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ ජේත නම් රාජ කුමාරයන්ගේ උයන්හි අනේපිඬු මහසිටාණන් විසින් සිව්පනස් කෙළක් ධන වියදම් කොට කරවා පිළිගන්වන ලද රාත්‍රිස්ථාන දිවාස්ථාන චංක්‍රමණ මණ්ඩප මාලකාදීන් විරාජමාන වූ පද්මෝත්පල කුවලයකුමුදකල්හාර කුසුමෝපශෝභිත පුෂ්කරණීන් රම්‍ය වූ භූමිප්‍රදේශ ඇති ජේතවන මහවිහාරයෙහි දිව්‍ය බ්‍රහ්ම ආර්ය ඊර්යාපථ විහරණයෙන් දවස් යවන සේක් සස්නෙහි උකටලී වූ එක්තරා භික්ෂු කෙනෙකුන් අරභයා මේ කුස ජාතක ධර්ම දේශනාව වදාළ සේක.

ඒ කෙසේ ද යත්?

සැවැත් නුවර වසන්නා වූ එක්තරා කුල පුත්‍රයෙක් බුදු සස්නෙහි යෙදී මහණ ව එක් දවසක් සැවැත්නුවර පිඬු සිඟා ඇවිදිනේ ය, සර්වාභරණ විභූෂිත වූ එක් මාතෘගාමයකු දැක සුභනිමිත්ත ග්‍රහණයෙන් බලා ක්ලේශවසඟව ශාසනයෙහි ඇලුම් නැතිව දික් වූ නියකෙස් හා ඉපිලුණු නහරබහන් කිලුටු වූ සිවුරු හා සුදුමැලි වූ සිරුරු ඇතිව වසන්නේ ය. යම් සේ දිව්‍යලෝකයෙන් චුත වන්නා වූ දිව්‍යපුත්‍රයන්ට පැලඳි මල් මලානික වීම ය, දිව සළු කිලුටු වීම ය, ශරීරය දුර්වර්ණයට පැමිණීම ය, දෙකිසිල්ලෙන් ඩා වැහීම ය දිව්‍ය ලෝකයෙහි ආලය මඳ වීම ය යන මේ පංච පූර්ව නිමිත්තයෝ පහළ වෙද්ද එ පරිද්දෙන් ම උකටලී වූ සිත් ඇතිව ශාසනයෙන් පිරිහෙනු කැමති භික්ෂූන්ටත් සැදෑ නමැති මල් මලානික වීම ය පිළි සිල් කිලුටුවීම ය කැරවැහැම් හා නුගුණ පැතිරෙමින් විරූප බවට පැමිණීම ය, ක්ලේශ නමැති ඩා වැහීම ය, විවේකස්ථානයෙහි නො ඇලීම ය යන පංචපූර්ව නිමිත්තයෝ පහළ වන්නාහ. ඒ මහණ හට ද එකියන ලද පස් වැදෑරුම් වූ ගුණයෝ ද පහළ වූහ. එබව දැන සෙසු භික්ෂූන් වහන්සේ ඒ මහණ නො කැමැති කරවා බුදුන් සමීපයට කැඳවා ගෙන ගොස් "ස්වාමීනි, මූ ශාසනයෙහි උකටලී වූ" යයි දැක්වූ සේක.

එකල සර්වඥයන් වහන්සේ "මහණ තා ශාසනයේ උකටලී වූයේ දැ"යි විචාරා වදාරා සැබෑයැ ස්වාමීනි යි දැන්වූ කල්හි "මහණ ක්ලෙශ වසඟව නො පවතුව. මේ මාතෘගාමයෝ නම් පවිටු සත්ත්ව කෙනෙකැයි ඔවුන් කෙරෙහි පිළිබඳ සිත් හැර ශාසනයෙහි ඇලී වාසය කරව ස්ත්‍රීන් කෙරෙහි පිළිබඳ සිත් නිසා තෙජස්වී වූත් පුරාතනයෙහි නුවණැත්තෝ තේජසින් පිරිහී නොයෙක් ව්‍යාසනයට පැමිණියාහු වෙද්දැ"යි

වදාරා භික්ෂූන් වහන්සේ විසින් ආරාධිත වූ පරදුක්ඛදුක්ඛිත වූ කරුණා නිධාන වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ කඩතුරාවක් පහ කොට විචිත්‍ර චිත්‍රකර්මාන්තයක් දක්වන කෙනෙකුන් පරිද්දෙන් භවයෙන් ප්‍රතිච්ඡන්න වූ ඉකුත්වත් කථාව කෘතයුග මහමේඝයක් නැගී වස්නා කලක් මෙන් ගෙන හැර දක්වා වදාරන සේක්.

යටගිය දවස මලල රට කුසාවතී නම් නුවර ඔක්කාක නම් රජ්ජුරු කෙනෙක් දස රාජ ධර්මයෙන් දැහැමෙන් රාජ්‍ය කරන්නාහ. ඔහුගේ සොළොස් දහසක් පුරංගනාවන්ට ප්‍රධාන වූ සීලවතී නම් අගමෙහෙසුන් බිසෝ කෙනෙක් වූහ. දූ පුත් දරු කෙනෙක් නැත්තාහ. එකල නුවර වැස්සෝ හා රාජ්‍ය වාසීහු හා පුරදොරට රැස්ව රට නස්නේ ය විනස්නේ යයි මහත් කොට කෝලාහල කළාහු ය. ඒ කෝලාහල ඇසූ රජ්ජුරුවෝ සීමැදුරු කවුළුව හරවා "මා රාජ්‍ය කරමින් සිටිය දී අන්‍යායක් කරන කෙනෙක් නැත්තාහ. කුමක් නිසා මොරගවුදැ"යි විචාළහ.

එකල ඔවුන් විසින් "සැබව, දේවයන් වහන්ස, අධර්මකාරී කෙනෙක් නැත. වංශ පරිපාලනය කරන්ට නිසි දරු කෙනෙක් නැත්තාහ. අනික් කෙනෙක් අප රාජ්‍යය ඇරගෙන අධර්මයෙන් රාජ්‍යය නසති. ඒ කාරණයෙන් දැහැමෙන් රාජ්‍යය කරන්ට නිසි පුතණු කෙනෙකුන් පැතුව මැනවැ"යි කීහ. එසඳ රජ්ජුරුවෝ ද දරුවන් ප්‍රාර්ථනා කරන්නා වූ මා විසින් කුමක් කටයුතු දැයි විචාළාහු ය. "දේවයන් වහන්ස, නුඹ වහන්සේගේ තුන් වැදෑරුම් වූ නාටක සත්‍රීන්ගෙන් පළමු කොට රැකවල් ඇති ව පිටත ඉන්නා වූ සුළු නළු මුළු රැකවල් හැර ස්ත්‍රීන් සිත සේ ඇවිදනාව හැර වදාළ මැනව. ඉදින් ඉන් එක් කෙනෙක් දරු කෙනෙකුන් ලද්දා නම් මැනව. නැත්නම් ඉක්බිති අගමෙහෙසුන් බිසවුන් වහන්සේ හැර අවශේෂ ස්ත්‍රීන් හළ මැනව. ඒකාන්තයෙන් මෙතෙක් දෙනා අතුරෙන් කුසල් ඇති කෙනෙක් දරු කෙනෙකුන් ලබති"යි කීවාහු ය. එකල රජ්ජුරුවෝ ඔවුන්ගේ බසින් එලෙස කරවාත් දරු කෙනෙකුන් නො ලදින් නො සතුටු වූහ.

නැවත නුවර වැස්සෝ රැස් ව කෝලාහල කළාහ. ඒ අසා රජ්ජුරුවෝ "තොප හැම කීමෙන් පුරංගනාවන් රැකවල් හරවාත් එතෙක් දෙනාගෙන් දරු කෙනෙකුත් ලත් කෙනෙකුත් නැත. දැන් කුමක් කරමෝ දැයි විචාරා ඔවුන් විසින් "දේවයන් වහන්ස, මේ සියලු ස්ත්‍රීහු දුරාචාරී කුසල් මඳ සත්ව කෙනෙක. මොවුන්ට දරු පින් නැතැයි නුඹවහන්සේ නිරුත්සාහ නුවුව මැනව. අගමෙහෙසුන් වූ සීලවතී දේවීන් වහන්සේ සීලාචාර සම්පන්න සේක. උන් වහන්සේ රැකවලින් හළ මැනව. දරු කෙනෙක් ඇති වෙත" කී සඳ රජ්ජුරුවෝ එබස් පිළිගෙන නුවර වැසියන් රැස් කරවා සීලවතී දේවීන්වහන්සේ සර්වාභරණයෙන් සරසා මාලිගාවෙන් පිටත් කළාහු ය. එකෙණෙහි බිසවුන්ගේ සීලානුභාවයෙන් ශක්‍ර දේවේන්ද්‍රයන්ගේ පාණ්ඩුකම්බල ශෛලාසනය උන් නො කමැති පරිද්දෙන් හුණු විය. එකෙණෙහි මීට කාරණා කිම්දෝ හෝ යි තමන්ගේ දහසක් නුවණැස් මෙහෙයා බලා සීලවතී දේවීන් දරුවන් පතන නියාව දැන "මා විසින් උන්ට දරු කෙනෙකුන් දිය යුතු"ය සිතා සියලු තව්තිසා භවනය බලා ගෙන ගොස් එයින් චුත ව මත්තෙහි දිව්‍ය ලෝකයට යනු කැමතිව සිටියා වූ බෝධිසත්ත්වයන් දැක ශක්‍රදේවේන්ද්‍රයෝ ඔහුගේ විමන් දොරට ගොස් "සබඳ තොප විසින් මනුෂ්‍යලෝකයට ගොස් ඔක්කාක රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ ගත යුතු යයි කියා ගිවිස්වා අන් දිව්‍ය පුත්‍රයෙකුත් එලෙස ම ගිවිස්වා "කවුරුත් බිසවුන්ගේ සීලභේදය

නො කෙරෙත්ව''යි සිතා තුමූ මහලු බමුණු වෙසක් මවා ගෙන රජ්ජුරුවන්ගේ මාළිගා දොරටට ගියාහු ය. එසඳ රැස් වූ බොහෝ දෙන ඒ ශක්‍ර බ්‍රාහ්මණයා දැක ''කුමක් නිසා තෝ මෙතනට ආයෙහි දැ''යි යනාදීන් පරිභව බැණ විචාළාහ.

ඒ අසා ශක්‍රදේවේන්ද්‍රයෝ ද ''කුමක් නිසා මට නින්දා කරවු ද ශරීරය ජරප්‍රාප්ත පමණක් විනා රාගය තරුණ වන්නේ ය. ඉදින් සීලවතී දේවීන් ලදින් නම් ගෙන යෙමි යි සිතා ආමි'' කියා තමන්ගේ ආනුභාවයෙන් හැමදෙනාට පෙරටුව සිටගෙන පිටත් වූ බිසවුන් අත අල්වාගෙන ඒ සියලු ජනයා නින්දා පරිභව කරමින් සිටිය දී නික්මුණාහු ය. එසඳ බිසව් ද මේ මහලු බමුණු මා ගෙන යන්නේ යයි පිළිකුලෙන් පෙළී ලජ්ජාවට පැමිණියෝ ය. රජ්ජුරුවෝ ද බමුණු මාල්ලා විසින් ගෙන යන ලද බිසවුන් දැක නො සතුටු වූ ය. ඉක්බිති ශක්‍රදේවේන්ද්‍රයෝ බිසවුන් ඇරගෙන නුවර වාසලින් පිටත් ව වාසල් සමීපයෙහි පනවන ලද දඬුමැසි ඇති හරනා ලද දොර පැලලි ඇති පැල්පතක් මවා ඒ පැල සමීපයට ගියෝ ය. එකල බිසව් ''මේ නුඹගෙ ගෙදර දැ''යි විචාරා බමුණු විසින් ''එසේ ය සොඳුර පළමු මම උදකලායෙමි. දැන් අපි දෙ දෙනමෝ වූම්හ. එහෙයින් මා සාල් මාළු ආදිය සිඟා ගෙන එන තෙක් මේ මැස්සේ වැදොවැ''යි කියා බිසවුන් ඇඟ මොලොකතින් පිරිමැද දිවපහස් පතුරුවා නිදි ගන්වා දිවපහස් ලැබ විසංඥව නිදන්ට වන් සඳ තමන්ගේ ආනුභාවයෙන් බිසවුන් තව්තිසා භවනයට ගෙන ගොස් සරහන ලද දිව්‍ය විමානයෙක්හි අතුරන ලද දිව යහන්හි සතප්පා ලූහ.

ඉක්බිති බිසව් සතියකින් පිබිද එහි දිව්‍ය ලෝකයෙහි සම්පත් දැක ''මේ මා ගෙනායේ මිනිසෙක් නො වෙයි ශක්‍ර දේවේන්ද්‍රයෝ වනැ''යි සිතා යහනින් නැගී නොයෙක් දිව නළුවන් විසින් පිරිවරන ලදුව පරසතු රැක මුල පඬු ඇඹුල්සල අස්නෙහි ඉඳ දිව ඉසුරු විඳිනාවූ සක්දෙව්රජහු කරා ගොස් වැඳ එකත්පස්ව සිටියෝ ය.

එකල ශක්‍ර දේවේන්ද්‍රයෝ ''තොපට වරදානයක් දෙමි, කැමති වරයක් ඉල්වා ගනැ''යි කීහ. එබස් අසා සතුටු වූ බිසව් ''දේවයන් වහන්ස පුත්‍ර වරයක් දුන මැනවැ''යි ඉල්වූ ය. එකල ශක්‍රදේවේන්ද්‍රයෝ ''දේවීනි එක් කෙනෙකුන් තබා දරුවන් දෙන්නෙකු දෙමි. බල ඉන් එක් කෙනෙක් නුවණැතිව රූ නැති වෙති. එක් කෙනෙක් රූ ඇතිව නුවණ නැති වෙති. ඔවුන් දෙ දෙනාගෙන් පළමුව කවුරුන් ලබන්නා දැ''යි විචාරා ''නුවණැති තැනැත්තන් පළමු ව ලබන්නා කැමැත්තෙමි'' කී සඳ එබස් ශක්‍ර දේවේන්ද්‍රයෝ පිළිගෙන එබිසවුන්ට කුස තණ මිටක් ද දිව සළුවක් ද දිව සඳුන් හරයක් ද පරසතු මදාරා මල් ද කොකනද නම් වීණාවක් ද දී බිසවුන් කැඳවා ගෙන අවුත් රජ්ජුරුවන්ගේ ශ්‍රී යහන් ගබඩාවට වැද රජ්ජුරුවන් හා එක් යහන් කරවා තමාගේ පය මහපට ඇඟිල්ලෙන් බිසවුන්ගේ පෙකනිය පිරිමැද සුරපුරට ම නැගී ගියාහ. එකෙණෙහි පුරන ලද බෝධිසම්භාර ඇති අප මහ බෝසතාණෝ තව්තිසා භවනයෙන් චුතව අවුත් සීලවතී දේවීන් බඩ පිළිසිඳ ගත්හ.

බිසවුන් තමන් කුස දරු ගැබ පිහිටි බව දත්හ. ඉක්බිති රජ්ජුරුවෝ පිබිද බිසවුන් දැක ''දේවීනි කවුරුන් විසින් ගෙනයනලද දැ''යි විචාරා ශක්‍ර දේවේන්ද්‍රයන් විසිනැයි කීකල ''මේ කිමෙක් ද මහලු බමුණෙකු ගෙනගිය නියාව මම දිටිමි. කුමක් කියා මට වළහා කියව් දැ''යි කිවු ය, ''දේවයන් වහන්ස, අඳහා ගත මැනව, ශක්‍ර දේවේන්ද්‍රයෝ මා හැර ගෙන දිව්‍යලෝකයට ගියාහුය''යි දෙ වෙනි තුන් වෙනි වත් කියා ගිවිස්වාලිය

නො හී ශක්‍රදේවේන්ද්‍රයන්විසින්දෙන ලද කුස තණ හා දිව සළු ආදිය පෑ ගිවිස්වා ලූහ. “වන්නාට ශක්‍ර දේවේන්ද්‍රයෝ තොප ගෙන ගියෝ ය. දරු කෙනෙකුන් ලදුදැ”යි විචාරා “එසේ ය දේවයන් වහන්ස, දරු කෙනෙකුන් ලදිමි කිවු ය.” එබස් අසා සතුටු වූ රජ්ජුරුවෝ බිසවුන්ට ගබ පෙරහර දුන්හ.

ඉක්බිති ඒ බිසවු ද ක්‍රමයෙන් දස එකඩමසක් ඇවෑමෙන් පුතණු කෙනෙකුන් වැදූහ. ඒ කුමාරයාහට කුස කුමාරයෝ යයි නම් තුබූහ. ඒ කුස කුමාරයන් පියවර නගා ඇවිදිනා කාලයෙහි අනික් දිව්‍ය පුත්‍රයෙක් දෙව් ලොවින් අවුත් බිසවුන් කුස උපන්හ. ඕහට ජයම්පතී යයි නම් තුබූහ. ඒ රාජ කුමාරවරු දෙදෙන මහත් වූ පෙරහරින් පෙරඩමස සඳ සේ ම වැඩිවිය පැමිණියාහ. මහා බෝධිසත්ත්වයෝ තමන් නුවණැති හෙයින් සියලු ශිල්පයන් ම ආචාර්‍ය කෙනෙකුන්ගෙන් නො ඉගෙන සිය නුවණින් ම දැන නිම වූහ. ඉක්බිති මහා බෝධිසත්ත්වයන් සොළොස් හැවිරිදි වයසට පැමිණි කල්හි පිය රජ්ජුරුවෝ කුමාරයන් රාජ්‍යයෙහි අභිෂේක කරනු කැමතිව බිසවුන් කැඳවා “දේවීනි, තොපගේ පුතණුවන් අභිෂේක කරවා නාටක ස්ත්‍රීන් හා ඓශ්වර්‍යය පාවා දී ජීවත් වන්නා වූ අපි රාජ්ජයෙහි පිහිටියාහුගේ ශ්‍රී විභූතිය දකුම්හ. මේ මුළු දඹදිව යම් රජක්හුගේ දුවක කැමති වේ ද උන් ගෙන්වා අගමෙහෙසුන් කරම්හ, කවර රජ්ජුරුකෙනෙකුන්ගේ කුමාරිකාවක කැමැත්තෝ ද උන්ගේ අභිප්‍රාය දැන කියව”යි කීහ. බිසවුන් යහපතැයි ගිවිස කුමාරයන්ට මෙපවත් කියා අභිප්‍රාය විචාරා ගෙන එවයි කියා කම්මිත්තක යවූහ. ඒ ස්ත්‍රී ගොසින් බෝධිසත්ත්වයන්ට එපවත් කිවු ය. ඒ අසා මහ බෝසතාණෝ “මම රූ නැත්තෙමි. රූපශ්‍රීන් යුක්ත වූ රාජ කුමාරිකාවක් ගෙනෙන ලද නම් මා දැක යකකු මෙන් විරූප වූ මොහු ගෙන් මට කම් කිම් දැයි පලා යන්නී ය. ඒ අපට ලජ්ජා කටයුතු වන්නේ ය. එහෙයින් මට ගෘහ වාසයෙන් ප්‍රයෝජන නැත. මාපිය දෙ දෙනා ජීවත් වන තෙක් උපස්ථාන කොට ගුරු දෙ දෙනා ඇවෑමෙන් ගොස් මහණ වෙමි ය සිතා මහබෝධිසත්ත්වයෝ තමන්ගේ මේ අදහස ඒ කම්මිත්තියට කිවු ය. ඕ තොමෝ ගොස් එපවත් බිසවුන්ට කිව. බිසවු එපවත් රජ්ජුරුවන්ට කීහ. ඒ අසා රජ්ජුරුවෝ නො සතුටුව නැවත කීප දවසකින් එලෙස ම කියා යවු ය. බෝධිසත්ත්වයෝනො කමැත්තේ යයි තුන් යලක් වළකා සතර වෙනි වාරයෙහි දෙ මවුපියන් කීවා නො කොට වරදවා පිළිපැදීම කටයුතු නො වෙයි, ඊට නිසි උපදෙසක් කෙරෙමියි සිතා මහා බෝධිසත්ත්වයෝ තරාල් දෙටුවකු කැඳවා බොහෝ රත්රන් දී එක් ස්ත්‍රීරූපයක් කොට ගෙනෙවයි කියා ඔහු නික්මවා තුමු රත්රනින් ස්ත්‍රී රූපයක් කළෝ ය.

බෝධිසත්ත්වයන්ගේ අභිප්‍රාය සිතූ පැතූ ලෙස ම සිද්ධ වන බැවින් ඒ රන්රුව කියා නිමවිය නො හැකි රූපශෝභා ඇත්තේ විය. එකල මහ බෝධිසත්ත්වයෝ ඒ රන්රුව සුරත් කොමු පිළියක් අඳවා ශ්‍රී යහන් ගර්භයෙහි සිටවූහ. ඉක්බිති බෝධිසත්ත්වයෝ තරාල ඇදුරා විසින් ගෙනෙන ලද රන්රුවට නින්දා කොට “යව, අපගේ ගර්භයෙහි තුබූ ස්වර්ණ රූපය ගෙනෙවයි ස්වර්ණකාරයාහට නියෝග කළේ ය. එසඳ ඒ ගොස් ශ්‍රී යහන් ගර්භයට වැද ඒ රන්රුව දැක කුමාරයන් වහන්සේ හා සමග ක්‍රීඩා පිණිස ආ දිව්‍යප්සරාවක් වනැයි සිතා අත දික්කරන්ටත් නො පෝසත්ව බෝධිසත්ත්වයන් කරා ගොස් “දේවයන් වහන්ස බිසවුන් වහන්සේ තනිව වැඩසිටි සෙයින් වැද්ද නො හෙමියි කී ය. නැවත බෝධිසත්ත්වයන් විසින් “ඇදුර, එ රන්රුව සැක නැතිව හැර ගෙන එවයි කියා යවන ලදුව ගොස් ගෙනායේ ය.

ඉක්බිති බෝධිසත්ත්වයෝ බඩාලා ගෙනා රත්‍රන් රුව ගබෙහි ලා තමන් කළ රුව ආභරණ ආදීන් සරහා රථ යානාවෙක්හි තබා "මෙබඳු රූපශ්‍රී ඇති කෙනෙකු ලදින් නම් පාවා ගනිමි" කියා රන්රුව මෑණියන් සමීපයට යවූහ. ඒ දැක බිසව් සතුටු ව අමාත්‍යයන් රැස් කරවා "සගයෙනි, මපුතණුවෝ නම් මහපිනැත්තාහ. ශක්‍ර දේවේන්ද්‍රයන් විසින් දෙන ලද කෙනෙක. එහෙයින් සුදුසු කුමාරිකා කෙනෙකුන් ලැබෙති. තෙපි හැම මේ රන්රුව පිළිසන් රථ යානාවෙක තබා ගෙන මුළු දඹදිව ඇවිදිමින් යම් රජ්ජුරු කෙනෙකුන්ගේ මෙබඳු රූ ඇති කුමාරිකාවක දුටු නම් ඒ රජහට මේ රන් රුව දී ඔක්කාක රජ්ජුරුවන් වහන්සේ නුඹවහන්සේ හා සමග විවාහ සම්බන්ධයක් කරනු කැමති සේකැ"යි කියා දවස් නියම කොට එවයි නියෝග කළාහු ය.

එසඳ ඒ නියෝග ලද ඇමතියෝ මහ පෙරහරින් ම ඒ රන්රුව හැර ගෙන ඇවිදිනාහු යම් නුවරකට පැමිණෙද්ද එහි සවස් වේලෙහි බොහෝ දෙනා රැස් වන තෙනක ඒ රුව වස්ත්‍රාභරණ කුසුමාදීන් සරහා රන්සිවිගෙයෙක්හි තබා පැන් තොටට යන එන මංහස සිටුවා තුමූ ඉවත් ව යනු එන්නන් බස් අසනු පිණිස සැඟ වී සිටිනාහ. එකල බොහෝ දෙන ඒ රුව දැක රන්රුවකැයි නො දැන "මනුෂ්‍යාවූත් මෝ තොමෝ දිව්‍යාප්සරාව මෙන් ඉතා හොබනී ය. මෝ තොමෝ කොයි සිට අවුදැයි කුමක් නිසා මෙතන සිටියා ද අපගේ නුවර මෙබඳු රූපශ්‍රී ඇති කෙනෙක් නැතැයි යනාදීන් ප්‍රශංසා කෙරෙමින් යන්නාහ. එකල අමාත්‍යයෝ "ඉදින් මෙනුවර මෙබඳු වූ කුමාරිකා කෙනෙක් ඇත්නම් අසෝ රජ්ජුරුවන්ගේ අසෝ අමාත්‍යයන්ගේ දියණියන් වැනියෝ යයි කියති. එලෙස නො කීයේ ඒකාන්තයෙන් මෙබඳු රූ ඇති කෙනෙකුන් මෙනුවර නැති හෙයිනැ"යි ඒ රුව හැර ගෙන අනික් නුවරකට යන්නාහ. මේ ලෙස ක්‍රමයෙන් ගොස් මදුරට සාගල නුවරට පැමිණියාහු ය.

එනුවර මද්‍ර රජ්ජුරුවන්ගේ දිව්‍ය ස්ත්‍රීන් හා සමානව උතුම් වූ රූපශෝභා ඇති දූ අට දෙනෙක් ඇත. ඔවුන් ඇමදෙනාට වැඩිමාලු ප්‍රභාවතීගේ ශරීරයෙන් හැම වේලෙහි ම බාලාර්කරශ්මියට බඳු වූ පැහැ විහිදුණේ ය. ඝනාන්ධකාර වූත් රාත්‍රියෙහි සතරරියන් ගෙයෙක්හි ප්‍රදීපාලෝකයක් නැතිව ශරීරාලෝකයෙන් ම එකාලෝක වන්නේ ය. උන්ට කිරිමවු වූ කුදු තොමෝ ප්‍රභාවතීන්ට නහන පැන් ගෙනෙන පිණිස ස්ත්‍රීන් අට දෙනෙකු ලවා රන් කළ අටක් ගෙන්වාගෙන සවස් වේලෙහි පැනට යන්නී, ඔක්කාක රජ්ජුරුවන්ගේ රන්රුව ගෙනා පුරුෂයන් විසින් මංහස සිටුවන ලද රුව දැක ප්‍රභාවතී යයි යන සිතින් ළඟට ගොස් "මේ නො කීකරු දරුවෝ අප පැනට එවා තුමූ මේ වේලෙ පළමු කොට අවුදින් මෙතන සිටියෝ ය. රජකුලයට පරිභව උපදවන්නා වූ කෙල්ල, ඉදින් රජ්ජුරුවන් වහන්සේ දත් සේක් වී නම් අප හැම නසා පියන සේකැ"යි කියා කිපී කොපුලතෙහි පහරක් ගැසුව. එකෙණෙහි අත්ල පැලී යන කලක් පරිද්දෙන් වේදනාවට පැමිණ රන් රුවකැයි දැන ලජ්ජාව සිනාසෙමින් "බලග මා කළ දෙයක. මම් මගේ දියණියකැයි සිතා පහරක් ගැසීමි. මෝ තොම මාගේ දරුවන්ගේ රුවට කුමක් අගී ද මාගේ අතට ආයාස වූ පමණකැ"යි තමා හා එක්ව ගියවුන්ට කිව. එබස් අසා රාජ දූතයෝ "මාගේ දියණියෝ මීටත් වඩා රූ ඇත්තාහයි කියන්නාහු තෙපි කුමක් කියව්දැ"යි විචාළාහු ය.

එකල ඔවුන්ට මේ රන්රුව මද්‍ර රජ්ජුරුවන්ගේ දියණියන් ප්‍රභාවතීන්ගේ රූපශ්‍රීන් සොළොස්වන කලාවෙන් කලාවකුත් නො හගනේ යයි කුදු කිව. ඔහු එබස් අසා සතුටුව රජගෙයි වාසලට ගොස් ඔක්කාක



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

රජ්ජුරුවන්ගෙන් ආ දූතයෝ වාසල සිටියාහුය''යි මද්‍ර රජ්ජුරුවන්ට කියා යවුහ. එබස් අසා මද්‍ර රජ්ජුරුවෝ උනස්නෙන් නැගී සිට ''ගෙනෙව ගෙනෙව''යි වහා ගෙන්වා ගන දුටහ. එකල දූතයෝ ''දේවයන් වහන්ස, අපගේ රජ්ජුරුවන් වහන්සේ නුඹ වහන්සේගේ සුවදුක් විචාළ සේක.'' යනාදීන් කථා කොට කරන ලද සම්භාවනා ඇතිව රජ්ජුරුවන් විසින් ''කුමක් පිණිස අවු දැ''යි විචාළ කල්හි ''අපගේ රජ්ජුරුවන් වහන්සේගේ සිංහ ගර්ජනාවට බඳු වූ අභීත නාද ඇති කුස නම් කුමාරයෙක් ඇත. අපගේ රජ්ජුරුවන් වහන්සේ උන් වහන්සේට රාජ්‍යය දෙනු කැමති සේක්, නුඹ වහන්සේ සමීපයට එවූ සේක. නුඹ වහන්සේගේ ප්‍රභාවතී නම් කුමාරිකාවන් වහන්සේ මේ රන්රුව වියදමට ඇර ගෙන දෙවා වදාළ මැනැවැ''යි කිවු ය.

ඒ අසා මද්‍ර රජ්ජුරුවෝ මෙබඳු වූ මහරජ්ජුරු කෙනෙකුන් හා සමග විවාහ සම්බන්ධයෙක් වන්නේ යයි සතුටු ව මැනවැයි ගිවිස්සාහ. එකල දූතයෝ ''අප විසින් කල් යැවිය නො හැකැයි වහා ගොස් රාජකුමාරිකා කෙනෙක් ඇති නියාව අපගේ රජ්ජුරුවන් වහන්සේට කියම්හ. උන් වහන්සේ ම අවුත් කැඳවා ගෙන යන සේකැ''යි කිවු ය, ඒ රජ්ජුරුවෝත් යහපතැයි පිළිගෙන දූතයන්ට ප්‍රසාද දී යවූහ. ඔහු ගොස් එපවත් රජ්ජුරුවන්ට හා බිසවුන්ට කිවු ය. එපවත් අසා ඔක්කාක රජ්ජුරුවෝ මහ පිරිවරින් කුසාවතී නුවරින් නික්ම ක්‍රමයෙන් ගොස් සාගල නුවරට පැමිණියහ. එබව අසා මද්‍ර රජ්ජුරුවෝ සිවුරඟ සෙනඟ පිරිවරා පෙර ගමන් ගොස් නුවරට කැඳවා ගෙන ගොස් මහත් සත්කාර සම්භාවනා කළාහු ය. කීපදවසකින් ඔක්කාක රජ්ජුරුවන්ගේ සීලවතී දේවීතොමෝ නුවණැති බැවින් කවුරු දනිද්දැයි සිතා රජ්ජුරුවන් වහන්සේ යෙහෙළණියන් දක්නා කැමැත්තම්හයි මද්‍ර රජ්ජුරුවන්ට කිවු ය. රජ්ජුරුවෝත් මැනවැයි පිළිගෙන දියණියන් කැඳවා යවු ය. එසඳ ප්‍රභාවතී සර්වාභරණයෙන් සැරසී කිරිමවුන් විසින් පිරිවරන ලදුව අවුත් නැන්දණියන් දැකලා සිටියාහ. සීලවතී දේවි ප්‍රභාවතීන් දැක මේ කුමාරිකා යහපත් රූ ඇත්තී ය. මපුතණුවෝ විරූපයහ. ඉදින් මූ උන් දිටුහු නම් එකදවසකුත් නොරඳා පලා යන්නාහ. ඊට නිසි උපායක් කෙරෙමියි සිතා ඉක්බිති බිසව ''මහරජ, මාගේ යෙහෙළණියෝ මපුතණුවන්ට නිස්සහ. එතකුදු උවත් අපගේ වංශ පරම්පරාවෙන් පැවත එන චාරිත්‍රයෙක් ඇත. ඉදින් මූ ඒ වූ ලෙස පිළිපදිත් නම් කැඳවාගෙන යම්හයි මද්‍ර රජ්ජුරුවන්ට කිවු ය. ඒ අසා මද්‍ර රජ්ජුරුවෝ ''කවර ආචාරයෙක් දැ''යි විචාළහ. අපගේ වංසයෙහි දරු ගර්භයක් පිහිටන තෙක් ස්ත්‍රීහු දාවල් සාමිපුත්‍රයා දකින්ට නො ලබති. ඉදින් මූ එලෙස පවතිත් නම් කැඳවා ගෙන යම්හ''යි කිවු ය. ඒ අසා රජ්ජුරුවෝ ''දියණියෙනි, එලෙස පවතින්ට පිළිවන්දැ''යි විචාළහ. ප්‍රභාවතී 'යහපතැ'යි ගිවිස්සහ. ඉක්බිති ඔක්කාක රජ්ජුරුවෝ මද්‍ර රජ්ජුරුවන්ට බොහෝ සම්පත් දී ප්‍රභාවතීන් කැඳවාගෙන ගියහ. මද්‍ර රජ්ජුරුවෝත් මහපෙරහරින් දියණියන් නික්මවූහ.

ඔක්කාක රජ්ජුරුවෝ ගොස් කුසාවතී නුවර දිව්‍යපුරයක් මෙන් සරසා බන්ධනගත සියලු සත්ත්වයන් මුදා හරවා පුතණුවන්ට ප්‍රභාවතීන් අග මෙහෙසුන් කොට අභිෂේක කරවා කුස රජ්ජුරුවන්ගේ ආඥාව යයි අණබෙර ලවා සේසත් නැංවූහ.

දඹදිව සියලු රජදරුවෝ තමන් තමන්ගේ දරුවන් කුස රජ්ජුරුවන්ට සේවය පිණිස එවූහ. එකල බෝධිසත්වයෝ නළු නාටකාදි මහත් පිරිවරින් යුක්තව අපමණ වූ ඓශ්වර්යයෙන් රාජ්‍ය ශ්‍රී විඳිනාහ.

එසඳ කුස රජ්ජුරුවන් හා ප්‍රභාවතී දේවි හා දෙදෙනා දිවා භාගයෙහි

ඔවුනොවුන් නො දැක රාත්‍රියෙහි ම දක්නාහ. ඒ ප්‍රභාවතීන්ගේ ශරීර ශෝභාව මහාබොධිසත්ත්වයන් තේජසින් සූර්යාලෝකයෙහි කදෝපැණියන් මෙන් ද දිවා චන්ද්‍රයා පරිද්දෙන් ද නිෂ්ප්‍රභා විය. කුස රජ්ජුරුවෝත් ශ්‍රී යහන් ගබින් පහන් වන්නට පළමු ව පිටත් වන්නාහ. මෙලෙසින් කලක් ගිය සඳ ප්‍රභාවතීන් දාවල් දක්නා කැමතිව මෑණියන්ට කිවු ය. මෑණියෝත් ඔහු බස් අසා "පුතණුවෙනි දරු කෙනෙකුන් ලබන කල් ඉවසුව"යි නැවතූහ.

බෝධිසත්ත්වයෝ නැවත නැවතත් ඇවිටිලි කොට කිවු ය. එකල මෑණියෝ "දක්නා කැමත හොත් ඇත්හලට ගොස් ඇත්ගොව්වන් හා එක්ව සිටුව, මම එතනට කැඳවාගන එමි, එකල ඇස් පුරා දැක පියව, තොප වූ නියාව නො හඟව"යි කිවු ය. බෝධිසත්ත්වයෝත් යහපතැයි පිළිගෙන ඇත්හලට ගියාහු ය. එකල්හි සීලවතී දේවි ප්‍රභාවතීන් ඇත්හලට කැඳවා ගෙන ගොස් මේ අසවල් ඇතා ය මේ අසවල් නම් ඇතා යයි නම් කිය කියා දක්ව දක්වා යන සඳ කුස රජ්ජුරුවෝ ප්‍රභාවතීන්ගේ පිට ඇත් ඉලත්තියක් ගැසූහ. එකල ප්‍රභාවතී "රජ්ජුරුවන් වහන්සේට කියා තොපගේ අත කප්පාලමි" යනාදීන් කියා බිසවුන් ලවාත් කෝප කැරවූ ය, එසඳ බිසවු ප්‍රභාවතීන්ගේ පිට අතින් පිරි මැද "මේ ඇත්හල කොල්ලෝ නම් ඉතා චපලයෝ ය. නුඹ වහන්සේට උරණවන්නෝ ය"යි යනාදීන් කියා අස්වසා රජගෙට ගියහු ය.

තව ද කලෙකින් බෝධිසත්ත්වයෝ ප්‍රභාවතීන් දක්නා කැමතිව පෙර පරිද්දෙන් ම මෑණියන්ට කියා අස්සලට ගොස් අස්සලයක්හු පරිද්දෙන් සිට ප්‍රභාවතීන් දැක එතන දීත් අස්බෙට්ටක් ගැසූ ය. එදවස ද කිපියා වූ ප්‍රභාවතීන් බිසවු සන්හිඳුවූ ය. ඉක්බිති කල්යාමෙන් ප්‍රභාවතී බෝධිසත්ත්වයන් දක්නා කැමති වනැයි නැන්දණියන්ට කියා උන් විසින් වළකන ලදුව නැවතත් යාච්ඤා කොට බිසවුන් විසින් "එසේ වී නම් කුස රජ්ජුරුවෝ සෙට නුවර පැදකුණු කෙරෙති. තෙපි ඒවෙලාවට සීමැදුරු කවුළුවෙන් දකුව"යි කියා දෙවන දවස් නුවර සරහවා රජ්ජුරුවන්ගේ මලණුවන් ජයම්පති කුමාරයන් රාජාභරණයෙන් සරහා මඟුලැතුපිට හිඳුවා බෝධිසත්ත්වයන් ඇත්ගොවු වේශයෙන් පශ්චිමාසනයෙහි ඉඳුවා නුවර පැදකුණු කරවා ප්‍රභාවතීන් කැඳවාගන සීමැදුරු කවුළුවෙන් බලමින් "තොපගේ ස්වාමිපුත්‍රයාණන්ගේ ශ්‍රී විභූතිය බලව"යි කිවු ය. එකල ප්‍රභාවතී ජයම්පති කුමාරයන් දැක "මට සුදුසු වල්ලභයාණ කෙනෙකුන් ලදිමි" සතුටු වූ ය. එදවස් ඇත්ගොව් වෙසින් පිටිපස උන් බෝධිසත්ත්වයෝ සිත් වූ පරිද්දෙන් ප්‍රභාවතීන් දකිමින් හස්ත විකාර මුඛවිකාරයෙන් උසුළු විසුළු පෑ කෙළියහ.

එලෙස ඇත් ගිය පසු "තොපගේ ස්වාමිපුත්‍රයාණන් දුටුදැ"යි ප්‍රභාවතීන් විචාරා උන් විසින් "ස්වාමීනි, දිටිමි පිටිපස්සේ උන් ඇත්ගොවු ඉතා ම චපලය, මට උසුළු විසුළු පෑයේ ය, එබඳු වූ නො හික්මුණු පින්මඳ තැනැත්තවු කුමක් පිණිස රජ්ජුරුවන්ට පිටිපස්සේ ඉඳුවු දැ"යි කිවු ය. එබස් අසා බිසවු "දියණියෙනි, රජ්ජුරුවන්ට ආරක්ෂා පිණිස සැලසූ ඇත්ගොව්වාය"යි වළහා කිවු ය. ඒ අසා ප්‍රභාවතී "මේ ඇත්ගොව්වා ඉතා නිර්භීත ය, රජ්ජුරුවන්ට රජ්ජුරු කෙනෙකැයි නො සිතයි. මේ කිමෙක් ද කුස රජ්ජුරුවෝ නම් මූ ම වනැයි ඒකාන්තයෙන් උන් රූ නැති කෙනෙකුන් විය යුතු ය. ඒ කාරණයෙන් මා නො දක්වති" සිතා කුද කැඳවා "යව මෑණියනි, කුස රජ්ජුරුවෝ ඇතුපිට ඉදිරියෙ උන් තැනැත්තෝ ද නොහොත් පිටිපස්සේ උන් තෙනැත්තෝ දැයි නියම

දැනගෙන එව''යි කිවු ය. එවිගස ''මම කෙසේ දැන ගනිම්දැ''යි විචාළහ. කුදට ''පළමුයෙන් ඇතුපිට බට තෙනැත්තෝ රජ්ජුරුවෝ ය. මෙලෙස සලකුණෙන් නියම දැන ගෙන එව''යි කිවු ය. ඒ නියෝග ලද කුද ගොස් එක් තෙනක සිට පළමු කොට බෝධිසත්ත්වයන් හා දෙවෙනිව ජයම්පති කුමාරයන් බට නියාව දුට. එකල බෝධිසත්ත්වයෝ ඈත මෑත බලා දුර සිට කුද දැක මෑ ආයේ මේ පරීක්ෂා කරන්නට යයි දැන ළඟට කැඳවා ''මේ තොරතුරු නො කියව''යි කියා නික්මවූහ. ඕ ගොසින් ''පෙර ආසනයේ උන් තෙනැත්තෝ ම පළමු කොට ම බටුය''යි කියා ගිවිස්වා ලූහ. නැවත කල් යාමකින් බෝධිසත්ත්වයෝ ප්‍රභාවතීන් දක්නා කැමතිව මෑණියන්ට කිවු ය. බිසෝ නවතා ගත නොහී ''එසේ වී නම් අප්‍රසිද්ධ වේශයෙන් උයනේ ගොස් සිටුව''යි කිවු ය.

එබස් අසා කුස රජ්ජුරුවෝ උයනට ගොසින් මඟුල් පොකුණේ කරවටක් දියට බැස නෙලුම් පතකින් ඉස වසා ගෙන නෙලුම් මලකින් මූණ වසා ගෙන සිටියාහු ය. බිසවුන් ප්‍රභාවතීන් උයනට කැඳවා ගෙන ගොස් සවස් වේලෙහි පුෂ්පඵලපල්ලවයෙන් සඤ්ඡන්න වූ සපු දුනුකේ නා පනා සීනිද්ද බෝලිද්ද දෑසමන් ආදි ගස් ලිය ද ගිරා බොකල් ඈ පක්ෂීන් ද දක්වමින් මඟුල් උයන් ඇවිද ගෙන ඇගේ සිත් පොලඹමින් පොකුණු තෙරට ගියෝ ය. එකෙණෙහි ප්‍රභාවතී තොමෝ පස්පියුමෙන් ගැවසී ගත් පොකුණ දැක නහනු කැමතිව පිරිවර හා සමග පොකුණට බැස කෙළිමින් මහබෝධිසත්ත්වයන් මූණ වසා ගෙන සිටි පියුමට අත දික් කළා ය. එකල්හි රජ්ජුරුවෝ නෙලුම්පත ඉවත් කොට ''මම කුස රජය''යි ප්‍රභාවතීන් අත ඇල්ලූ ය. ඔහුගේ මුඛය දැක ''යක්ෂයෙක් මා අත අල්වා ගතැ''යි මුරගාමින් හයින් මූර්ඡාව ගියා ය. එසඳ රජ්ජුරුවෝ අත ඇරපීහ. ඉක්බිති බිසෝ සිහි ලදින් සිතන්නාහු ''මා අත ඇල්ලුවෝ ඉදින් කුස රජ්ජුරුවෝ වී නම් ඇත්තල දී ඉලත්තියෙනුත් අස්සල දී අස්බෙටියෙනුත් මුන් විසින් ම ගසන ලදිමි. ඇතුගේ පශ්චිමාසනයෙහි ද මා වෙහෙසවූවෝත් මූ ම ය. මෙසේ විරූප වූ දුර්මුඛ වූ වල්ලභයාගෙන් මට ප්‍රයෝජන කිම් ද, ජීවත්ව උනිමි නම් මට වල්ලභයන් අරුම නො වන්නේ ය''යි සිතා තමන් හා එක්ව ආ අමාත්‍යයන් යවා ''යාන වාහන සරහව, අද දවසේ ම නික්මෙමි''යි කීහ.

ඔහු එපවත් රජ්ජුරුවන්ට කීවාහු ය. ඒ අසා රජ්ජුරුවෝ ''මූ යන්ට අවසර නො ලද්දූ නම් ළය පැළී මිය යන්නාහ. වන්නාට දැනට යෙත්ව''යි නැවත මාගේ බලයෙන් ගෙන්වා ගනිමි සිතා ගමන් අනුදත්හ. එකල්හි ප්‍රභාවතී පිරිවර හා සමග පිය රජ්ජුරුවන්ගේ සාගල නුවරට ම ගියෝ ය. ප්‍රභාවතී තොම කුස රජ්ජුරුවන්ට ජාතියෙහි කළ ප්‍රාර්ථනාවෙන් නො කැමති වුව බෝධිසත්ත්වයෝ ද පූර්වයෙහි කරන ලද අකුසල බලයෙන් විරූපව ගියහ.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවරට නුදුරු ගමෙක්හි වීථි දෙකක කෙළෙඹි කුල දෙකෙක් ඇත්තේ ය. ඉන් ගෙයක පුත්තු දෙන්නෙක් වූහ. ඉක්බිති බෝධිසත්ත්වයෝ බාල මලණුවෝහ.

අනික් කෙළෙඹි කුලයෙහි දියණි කෙනෙක් වූහ. ඒ කුමාරිකාව බෝධිසත්ත්වයන්ගේ බෑණන්ට සරණ ගෙන්වූ ය. බෝධිසත්වයෝ වෙන ගෙයක් දොරක් නැතිව බෑණන්ගේ ගෙයි වාසය කෙරෙති. ඉක්බිති එක් දවසෙක අතිරස කැවුම් පිස කිසි කටයුත්තක් නිසා වල ගිය බෝධිසත්ත්වයන්ට තිබා තුමූ දෙ දෙන අනුභව කළහ.

එවේලෙහි සිඟා වැඩි පසේ බුදු කෙනෙකුන් වහන්සේ දැක බෝධිසත්ත්වයන්ගේ බැදෑණියෝ උන්ට කැවුම් පසුව පිස දිය හැක්කැයි සිතා බෝධිසත්ත්වයන්ට තිබූ කොටස පිළිගැන්වූහ. බෝධිසත්ත්වයෝ "තොප සන්තක කොටස කා පියා මගේ කොටස දන් දෙන්ට කාරණා කිම් දැ"යි කිපී ලුහුබඳවා ගොසින් පසේ බුදුන්වහන්සේගේ පාත්‍රයේ තුබූ කැවුම් අරගත්තු ය. එකල ස්ත්‍රී මෑණියන්ගේ ගෙට ගොස් සපුමල් පෙත්තක් සේ සනරන්වන් වූ අලුත් දැවූ ගිතෙල් ගෙන පාත්‍රයෙහි පුරා සතුටුව "ස්වාමීනි, මා උපනුපන් ජාතියෙහි මාගේ ශරීරයෙන් ආලෝක පැතිරේවයි උතුම් වූ රූ ඇතිවෙම්වයි අසත්පුරුෂයා හා එකතැන වාසය නො කෙරෙම්ව"යි කියා කළ ප්‍රාර්ථනා වශයෙන් ප්‍රභාවතී බෝධිසත්ත්වයන් නො කැමති වූ ය.

බෝධිසත්ත්වයෝ ද පසේ බුදුන්වහන්සේගේ පාත්‍රයට කැවුම් කොටස පිළිගන්වා "ස්වාමීනි, ඉදින් යොදුන් සියයක උන්නත් මුන් මාගේ බලයෙන් ගෙන්වා ගෙන මට පාදපරිචාරිකා කරන්ට සමර්ථ වෙම්ව"යි ප්‍රාර්ථනා කළෝ ය.

කිපී ගොස් පසේ බුදුන්ගේ පාත්‍රයේ තුබූ කැවුම් හැර ගත් හෙයින් මුඛය විසූළු ව ගියේ ය. මේ තෙම මොවුන්ගේ පූර්වක්‍රියා වන්නේ ය. බෝධිසත්වයෝ ප්‍රභාවතීන් ගිය නියාව අසා ශෝකයට පැමිණියහ. අවශේෂ නාටක ස්ත්‍රීහු නොයෙක් ප්‍රකාරයෙන් සිත් නළවන්නාහු පොලඹා ගත නුහුණුවහ.

ප්‍රභාවතීන් නැති රජගෙය කුස රජ්ජුරුවන්ට හිස්වූවාක් මෙන් වැටහෙන්නේ ය. මෙලෙසින් රාත්‍රියෙහි බොහෝ දුක් විඳ අලුයම නැඟී සිට සාගල නුවරට ගොස් ප්‍රභාවතී දේවී කැඳවා ගෙන එම් කියා මා එන තෙක් රාජ්‍යය පියාණන්වහන්සේට වේවායි මලණුවන්ට වේවයි පාවා දී ලීම් නම් නැවත ඇරගැන්ම ආයාස වේ දැයි සිතා මෑණියන් සීලවතී දේවීන් සමීපයට ගොස් "මෑණියන් වහන්ස ධන ධාන්‍යාදීන් භරිත වූ ඇත්ඇණි අස්ඇණි රියබලයයි සිව්රඟ සෙනගින් යුක්ත වූ පංචකකුධභාණ්ඩයන් ඇති සියලු උපභෝග පරිභෝග වස්තුවෙන් සමෘද්ධ වූ මේ රාජ්‍යය ප්‍රභාවතී කැඳවා ගෙන එන තෙක් පාවා ගත මැනවැ"යි මෑණියන්ට කියා අවසර ඉල්වූහ.

එබස් අසා බිසෝ බියපත්ව "පුත, ස්ත්‍රීහු නම් නොයෙක් වංචා දනිති" යනාදීන් අවවාද කියා මග දී අනුභව කරන පිණිස අනගි රසයෙන් යුක්ත වූ රාජභෝජනය රන්මුඩමක පුරා දුන්හ. එසඳ මහාබෝධිසත්ත්වයෝ මෑණියන් තුන්යලක් පැදකුණු කොට පසඟ පිහිටුවා වැඳ "ජීවත්ව උනිම් නම් සැපසේ අවුත් දකිනෙම් වේදැ"යි කියා අවසර ඉල්වා ගෙන ශ්‍රීයහන් ගබඩාවට වැද දුනුමුගුරු කඩු කොන්ත සොටි යන පඤ්චායුධ සන්නද්ධව ගෙන බත් මුඩම හා සමග කහවනු දහසකුත් පයියෙහි ලා ගෙන කොකනද නම් වීණාව අතින් ගෙන නුවරින් පිටත්ව මගට පිළිපන්ව මහත් වූ බලවීර්ය ඇති මහාබෝධිසත්ත්වයෝ එදවස් දාවල් බතට පනස් යොදුන් මග ගෙවා ගෙන ගොස් බත අනුභව කොට පස්වරු භාගයෙහි තුබූ පනස් යොත්න ගෙවා ගොස් සවස් වේලෙහි පැන් සනහා සාගල නුවරට වන්හ. බෝධිසත්ත්වයන් එනුවරට වන් කෙණෙහි ම ප්‍රභාවතී උනස්නෙහි ඉඳ නො හී යහනෙන් බිමට බැස පුව. එකල නුවරට වැද විඩාපත් ව යන්නා වූ බෝධිසත්ත්වයන් දැක එක්තරා ස්ත්‍රියක් තමාගේ ගෙට කැඳවා ගෙන ගොස් ඉඳිනා අසුන් දී පය සෝධවා සැතපී හුන් කල්හි බත්මාළු සපයා අනුභව කරවූ ය. එසඳ සතුටු වූ මහාබෝධිසත්ත්වයෝ රන්මුඩම හා සමග මසුදාස ඒ ස්ත්‍රියට දී ගෙන ගිය පඤ්චායුධය එම ගෙයි තබා "මා ගොස් ආ යුතු තැනෙක් ඇතෙ"යි කියා

නොම්ලේ බෙදා හැරීම සඳහා ය.

වීණාව අතට ඇර ගෙන ඇත්හළට ගොස් "මේ රාත්‍රියෙහි සැතපෙන තෙනක් දෙවු නම් තොපට වීණා ගායනා කෙරෙමි" කියා ඇත්ගොව්වන් විසින් අනුදන්නා ලදුව එක් තෙනක වැද හෙව මඳක් නිදා පිබිද ගමන් විඩා සන්හිඳුවා ගෙන වීණාව තත් සරහා සියලු නුවරවාසී සත්වයෝ මේ අසත්වයි සිතා ගී කියමින් වීණා ගායනා කරන්නාහ.

එකල්හි බිම වැද හොත් ප්‍රභාවතී ද ඒ ශබ්දය අසා මේ අනික් කෙනෙකුන්ගේ වීණා ශබ්දයෙක් නො වෙයි ඒකාන්තයෙන් කුස රජ්ජුරුවන් වහන්සේ මා නිසා මේ නුවරට ආ සේක් ම යයි දත්තාහු ය.

මදු රජ්ජුරුවෝ ද වීණා ශබ්දය අසා "ඉතා මිහිරි කොට ගායනා කරන්නේ ය. සෙට ඔහු කැඳවා ගායනා කරන්ට උවමැනවැ"යි සිතූහ. බෝධිසත්ත්වයෝ මෙතන විසීමෙන් ප්‍රභාවතීන් දැක්ක නො හැක්ක, එහෙයින් අස්ථානයයි උදාසනක් සේ ම ඇත්හලින් නික්ම සවස බත් අනුභව කළ ගෙන් ම පෙර බත් අනුභව කොට වීණාව ගෙයි තබා මදු රජ්ජුරුවන්ගේ මගුල් කුඹලාගේ ගෙට ගොස් ඕහට අතවැසිව එක දවසින් ම මැටි ගෙන හැර "ආචාරීනි වළන් කෙරෙම් දැ"යි විචාරා, "එසේය, කළ මැනවැ"යි කී සඳ මැටිපිඩක් ඇරගෙන සකෙහි තබා සක කරකැවූහ. එකෙණෙහි එක විට කරකවන ලද ඒ සක ඉර මුදුනට එන තෙක් ම කරකැවිණ. මහාබෝධිසත්ත්වයෝ නොයෙක් ප්‍රකාර ඇති කුඩා මහත් බොහෝ වළන් රූ නගා කොට මේ රූ ප්‍රභාවතීන් විනා අනික් කවුරුත් නො දකිත්වයි අධිෂ්ඨාන කළාහු ය.

මෙලෙසින් වළන් උකා වියළා පලහා කුඹල්හල පිරූහ. එසඳ කුඹල්දෙටුවා නොයෙක් විසිතුරු අත්කම් දක්වා කරන ලද වළන් ගෙන්වා ගෙන ගොස් රජ්ජුරුවන් දැක්වී ය. එකල මදු රජ්ජුරුවෝ නුදුටු විරූ ම වළන් දැක සතුටු ව මේ කළෝ කවුරු දැයි විචාරා කුඹලා විසින් "මම ය, ස්වාමීනි" කීකල්හි "තොපගේ කර්මාන්තය මම නො දනිමි ද නො වළහා කියව"යි තරව විචාළ සඳ "දේවයන් වහන්ස මාගේ අතවැස්සා විසින් කරන ලදැ"යි කී ය. "එඹල ඒ තට අතවැසි කමට නිසි එකෙක් නො වෙයි ඇදුරුකමට නිස්සෝ ය. තෝ මෙතැන් පටන් උන්ගෙන් සිල්ප උගනුව. තව ද එතෙම මෙතැන් පටන් මාගේ දරුවන්ට කෙළිවළන් කෙරේව"යි නියෝග කොට "මේ ඕහට දෙවාල"යි බෝධිසත්වයන්ට රන් මසුදහසක් යවා මේ කුඩා වළන් දරුවන්ට දෙව"යි යවූහ.

කුඹලා ද ඒ වළන් ඇරගෙන අන්තඃපුරගෙට ගොස් කෙළිවළන් ගෙනාමි කියා යවුයේ ය. එබස් අසා රාජකුමාරිකාවරු එතනට රැස්වූ ය. ඒ කුඹලා විසින් වළන් බෙදන සඳ බෝධිසත්ත්වයන්ගේ ආනුභාවයෙන් ප්‍රභාවතීන් උදෙසා රූ නගා කරන ලද වළන් ම උන්ට දින. එසඳ ප්‍රභාවතී ඒ වළන්වල මහාබෝධිසත්ත්වයන්ගේ හා තමන්ගේ හා කුදගේ රූ දැක "මේ අනික් කෙනෙකුන් විසින් කළ දෙයක් නො වෙයි කුස රජ්ජුරුවන් විසින් ම කරනලදැ"යි කිපී "මෙයින් මට ප්‍රයෝජන නැත කැමති කෙනෙකුන්ට දී පියව"යි කිවු ය. එසඳ උන්ගේ නගු කිපි බව දැන මේ කුස රජුජුරුවන් වහන්සේ විසින් කළ දෙයකැයි සිතවු ද, කුඹලා විසින් කළා ය, ඇරගනුව"යි යනාදීන් කිවු ය. ඒ ප්‍රභාවතී තොම කුස රජ්ජුරුවන් එ නුවර ගිය බව ද ඒ වළන් උන් විසින් කළ බව ද ඔවුන්ට නොකීව. ඉක්බිති කුඹලා රජ්ජුරුවන්ගෙන් යවන ලද මසුදහස ගෙන ගොස් බෝධිසත්ත්වයන්ට දී "සබඳ, රජ්ජුරුවන් වහන්සේ තොපට සමාධි වූ සේක. මෙතැන් පටන් රාජකුමාරිකාවරුන්ට ම තෙපි වළන් කරව, මම ඒ ගෙනගොස් දෙමි" කීයේය. ඒ අසා බෝධිසත්ත්වයෝ "ප්‍රභාවතීන් මෙතන වසාත් දැක්ක නො

හැක්කැ''යි සිතා ඒ කහවනුදහස ඕහට ම දී එතනින් ගොස් රජ්ජුරුවන්ට මඟුල් මෙහෙ කරන නළකරුවා ළඟට ගොස් ඕහට අතවැසිව තල් වැටක් කොට එහි ම සේසතය, රාහලය, රා ඔඩම ගෙන සිටි ප්‍රභාවතීන්ගේ රූපය යනාදී විසිතුරු වූ අත්කම් දැක්වූ ය. නළකරුවා ඒ තල්වැට ආදී බෝධිසත්ත්වයන් විසින් කරන ලද කර්මාන්ත විශේෂය ගොස් දැක්වී ය.

රජ්ජුරුවෝ ඒ කර්මාන්ත විශේෂය දැක ''මෙතල්වැට ආදිය කවුරුන් විසින් කරන ලද්දේ දැ''යි යනාදීන් පෙර පරිද්දෙන් විචාරා මසුදහසක් දී මෙතල්වැට ආදිය ''මාගේ කුමාරිකාවරුන්ට දෙව''යි නියෝග කළහ. ඒ කර්මාන්තයන් බෙදා දෙන නළකරුවා ද බෝධිසත්ත්වයන් විසින් ප්‍රභාවතීන් උදෙසා කරන ලද තල්වැට උන්ට ම දුන්නේ ය. එසඳ ප්‍රභාවතී ඒ විසිතුරු රූපයන් දැක කුස රජ්ජුරුවන් විසින් කරන ලද බව දැන කැමති කෙනෙක් ඇරගනුවයි බිමට දැමූව, ඒ දැක ඉතිරි කුමාරිකාවරුන් වෙහෙසන ලද. නළකරුවා රජ්ජුරුවන් විසින් දෙන ලද මසුදහස ගෙන ගොස් බෝධිසත්ත්වයන්ට දුන්නේ ය.

ඉක්බිති බෝධිසත්ත්වයෝ ''මෙයිත් මට අස්ථානය''යි සිතා ඒ රන් ඕහට දී එතනින් ගොස් රජ්ජුරුවන්ගේ මාලාකාරයාට අතවැසිව නොයෙක් ප්‍රකාර ඇති මල්පටි ගොතා ප්‍රභාවතීන් පිණිස නොයෙක් රුවින් විසිතුරු කොට මල්සුඹුලක් ද කළාහු ය. මල්කරුවාත් ඒ සියල්ල හැර ගෙන ගොස් රජ්ජුරුවන්ට දුන්නේ ය.

රජ්ජුරුවෝත් විශේෂ කර්මාන්තය දැක ''මේ ගෙතුවෝ කවුරු දැ''යි විචාරා ''දේවයන් වහන්ස, මා විසිනැ''යි කීකල්හි ''තොපගේ මල් ගෙතීම අපි නො දනුමෝ ද මේ ගෙතුවන් කියව''යි තරයේ විචාරන ලද්දේ ''අතවැස්සා විසින් ගොතන ලදැ''යි කීයේ ය. එබස් අසා රජ්ජුරුවෝ ''එතෙම අතවැස්සෙක් නො වෙයි, තොපට ඇදුරුකමට නිසි ය. ඔහු කෙරෙන් මල් ගෙතීම් ඉගෙන ගනුව, ඔහු ලවා ම මෙතැන් සිට මාගේ දරුවන්ට මල් ගොතාලව''යි සතුටුව මසුදහසක් දී '' මේ මල්කම් දරුවන්ට දෙව''යි යවූහ.

ඒ මල්කරුවා ද බෝධිසත්ත්වයන් විසින් ප්‍රභාවතීන් උදෙසා රූ නගා කරන ලද මල්සුඹුල උන්ට ම දුන්නේ ය. ප්‍රභාවතී ද ඒ මල් සුඹුලෙහි කුස රජ්ජුරුවන්ගේ හා තමන්ගේ හා නොයෙක් රූ දැක කුස රජ්ජුරුවන් කළ බව දැන කිපී බිමට දැමූව. නෙසු නගු පෙර පරිද්දෙන් ම වෙහෙසූ ය. මල්කරුවා ද මසුදහස ගෙන ගොස් බෝධිසත්ත්වයන්ට දී එපවත් කීයේ ය. බෝධිසත්ත්වයෝ ''මෙයිත් මට අස්ථානය''යි එ රන් ඕහට දී එතනින් රජ්ජුරුවන්ගේ අරක්කැමියා කරා ගොස් ඕහට අතවැසිව දවසක් අරක්කැමියා රජ්ජුරුවන්ට මේ වඩා ගෙන යමින් තමහට පිසන පිණිස බෝධිසත්ත්වයන්ට ඇටමුසු දඩමසක් දීලා ගියේ ය. බෝධිසත්ත්වයෝ ද ඒ ඇටය පිස මුළු නුවර සුවඳ පැතිරෙන සේ දුම් කරවූ හ. එසඳ රජ්ජුරුවෝ සුවඳ අසා ''කිමෙක් ද, මුළුතැන්ගෙයි අනික් මාළුවකුත් පිසත්දැ''යි විචාරා අරක්කැමියා විසින් ''දේවයන් වහන්ස, අනික් පිසන මාළුවක් නැත්තේ ය. එතකුදු වත් ඇටමුසු මසක් අප ඇමට පිසන ලෙස අතවැස්සාට දීලා ආමියි, එහි සුවඳ විය යුතු ය''යි කී සඳ රජ්ජුරුවෝ ඒ ගෙන්වා ගෙන ඉන් සුඟක් අනුභව කොට බැලූ ය. එකෙණෙහි එහි රස සත්සියයක් පමණ රස නහරවල පැතිර සිටියේ ය. රජ්ජුරුවෝ ඒ රස තෘෂ්ණාවෙහි බැඳී ඕහට මස්සෙන් දහසක් දී ''මෙතැන් පටන් තොපගේ අතවැස්සා ලවා මටත් මාගේ දරුවන්ටත් බත් මාළු පිස මා දරුවන්ට ඔහු විසින් ගෙන දෙන්ට කියව, තෝ අපට ගෙනෙව''යි නියෝග කළේ ය. අරක්කැමි ගොස්



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

බෝධිසත්ත්වයන්ට කීයේ ය. එබස් අසා බෝධිසත්ත්වයෝ "දැන් මාගේ මනෝරථය මස්තකප්‍රාප්ත ව ගියේය"යි සතුටුව "මෙතැන් පටන් ප්‍රභාවතීන් දකිමි" සිතා ඕහට රන්දහස දී දෙවන දවස් බත්මාළු පිස රජ්ජුරුවන්ට දී අරක්කැමියා අත යවා රාජ කුමාරිකාවරුන්ට ගෙන යන වසුන් කඳ තුමූ හැර ගෙන ගොස් ප්‍රභාවතීන්ගේ මාළිගාවට නැංගහු ය. එසඳ ප්‍රභාවතීන් වසුන් කද ගෙනෙන බෝධිසත්ත්වයන් දැක මුන් වහන්සේ තමන් වහන්සේට නුසුදුසු වූ වහල් කළමනා දෙය කරන සේක. ඉදින් මම දවස් ගණනක් බැණ නො නැගී උනිම් නම් මූ මා කැමැත්තෝ වනැයි සිතා අන් තෙනකට ගොස් මා දැක දැක මෙහි වාසය කරන සේක. එසේ නො කොට මෙහි ඇසිල්ලකුත් නො රඳා යන සැටියේ බැණ දොඩා නික්මවමි සිතා දොර අඩවල කොට ගෙනගොස් එක් අතකින් දොර අල්වා ගෙන අඟුළු කනුවේ වැතිර සිට "කුස රජ්ජුරුවන් වහන්ස, මෙබඳු වූ කාරියක් ඉදින් ජීවිතය සේ නමුත් නො කරන සේක. එතකුදු වුවත් මා නිසා උදාසනය සවසය මධ්‍යම රාත්‍රි ය මධ්‍යාහ්නය යන විභාගයක් නැතිව දිය දර සැපයීම් පිසීම් කැවීම් පෙවීම් ආදි හීනක්‍රියාවෙන් හා දුර්භෝජන දුක්ඛසෙය්‍යාවෙන් දවස් යවමින් මෙහි සිට දුක් නො විඳ නුඹ වහන්සේගේ කුසාවතී නුවරට නැගී ගොස් මා කෙරෙහි සිතිවිල්ලක් නො සිතා නුඹ වහන්සේ වැනි සකුරු පූවක් සේ දාහැලී ගිය මුහුණු ඇති යකින්නක අගමෙහෙසුන් කොට ගෙන රාජ්‍යය කළ මැනව. ඉදින් විරූප වූ නුඹ වහන්සේ කෙතෙක් කල් මී ඉඳ දුක් උණත් මම නො කැමැත්තෙමි, නො රඳා වහා නික්මුණු මැනව"යි කිවු ය. එකල්හි මහාබෝධිසත්ත්වයෝ ප්‍රභාවතීන්ගෙන් මෙව්චර කථා සම්භාෂණයක් ලදිමියි සතුටුව "මුවපොල්ලන්ට බඳු වූ ඇස් ඇති හේමාභරණ විභූෂිත ගාත්‍රා ඇති මනා වූ කටී ප්‍රදේශ ඇති රන්කමින් විසිතුරු වූ වස්ත්‍රයෙන් ශෝභමානවූ දේහ ඇති ප්‍රභාවතීනි, තොපගේ රූප සෞන්දර්යයෙන් පැහැර ගන්නා ලද සිත් ඇති ක්ලේශාන්ධකාරයෙන් වසන ලදුව දික්විභාගයෙහි අසමර්ථ හෙයින් කුසාවතී නම් රාජධානියට යා නොඑමි. ඒ රාජ්‍යශ්‍රීයෙන් මට ප්‍රයෝජන නැත්තේ ය, මෙරට ම වාසය කරමි" කීහ.

බෝධිසත්ත්වයන් විසින් මෙලෙස කී කල්හි මූ විපිලිසරව නැගී යෙති, පරිභව කොට කියමින් සිටිය දී ම මා කෙරෙහි ඇලී ම කථා කෙරෙති, ඉදින් මූ මම කුසරජ යයි අවුත් මා අත අල්වා ගත්තු නම් කවුරු වළකත් දැයි ගෙට වැද දොර අගුළු ලා ගත්තු ය.

බෝධිසත්ත්වයෝ ද වස්න හැර ගෙන ගොස් තෙසු රාජකුමාරිකාවරුන් බත් කැවූහ. ඉක්බිති ප්‍රභාවතී "කුස රජ්ජුරුවන් විසින් සපයන ලද ආහාරය ගෙනෙව"යි කුදට විධාන කොට ගෙන්වා ගෙන "මේ බත් අනුභව නො කෙරෙමි, තොපි ලත් බත් පියා මේ බත් තොපි කා පියව, කුස රජ්ජුරුවන්වහන්සේ මෙනුවරට ආ බව කාටත් නො හඟවව"යි කිවු ය. එතැන් පටන් කුදත් ප්‍රභාවතීන්ගේ බත් කොටස තුමූ අනුභව කොට තමන්ගේ බත් ප්‍රභාවතීන්ට දෙන්නී ය.

කුස රජ්ජුරුවෝ එතැන් පටන් ප්‍රභාවතීන් නො දක්නාහු ය. මා කෙරෙහි ප්‍රභාවතීන් ස්නේහ ඇති නැති බව පරීක්ෂා කෙරෙමි සිතා එක් දවසක් රාජකුමාරිකාවරුන් බත් කවා වළන් කද ගෙන යමින් ප්‍රභාවතීන්ගේ දොර සමීපයෙහි අඩි ඇන වළන් අඬවා පැකිල වැටී හී කෙඳිරි ගාමින් ඔත්තාහු ය. එකල ප්‍රභාවතී බෝධිසත්ත්වයන්ගේ කෙඳිරි ගැවිලි අසා ගෙයි දොර ඇර බලා කද කර තබා ගෙන වැද හොත්තවුන් දැක "මුන්වහන්සේ මුළු දඹදිවට අග්‍රරාජයන් සේක. මා නිසා

රෑ දාවල් දුක් විඳිමින් සිව්මැලි බැවින් වසුන් කද බරින් මැඩී වැටී ගිය සේක. ඉදින් අමුත්තෙක් වී නම් මට මීට වඩා වැරැද්දෙක් නැත. ප්‍රාණය ඇද්ද නැද්දැයි පරීක්ෂා කෙරෙමි"යි සිතා භය ගෙන ගෙන් පිටත්ව බෝධිසත්ත්වයන්ගේ ශ්වාසය පරීක්ෂා කරනු පිණිස නැඹුරුව මුහුණ බැලුව. එසඳ කුස රජ්ජුරුවෝ කෙළ කටක් පුරා ගෙන ප්‍රභාවතීන් මුහුණට දැමූහ. එකල ප්‍රභාවතී බැණ දොඩා ගොස් ගෙට වැද දොර අඩවලු කොට "රජ්ජුරුවන් වහන්ස, යමෙක් විරූපීව රූ ඇත්තන් ප්‍රාර්ථනා කෙරේ ද නො කැමතියන් කැමති වේ ද ඕහට අවැඩ වන්නේ ය" යනාදීන් ප්‍රභාවතීන් විසින් නො යෙක් ලෙස බැණ දොඩා පරිභව කළත් බෝධිසත්ත්වයෝ උන් කෙරේ නො කලකිරී "එම්බා ප්‍රභාවතීනි, මේ ලෝකයෙහි යම් පුරුෂයෙක් ලෝකාස්වාදරති වශයෙන් තමා නො කැමති වූ ද ස්ත්‍රියගෙන් දර්ශනය ස්පර්ශය සම්භාෂණය සම්භෝගයයි යන මෙයින් එක්තරා සන්තෝෂ කාරණයක් ලැබේ ද එසේ ලබන ලද ලාභය මනා වූ ලාභයකැයි ප්‍රශංසා කරම්හ. තමා නො කැමතිවත් ස්ත්‍රිය කෙරෙන් ප්‍රීතියක් නො ලැබීම නපුරු වන්නේ ය. එහෙයින් තොපගේ දර්ශන ලාභාදී ඓශ්වර්ය විඳිමින් මෙහි ම වාසය කෙරෙමී" කීහ.

බෝධිසත්ත්වයන් මෙලෙස කී කල්හිත් ප්‍රභාවතී මඳකුත් පසු නො බැස තද කොට ම කියා මොහු පලවමි සිතා "මඳකුත් ස්නෙහරති වශයෙන් නො කැමැත්තාවූත් මා කෙරෙහි පිළිබඳ සිතින් කැමතිව වසන්නා වූ තෙපි පිපාසාවෙන් පීඩිතව බොළඳකමින් කිහිරි උලක් ඇරගෙන ගල්පොත්තක් කැණ පැන් හැර ගන්නා කැමතියක්හු ද සර්මයෙන් පීඩිතව දැලක් බැඳ සුළන් රඳවන්නක්හු හා ද සමාන ය" යනාදීන් තදපරුෂ බස් කියා දෙඩුව.

එබස් අසා කුසරජ්ජුරුවෝ "චාටු මනෝඥ වූ අංගප්‍රත්‍යංගාදී ස්ත්‍රීසෞභාග්‍යයෙන් යුක්ත වූ ප්‍රභාවතීනි, අනේකකෝටි හා නාටක ස්ත්‍රීන් හා අනන්තසාමන්තචක්‍ර මෞලිමාලලාලිත පාද පීඨ ඇති රාජ්‍යශ්‍රී ද හැර පෙර තොප කෙරෙහි බැඳුණු සිතින් නො රටට පැමිණ දුක් විඳිමින් තොප හා සමග ප්‍රේමාන්විත වූ කථා සම්භාෂණ මාත්‍රයකුත් නො ලද්දා වූ මම භාවභාවලීලාකටාක්ෂ නිරීක්ෂණමන්දස්මිතමධුමධුරභාෂිතාදී සෞභාග්‍යයෙන් යුක්ත කෝමලාංග ඇති තොපගේ ළය ගලකින් කරන ලදැයි සිතමි. තව ද ප්‍රභාවතීනි, තෙපි යම් පමණ කලක් කෝපයෙන් බැම බිඳ රූෂ්ටව බලන්නී ද ඒ තාක් මදු රජ්ජුරුවන්ගේ මේ භවනයෙහි දුක් විඳිමින් අරක්කැමිව වාසය කෙරෙමි. යම් කලෙක්හි සිනා පහළ කර ස්නිග්ධ වූ නිරීක්ෂණයෙන් සතුටුව බලන්නෙහි ද එකල චිත්ත සන්තාපයන් දුරු කොට රාජ්‍යශ්‍රීයට පැමිණියාක් මෙන් වෙමි. එහෙයින් සොඳුර මෙතැන් පටන් මෙබඳු වූ තදමන් නො කරව" යනාදීන් යාඥා කීවාහු ය. එබස් අසා ප්‍රභාවතී තොම මෙතෙම වඳුරු ලාවෙහි බැඳුණු වානරයක්හු පරිද්දෙන් මා කෙරේ ඉතා ශක්තව කියන්නේ ය. උපදෙසකින් බොරුවක් කියා මෙයින් නික්මවමී සිතා "මහරජ, කුස රජ්ජුරුවන් වහන්සේ මට ස්වාමි වන සේක් ද නො වන සේක්දැයි නිමිත්ත විචාළ තෙන ඒ නිමිත්ත පාඨකයෝ නුඹ වහන්සේ සත්කඩක් කොට කැපුවත් උන් වහන්සේට අග මෙහෙසුන් වන්නේ නැතැයි තරයේ ම කිවු ය. එහෙයින් නොයෙක් කාරණයෙන් නො කැමති වූ මා නිසා දුක් නො විඳ නුඹ වහන්සේගේ රටට ම පලා ගිය මැනවැ"යි කිවු ය. ඒ අසා කුස රජ්ජුරුවෝත් ඔවුන්ට කී බස් ප්‍රත්‍යුත්තරයෙන් ම පසුබස්වමින් "සොඳුර, මා විසිනුත් නිමිත්ත විචාළ තැන මාගේ රට නිමිත්ත පාඨකයෝ තොප විනා උන්ට වල්ලභ කෙනෙක් නැත්තාහයි

තරයේ ම කිවු ය. එකී නිමිත්තයෙනුත් මා දුටු කාරණයෙනුත් මා විනා තොපට අනික් වල්ලභ කෙනෙක් නැත. ඒ කාරණයෙන් තොපගේ තද මන් හැර පියව''යි කීහ.

ප්‍රභාවතී කුසරජ්ජුරුවන්ගේ බස් අසා කවර ලෙසකිනුත් මුන් ලජ්ජාවට පමුණුවාගත නො හැක්කේ ය. යේවා නො යේවා මට නම් කම් කිම් ද සිතා දොර අගුළු ලා ගත්තු ය, එකල බෝධිසත්වයෝ වළන්කද කර තබා ගෙන පලා ගියාහු ය.

එතැන් පටන් දැකුමුත් නැතිව අරක්කැමිකම් කරමින් දඹු මුසු සීල් බත් කමින් බත් නිවන ඔරුව පිට සයනය කෙරෙමින් දර පළමින් පැන් ගෙනෙමින් වළන් සෝදමින් උදැසන කැඳ අවුළු දාවල බත් මාළු අවුළු පිසගෙන ගොස් කවමින් පොවමින් මධුරාන්නපාන සයන වස්ත්‍රාභරණාදියක් නැතුව කාමතෘෂ්ණානු රාගයෙන් බැඳී බොහෝ දුක් විඳිමින් එක් දවසක් මුළුතැන්ගෙය මිදුලෙන් යන්නාවු කුද දැක, කැඳවා ප්‍රභාවතී කෙරෙහි භයින් නො ඇසූකන්ව යුහුව යන සඳ වහා ගොස් සාමිදුව මෙන් තදව ගියහු ය. මෙතෙක් දවස් මුළුල්ලෙහි තොප හැම සමීපයෙහි වැස සුව දුක් විචාරීම් විචරකුත් නො ලදුම්හ. සෙසු ලාභයෙක් කැළම වේද, එතකුදු වුවත් ප්‍රභාවතීන්ගේ තද මන් අරවා දක්වා ලිය එව් දැ''යි විචාළා. ඒ අසා කුදිත් ''යහපතැ''යි කිව. එකල බෝධිසත්ත්වයෝ සතුටු ව ''ඉදින් ඇත්සොඬක් මෙන් ක්‍රමෝන්නතව මට සිලුටු වූ ඌරු යුගලක් ඇති ප්‍රභාවතී තොම තොපගේ සමවායෙන් ප්‍රේමදෘෂ්ටියෙන් බැලූ නම් වේවයි මා හා සන්තෝෂයෙන් යුක්තව ප්‍රිය කථාවක් කළා නම් වේවයි නොයෙක් ස්නේහයෙන් මන්දස්මිතියක් පවත්වා මා සෙවාපු නම් වේවයි තව ද මා දැක සතුටුව මාහා සිනායෙන් යුක්තව බැලූ නම් වේවයි ඉදින් තරුණාර්කරශ්මීන් ප්‍රවිකසිත සරසිරුහ සෝදර සුමුදු කොමලපාණිපල්ලවයෙන් මාගේ ශරීරය ස්පර්ශ කළා නම් සැප සේ මාගේ කුසාවතී නුවරට ගොස් වන් දවස් ම මෙ තිගේ කුද හැර යන පරිද්දෙන් හාර කේයුර කනක කටක නූපුර රසනා තැලිමුදු ආදි සර්වාභරණයෙන් තී සරහා ලමි. තෙපි ප්‍රභාවතීන්ට කාරණ කියා මාගේ වශයට පමුණුවා ලව''යි කීහ.

කුදුත් බෝධිසත්ත්වයන්ගේ බස් අසා ''දේවයන් වහන්ස, නුඹ වහන්සේ සැකයක් නො සිතුව මැනව, කීප දවසකින් උන් නුඹ වහන්සේ වශයට පමුණුවා මාගේ සාමර්ථ්‍යය දක්වා ලමි''යි බෝධිසත්ත්වයන්ට කියා තමා ගිය කාර්යය සමෘද්ධ කොට ගෙන ප්‍රභාවතීන් කරා ගොස් උන්ගේ ගෙය කසළ අදින්නියක මෙන් යටත් පිරිසෙයින් ගසා ලන්ට නිසි කැටක් විචරකුත් ගෙයි නො තිබා වහන් පටන් සියල්ලම දොර ගාවා ලා ගෙය හැමද කසළ දමා දොරට පිට ලා එළිපත් පඩිය උස් පුටුවක් ලා ඊට මිටිව ප්‍රභාවතීන්ට අස්නක් පනවා ''දියණියෙනි, මෙසේ අව මැනව. ඉස බලම්හ''යි ප්‍රභාවතී මිටි පුටුවෙක ඉඳුවා ගෙන තොමෝ උස් පුටුවෙක තමාගේ දණ දෙකින් උන්ගේ ඉස වහල කොට ගෙන මදක් ඉස නිය ගා ''අනේ, මුන්ගේ ඉස උකුණෝ බොහෝව ගියෝ යයි කියමින් තමාගේ ඉසින් උකුණන් හැරගෙන ප්‍රභාවතීන්ගේ අත්ලෙහි ලා ''තොපගේ ඉස උකුණන්ගේ විචර බලව''යි යනාදීන් නොයෙක් කථා කොට බෝධිසත්වයන්ගේ ගුණ කියමින් ''මේ ප්‍රභාවතී තොමෝ කුස රජ්ජුරුවන්ගේ නුවර වසන සමයෙහි එ කුස රජ්ජුරුවන් වහන්සේ ගෙන් අන්නපාන වස්ත්‍රාභරණ ගන්ධමාලා තාම්බූලාදී කිසි සත්කාරයකුත් මුන් නො ලදැයි සිතමි. කාරණා කිම යත් ස්ත්‍රීහු නම් එක දවසකුත් ඇකයෙහි වැතිර ඔත් ස්වාමිපුත්‍රයාගේ සිත් නො කලකිරුවති. මේ කුස රජ්ජුරුවන් වනාහි අරක්කැමිව තොප නිසා රාජ්‍යශ්‍රීය හැර අවුත් බැලමෙහෙ කොට දුක් විඳිමින්

සිටියදීත් සුවදුක් විචාරීමකුත් නො කරව ඉදින් උන් වහන්සේ කෙරෙහි ස්නේහය නැතත් මුළු දඹදිවට අග්‍රරාජන් වූ මේ කුස රජ්ජුරුවන් වහන්සේ මා නිසා ම දුක් ගන්නා සේකැයි දැන උන් වහන්සේට කිසි සත්කාරයක් කරන්ට උවමැනව''යි කිව. එබස් අසා ප්‍රභාවතී කිපි සඳ කුදත් නැඟීසිට ප්‍රභාවතීන් කරටිය අල්වා ඇතුළුගෙට දමා තොමෝ පිටත්ව දොර වසා දොර අදිනා ලනුව ඇද අල්වා ගෙන සිටියා ය. එසඳ ප්‍රභාවතී උන් අල්වා ගත නොහී දොරමුල වැදසිට ඇට දොඩමින් මෙබඳු වූ නො කිවමනා බස් කියන්නාක් වූ නො කටයුතු දන්නා මෙකෙලි සියුම් මුවහත් ඇති ශස්ත්‍රයෙන් ජිව්හාච්ඡේදනය ලබන්නට නිසි එකක'යි යනාදි කිපුණා ය. ''ඉක්බිති කුදත් ළං ව ලනුව අල්වා ගෙන සිට පින්මඳ නො කීකරු තෙනැත්තිය, තිගේ රුව කාට කුමක් කෙරේ ද අපි තොපගේ රූපයෙන් කා බී රැකෙන දෙයෙක් ඇද්ද'' යනාදීන් දොඩා බෝධිසත්ත්වයන්ගේ ගුණ වර්ණනා කෙරෙමින් ''තෙල ප්‍රභාවතිය, ආරොහ පරිණාහයෙන්යුක්තවූසිද්ධාංගනාප්‍රතිභාගවූ විශිෂ්ටවූරූඇත්තෙමියිතිගේරූපසෞන්දර්ය හා ඒ රාජාධිරාජ වූ කුස රාජෝත්තමයන් හා සමාන කොට නොසිතව. කුස රජ්ජුරුවන් වහන්සේ අපරිමිත බලවාහන ද මහානුභාව ද මුක්තාමාණික්‍යසංඛසිලාප්‍රවාලකනක රජතාදි මහා ධන ඇති සේක. තිමද ගලිත හස්තිරාජයකු පරිද්දෙන් කිසිවක්හු විසින් වැළකිය නොහැකි කායබල ඇති සේක. අන්නපානවස්ත්‍රාභරණ ග්‍රාමක්ෂේත්‍රාදී සියලු උපභෝග පරිභෝග වස්තුවෙන් සමෘද්ධ වූ කාශිකෝසලාදී වූ බොහෝ රාජ්‍යයට අධිපති සේක. සකලජම්බුද්වීපයෙහි අනන්ත රාජධානිවල ඒ ඒ රජදරුවන්ට අග්‍රරාජන් සේක. ශත්‍රුජන නමැති මත්ත හස්තීන් මධ්‍යයට වන් සිංහරාජයෙකු පරිද්දෙන් අභීත සිංහනාද ඇති සේක. කුරවිකෙවිල්ලන්ට බඳු වූ ලීලෝපෙත ගීතස්වර ඇති සේක. ගම්භීරෝදාර මධුරශ්‍රවණීය කමණීය ප්‍රත්‍යනීය මධුරස්වර ඇති සේක. ස්වයම්භූඥානයෙන් ප්‍රතිවේධ කරන ලද අක්ෂරලිඛිතගණිතගාන්ධර්වාදී අෂ්ටාදශ විද්‍යාස්ථානාදී අනේක ශත ප්‍රභේද භින්න ශිල්පයන් ඇති සේක. උභය කුල පරිශුද්ධ අනන්‍යසාධාරණ සුභගුණමණිගණාකීර්ණ ඉක්ෂවාකුවංශ සම්භූත වූ කුස රජ්ජුරුවන් වහන්සේගේ ඇති ගුණ සලකා තොපගේ රූ ඇත්තෙමි යන තදමන් හැර උන් වහන්සේ කෙරෙහි සිනිදස පතුරුවාල''යි යනාදීන් බෝධිසත්ත්වයන්ගේ නොයෙක් ගුණ කියා අවවාද කළා ය.

ඉක්බිති එබස් අසා ප්‍රභාවතී තොමෝ කෝපයෙන් දිලිහී ''කුද තෝ තිගේ පමණ නො දැන ගර්ජනා කරන්නෙහි ය. අතට පැමිණියා වී නම් ස්වාමිදරුවන් ඇති නියාව අඳුන්වාලමි'' යනාදීන් කියා කුද භය ගැන්වුව, එසඳ කුදුත් ''එම්බල තී රක්නා නිසා මෙතෙක් දවස් මුළුල්ලේ කුස රජ්ජුරුවන් මෙනුවරට ආ නියාව තොපගේ පියාණන් වහන්සේට නො කීමි. වන්නාට, අද දවස් රජ්ජුරුවන් වහන්සේට කියා තිට නිහඬ කියවන්නෙම් වේදැ''යි මහත් කොට කියා උන් භය ගැන්වුව. ප්‍රභාවතී එසඳ භයින් වෙවුලා ''මැණියෙනි එසේ නො කියව මැනවැ''යි කියා කුද අස්වැසුව.

මහබෝධිසත්ත්වයෝ ද ප්‍රභාවතීගේ දැකුමුත් නො ලැබ දුබ්භෝජන දුක්ඛසෙය්‍යාදීන් සත්මසක් මුළුල්ලෙහි දුක්විඳත් ''මැගේ දැකුම් විචරකුත් නො ලබමි. ඉතා තදපරුෂ ගත් හැඟි වූ මැගෙන් මට ප්‍රයෝජන කිම් ද මාගේ රටට ගොස් මවුපිය දෙදෙන දැක වාසය කරමි''යි සිතූහ.

එසඳ මනුෂ්‍යලෝකය බැලූ ශක්‍රදේවේන්ද්‍රයෝ කුස රජ්ජුරුවන් සත්මසක් මුළුල්ලෙහි දුක්විඳත් ප්‍රභාවතීන් දැක්ක නොහී උකටලී නියාව දැක ඈ ලැබෙන්ට කිසි කාරණයක්

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

කෙරෙමි සිතා මද්‍ද රජ්ජුරුවන්ගෙන් ගිය දූතයන් බඳු කොට "ප්‍රභාවතී තොම කුස රජ්ජුරුවන් හැර ගොස් පියා පලා අවු ය, වහා අවුත් උන් කැඳවාගෙන යවයි සත්රජ්ජුරුකෙනෙකුන්ට වෙන වෙන ම පත් අසුන් ඇතිව දූතයන් යවූහ. ඔවුන් දැක රජ්ජුරුවෝ සතුටුව වෙන වෙන ම සිය සෙනග පිරිවරා සාගල නුවරට අවුත් වටලා ගෙන උනුන් දැක "තොපි කුමක් නිසා අවුද තොපි කුමක් නිසා අවුදැ"යි ඔවුනොවුන් විචාරා ප්‍රභාවතින් නිසා මද්‍ද රජ්ජුරුවන් විසින් කැඳවා යවූ හෙයින් ආම්හ"යි යනු අසා, "මේතෙම තමාගේ එක දුව අප සත්දෙනාට ම දේල, මුගේ නො කටයුත්තක් බලව, අප වෙහෙසුයේ යයි දණ්ඩ ාසාත විෂඝෝර සර්පයන් පරිද්දෙන් කිපී වෙන වෙන ම අපට ප්‍රභාවතීන් හෝ දෙව, යුද්ධ හෝ කරව"යි පත් අසුන් යවූහ.

ඒ අසා මද්‍ද රජ්ජුරුවෝ බලවත් භයපත්ව අමාත්‍යයන් කැඳවා කුමක් කරමෝ දැයි විචාළහ. එකල අමාත්‍යයෝ "දේවයන් වහන්ස, මේ රජදරුවෝ සත් දෙන ප්‍රභාවතීන් නිසා ම අවු ය. ඉදින් නුදුනහොත් පවුරු පදනම් වාසල් බිඳගෙන නුවරට වැදගෙන ජීවිතක්ෂයට පමුණුවා රාජ්‍යය හැරගනුම්හයි කියා සේනාව සන්නද්ධ කොට ගෙන යුද්ධාභිමුඛව සිටිනාහ. වදිනාට පළමු කොට ප්‍රභාවතීන් යවම්හ"යි කීවාහුයි.

එබස් අසා රජ්ජුරුවෝ "එක්කෙනෙකුන්ට ප්‍රභාවතී පවා දිනුමෝ නම් තෙස්සෝ යුද්ධ කරන්නාහ. එහෙයින් එක්කෙනෙකුන්ට දී සන්හිඳවිය නො හැක්ක. මුළු දඹදිව අග්‍රරාජන්ව සිටි කුස රජ්ජුරුවන් හැරපියා ආ ගමනට විපාක දක්වමි. මැ සත් කඩක් කොට කපා රජ දරුවන් සත් දෙනාට දී පියා ගැලවෙම්ව"යි කිවූ ය. එලෙස රජ්ජුරුවන් කී බස් රාජාංගණය මුළුල්ලෙහි ප්‍රකාශව ගියේ ය. එපවත් ඇසූ පරිවාර ස්ත්‍රිහු ගොස් ප්‍රභාවතීන්ට කීහ. එබස් අසා ප්‍රභාවතී මරණ භයින් පෙරළී හඬමින් උනස්නෙන් නැගී ජාම්බෝනද ස්වර්ණයට බඳු වූ රන්වන් පැහැ ඇති රන්කමින් විසිතුරු වස්ත්‍රධාරීව නඟුන් හා පරිවාර ස්ත්‍රීන් විසින් පිරිවරන ලදුව මෑණියන්ගේ ගෙට ගොස් නමස්කාර කොට අඬ අඬා සිට "මෑණියන් වහන්ස, මාගේ සඳුන් තුවරලා කස්තුරි කපුරු ආදි සුවඳසුන්නෙන් උලා ඔප්නගන ලද ප්‍රියකරු වූ මනා ඇස් සගලක් ඇති නිර්මල වූ කිසි කැලලක් නැති පෙම්බර වූ දළ කඩමිටු ඇති කැඩපතින් බල බලා සරහන ලද මාගේ මේ මුඛ බිම්බය මේ සත් රජ්ජුරුවන් විසින් දමන ලදුව වලැ තිබෙන්නේ වේ ද තව ද මෑණියන් වහන්ස, බමර වැලසලා මෙන් අක්බඹුරු සිනිඳු මොළොක් දික් වූ සඳුන් සාන්දු ජබාදු ආදී වූ සුවඳ ගන්වන ලද මේ මාගේ කෙස් වැටිය අමුසොහොනෙහි දමන ලදුව උකුස්සෝ ගිජුලිහිණි ආදි පක්ෂීහු නියපසුරෙන් බදාගෙන ආකුල ව්‍යාකුල කොට ඇත මැත අදින්නෝ වේද තව ද මෑණියන් වහන්ස, පබලුදලු මෙන් රත් වූ නිය ඇති සාවුන් බඩ ලොම් සේ මෘදු කොමල තුනුලොමින් ගැවසීගත් රත් සඳුන් සුවඳ ගල්වන ලද මනෝඥ වූ මාගේ හස්ත යුගලය මෙරජුන් විසින් කපා දමන ලදුව කොක්නාවුන් විසින් ඒකාන්තයෙන් ඩැහැගෙන යනු ලබන්නෝ වේ ද තව ද මෑණියන් වහන්ස මාගේ මේ ස්වර්ණතාලඵලයට බඳු වූ උපමා ඇති මුඛ පද්මයෙහි ලොල්ව උඩබලා උන් ස්වර්ණ චක්‍රවාක යුගලය මෙන් නුහුණුවා වූ වටමට වූ සඳුන් කොකුමඟරා මුතුහරින් හොබනා වූ මේ මාගේ තනයුගලය කපා වළ දමන ලද කල්හි මෑණියන්ගේ තනයේ එලුණ බාල දරුවන් පරිද්දෙන් කැනහිල්ලු එලෙන්නාහු වේ ද

තව ද මෑණියන් වහන්ස, මෙමාගේ රන්පෝරුවක් මෙන් පළල් වූ තලා හඹා වෙලා මනෝඥ කොට කැට කරන ලද

රන්රසුදැලින් යුක්ත වූ මෙවුල්දමින් සශ්‍රීක වූ කටිප්‍රදේශය මේ රජුන් විසින් කපා වල දමන ලදුව කොක්නහවු ඩැහැගෙන කැමති තෙනකට ගෙන ගොස් කන්නේ වේ ද

තව ද මෑණියන් වහන්ස, බල්ලෝ ය, කොක්නහවු ය, කැනහිල්ලු ය යනාදී වූ දළ ඇති සත්ත්ව කෙනෙක් ඇත්නම් ඒ සියලු සත්ත්වයෝ ප්‍රභාවතීන්ගේ ශරීර මාංසය නමැති රසායනය අනුභව කොට ඒකාන්තයෙන් අජරාමර වෙතී සිතමි.

තවද මෑණියන් වහන්ස, මේ එක් වූ රජ දරුවෝ ස්නේහයෙන් ඉදින් මාගේ ශරීර මාංශය ලියා ගෙන ගියාහු නමුත් ඔවුන්ට යාඥාව කියාත් ඇට හැරගෙන දෙමං අතුරෙක්හි දමාපුව මැනව.

තව ද මෑණියන් වහන්ස, ඒ සොහොන් බිම මල්වතු කරවා එහි උඳු කිණිහිරි ගස් ම ඇති කරව. හිම කාලයාගේ කෙළවර මැදින් මස පිපී වැනී ගිය මල් ගෙන්වා ගෙන රන්සුමුඟක් පුරා ඔර පිට තබා ගෙන මාගේ දියණියන් ප්‍රභාවතීන්ගේ ඡවිවර්ණය මෙබඳු යයි බල බලා මා සිහිකළ මැනවැ''යි යනාදීන් බල පාමින් මෑණියන්ගේ සමීපයේ ම හිඳ ඇඬූ ය.

එසඳ මදු රජ්ජුරුවන්ගේ නියෝගයෙන් වධකයා තමාගේ පොරවත් කොළඹුවත් ඇර ගෙන රජ ගෙට ආයේ ය. ඒ වධකයා ආ බව රාජාංගණයෙහි ප්‍රකාශ විය. ඒ අසා ප්‍රභාවතීගේ මෑණියෝ රජ්ජුරුවන් කරා අඬ අඬා ගොස් පොරව හා කොළඹුව දැක ''දේවයන් වහන්ස, මනාව හැසුණු සිහින් සිඟුවලඟ ඇති මාගේ දියණියන් මේ පොරවෙන් කපා බෙදා මේ සත් රජ්ජුරුවන්ට දෙවන සේක් දැයි විචාළෝ ය.

ඉක්බිති රජ්ජුරුවෝ බිසවුන් ගිවිස්වමින් ''දේවීනි, ප්‍රභාවතීන් කපා නො දී අනික් කුමක් කරවු ද, තොපගේ දියණියෝ සියලු දඹදිවට අග්‍ර රජ්ජුරුවන් විරූප යයි හැර පියා ගිය මහ එම පිය නො මැකෙන තෙක් මරණ නළල තිබා ගෙන අවු ය. දැන් තමාගේ රූ නිසා කරන ලද ඊර්ෂ්‍යාවෙහි විපාක ලබන්නී වේ දැ''යි කීහ.

එබස් අසා බිසෝ දියණියන් ළඟට ගොස් අඬමින් වලපමින් ''දියණියෙනි තොපට අමනාපයක් සිතිනුත් නො සිතන්නා වූ මාගේ බස් නො ගිවිස තොප දැන් ලේ පෙර පෙරා සත්කඩක් කොට කපා මේ රජදරුවන්ට දෙන ලදුව යමපුරයට යන්නී වේ ද

තව ද මේ ලෝකයෙහි යම් සත්වයෙක් වැඩෙහි හැසිරෙන හිතේෂීන්ගේ කීම නො කරන්නේ ද එතෙම මෙබඳු වූ දුක්කම්කටුළු ලදුව නොයෙක් අනය ව්‍යසනයට ද පැමිණෙන්නේ ය. තව ද රන්කමින් උදුල මාණික්‍ය මේඛලාදාමයෙන් විරාජමාන වූ ප්‍රභාවතීනි, ඉදින් තමාගේ සිත් පස්සේ නො ගොස්, උභයකුල පරිශුද්ධ අසම්භින්න සූර්යවංශප්‍රසූත ශෞරවීර්යවික්‍රමසමන්විත කුස රජ්ජුරුවන් හා එක්ව තොප හා සමාන රූපශ්‍රීන් ඇති දැකුම් කටයුතු වූ කුමාර කෙනෙකුන් ලද හොත් අප ඇම ඇතුළු වූ බොහෝ ඥාතිවර්ගයා විසින් සත්කාර සම්භාවනා කරන ලදුව සියලු දුක් දුරුකොට බොහෝ දවසක් සැප සේ වාසය කරන්නී වේ ද

තව ද මාගේ සොඳුරු වූ දියණියෙනි, යම් කුසරජහුගේ මණිකනක රජතා දී වූ විචිත්‍ර වූ කර්මාන්තයෙන් යුක්ත රාජභවනයෙහි සර්වාභරණයෙන් සැරහුණා වූ දිව්‍යාංගනා ප්‍රතිභාග පුරාංගනාවන් විසින් වයන ලදපංචාංගිකතූර්යනාදඅනවරතයෙන් පවතී ද මනා වූ ලක්ෂණාන්විත මංගල හස්තීන් ප්‍රධාන කොට ඇති කෙලාසකූට ප්‍රතිභාග අනේකශතමත්තහස්තීහු නාද කෙරෙද්ද.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

තව ද ප්‍රභාවතීනි, රාජාංගණයෙහි උදාසන සවස මනා වූ ලක්ෂණ ඇති මංගල අශ්වරාජයා ප්‍රධාන වූ ක්ෂීර සාගරයෙහි තරංග පරම්පරාවෙන් විරාජමාන වූ නොයෙක් දහස් ගණන් අශ්වයෝ කුල්මතින් හේෂාරව පවත්වන්නාහු ද,

තව ද යම් කුසාවතී රාජධානියෙක්හි ඒ ඒ ස්ථානයෙහි සර්වාභරණ විභූෂිත සිද්ධ විද්‍යාධරයන් වැනි නළු නාටක සමූහයෝ නොයෙක් ප්‍රභේද ඇති තූර්යභාණ්ඩයන් ගෙන හැම වේලෙහි ම සුබිතමුදිතව සේවය කෙරෙද්ද,

තව ද ප්‍රභාවතීනි කුසරජ්ජුරුවන්ගේ යම් ගෘහෝද්‍යාන විද්‍යුල්ලතා සශ්‍රීක ව විරාජමාන වූ ස්වර්ණමයූර රාජයන් විසින් මිහිගු බෙර හඬින් මත් ව පවත්වන ලද කෙකානාදයෝ ද කොස්ලිහිණියන් විසින් පවත්වන ලද අනුරාගයෙන් හරිත වේ ද, එබඳු වූ ශ්‍රී සෞභාග්‍යය හා ඓශ්වර්ය විශේෂ ඇති ඒ කුසාවතී රාජධානියෙහි ඉසුරු හැර ඊට වඩා කවර සැපයෙක් කොයි ඇති හෙයින් මීට අවුද'' යනාදීන් ප්‍රභාවතීන්ට අවවාද වශයෙන් කුසාවතියෙහි විභූතිය වර්ණනා කොට ඉදින් ඒ කුස රජ්ජුරුවෝ අද මෙතන වී නම් මේ සත්රජදරුවන් මරා ලුහුබඳවා මාගේ දියණියන්ට පැමිණි මේ දුක් දුරුකොට කැඳවා ගෙන යන්නෝ වේ ද, කපුටු රැසක් කැටක් ගසා පලවා ලන්නාක් මෙන් තමන්ගේ වචන මාත්‍රයකින් ම සකල ශත්‍රු මර්දනය කරන්නා වූ ඉදින් සිතුව හොත් එක් සියක් රාජධානීනුත් හැර ගන්ට නිසි වූ සමර්ථ ඇති විශිෂ්ට වූ ප්‍රඥානුභාව ඇති ඒ කුස රජ්ජුරුවෝ අද මෙනුවර වූ නම් අප හැමට පැමිණි මේ දුකින් ගලවා ගන්නාහු යයි යනාදීන් කුස රජ්ජුරුවන්ගේ බොහෝ ගුණ කථනය කළාහු ය.

එකල්හි ප්‍රභාවතී තොමෝ ''කුස රජ්ජුරුවන්ගේ ගුණ කියන්නා වූ මාගේ මෑණියන් වහන්සේගේ මුඛ නො සෑහෙන්නේ ය. එහෙයින් උන් වහන්සේ අරක්කැමි කොට මේ ගම වසන බව මෑණියන් වහන්සේට කියමි"යි සිතා ''මෑණියන් වහන්ස, අනන්‍ය සාධාරණගුණගණාභරණවිභූෂිත ශෞරවීර්යබලපරාක්‍රමප්‍රතාපප්‍රඥාගුණ ඇති මේ සතුරන් නසා අප හැම රකින්ට නිසි වූ කුසරජ්ජුරුවන් වහන්සේ අපට ආළාරිකව මෙතන ම වාසය කරන සේක. උන් වහන්සේ කැඳවම්දැ''යි විචාළා ය.

ඉක්බිති ''ප්‍රභාවතීනි, මරණභයින් පීඩිත ව නන්දොඩ වූ ද, අඥානයෙන් මූඪ වූ ප්‍රලාප දොඩවූ ද, බොලඳකමින් කිව මනා දෙය තබා අනිකක් කියවූ ද තොප මේ කියන්නේ කිම් ද ඒ කුස රජ්ජුරුවෝ ඉදින් මේ නුවරට අවු නම් අපට නො දැනෙන්ට කාරණා කිම් ද ඉදින් එත් නම් අපට කියා එවා තමන්ගේ සේනාවාහනයන් පිරිවරා නේත් ද, මෑගේ කුමන නන් දෙඩීමෙක් ද'' යනාදීන් දෙඩූ ය.

එසඳ ප්‍රභාවතී මෑණියන් වහන්සේ කුමක් කීවත් අදහා නො ගන්නා සේක. ප්‍රත්‍යක්ෂයෙන් දක්වාලා කියමී සිතා මෑණියන්ගේ අත අල්වා ගෙනමතුමාල්තලයට නැගී ගොස් සීමැදුරු කවුළුව හැර පිටත බලා වළන් සෝධමින් සිටි බෝධිසත්ත්වයන් දිසාවට අත දිගු කොට ''මෑණියන් වහන්ස, තෙලෙ කුමාරිකාවරුන්ගේ අන්තඃපුර ආසන්නයෙහි මුළුතැන්ගෙයි මිදුලෙහි තරයේ කැසපට ගන්වා අරක්කැමි වේශයෙන් නැඹුරුව සිට වළන් සෝධන සේක් කුස රජ්ජුරුවන් වහන්සේ'' යයි දැන් වූ ය.

එකල බෝධිසත්ත්වයෝ ප්‍රභාවතීන් නිසා සත්රජ්ජුරු කෙනෙක් මෙ නුවර වටලා ගත්තාහ යි යනු අසා අද දවස් මාගේ මනෝරථය මුදුන් පැමිණෙන්නේ යයි මාගේ මේ ගමට ආ නියාව අද දවස් ප්‍රභාවතී දෙමවුපියන්ට කියන්නී ය, ඒ

අසා මා ගෙන්වා ගෙන උන් මට පාවා දෙති, එකල මා ගත් දුක් සාර්ථක වන්නේ යයි වළන් සෝධා තැන්පත් කොට තබමි සිතා පැන් ගෙනවුත් වළන් සෝධන්ට පටන්ගත්හ, එසඳ වළන් සෝධමින් සිටි රජ්ජුරුවන් දැක දියණියන්ට උරණව "කෙල්ල, තෝ චණ්ඩාල එකක් ද, අවශේෂ හීන ජාතියෙහි එකක් ද නොහොත් මෙබඳු රාජ වංශය නසන්ට උපන් එකක් ද මදු රජ කුලයෙහි උපන් තෝ සකල රාජ මෞලිමාණික්‍යකාන්තීන් බබළන ලද පාදපීඨ ඇති තොපගේ වල්ලභ වූ කුස රජහු ලවා දාස ක්‍රියා කරව් දැ"යි පරිභව බිණූ ය, ඉක්බිති ප්‍රභාවතී තොම මාගේ මෑණියන් වහන්සේ මා නිසා මේ කුසරජ්ජුරුවන් වහන්සේ අවුත් මෙනුවර වසන බව නො දන්නා සේක් වනැයි සිතා, "මෑණියන් වහන්ස, මම චණ්ඩාල ස්ත්‍රියකත් නො වෙමි, තෙසු හීන ජාති එකකත් නො වෙමි, නුඹ වහන්සේගේ රාජවංශය නසන එකකත් නො වෙමි, මේ ඉක්ෂවාකු රාජ වංශයට නගන ලද කේතුවක් වැනි රජ්ජුරුවන් වහන්සේ යයි දනිමි. ඉදින් නුඹ වහන්සේ දාස කෙනෙකු යැයි නො සිතම්" කියා බෝධිසත්වයන්ගේ ඓශ්වර්ය වර්ණනා කරන්නා වූ ප්‍රභාවතී තොමෝ "මෑණියන් වහන්ස, මේ කුස රජ්ජුරුවන් වහන්සේ ත්‍රිවිධවේදපාරප්‍රාප්ත සදාචාර නිරත වූ විසිදහසක් පමණ බ්‍රාහ්මණයන් මාළිගායෙහි මධුරාන්නපාණයෙන් සන්තර්පණය කරවන සේක් ද,

තව ද රන්සත් රන්පොරෝදු රන් සන්නාහයෙන් සදන ලද කනකගිරි සිඛර සුන්දර වූ ත්‍රිමදගලිත වූ විසිදහසක් පමණ හස්තීහු සතතයෙන් සැරහී සිටිද්ද යම් රජ්ජුරුවන් වහන්සේගේ ප්‍රචණ්ඩ මාරුතයෙන් මෙහෙයන ලද ශරත් කාලයෙහි මේඝකූට නිකර සුන්දර වූ මනෝඥ ලක්ෂණාන්විත රාජවාහන යෝග්‍ය වූ නොයෙක් අශ්වාලංකාරයෙන් සරහන ලද විසිදහසක් පමණ අශ්වයෝ හැමවේලෙහි ම සන්නද්ධ ව සිටිද්ද,

තව ද යම් රජ්ජුරුවන්ගේ සුරලෝකාවතීර්ණ සුන්දර විමානයක් මෙන් ශෝභමාන වූ නගන ලද ධවලාත පත්‍රයෙන් විරාජමාන වූ සරහන ලද සිංහාසනයෙන් සශ්‍රීක වූ සුරසුන්දරීන් සමාන පුරසුන්දරීන් විසින් සලන ලද චාරුචාමරනිකරාකීර්ණ වූ සියලු රථාලංකාරයෙන් විචිත්‍ර කොට සරහන ලද එල්වනලද මලෝලුඹු මල්දම් රන්මිණි කිකිණිදැලින් ශෝභමාන වූ විසිදහසක් පමණ රථ නිරන්තරයෙන් සැදී සිටී ද,

තවද යම් රාජෝත්තමයක්හුගේ ධරණීතලාවතීර්ණ නෛකවර්ණ ඇති අභ්‍රකූට සහස්‍රයෙන් ශෝභමාන වූ ඝනගර්ජනාකාර වෘෂභ ගර්ජනා ඇති නිසාන තම්මැට එකැස්බෙර ආදින් සරහන ලද පිටු ඇති විසිදහසක් පමණ වෘෂභ රාජයෝ මත්ත හස්තීන් මෙන් තප්ලා කුර ඇන සිටිත් ද,

තව ද රක්ත නීල ශ්වේත කෘෂ්ණා දී වූ අනේක වර්ණොජ්වලිත අනවරතයෙන් වෑහෙන්නා වූ ක්ෂීර ධාරා සහස්‍රයෙන් සන්හිඳුවන ලද ග්‍රීෂ්ම සන්තාපයන් ඇති සක්ත වූ තුංග තරංග භංගාකාර ඇති විසි දහසක් පමණ දෙනුන් සතතයෙන් රජත ස්වර්ණමය භාජන පුරා ක්ෂීර දෝහනය කෙරෙද්ද" යනාදීන් ප්‍රභාවතී කුස රජ්ජුරුවන්ගේ යශෝ විභූතිය ප්‍රශංසා කොට "මෙබඳු වූ ඓශ්වර්ය ඇති රාජාධිරාජයා නුඹ වහන්සේ ම දස්කොට සිතන පමණ විනා මම එලෙස නොසිතමී" යනාදීන් බෝධිසත්ත්වයන්ගේ ගුණ කථනය කළාහු ය.

එකල බිසවු "තොමෝ ම අසම්භීතව කියන්නී ය"යි ඒකාන්තයෙන් අදහාගෙන මදු රජ්ජුරුවන් කරා ගොස් එපවත් කිවු ය. එබස් අසා රජ්ජුරුවෝ යුහුව ප්‍රභාවතීන් කරා ගොස් "දියණියනි කුස රජ්ජුරුවන්

මෙනුවරට ආයේ සැබෑ දැ''යි විචාළහ. එසඳ ප්‍රභාවතීන් ''එසේ ය, පියාණන් වහන්ස උන් වහන්සේ මෙනුවරට අවුත් රාජ කුමාරිකාවරුන්ට අරක්කැමිකම් කරන්නේ දැන් සත් මසෙකැයි කිවු ය, ඒ අසා මද්‍ර රජ්ජුරුවෝ උන්ගේ බස් අදහා නො ගෙන කුද කැඳවා විචාරා නියම කොට දැන ''එඹල කෙල්ල, වෙස් වළා මුඩු වෙසින් පැමිණ විෂඝෝර සර්පරාජයකු පරිද්දෙන් සකල භුවන ශේඛර වූ විශිෂ්ට කායබල ඥාණබල ඇති ඒ කුස රජ්ජුරුවන් වෙස්වලා තොප නිසා මීට අවුත් සත් මසක් මුළුල්ලෙහි දුක් ගනිමින් සිටිය දී අපට නො කියා කළ දෑ ඒකාන්තයෙන් වැරැද්දේ ය'' යනාදීන් දියණියන්ට දොඩා වේගයෙන් ඉක්මන්ව බෝධිසත්ත්වයන් කරා ගොස් සුවදුක් විචාරා බද්ධාඤ්ජලීව සිට ''මහරජ්ජුරුවන් වහන්ස, සත් මසක් මුළුල්ලෙහි දුක් ගනිමින් සිටිය දී නුඹ වහන්සේ වෙස් වළා අවුත් මෙගම සිටි බව නො දනුම්හ. ඒ අප නො දැන කළ අපරාධයක් ක්ෂමා කර වදාළ මැනවැ''යි යාඥා කළහ.

එබස් අසා මහා බෝධිසත්ත්වයෝ ''ඉදින් මම තද කොට කීම් නම් මොහුගේ ළය පැළී යන්නේ ය. එහෙයින් අස්වසා කියමි'' සිතා වළන් අස්සෙහි සිට ''දේවයන් වහන්ස, මෙබඳු වූ මම සම්ප්‍රාප්ත වූ රාජ්‍යශ්‍රීය හැර ප්‍රභාවතීන් කෙරෙහි බද්ධාභිලාෂයෙන් වෙස් වළා අවුත් අරක්කැමිකම් කෙරෙමින් දුක් වුණිම් ද මා කළ ඒ අකර්තව්‍යය ම අධිරාජ්‍යයන්ව සිටි මා බඳුන්ට නුසුදුසු හෙයින් මාගේ ම වැරදි විනා නුඹ වහන්සේගේ වැරැද්දක් නැත්තේ ය, එහෙයින් මේ මා කළ දෙයට නුඹ වහන්සේ ම ක්ෂමා කොට වදාළ මැනවැ''යි කීහ.

එසඳ මද්‍ර රජ්ජුරුවෝ මහා බෝධිසත්ත්වයන් විසින් ප්‍රිය වචනයෙන් කියන ලද පිළිසඳර කථා ඇතිව සන්තෝෂප්‍රාප්තව ප්‍රාසාදයට ගොස් ප්‍රභාවතීන් කැඳවා ''නුවණ නැති තැනැත්තිය, මහාබල පරාක්‍රම ඇති කුස රජ්ජුරුවන් කරා ගොස් ක්ෂමා කරවා ගනුව''යි කීහ.

එසඳ ප්‍රභාවතී පිය රජ්ජුරුවන්ගේ බස් අසා නඟුන් හා පරිවාර ස්ත්‍රීන් විසින් පිරිවරා බෝධිසත්ත්වයන් සිටි තෙනට ගියා ය. කුසරජ්ජුරුවෝ ද මෙහෙ කරමින් සිට ප්‍රභාවතීන් තමන් කරා එන නියාව දැන, ''දැන් මම මැගේ මන් බිඳ මාගේ පාපිට මඩෙහි ම වැද හොවමි''යි සිතා වළන්වල තිබූ පැන් බිම නමා කලවිටක් පමණ තැන් පාගා බොර කොට බොර මඩයෙහි සිටියාහු ය. එකල ප්‍රභාවතී ගොස් බෝධිසත්ත්වයන්ගේ පත්ලෙහි ඉස තබා මහ පවතින් මුලින් උපුටා එලන ලද ස්වර්ණ තාලස්කන්ධයක් පරිද්දෙන් මඩෙහි වැතිර, තමාගේ සුරක්තපල්ලවාභිරාම වූ මෘදුකෝමල පාණි යුගලයෙන් බෝධිසත්ත්වයන්ගේ තරුණාරුණ කිරණ සම්පර්කයෙන් ප්‍රවිකසිත වූ සන්ධ්‍යාරාග නිර්විශේෂ ප්‍රභා භාසුර පාදපද්මයුගලය අල්වා ගෙන මරණ භයින් පීඩිත ව මහ හඬින් හඬ හඬා ''දේවයන් වහන්ස, මාගෙන් වෙන්ව නුඹ වහන්සේ විසින් රාජ්‍ය ශ්‍රීවිභූතිය හැර අපමණ දුක්ඛයෙන් යම් පමණ කලක් ඉක්මවන ලද ද එපමණ කාලයක් මුළුල්ලෙහි මා විසිනුත් දුර්භෝජන දුක්ඛසෙය්‍යාදීන් හා ස්නානපාන රහිත වීමෙන් නුඹ වහන්සේ සේ ම දුකින් ම දවස් යවන ලද්දේ ය. එහෙයින් මට නො කිපී ක්ෂමා කොට වදාළ මැනව.

තව ද මහ රජ්ජුරුවන් වහන්ස, මාගේ සත්‍ය වචනයක් ඇසුව මැනව. මම මෙතැන් පටන් දිවිහිමියෙන් කයින් වචසින් මනසින් අමනාපයක් නො සිතමි, නො කරමි ඉදින් මා මෙසේ යාඥා වෙමින් සිටිය දී මට ක්ෂමා නො කොට මාගේ බස් නො පිළිගත් සේක්

වී නම් දැන් මපියාණන් වහන්සේ මෙසත් රජදරුවන්ට මා සත් කඩක් කොට කපා දෙන සේක. එහෙයින් මට ක්ෂමා කොට රැක්ක මැනවැයි යාඥා කළා ය.

එකල කුස රජ්ජුරුවෝ ප්‍රභාවතීන්ගේ බස් අසා "ඉදින් සබඳ, තෙපි ම වේද දන්නා ඒ මට ඇයි දැයි කීම් නම් මුන්ගේ ළය පැලී යන්නේ ය, එහෙයින් මුන් අස්වසා කියම්යි සිතා "ප්‍රභාවතීනි, තොප මේ ලෙස යාඥා වෙමින් සිටිය දී කුමක් නිසා තොප කීවා නො කෙරෙම් ද තොප කෙරෙහි මාගේ මඳකුත් කෝපයක් කනස්සල්ලෙක් නැත්තේ ය, තව ද තොපි කිසි විටකත් නො බව, තව ද කලණ ගුණයන් ඇති රාජපුත්‍රිය, සත්‍ය වචනයක් ඇති කියමි. මමත් මෙතැන් පටන් කයින් වචනින් මනසින් අප්‍රියයක් නො කෙරෙමි. මේ එක මදු රජ කුලය තබා මෙබඳු නො යෙක් සිය ගණන් රාජ කුලයන් මර්දනය කොට මා කැමති පරිද්දෙන් තොප ඇර ගෙන යන්ට සමර්ථ වුවත් මම තොප නිසා මාගේ එබඳු රාජ්‍ය ශ්‍රීය හැර හීන ක්‍රියා කෙරෙමින් මෙතෙක් දවස් මුළුල්ලෙහි දුක් වින්දෙමි. එබඳු වූ මා පෙනී සිටිය දී තොපට කිසි යම් භයකුත් නැත්තේ ය"යි යනාදීන් ප්‍රභාවතීන් අස්වසා සියලු රජපිරිවරින් පිරිවරන ලදුව ක්ෂත්‍රියමාන උපදවාගෙන "මා ජීවත් ව සිටිය දී මාගේ භාර්යාව අනිකෙකු ඇර ගෙන යෙතැ"යි කේශර සිංහරාජයකු මෙන් පැලඹෙමින් "මේ සියලු සාගල නුවර වාසීහු මා මෙතනට ආ බව දනිත්ව"යි ඇත මැත පනිමින් අභීතනාද පවත්වමින් අත්පොළසන් දෙමින් "දැන් දැන් ඒ කොල්ලන් ජීවග්‍රාහයෙන් අල්වාගෙන එමි." සියලු අන්තඃපුර වාසීන් අස්වසා "තව ද මණිකනක රජතාදී විචිත්‍ර චිත්‍ර කර්මාන්තයෙන් විරාජමාන වූ රථ යානාවෙක්හි හික්මුණා වූ කීකරු සියලු අශ්වාලංකාරයෙන් සරහන ලද අශ්වයන් යොදව. දැන් දැන් ශත්‍රු මථනය කරන්නා වූ මාගේ බල පරාක්‍රම සාමර්ථ්‍යය බලව." යනාදීන් අභීත නාද පවත්වමින් "ශත්‍රුමථනය කිරීම මට භාර ය, තෙපි තොපගේ මාළිගාවට ගොස් ඉස්සෝධා නහා සැරහී ගන වැද හිඳුවයි ප්‍රභාවතීන් එතනින් නික්මවූහ. එකල මදු රජ්ජුරුවෝ ද කුස රජ්ජුරුවන්ට පිරිස් සරහන පිණිස අමාත්‍යයන් යවූහ. ඒ නියෝග ලද අමාත්‍යයෝ ගොස් මුළුතැන්ගෙයි මිදුලෙහි වටතිරයක් බැඳ එලවන ලද ඒ මගුල්කපුවා විසින් කරන ලද දැළි රැවුලු අන්දම් තිබීම් ඇතිව ඉස් සෝධා නහා සියලු රාජාභරණයෙන් සැරහී ඇමති මඬුලු ආදී දශ මේ තැන් පිරිවරා මාළිගාවට යෙමින් අත් පොළසන් දෙමින් සියලු අන්තඃපුර සත්වයන් බල බලා සතුටුවන පරිද්දෙන් අභීත නාද පැවැත්වූහ.

එකල මදුරජ්ජුරුවෝ මනාව හික්මවන ලද රන්සැත් රන් පොරොදු රන්සන්නාහ කර්ණ චාමරාදී සියලු හස්ත්‍යාලංකාරයෙන් සරහන ලද්දා වූ නගන ලද ධවලාතපත්‍ර ඇති මගුලැත් සරහා බෝධිසත්වයන් නැගෙන පිණිස යැවූහ. එකල කුස රජ්ජුරුවෝ ඒ ඇතු පිට පැන නැගී ප්‍රභාවතීන් පශ්චිම ආසනයේ හිඳුවා ගෙන චතුරංගිණි සේනාව විසින් පිරිවරන ලදුව නුවර නැගෙනහිර වාසලින් පිටත් ව කැනහිල් රැසක් මධ්‍යයට වන් කේශර සිංහරාජයකු පරිද්දෙන් යුද්ධභූමියට වැද "මම් කුස රජය, ප්‍රාණාර්ථ කෙනෙක් බඩින් තලායෙත්ව"යි කියා අසනිසම්පාත නිර්ඝෝෂ ඝෝර කොට තුන්යලක් සිංහනාද ස්වරයෙන් අභීත නාද පැවැත්තූහ.

එසඳ කුසනරේන්ද්‍රසිංහයාගේ ඒ සිංහනාදය අසා භයට පත්ව ඉස් ලූ ලූ අත පලා ගොස් පර්වත ඝන වන ගහනාදියට වන් මෘගසූකරාදීන් පරිද්දෙන් ශත්‍රු රජදරුවන් පිරිවරා සිටි නොයෙක් සියදහස් ගණන් ඝනගර්ජනාකාර භීමනාද ඇති භීමසේනානුකාරියෝධාභිරූඪ

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ත්‍රිමදගලිත තරුණ කරවාරණෙන්ද්‍ර සේනාව ද ප්‍රලයකාල ප්‍රවෘත්තෝදාර චණ්ඩමාරුතා භිඝාත සින්ධුතුංගතරංගභංගානුකාරි රංගතුරංගානුධිෂ්ඨිත වූ යුද්ධමර්දනාභිලාෂ ඇති දහස් ගණන් අසරුවන් විසින් උපලක්ෂිත අශ්වසේනාවන් ද වේරම්බ වාතයෙන් ප්‍රේරිතව ඝෝරනිර්ඝෝෂ පවත්වමින් දිගාන්තරාභිධාවනය කරන විද්‍යුල්ලතා සහස්‍රයෙන් සශ්‍රීක වූ මේඝකූටානුකාරී ව රථාලංකාරයෙන් සරහන ලද විචිත්‍ර ධජ පතාකාභිකීර්ණ ගම්භීරචක්‍රධ්වනි ඇති ප්‍රචණ්ඩදොර්දණ්ඩකෝදණ්ඩ කාණ්ඩාභිලක්ෂිත ප්‍රබල යෝධාධිෂ්ඨිත රථ සෙනග ද නානාවේශ ග්‍රහණ භීෂණ වූ දුර්වාරගර්වෝද්ධත පවනාතිපාතවේග ඇති ඛඩ්ගමුද්ගර තෝමර කුන්තචාරු චාපබාණාදී විවිධායුධග්‍රහණාතිභීෂණ අනේකකෝටි පාබළ සේනාව දැයි යනාදී මේ සේනාව මරණභයින් ත්‍රස්තව සිටි පිය සිටිය නො හී භයෝන්මාදයෙන් මූර්ඡාවට පැමිණ ඔවුනොවුන් ඇඳින ගත නොහී සිය සෙනඟ ම කොටා වටා දිව පැන විධාපත්ව ඒ ඒ අත දිවපූහ.

එසඳ මේරුසාර වූ කුස රජ්ජුරුවෝ මන්දරපර්වතයෙන් අළලන ලද මහාසමුද්‍රය පරිද්දෙන් නිරායාසයෙන් තමන්ගේ සිංහනාද මාත්‍රයෙන් ඒ ශත්‍රුසාගරය මථනය කොට ප්‍රභාවතීන්ගේ පාණිග්‍රහණය පිණිස ආ සත් රජුන් ජීවග්‍රාහයෙන් අල්වා ජයගෙන සිටි සඳ ශක්‍රදෙවේන්ද්‍රයෝ තමන්ගේ දහසක් නුවණැස් මෙහෙයා මනුෂ්‍ය ලෝකය බලා ඒ රණධරණිමධ්‍යයෙහි ශත්‍රුරජදරුවන් හා සමග විජය ශ්‍රී කාන්තාවගේ පාණිග්‍රහණය කළ අපගේ විසුද්ධ ශ්‍රී මහාබෝධිසත්ත්ව වූ කුසරාජාධි රාජෝත්තමයා පරහිංසාවක් නො කොට සිංහ නාද පමණකින් කැටක් ගැසූ කපුටු රැසක් පලවන පරිද්දෙන් නිරායාසයෙන් කරන ලද ශත්‍රු සේනා මර්දනය දැක සඤ්ජාත ප්‍රීති ප්‍රමෝදයෙන් ප්‍රමුදිතව මේ උත්තම පුරුෂයාගේ විරූපතාව දුරු කොට උතුම් රූප සෞන්දර්යයෙන් සරහන්ට උව මැනවයි සිතා තරුණාර්ක රශ්මීන් ප්‍රදානයක් මෙන් දීප්තිමත්ව විරෝචන නම් වූ අෂ්ටවංක මාණික්‍යරත්නයක් තුෂ්ටිදානයෙන් ගෙනහැර උරස්තලයෙහි පැළඳවූහ.

එසඳ මහාබෝධිසත්ත්වයෝ එසත් රජුන් අල්වා ඔවුනොවුන්ගේ උතුරු සළුවෙන් පිටිතල අයා බැඳ ගෙන ඒ රණ භූමියෙන් නොයෙක් ජයඝෝෂා පවත්වා ගෙන මාණික්‍ය රත්නයෙහි ආනුභාවයෙන් දිවි දළන් ඔප් නගා කරන ලද ස්වර්ණ ප්‍රතිමාවක් මෙන් විරාජමානව අනන්‍ය සාධාරණ ශ්‍රී විභූතියෙන් යුක්තව සුරසෙන් පිරිවරා සුජාතාවන් හා ඓරාවණ වාහනාරූඪ ව අසුර විජය කොට අවුත් වෛජයන්ත ප්‍රසාදයට වදනා ශක්‍රදේවේන්ද්‍ර විලාසයෙන් මාළිගාවට වැද මද්‍ර රජ්ජුරුවන් දැක "මයිලණුවන් වහන්ස, නුඹ වහන්සේට විරුද්ධ ව අවුදින් නුවර වටලා ගත් ශත්‍රු සේනාව මථනය කොට රජ දරුවන් සත් දෙනා ජීවග්‍රාහයෙන් අල්වා ගෙන ආමි, මොවුන් මරතත් මැරුව මැනව, හරිතත් හල මැනව, වහල් මේ ගනිතත් ගත මැනව, කැමැත්තක් කළ මැනවැ"යි කීහ.

එබස් අසා මද්‍රරජ්ජුරුවෝ "මහ රජ්ජුරුවන් වහන්ස අප ඇම දෙනාට ම ප්‍රධානව සිටි හෙයින් මොහු නුඹ වහන්සේට ම සතුරෝ ය, මරතත් තබතත් අරිතත් නුඹ වහන්සේට ම කැමැත්තක් කළ මැනවැ"යි කීහ.

මද්‍ර රජ්ජුරුවන් විසින් මෙලෙස කී කල්හි මහා බෝධිසත්ත්වයෝ "මොවුන් මරා ලබන්නේ කිම් ද, මුන් හැම මේ නුවරට ආ ගමන් ව්‍යර්ථ නො වේවයි, ප්‍රභාවතීන්ගේ නගුන් සත් දෙනා රජදරුවන් සත් දෙනාට දෙවා ලමි" සිතා "දේවයන් වහන්ස, දිව්‍යප්සරාවන් සමාන

රූප ශෝභා ඇති නුඹ වහන්සේගේ දූන් සත් දෙනා මෙරජ දරුවන්ට පාවා දී මුන් හැම බැණ කොට ගත මැනවැ''යි කිවූ ය. එබස් අසා මදුරජ්ජුරුවෝ මහා රජ්ජුරු වහන්ස, අපටත් උන්ටත් නුඹ වහන්සේ ම ප්‍රධාන සේක. ඉදින් කැමති සේක් වී නම් දෙවා වදාළ මැනවැ''යි කිවූ ය.

ඉක්බිති කුස රජ්ජුරුවෝ ඒ ක්ෂත්‍රිය කන්‍යාවන් සත් දෙනා සර්වාභරණයෙන් සරහා රජදරුවන් සත්දෙනාට මහමගුලෙන් පාණිග්‍රහණය කරවා දුන්හ. එසඳ රජදරුවෝ සත්දෙන ස්ත්‍රීරත්න ප්‍රතිලාභයෙන් අතිශයෙන් සතුටුව කුස රජ්ජුරුවන් වැඳ අවසර ඉල්වාගෙන තම තමන්ගේ රාජ්‍යයට ම ගියා හ.

ඉක්බිති උපාය කෞශල්‍ය ඥානය ඇති මහාබෝධිසත්ත්වයෝ කීපදවසක් එහි වාසය කොට මයිල් රජ්ජුරුවන්ගෙන් අවසර ඉල්වා ගෙන ප්‍රභාවතීන් කැඳවා ගෙන චතුරංගිණි සේනාව පිරිවරා මහත් වූ රාජානුභාවයෙන් සාගල නුවරින් නික්ම මනා ව සරහා පිළියෙල කරන ලද්දා වූ නගන ලද ධවලාත පත්‍ර ඇති විචිත්‍ර චිත්‍ර කර්මෝජ්වලිත වූ රථයානාවකින් ගොස් මාණික්‍යරත්න කාන්තීන් ප්‍රභාවතීන් හා විශිෂ්ට වූ රූප සෞන්දර්ය ශෝභාවෙන් විරාජමානව විමානස්ථව ගමන් ගත් සිද්ධ යුගලයක් පරිද්දෙන් කුසාවතී රාජධානියෙහි සියලු සත්ත්වයන්ට නෙත්‍රෝත්සව කෙරෙමින් නුවරට වන්හ.

එසඳ බෝධිසත්ත්වයන්ගේ මෑණියෝ සීලවතී දේවි ''කුස රජ්ජුරුවන් ප්‍රභාවතීන් කැන්දාගෙන නුවරට ආහ''යි යනු අසා කැම් බීම් ආදි බොහෝ උපකරණ ඇරගෙන මහපිරිවරින් පෙර ගමන් කොට ගොස් දැක සතුටුව බෝධිසත්ත්වයන් කැඳවා ගෙන නුවර පැදකුණු කොට මාළිගාවට වැද රාජ ශ්‍රීයෙහි පිහිටවූහ.

එතැන් පටන් ප්‍රභාවතීන් හා කුස රජ්ජුරුවන් හා දෙ දෙන එකාත්මික ව සමඟ වාසයෙන් දිවි පමණින් දස රජ දහමින් යුක්ත ව රාජ්‍ය ශ්‍රී අනුභව කොට කෙළවර කම් වූ පරිද්දෙන් සංසාරයාත්‍රාව කළාහු යයි තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ධර්මසභාමණ්ඩපයට රැස්වූ ශාසනයෙහි උකටලී වූ ඒ භික්ෂූන් වහන්සේ ප්‍රධාන කොට ඇති සිවුවණක් පර්ෂදට මේ අතීත කථාව ගෙනහැර දක්වා ධර්ම දේශනා කොට වදාරා දුක්ඛ සත්‍යය, සමුදය සත්‍යය, නිරෝධ සත්‍යය මාර්ග සත්‍යය යන චතුරාර්ය සත්‍යයන් ප්‍රකාශ කොට මේ ජාතක ධර්ම දේශනාව පූර්වාපරසන්ධි ගළපා නිමවා වදාළ සේක.

චතුස්සත්‍ය ධර්මදේශනාවගේ කෙළවර උකටලී වූ භික්ෂූන් වහන්සේ දහසක් නයින් හෙබියා වූ සෝවාන් පලයෙහි පිහිටා නිවන් දුටු සේක.

එකල මවුපිය දෙදෙන සුධෝදන රජ්ජුරුවන් හා මහාමායා දේවී වූහ. ජයම්පති කුමාරයෝ නම් ධර්මභාණ්ඩාගාරික වූ ආනන්ද ස්ථවිරයෝ වූහ. එසමයෙහිකුදුත් දැන් බුජ්ජුත්තරා නම් භික්ෂුණී වූහ. ප්‍රභාවතී තොමෝ රාහුල ස්ථවිරයන්ට මවු බිම්බාදේවි වූය, එසමයෙහි රජ පිරිස් දැන් බුදු පිරිස් විය. ප්‍රභාවතී නිසා සත්මසක් දුක්ගෙන සත් රජුන් මන්මැඩ සෙමෙහි තබා ප්‍රභාවතීන් ගෙනවුත් රාජ්‍යය කළ කුස රජ්ජුරුවෝ නම් තිලෝගුරු බුදු වූ මම් ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

## අරුත් පැහැදිලි කිරීම

| | |
|---|---|
| දසබලධාරී | - ශක්ති විශේෂ දහයක් දරන්නා වූ |
| සුරාසුරවරචක්‍ර | - උතුම් වූ සුර අසුර සමූහයාගේ |
| චාරුචූඩාමණි | - මනෝඥ වූ සිළුමිණිවල |
| මරීචිසඤ්චය | - රශ්මි සමූහය |
| පරිචුම්බිත | - සිප ගන්නා ලද |
| චරණ යුගල ඇති | - පා යුවලක් ඇති |
| සිවු පනස් කෙළක් | - පනස් හතර කෝටියක් |
| චංක්‍රමණ මණ්ඩප මාලකාදීන් | - සක්මන් කිරීම සඳහා පිළියෙල කළ මණ්ඩප මළු ආදියෙන් |
| විරාජමාන වූ | - බැබළෙන්නා වූ |
| පද්මෝත්පල | - නෙලුම්, මානෙල් |
| කුවලය කුමුදු කල්හාර | - නිල් මානෙල්, කුමුදු හා හෙල්මැලි යන |
| කුසුමෝපශෝභිත | - මල්වලින් අලංකාරවත් වූ |
| පුෂ්කරණීන් රම්‍ය වූ | - පොකුණුවලින් අලංකාරවත් වූ |
| භූමි ප්‍රදේශ ඇති | - බිම් පෙදෙසක් ඇති |
| ඊර්යාපථ විහරණයෙන් | - ඉරියවු වෙනස් කොට වාසය කරමින් |
| සස්නෙහි උකටලී වූ | - බුදු සසුන පිළිබඳව කලකිරුණා වූ |
| සර්වාභරණ විභූෂිත | - සියලු ආභරණවලින් සැරසුණු |
| මාතුගාමයකු | - කාන්තාවක |
| සුභ නිමිත්ත ග්‍රහණයෙන් | - සුභ නිමිති ගැනීමෙන් |
| ක්ලේශ වශඟව | - කෙලෙස්වලින් යටපත් වී |
| නහරබහන් | - නහර වැල් |
| පිළිසිල් කිලුටු වීම ය | - වස්ත්‍ර නැමැති සිල් කිලිටු වීම |
| කැර වැහැම් | - දැලි රැවුළු කැපීම |
| ඩා වැහීම ය | - ඩහදිය ගැලීම |
| පංච පූර්ව නිමිත්තයෝ | - මුලින් ම පහළ වන නිමිති පහ |
| නොයෙක් ව්‍යසනයට | - නොයෙකුත් විපත්වලට |
| පරදුක්ඛ දුක්ඛිත වූ | - අනුන්ගේ දුකෙහි දී දුකට පත් වූ |
| කරුණා නිධාන වූ | - කරුණාවට නිධානයක් වූ |
| කඩතුරාවක් පහ කොට | - රෙදි කඩක් ඉවත් කොට/තිරයක් මෑත් කොට |
| භවයෙන් ප්‍රතිච්ජින්න වූ | - භවයෙන් (සසර ගමනින්) වැසී ගියා වූ |
| ඉකුත් වත් | - අතීත කථා වස්තුව |

| | |
|---|---|
| කෘත යුග මහා මේඝයක් | - කෘත යුගයේ දී ඇති වන විශාල වැහි වලාවක් (කෘත යුග යනු ලොව ඉතා සමෘද්ධව පවතින වර්ෂ 17,28000ක් වූ කල්පයෙහි ප්‍රථම භාගය යි.) |
| දස රාජ ධර්මයෙන් | - රාජ්‍ය පාලනයේ දී තිබිය යුතු ගුණ ධර්ම දහයෙන් (දානය, ශීලය, පරිත්‍යාගය, ඍජු බව, මෘදු බව, තපස, අක්‍රෝධය, අවිහිංසාව, ඉවසීම, අවිරෝධතාව යන රාජ ධර්ම දහය) |
| පුරංගනාවන්ට | - අන්තඃපුරයේ ස්ත්‍රීන්ට |
| විනස්නේ ය | - විනාශ වන්නේ ය |
| පුර දොරට | - නගරයේ ප්‍රධාන දොරටුව ළඟට |
| සී මැදුරු කවුළුව හරවා | - සිංහ රූපාකාර ජනේලය අරවා |
| අන්‍යායක් | - වැරදි සහගත ක්‍රියාවක් |
| මොර ගවු දැයි | - කෑ ගසන්නාහු දැයි |
| අධර්මකාරී | - අධාර්මික වූවක් කරන |
| සුළු නළු මුළු රකවල් හැර | - කුඩා නාට්‍ය කණ්ඩායම්වල ආරක්ෂාව ඉවත් කොට |
| ඇවිදිනාව | - ඇවිදිනු පිණිස |
| දුරාචාරී | - වැරදි කටයුතුවල යෙදුණු |
| සීලාචාර | - සීලයෙහි හැසිරෙන |
| පාණ්ඩුකම්බල ශෛලාසනය | - පාණ්ඩුකම්බල නම් ගල් ආසනය |
| ජර ප්‍රාප්ත | - ජරා තත්ත්වයට පත් වූ |
| පිළිකුලෙන් පෙළී | - පිළිකුල් සහගත හැඟීමෙන් පීඩාවට පත් වී |
| දඬු මැසි ඇති | - ලී මැස්සක් සහිත |
| හරනා ලද දොර පැලලි ඇති | - විවෘතව තබන ලද දොර පැලැල්ලක් සහිත |
| උදකලායෙමි | - තනිව වාසය කරමි |
| වැදොවැයි | - (වැද+ඔවැ යි) නිදා ගන්නැ යි |
| දිව පහස් ලැබ | - දිව්‍ය ස්පර්ශය ලැබී |
| විසංඥ වැ | - සිහි මූර්ච්ඡා වී |
| වරදානයක් | - ශ්‍රේෂ්ඨ වූ දීමනාවක්/උතුම් දීමක්/කැමති යමක් දීමක් |
| දස එකඩ මසක් | - එකක් අඩ දස මසක් (මාස නමය හමාරක්) |
| ඓශ්වර්ය පාවා දී | - සම්පත් ලබා දී |
| ශ්‍රී විභූතිය | - සම්පත් රාශිය |
| කම්මිත්තක | - දාසියක |
| කම් කිම් දැයි | - ප්‍රයෝජනය කුමක් දැයි |
| ගෘහ වාසයෙන් | - ගිහි ගෙදර වාසය කිරීමෙන් |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

| | |
|---|---|
| තරාල් දෙටුවකු | - රන්කරු නායකයෙකු |
| සුරත් කොමු පිළියක් | - කොමු නූලෙන් වියන ලද රත් පැහැති වස්ත්‍රයක් |
| ශ්‍රී යහන් ගර්භයෙහි | - නිදා ගන්නා කාමරයෙහි |
| බඩාලා ගෙනා | - රන්කරුවා ගෙන ආ |
| යන එන මං හස | - යන එන්නා වූ මාර්ගය අසල |
| බාලාර්ක රශ්මියට | - ළපටි සූර්යයාගේ රශ්මියට |
| ප්‍රදීපාලෝකයක් | - පහන් එළියක් |
| ඒකාලෝක වන්නේ ය. | - අලෝකයෙන් පිරෙන්නේ ය.<br>(එක ම එළියක් වන්නේ ය) |
| නහන පැන් | - නෑම පිණිස වූ ජලය |
| පරිභව | - නින්දා |
| කොපුලතෙහි | - කම්මුලෙහි/කම්මුලට |
| බලග | - බලනු මැනවි |
| කරන ලද සම්භාවනා ඇතිව | - කරන ලද ගෞරව කිරීම් ඇතිව |
| අභීත නාද ඇති | - බියෙන් තොර හඬක් ඇති |
| ඇති නියාව | - සිටින ආකාරය/සිටින බව |
| යෙහෙළණියන් | - ලේළිය |
| දිටුහු නම් | - දුටුවාහු නම් |
| නිස්සහ | - සුදුසු ය |
| කදෝපැණියන් | - කණාමැදිරියන් |
| නිෂ්ප්‍රභ | - අලෝකයක් නැති |
| ඇත් ඉලත්තියක් | - ඇත් වසුරු පිඬක් |
| අස්වසා | - සනසවා |
| හස්ත විකාර | - අතින් කරන උසුළු විසුළු |
| මුඛ විකාරයෙන් | - මුහුණෙන් කරන විකාර කටයුතු |
| වළහා කිවූ ය | - ඇත්ත සඟවා කිවුවා ය/වංචා කොට/රවටා කිවුවා ය |
| පළමු කොට ම බටු ය | - මුලින් ම බැස්සේ ය |
| පුෂ්පඵල පල්ලවයෙන් | - මල්,ගෙඩි සහ දළුවලින් |
| සඤ්ජන්න වූ | - ගැවසුණා වූ |
| පනා | - කොස් |
| බොකල් | - සැළලිහිණි |
| පස් පියුමෙන් | - ඕලු, කුමුදු, මානෙල්, රතු නෙලුම් සහ සුදු නෙලුම් |
| දුර්මුඛ වූ වල්ලභයාගෙන් | - විරූපී ස්වාමියාගෙන් |

| | |
|---|---|
| වන්නාට | - විය යුත්තක් වේවා |
| ගමන් අනුදත්හ | - යෑම අනුමත කළහ |
| බැදෑණියෝ | - වැඩි මහලු සොහොයුරාගේ බිරිඳ |
| පාද පරිචාරිකා | - බිරිඳ |
| පූර්ව ක්‍රියා | - පෙර කරන ලද කටයුතු |
| අවශේෂ නාටක ස්ත්‍රීහු | - ඉතිරි නිළියෝ |
| ධන ධාන්‍යාදීන් හරිත වූ | - ධන ධාන්‍යයෙන් පිරී ගියා වූ |
| ඇත් ඈණි | - ඇත් හමුදාව |
| පංච කකුධ භාණ්ඩයන් | - රජ කෙනෙකු බව අඟවන භාණ්ඩ පහ (නළල් පට, මඟුල් කඩුව, රන්මිරිවැඩි සඟල, දළ පුඬු සේසත, වල් විදූනාව) |
| උපභෝග පරිභෝග වස්තුවෙන් | - වැලඳ ගෙන ප්‍රයෝජනයට ගන්නා ආහරණ වැනි වස්තු හා පරිහරණය කරන වෙනත් වස්තුවලින් |
| රන් මුඩමක | - රන් බඳුනක |
| පසඟ පිහිටුවා | - දෙදණ, දෙවැලමිට සහ නළල පොළවේ වදින ලෙස සිට |
| පඤ්චායුධ | - දුනු, මුගුරු, අඩයටි, පත් කොහොල් සහ පාරා වළලු |
| සොටි | - හෙල්ල |
| පයියෙහි | - මල්ලෙහි/කුඩෙහි |
| කොකනද | - එනම් වීණාව |
| පිළිපන්ව | - බැස |
| අනුදන්නා ලදුව | - අනුමත කරනු ලැබූ පසු |
| තත් සරහා | - වීණාවේ තත් සකස් කොට ගෙන |
| අස්ථාන යැයි | - නුසුදුසු තැන යයි |
| පෙර බත් | - උදේ ආහාරය |
| අතැවැසිව | - සමීපයෙහි වාසය කරන තැනැත්තෙකු වී |
| වළන් උකා | - වළන් සාදා |
| පලහා | - පුලුස්සා |
| නො වළහා | - නො සඟවා |
| උන්ගේ නගු | - ඇයගේ නැගණියන් |
| තොම | - තොමෝ |
| සමාධි වූ සේක | - එකඟ වූ සේක/අනුමත කළ සේක |
| නළකරුවා | - නළා පිඹින්නා |
| තල් වැටක් | - තල් ලීයක් |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

| | |
|---|---|
| ඔඩම | - බඳුන |
| මල්සුඹුලක් | - මල් වැලක්/මල් දරණුවක්/මාලා චුම්බටකයක් |
| තෙසුනගු | - අතිකුත් සොහොයුරියෝ |
| දුම් කරවූහ | - තෙම්පරාදු කරවූහ/සුවඳවත් කරවූහ |
| සුගක් | - ටිකක් |
| මනෝරථය | - සිතේ පැවති අපේක්ෂාව |
| මස්තකප්‍රාප්තව | - මුදුන් පත්ව |
| වසුන් කද | - ආහාර කද |
| දුර්භෝජන | - කටුක ආහාර |
| හීන ක්‍රියාවෙන් | - තමාට නො ගැළපෙන කටයුතුවලින් |
| දුක්ඛ සෙය්‍යාවෙන් | - දුක්බර තැන්වල නිදා ගැනීමෙන් |
| සකුරු පූවක් | - පැණි කැවුමක් |
| දා හැලී ගිය | - පිලිස්සුණු |
| මී ඉඳ | - මෙහි හිඳ/මෙහි නැවත සිට |
| මුව පොල්ලන්ට | - මුව පැටවුන්ට |
| හේමාභරණ | - රනින් සැදූ ආභරණ (හේම+ආභරණ) |
| විභූෂිත | - සරසන ලද |
| කටී ප්‍රදේශ | - උකුළු පෙදෙස් |
| ක්ලේශාන්ධකාරයෙන් | - කෙලෙස් නැමැති අඳුරෙන් (ක්ලේශ+අන්ධකාර) |
| දික් විභාගයෙහි | - එක් එක් දිශාව වෙන් කොට හඳුනා ගැනීමෙහි |
| විපිලිසරව | - පසුතැවිල්ලෙන් |
| වස්න | - ආහාර ගෙන ආ භාජනය |
| පැකිල | - පටලැවී/ගැටී |
| වළන් අඬවා | - වළංවලින් ශබ්ද නංවා |
| හී | - බිම වැටී |
| ලෝකාස්වාදරති | - ලෝකයා විසින් මිහිරි යැයි පිළිගත් දැයට ඇති ඇල්ම/ සම්භෝග සුඛය |
| දර්ශන ලාභාදි ඓශ්චර්ය | - දැකීමට ලැබීම ආදි සම්පත් |
| ස්නේහරති | - ආදරයෙන් කරන ලද ඇල්ම |
| පිළිබඳ සිතින් | - බැඳුණා වූ සිතින්/ප්‍රතිබද්ධ වූ සිතින් |
| බොළඳකමින් | - නො දන්නාකම නිසා |
| කැණ | - හාරා |

| | |
|---|---|
| ඝර්මයෙන් පීඩිතව | - දැඩි උණුසුමෙන් පීඩාවට පත්ව |
| තද පරුෂ බස් | - සිත රිදෙන දැඩි වචන |
| චාටු | - රැවටිලිකාර |
| මනෝඥ | - සිතට ගැළපෙන |
| අංග ප්‍රත්‍යංගාදි | - අඟ පසඟ ආදි කොට ඇති (අංග+ප්‍රති+අංග+ආදි) |
| අනේක කෝටි චාටු නාටක ස්ත්‍රීන් | - අප්‍රමාණ වංචාකාර නිළියන් |
| අනන්ත සාමන්ත චක්‍ර | - අප්‍රමාණ වූ ප්‍රාදේශික රජවරුන් සමූහයාගේ |
| මෞලිමාලාලාලිත | - ඔටුනුවල රශ්මි සමූහයෙන් නැළවුණු |
| පාද පීඨ | - පා පුටු/පා තබා ගන්නා පුටුව |
| ප්‍රේමාන්විත | - ප්‍රේමයෙන් යුක්ත (ප්‍රේම+අන්විත) |
| හාව භාව ලීලා | - ශරීර ලක්ෂණ ආදියෙන් ස්වාභාවිකව ඇඟවෙන සහ මනෝභාව වශයෙන් ප්‍රකට කරවන රාගාදි ස්වරූප |
| කටාක්ෂ නිරීක්ෂණ | - ඇස් කොන් බැල්ම (කට+අක්ෂ) |
| මන්දස්මිත | - මඳ සිනහ |
| මධු මධුර භාෂිත | - මී පැණි මෙන් මිහිරි වචන |
| සෞභාග්‍යයෙන් යුක්ත | - ප්‍රිය උපදවන ස්වභාවයෙන් යුක්ත |
| කෝමලාංග | - සිනිඳු අඟපසඟ ඇති |
| රුෂ්ටව | - දැඩි කෝපයකින් යුක්තව |
| ස්නිග්ධ | - සිනිඳු/ස්නේහයෙන් යුක්ත |
| වදුරු ලාවෙහි | - වදුරන් ඇල්ලීමට යෙදූ ලාටුවල |
| ශක්තව | - ඇලී (සක්තව - ඇලී) |
| ප්‍රත්‍යුත්තරයෙන් | - නැවත ලබා දුන් උත්තරයෙන්/පිළිතුරෙන් (ප්‍රති+උත්තර) |
| තද මන් | - දැඩි මානය |
| දඩු මුසු සීල් බත් | - දංකුඩ මිශ්‍ර හීල්බත් |
| මධුරාන්නපාන | - මිහිරි ආහාර පාන |
| කාම තෘෂ්ණානුරාගයෙන් | - කාම තණ්හාවෙන් බැඳී |
| නො ඇසූ කන්ව | - නො ඇසුණු කන් ඇතිව/නැසුණාක් මෙන් |
| කැලම වේ ද | - ඒකාන්තයෙන් ම ලැබේ ද |
| ක්‍රමෝන්නතව | - ක්‍රමයෙන් ඉහළට මහත් වී ගිය |
| ඌරු යුගලක් | - කලවා යුවලක් |
| සමවායෙන් | - එකට බැඳී පවත්නා |
| ප්‍රේම දෘෂ්ටියෙන් | - ප්‍රේම සහගත බැල්මෙන් |


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

| | |
|---|---|
| සෙවාපූ නම් | - සැනසුවේ නම් |
| තරුණාර්ක රශ්මීන් | - තරුණ සූර්ය රශ්මියෙන් |
| ප්‍රවිකසිත | - මනා ලෙස පිබිදුණු |
| සරසිරුහ සෝදර | - නෙලුම්මලක් සේ ඇල්මක් ඇති කරවන |
| කොමල පාණි පල්ලවයෙන් | - සියුමැලි අත් නැමැති ලා දලුවලින් |
| කේයූර | - ශරීර ආභරණයක් |
| කනක කටක | - රන් වළලු |
| නූපුර | - පයේ පලඳින ආභරණ විශේෂයක් |
| රසනා | - මෙවුල්දම |
| තැලි මුදු | - තැල්ල සහ මුදු |
| වහන් පටන් | - වහන් සඟලේ පටන් |
| දොරට පිට ලා | - දොරට පිට පැත්තෙන් |
| එළිපත් පඩිය | - එළියට බසින තැන තිබෙන පඩියෙහි |
| අව මැනව | - එනු මැනව |
| විචර | - ප්‍රමාණය |
| ඇකයෙහි වැතිර ඔත් | - උකුළෙහි වැතිරී නිදාගත් |
| කරටිය අල්ලා | - බෙල්ලෙන් අල්ලා |
| මෙකෙලි | - මේ කෙල්ල |
| ජිව්හාච්ඡේදනය | - දිව කපා දැමීම |
| අරෝහපරිණාහයෙන් යුක්ත වූ | - උසට ගැළපෙන මහතින් යුක්ත/කඩවසම් |
| සිද්ධාංගනා ප්‍රතිභාග | - බෙහෙත් බලයෙන් හාස්කම් දක්වන කාන්තාවන් මෙන් |
| අපරිමිත | - සීමා රහිත |
| මුක්තාමාණික්‍ය | - මුතුමැණික් |
| සංඛ | - හක්ගෙඩි |
| සිලා | - රන් ඔබ්බා සකස් කළ මුං පැහැති මැණික් ගල් විශේෂයක් |
| ප්‍රවාල | - පබළු |
| කනක රජත | - රන් රිදී |
| ත්‍රිමද ගලිත | - තුන් තැනකින් මද ජලය වැගුරුණු (දෙ කම්මුල හා රහසඟ) |
| කුරවිකෙවිල්ලන්ට | - කෝකිල පක්ෂි විශේෂවලට |
| ලීලෝපේත | - ස්වභාවයෙන් යුක්ත (ලීලා+උපේත/ලීලාවෙන් යුක්ත) |
| ගම්භීරෝදාර | - ගැඹුරුඋදාර |
| මධුර ශ්‍රවණීය | - ඇසීමට මිහිරි |

| | |
|---|---|
| කමණීය | - සිත් අලවන |
| ප්‍රත්‍යනීය | - නැවත ඇසීමට ප්‍රිය උපදවන (අශුද්ධ පාඨයක්) |
| ස්වයම්භූඥානයෙන් | - අනෝ්‍යාපදේශ රහිතව තමාම ම පහළ වූ සර්වඥතා ඥානය |
| ප්‍රතිවේධ කරන ලද | - අවබෝධ කර ගන්නා ලද |
| අක්ෂර ලිඛිත ගණිත ගාන්ධර්වාදි | - අකුරු ලිවීම, ගණිතය, සංගීතය ආදි වූ |
| අෂ්ටාදශ විද්‍යාස්ථානාදි | - ඉගෙනගත යුතු දහ අටක් විද්‍යා ආදි වූ |
| අනේකශත ප්‍රභේද | - නොයෙක් සිය ගණන් කොටස්වලින් |
| භින්න ශිල්පයන් | - බිඳී ගිය ශිල්ප |
| අනන්‍යසාධාරණ | - වෙනත් කිසිවකු හා සමාන නැති |
| සුභගුණමණිගුණාකීර්ණ | - යහපත් ගුණ නැමැති මැණික් සමූහයෙන් ගැවසුණ |
| ඉක්ෂ්වාකුවංශ සම්භූත | - ඉක්ෂ්වාකු (ඔක්කාක) නැමැති වංශයෙහි උපන් |
| සිනිදස | - සෙනෙහස |
| දණ්ඩාඝාත | - ලීයකින් පහර කෑ |
| විෂඝෝර සර්පයන් | - දැඩි විෂ සහිත සර්පයන් |
| යුද්ධාභිමුඛව | - යුද්ධයට සූදානම් වී/මුහුණ ලා |
| තෙස්සෝ | - සෙසු අංග/ඉතිරි අය |
| ජාම්බෝනද ස්වර්ණයට බඳු වූ | - ජම්බු නදියෙහි උපන් රත්රන්වලට සමාන වූ |
| රන්කමින් විසිතුරු | - රත්රන් යෙදීමෙන් විචිත්‍ර වූ |
| තුවරලා | - එනම් සුවඳ ද්‍රව්‍යය |
| සුවඳ සුන්නෙන් උලා | - සුවඳ සුනු තවරා |
| ඔප් නගන ලද | - ඔප දැමූ/දැකුම් කලු කළ |
| දළ කඩ මිටු | - ඇත් දළ කැබැල්ලක් සවි කළ මිටක් ඇති |
| මුඛ බිම්බය | - මුහුණේ පිළිබිඹුව |
| දමන ලදුව | - අත්හැර දැමූ පසු |
| වලැ | - කැලයෙහි |
| අක් බඹුරු | - පොකුටු/අගින් කරකැවුණු |
| සාන්දු ජබාදු ආදි වූ | - එනම්වලින් හැඳින්වෙන සුවඳ ද්‍රව්‍ය |
| ආකුල ව්‍යාකුල කොට | - අවුල් වියවුල් කොට |
| තුනු ලොමින් | - ශරීරයේ ලෝමවලින් |
| කොක්නාවුන් විසින් | - ගිජු ලිහිණියන්/වෘකයන් විසින් |
| ස්වර්ණතාල ඵලයට බඳු වූ | - රනින් කළ තල් ගෙඩියක් වැනි වූ |
| ස්වර්ණ චක්‍රවාක යුගලය මෙන් | - රන් සක්වාලිහිණි යුවලක් මෙන් |
| නුහුණුවා වූ | - ඉවසා ගත නො හැකි වූ |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

| | |
|---|---|
| වටමට වූ | - රවුම් වූ ද ඔප මට්ටම් වූද |
| කොකුමඟරා | - කුංකුම නැමැති සුවඳ ද්‍රව්‍යයෙන් |
| මුතුහරින් | - මුතුවැලින් |
| තලා හඬා වෙලා | - තැලීම ඇඹීම සහ වෙළීමෙන් |
| කැට කරන ලද | - කැටි කළ |
| රන් රසු දැල් | - රනින් කළ කුඩා ගෙජ්ජි වැල්/රනින් සෑදූ රහුගෙඩි වැල් |
| රසායනය | - රසයක් ලබා දෙන වස්තු/ඉන්ද්‍රිය පිනවන වස්තු |
| යාඥාව කියාත් | - අයාචනා කළත් |
| දෙමං අතුරෙක්හි | - මාර්ග දෙකක් ඇති ස්ථානයක් අතර |
| හිම කාලයාගේ | - හිම වැටෙන කාලයේ |
| රන්සුමුගක් පුරා | - රනින් කළ කරඬුවක් පුරා |
| ඔරපිට | - උකුළෙහි |
| කොළඹුවක් | - වාඩි වීම සඳහා ලීයෙන් සෑදූ උපකරණයක්/ලී කොටයක් |
| හැසුණු | - මනා ලෙස පිරුණු/ හැඩගැසුණු |
| සිඟුවලග | - ඉඟ ප්‍රදේශය |
| එම පිය නො මැකෙන තෙක් | - ඒ පා සටහන් මැකී යන්නටත් පෙර |
| යමපුරයට | - යමයාගේ පුරයට |
| අනය ව්‍යසනයට | - අක්‍රමවත් විපත්වලට |
| උදුල | - බැබළුණු |
| මේඛලාදාමයෙන් | - මෙවුල්දමෙන්/කාන්තාවන් ඉණේ පලඳන ආභරණයක් |
| විරාජමාන | - බබළන |
| අසම්භින්න | - නො කැඩුණු/නොබිඳුණු |
| සූර්යවංශ ප්‍රසූත | - සූර්ය වංශයෙහි උපන් |
| ශෞරවීර්ය වික්‍රම සමන්විත | - ශුර, වීර, වික්‍රම යන ගුණාංගවලින් යුක්ත |
| සම්භාවනා | - ගරු කිරීම් |
| මණිකනක | - මැණික් සහ රත්රන් |
| ප්‍රතිභාග | - වැනි වූ |
| පංචාංගික | - අංග පහකින් යුක්ත |
| අනවරතයෙන් | - නිතර |
| අනේකශතමත්තහස්තීහු | - නොයෙක් සිය ගණන් මත් වූ ඇත්තු |
| විභූෂිත | - සරහන ලද |

| | |
|---|---|
| සිද්ධ විද්‍යාධරයන් | - බෙහෙත් බලයෙන් ද විද්‍යාත්මක වශයෙන් ද හාස්කම් කරන්නාවුන් |
| අනන්‍ය සාධාරණ | - (න+අන්‍ය> අනන්‍ය) වෙනත් කිසිවෙකු සමීපයෙහි දක්නට නො ලැබෙන |
| ගුණගණාභරණ විභූෂිත | - උසස් ගුණ සමූහය නැමැති ආභරණවලින් සැරසුණ |
| ශෞර්‍යවීර්‍ය | - ශූර සහ වීර |
| බලපරාක්‍රම | - ශක්තිය සහ පරාක්‍රමය (වීරත්වය) |
| ප්‍රතාප ප්‍රඥාගුණ ඇති | - අනුන් තවන සුලු ගුණය සහ නුවණ යන ගුණවලින් යුක්ත |
| ආළාරිකව | - තමන්ගේ ශක්ති විශේෂය ප්‍රදර්ශනය නො කොට |
| අඥානයෙන් මූඪ වූ | - නො දැනුවත්කමින් මුළා වූ |
| සකලරාජ | - සියලු රජවරුන්ගේ |
| මෞලිමාණික්‍යකාන්තීන් | - ඔටුනුවල මැණික් එළිවලින් |
| පරිභව බිණූ ය | - අපහාසාත්මක වචන කීවා ය |
| ත්‍රිවිධ වේදපාරප්‍රාප්ත | - ත්‍රිවේදයෙහි පරතෙරට පැමිණි |
| සදාචාර නිරත | - යහපත් හැසිරීමෙහි නියුක්ත |
| මධුරාන්නපානයෙන් | - මිහිරි ආහාර පානවලින් |
| සන්තර්පණය කරවන | - සතුටට පත් කරවන |
| සුඛිත මුදිත | - සුවයට සහ සතුටට පත් වූ |
| ගෘහෝද්‍යාන | - ගෙ උයන් |
| විද්‍යුල්ලතා සශ්‍රීක | - විදුලිය එළියෙන් පිරී ගිය |
| මිහිගු බෙර හඬින් | - මෘදංග නමින් දැක්වෙන බෙර විශේෂයෙහි නාදයෙන් |
| කෙකානාදයෝ | - කේකාරාව, මොනර හඬ |
| අනුරාගයෙන් හරිත වේ ද | - රාගී හැඟීම්වලින් බර වේ ද |
| ශ්‍රී සෞභාග්‍යය හා ඓශ්චර්ය විශේෂ | - සුන්දර භාවය සහ සම්පත් රාශිය |
| සකල ශත්‍රු මර්දනය කරන්නා වූ | - සියලු සතුරන් මැඩ පවත්වන්නා වූ |
| රන්සත් | - රනින් කළ කුඩ/ඡත්‍ර |
| රන් පොරෝදු | - ඇත් බඳ මැද බඳනා රන් යොත් |
| රන් සන්නාහය | - රනින් කළ යුද ඇඳුම |
| කනක ගිරි සිඛර සුන්දර වූ | - රත්රන් පර්වත මුදුන් මෙන් දැකුම්කලු වූ |
| සතතයෙන් | - නිතර |
| ප්‍රචණ්ඩ මාරුතයෙන් | - සැඩ සුළඟින් |
| මේඝකූට නිකර | - වැසි වලා සමූහයෙන් |
| රාජ වාහන යෝග්‍ය වූ | - රජ කෙනෙකුට ගමන් කිරීමට සුදුසු වූ |
| සුරලෝකාවතීර්ණ වූ | - දෙව් ලොවට බැස ආ |
| ධවලාතපත්‍රයෙන් | - අව් රශ්මියට ඔසවන සුදු කුඩයෙන් |

| | |
|---|---|
| චාරුචාමරනිකරාකීර්ණ | - (චාරු+චාමර+නිකර+ආකීර්ණ)<br>මනෝඥ, වල්විදුනා සමූහයෙන් ගැවසුණු |
| මලෝලඹු මල්දම් | - (මල්+ඕලඹු) මල් එල්ලන ලද මාලාදාම |
| රන් මිණි කිකිණි දැලින් | - රන්, මැණික් සහ කිංකිණි දැල්වලින් |
| ධරණීතලාවතීර්ණ | - පොළවට බැස ගත් |
| අභ්‍රකූට සහස්‍රයෙන් | - වැසි වලා දහස් ගණනින් |
| ඝනගර්ජනාකාර | - වැසි වලාවක ගෙරවුම් හඬට සමාන හඬක් ඇති |
| නිසාන | - බෙර විශේෂයක් |
| තප්ලා | - තප්පුලා |
| රක්ත නීල ශ්වේත කෘෂ්ණාදි වූ | - රතු, නිල්, සුදු, කළු ආදි වූ |
| වර්ණෝජ්වලිත | - වර්ණවලින් දීප්තිමත් වූ |
| ග්‍රීෂ්ම සන්තාපයන් | - අව් රශ්මිය නිසා ඇති වන පීඩන |
| සක්ත වූ | - ඇලුණු |
| තුංග තරංග භංගාකාර | - උස් වූ මුහුදු රළ බිඳෙන ස්වරූප ඇති |
| ක්ෂීර දෝහනය | - කිරි දෙවීම |
| යශෝවිභූතිය | - කීර්ති කදම්බය/කිත් රැස |
| දස් කොට | - දාස තත්ත්වයට පත් කොට |
| අසම්භීතව | - බියෙන් තොරව |
| සකල භුවන ශේඛර වූ | - මුළු පොළෝ තලයටම මුදුන් මල් කඩක් වූ |
| වෙස් වළා | - වෙස් මාරු කොට ගෙන |
| මීට අවුත් | - මේ ස්ථානයට පැමිණ |
| බද්ධාඤ්ජලීව | - බැදැඳිලි ඇතිව/වැඳ/නමස්කාර කොට |
| සම්ප්‍රාප්ත වූ රාජ්‍යශ්‍රීය | - ලැබුණු රජ සැපත |
| බද්ධාභිලාෂයෙන් | - බලාපොරොත්තුවෙන් යුක්තව |
| අකර්තව්‍යය | - නො කළ යුතු දේ |
| පිළිසඳර කථා | - සුව දුක් විමසීම් වශයෙන් කෙරෙන කථා |
| සන්තෝෂ ප්‍රාප්තව | - සතුටට පත්ව |
| මාගේ පාපිට | - මාගේ පා මත |
| මඩෙහි ම වැද හොවමි | - මඩ ගොඩෙහි දමා නිදි කරවමි |
| කලවිටක් | - කමතක් |
| පත්ලෙහි ඉස තබා | - පතුල් මත හිස තබා |
| ස්වර්ණ තාලස්කන්ධයක් | - රන් තල් කඳක් |
| මෘදු කෝමල පාණි යුගලයෙන් | - මෘදු වූ ද සියුම් වූ ද අත් දෙකින් |
| තරුණාරුණ කිරණ සම්පර්කයෙන් | - තරුණ වූ අරුණාලෝකය සමග ගැටීමෙන් |
| ප්‍රවිකසිත වූ | - මනාව පිබිදුණු |

| | |
|---|---|
| සන්ධ්‍යාරාග නිර්විශේෂ | - සන්ධ්‍යා කාන්තියට වඩා වෙනස් නො වූ |
| ප්‍රභා භාසුර | - කාන්තියෙන් දීප්තිමත් වූ |
| පාදපද්ම යුගලය | - පා පියුම් යුවල |
| ස්නාන පාන රහිත වීමෙන් | - නෑම සහ බීම නො මැති වීමෙන් |
| සත්‍ය වචනයක් ඇති කියමි | - ඇත්ත වූ යමක් ප්‍රකාශ කරන බව කියමි |
| ක්ෂත්‍රියමාන | - ක්ෂත්‍රිය කුලයෙහි උපන් නිසා ඇති වන ගර්වය |
| පැලඹෙමින් | - උද්දාමයට පත් වෙමින් |
| ශත්‍රු මථනය | - සතුරන් මර්දනය කිරීම/යටත් කිරීම |
| දැළි රැවුලු අන්දම් තිබීම් | - අන්දම් තබා දැළි රැවුල් කැපීම |
| දශ මේ තැන් පිරිවරා | - තනතුරු ලැබූ දස පිරිසක් පිරිවරා |
| ප්‍රාණාර්ථ කෙනෙක් | - ජීවත් වීමට අපේක්ෂා කරන්නෙක් |
| බඩින් තලා යෙත්වයි | - බඩ ගා ගෙන යෙත්වා |
| අසනි සම්පාත නිර්ඝෝෂ ඝෝර කොට | - අකුණු හඬ තවත් දැඩි කොට |
| පර්වත ඝන වන ගහනාදියට වන් | - පර්වත සහිත විශාල කැලෑවකට ඇතුළු වූ |
| ඝන ගර්ජනාකාර භීම නාද ඇති | - මේඝ ගර්ජනාවක ඇති බියකරු හඬක් තිබෙන |
| භීම සේනානුකාරී | - භීම නැමැති පාණ්ඩවයාගේ සේනාව අනුකරණය කරන්නා වූ |
| යෝධාභිරූඪ | - යෝධයන් නැග සිටින |
| කරවාරණේන්ද්‍ර සේනාව | - නායක ඇත් සේනාව |
| ප්‍රලයකාල | - කල්පාන්තයෙහි මුහුදේ කැලඹීම ඇති වන කාලයෙහි |
| ප්‍රවෘත්තෝදාර චණ්ඩ මාරුතාභිඝාත | - පැවතුණු අති විශාල දරුණු සුළඟ ගැටීමෙන් |
| සිංධුතුංග තරංග භංගානුකාරී රංග | - මුහුදෙහි උස් වූ තරංග සමූහය බිඳගෙන යන ස්වරූප ඇති |
| තුරංගානුධිෂ්ඨිත | - අශ්වයන් පිට නැගුණු |
| යුද්ධමර්දනාභිලාෂ ඇති | - යුද්ධය මර්දනය කිරීමේ අපේක්ෂාවක් ඇති |
| අස්රුවන් විසින් උපලක්ෂිත | - අශ්වාරෝහකයන්ගෙන් සැදුම් ලත් |
| වේරම්බ වාතයෙන් ප්‍රේරිතව | - වේරම්බ නැමැති සුළඟින් මෙහෙයවන ලදුව |
| ඝෝර නිර්ඝෝෂ පවත්වමින් | - දරුණු වූ රාව ප්‍රතිරාව නංවමින් |
| දිගාන්තරාභිධාවනය කරන | - දිශා කෙළවරට ම දුවන්නා වූ |
| විද්‍යුල්ලතා සහස්‍රයෙන් සශ්‍රීක වූ | - විදුලිය දහස් ගණනින් පෝෂණය වූ |
| මේඝකූටානුකාරී | - වැහි වලාකුළු අනුකරණය කරන්නා වූ |
| ධජපතාකාභිකීර්ණ | - ලොකු කුඩා කොඩිවලින් ගැවසුණු |
| ගම්භීර චක්‍ර ධ්වනි | - රෝදවලින් නැගෙන ගැඹුරු හඬ ඇති |
| ප්‍රචණ්ඩ දෝරදණ්ඩ කෝදණ්ඩ කාණ්ඩාභිලක්ෂිත | - දෝර්දණ්ඩ කෝදණ්ඩ ආදි දුනු හීතල ගත් ඉතා දරුණු |


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

| | |
|---|---|
| යෝධාධිෂ්ඨිත | - යෝධයන් නැග සිටින |
| නානා වේශ ග්‍රහණ භීෂණ වූ | - විවිධ වූ වෙස් ගැනීමෙන් බිහිසුණු වූ |
| දුර්වාර ගර්වෝද්ධත | - නො වැළැක්විය හැකි අහංකාරකමෙන් උඩඟු වූ |
| පවනාතිපාතවේග | - සුළගේ වේගය ඉක්මවා සහ වේගයක් ඇති |
| ඛඩ්ග මුද්ගර තෝමර කුන්ත චාරුචාප බාණාදි | - කඩු, මුගුරු, තෝමර, කුන්ත, දැකුම්කලු දුනු, ඊතල ආදි |
| විවිධායුධග්‍රහණාතිභීෂණ | - විවිධ වූ ආයුධ ගැනීමෙන් අති බිහිසුණු වූ |
| භයෝන්මාදයෙන් මූර්ජාවට පැමිණ | - බිය නිසා ඇති වන උමතු බවින් සිහි මුළාවට පත් ව |
| වටා දිව පැන | - වටේට දුවමින් ඉවතට පැන ගොස් |
| මේරුසාර | - මහා මේරු පර්වතය මෙන් සාරවත් වූ |
| මන්දර පර්වතයෙන් අළලන ලද | - මන්දර පර්වතයෙන් කලඹන ලද |
| පාණිග්‍රහණය | - අත ගැනීම |
| රණධරණී මධ්‍යයෙහි | - යුද බිමේ මැද |
| විජය ශ්‍රී කාන්තාවගේ | - ජයග්‍රහණය නැමැති ශ්‍රී කාන්තාවගේ |
| විසුද්ධ | - අතිපාරිශුද්ධ/ඉතා පිරිසිදු |
| සඤ්ජාත ප්‍රීති ප්‍රමෝදයෙන් ප්‍රමුදිතව | - හටගත් ප්‍රමෝදය සහ ප්‍රීති යන දෙකින් උදම් වී |
| තරුණාර්ක රශ්මීන් | - තරුණ සූර්යයාගේ රශ්මියෙන් |
| ප්‍රදානයක් මෙන් | - විශේෂ දීමනාවක් මෙන් |
| තුෂ්ටි දානයෙන් | - සතුටින් දෙන දීමක් වශයෙන් |
| දිවි දළන් | - දිවියන්ගේ දත් |
| ඓරාවණ වාහානාරූඪ | - ඓරාවණ නම් ඇතා පිට නැග |
| වහල් මේ | - වහල් මෙහෙය/වහල් කටයුතු |
| ව්‍යර්ථ | - නිෂ්ඵල |
| ස්ත්‍රීරත්න ප්‍රතිලාභයෙන් | - කාන්තා රත්නයන් ලැබීමෙන් |
| උපාය කෞශල්‍යඥානය | - ප්‍රයෝගයෙහි කුශලතාඥානය/උපාය යෙදීමෙහි ඇති දක්ෂතාව සම්බන්ධ නුවණ |
| චිත්‍ර කර්මෝජ්වලිත | - සිතුවම්වලින් බැබළුණු |
| විමානස්ථව | - විමානයේ හිඳ |
| සිද්ධ යුගලයක් පරිද්දෙන් | - බෙහෙත් බලයෙන් හාස්කම් කරන යුවලක් ලෙස |
| නෙත්‍රෝත්සව | - (නේත්‍ර+උත්සව) ඇසට ප්‍රිය උපදවන දර්ශන |
| ඒකාත්මිකව | - එක ම ආත්මයක් ඇත්තන් මෙන් |
| දිවි පමණින් | - ජීවිතය පවතින තාක් |
| සංසාර යාත්‍රාව | - සසරේ ගමන් කිරීම |
| සිවුවණක් | - වර්ග සතරකට අයත් |

| | |
|---|---|
| පර්ෂදට | - පිරිසට |
| දහසක් නයින් හෙබියා වූ | - ක්‍රම දහසකින් යුක්ත වූ |
| මන් මැඩ | - මානය දුරු කොට |
| සෙමෙහි තබා | - සාමය ඇති කොට |
| සර්වඥතා ඥාන | - සියල්ල දන්නා නුවණ/බුද්ධත්වයට පත් වන අවස්ථාවේ දී ලැබුණු විශේෂ ඥානය |
| ලත් ධන සතෙක් | - ලබා ගත් ආර්ය ධන හතක් |
| අප ලා ලා ආ රකවල් නැති හෙයින් | - අප විසින් තබා ආ වස්තුවකට යොදන ලද ආරක්ෂාවක් නැති නිසා |
| තුබුවා නැත | - තුබූ දෙයක් නැත/රැක ගත් දෙයක් නැත |
| මට මතු | - මට පමණක් |
| අනු නොදත් | - අනුමත නො කළ |
| බිතත | - බිත්තියෙහි |
| උකටලීව | - උදාසීන වී |
| හිසකේ හිණි නො ගන්නා තෙක් | - හිසකෙස් වියළෙන්නට/තෙත සිඳෙන්නට |
| එක් වන් | - එක විට |
| යහපත්තු ද | - යෝග්‍ය යැයි (සුදුසු දැයි) තීරණය කෙරේ ද |
| කෙලෙසුන් | - සිත දූෂණය කරන කරුණු/ධර්ම |
| කෙලෙසුන් ගෙවා ගන්ට නුවුව හොත් | - ක්ලේශයන් විනාශ කිරීමට නො හැකි වූවොත් |
| නියාවට | - ආකාරයට |
| බඹසර | - බ්‍රහ්ම චර්යාවෙහි/ශ්‍රේෂ්ඨ හැසිරීමෙහි |
| හැදහිලි | - විශ්වාසය/පිළිගැනීම |
| සංකමුත් | - පැවිදිකමත්/මහණකමත් |
| ගෙය කඹුරන්නා සේ | - ගෙය තුළ ම දුක් විඳිමින් වැඩ කටයුතු කරන්නා සේ |
| පෙරළි හන්ට තුබූ දෙයක් | - වෙනස් වී යෑමට තුබූ වස්තුවක්/පෙරළී යන්නට තුබූ දෙයක් |
| නො හෙන ලෙස | - නො වැටෙන ලෙස/නො පෙරළෙන ලෙස |
| තනා තබා ගන්නා සේ | - සකස් කොට තබා ගන්නා මෙන් |
| පෙරළා | - නැවත |
| සතර සීවටන් | - සතර සතිපට්ඨානය |
| මරා | - පහර දී |
| භවෝත්පත්ති නැති වීමට | - තවත් භවයක උත්පත්තිය ලැබීම නැති වීමට |
| ගම්භීරාරණ්‍ය | - විශාල වනාන්තර |
| ගල් පාවුළු | - කඳු බෑවුම් |

| | |
|---|---|
| අබවස | - ඉඩ ඇති තැන/නිදහස් තැන |
| හුණු | - වැටුණු |
| එක් විසි අන්වේෂණ | - සොයා බැලීම් විසි එකක්/ලාභ උපයන මාර්ග (උණ ගස් දීම, බුලත් දීම ආදි) විසි එකක් |

## ලිඛිත අභ්‍යාස

1. කුස ජාතකය පාඨක, ශ්‍රාවක සිත් තුළ හාස්‍ය රසය ජනනය කරන කතා වස්තුවකි. නිදසුන් තුනක්වත් යොදාගනිමින් පැහැදිලි කරන්න.
2. ජාතක කතාකරුවා මිනිසුන්ගේ ගුඪ සිතුවිලි දැන හැඳින ඒවා පාඨකයා හමුවේ ඉදිරිපත් කර ඇති ආකාරය කුස රජුගේ චරිතය ඇසුරෙන් විමසුමට ලක් කරන්න.
3. සැබෑ ලෝකයේ කාන්තාවකගේ චිත්ත ස්වභාවය පබාවතියගේ චරිතයෙන් නිරූපණය වෙයි. නිදසුන් තුනක්වත් දෙමින් සාකච්ඡා කරන්න.
4. කුස ජාතකයෙන් නිරූපණය වන්නේ සරාගී සිතුම් මිස පිවිතුරු සෙනෙහස නොවේ. කතා පුවත ඇසුරෙන් විමසන්න.
5. කුස ජාතක කතාවේ ප්‍රබල සංකල්ප රූප මැවෙන අවස්ථා තුනක් විමසුමට බඳුන් කරන්න.
6. ජාතක කතාකරුවා කුස ජාතකය රසවත් ව ඉදිරිපත් කිරීම සඳහා භාෂාව හසුරුවා ඇති ආකාරය පිළිබඳ විමසීමක් කරන්න.
7. ජාතක කතාකරු පබාවතිය කෙරේ පාඨක සිත් තුළ උපහාසය ජනනය කළ ආකාරය විස්තර කරන්න.
8. කුස ජාතකය කියවන විට දී හෝ අසා සිටින විට දී අපූර්ව වාග්චිත්‍ර මැවීම එම කතා පුවතේ විශේෂත්වයකි. එවන් අවස්ථා තුනක් පිළිබඳ විස්තර කරන්න.

# 3 සුභාෂිතය

## සීතාවක අවධිය

සිංහල උපදේශ කාව්‍යයක් පළමු වරට රචනා වන්නේ කෝට්ටේ සාහිත්‍ය සමයේ ය. ඒ වීදාගම මාහිමියන්ගේ **ලෝවැඩ සඟරාව යි**. දෙ වැන්න සීතාවක සමයේ අලගියවන්න මුකවෙටිතුමාගේ **සුභාෂිතය යි**. (ක්‍රි:ව: 1611)

කුසලයෙහි අගය, සුදන දුදන ගුණ, බොරු නො කීමේ අගය, උඩඟු නො වීම, උගතුන්ගේ ස්වභාවය ආදිය ඒවායෙන් පැහැදිලි කෙරේ. මේවා එදිනෙදා සමාජයේ ජීවත් වන විට අවශ්‍ය වන සාරධර්ම ය. සුභාෂිතයේ පද්‍ය, උපමාවලින් අලංකාර කර තිබීම විශේෂත්වයකි. ඉදිරිපත් කෙරෙන උපදේශ පොදු ජනයාට පහසුවෙන් වටහා ගත හැකි වන පරිදි එදිනෙදා ජීවිතය හා බැඳෙන වෙනත් සිද්ධි සමග සම්බන්ධ කරමින් රචනා කර ඇත.

නැ ණැ ති දනන්හට මඳ ගුණයක් කළ ද
ප ව ති ගල කෙටූ අකුරක් මෙන් නිබඳ
වි ම ති දනන්හට කළ කිසි ගුණ නොමඳ
එ නැ ති වේ ය දිය පිට ඇඳි ඉරක් ලෙද

සුභාෂිතය ලිවීමේ අරමුණු කෘතියේ ම සඳහන් වේ. **පාලි, සංස්කෘත නො දන්නා අයට නීති ශාස්ත්‍රය ඉගෙන ගැනීමට උපකාර කිරීම එම අරමුණ යි.** ඒ බව පහත කවියෙන් පැහැදිලි වේ.

පහළ පොරණ ඉසිවර මුවෙහි මන නඳ
දෙමළ සකු මගද නො හසළ සතට දද
පුවළ නීති සක ගත පද අරුත් ලෙද
සිහළ බසින් සැකෙවින් කියමි පද බැඳ

සුභාෂිත කතුවරයා **හිතෝපදේශය, පංචතන්ත්‍රය, කුවලයානන්ද** ආදි සංස්කෘත පොත්වල ඇසුර ලබා ගෙන ඇත; **ධම්ම පදය** වැනි පාලි පොතපතේ උපදේශ ද ඍජුව ම උපුටා ගෙන ඇත; අඳුරෛ, නාල්වලි ආදි ද්‍රවිඩ පොත්වල සඳහන් උපදේශ ද ආශ්‍රය කර ගෙන ඇත.

මෙහි එන පද්‍ය සියය ම සමුද්‍රඝෝෂ විරිතෙන් ලියා තිබේ. මිනිස් දුර්වලතා දෙස උපහාසයෙන් බලා පාඨක මුවගට සිනාවක් නැගෙන අයුරින් උපදේශ ඉදිරිපත් කිරීම එම කවියාට ප්‍රිය වූ උපක්‍රමයකි. **සුභාෂිතය** රචනා කිරීමේ දී වෙනත් පොත්වලින් අදහස් ලබා ගත්ත ද ඒවා ඉදිරිපත් කර ඇති ආකාරයෙන් කවියාගේ ස්වාධීන කාව්‍ය ප්‍රතිභාව ද ප්‍රතීයමාන වේ.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

පුද්ගල ගුණදහම් පිරිහී යන ඕනෑම සමාජයක් උදෙසා උපදෙස් දීමට මෙම පද්‍ය ගුරු කොට ගත හැකි ය. එමගින් පුද්ගල උන්නතියත් සමාජ යහපතත් වර්ධනය වන බව සඳහන් කළ හැකි ය. ගැඹුරු ජීවන දර්ශනයක් සරලව පහදා දීමත් කාලයකට දේශයකට පමණක් සීමා නො වීමත් උපදේශ කාව්‍යවල කැපී පෙනෙන ලක්ෂණයකි. **සුභාෂිතය** ඒ සියල්ලට හොඳ ම නිදසුනකි.

| | | | |
|---|---|---|---|
| 1. | නැ ගෙ ත ත් | අවර ගිරගින් දිනකර | මඬල |
| | සැ ලෙ ත ත් | සුනෙර පවනින් සෙදෙතත් | අනල |
| | පි පෙ ත ත් | ගිරි මුඳුන හෙල් මැලි | පියුමු'පුල |
| | බොරු නැත් | තෙ ම ය මහතුන් පැවසූ | තෙපුල |

| | | | |
|---|---|---|---|
| දිනකර | - හිරු | සුනෙර | - මහමෙර |
| සෙදෙතත් | - සිසිල් වුවත් | හෙල් මැලි | - කුමුදු මල් |
| තෙපුල | - වචනය | අනල | - ගින්න |

**අදහස:**

සූර්යයා අපර පර්වතයෙන් උදා වුවත්, මහා මේරු පර්වතය සුළඟින් සෙලවෙතත්, ගින්න සිසිල් වුවත් පර්වත මුදුනෙහි කුමුදු, නෙලුම්, මානෙල් මල් පිපෙතත් මහාත්මයන් කී වචනයෙහි නම් බොරුවක් නැත්තේ ම ය.

| | | | |
|---|---|---|---|
| 2. | කො තෙ ක් | වෙහෙස ලදුවත් සුදනෝ | පවර |
| | උ ද ක් | ලොව සතුන් සිත දුක් කෙරෙති | දුර |
| | ප ස ක් | රාහු මුව පත් වෙමිනි බිය | කර |
| | අ නි ක් | පසින් ලොව හෙළි කෙරෙය | හිමකර |

| | | | |
|---|---|---|---|
| පවර | - උතුම් | උදක් | - ඒකාන්තයෙන් ම |
| හිමකර | - සඳ | රාහු මුව පත් | - රාහුගේ මුඛයට ඇතුළු වූ |

**අදහස:**

කොතරම් වෙහෙසට පත් වුවත් උතුම් සත්පුරුෂයෝ ලෝක සත්ත්වයාගේ සිතෙහි පවතින දුක ඒකාන්තයෙන් ම ඉවත් කරති. චන්ද්‍රයා තමාගේ පැත්තක් භයංකර වූ රාහුගේ කටට අසු ව තිබියදීත් අනෙක් පැත්තෙන් ලෝකයට එළිය ලබා දෙයි.

| | | | |
|---|---|---|---|
| 3. | පි න් ම ඳ | පුතුන් සියයක් ලදුවත් | නිසරු |
| | ගු ණ නැ ණ | බෙලෙන් යුතු පුතු ම ය ඉතා | ගරු |
| | එ ක පු න් | සඳින් දුරු වෙයි ලොව ගන | අඳුරු |
| | නෙ ක ත රු | රැසින් එ ලෙසට නො ම වේ ය | දුරු |

| | | | |
|---|---|---|---|
| පින් මඳ | - පින් අඩු | නිසරු | - නිස්සාර/සරු නැති |

අදහස:

පින් අඩු ප්‍රයෝජනයක් නැති පුතුන් සියයක් ලැබුණත් පලක් නැත. ඉතා උතුම් වන්නේ ගුණයෙන් ද නුවණින් ද බලයෙන් ද යුත් පුත්‍රයා ම ය. ලෝකයෙහි ගන අඳුර එක පුන් සඳක් නිසා දුරු වේ. නොයෙක් තාරකා රාශියක එළියෙන් ඒ ආකාරයට අඳුර පහ නො වේ.

4. විපුල ගුණැති මහතුන් හට පත් විපත
නිසල නැණින් යුතු උතුමෝ ම දුර ලත
කලල ගිලුණු මත වරණිඳු ගොඩ ගනුත
තුමුල බලැති ගිජිඳකු මිස අන් කෙවත

| | | | |
|---|---|---|---|
| විපුල | - මහත් | නිසල නැණින් | - තැන්පත් නුවණින් |
| කලල | - මඩ | මත වරණිඳු | - මඳ කිපුණ ඇත් රජු |
| තුමුල බලැති | - විශාල ශක්තියක් ඇති | ගිජිඳා | - ඇතා |

අදහස:

මහත් ගුණයෙන් යුත් මහාත්මයනට පැමිණි විපත්තිය තැන්පත් නුවණින් යුක්ත වූ උත්තමයෝ ම දුරු කරති. මඩෙහි එරුණා වූ මත් ඇත්රජු ගොඩ ගැනීමට මහත් බල ඇති (තවත්) ඇත්රජකු මිස වෙන කවරෙක් සමත් වේ ද?

5. කුලුණු ගුණින් යුතු උතුමන් සිත මහරු
දුදන බසින් නො යෙදෙයි කරනට නපුරු
නව රුවනින් පිරි මහ සමුදුර ගැඹුරු
තණ සුළකින් උණු කළ හැකි වෙති කවුරු

| | |
|---|---|
| මහරු | - මාහැඟි (ඉතා වටිනා) |
| දුදන | - දුර්ජනයන්ගේ (අසත් පුරුෂයන්ගේ) |
| බසින් | - වචනයෙන් |

අදහස:

කරුණා ගුණයෙන් යුක්ත වූ උතුමන්ගේ ඉතා වටිනා සිත අයහපත් පුරුෂයන්ගේ වචනවලින් නපුරු තත්ත්වයකට පත් කිරීම නුසුදුසු ය ය. නවරත්නයෙන් පිරුණා වූ ගැඹුරු මහා වූ සාගරය තණ කොළ හුළකින් උණු කිරීමට කවර නම් කෙනෙක් පොහොසත් වෙත් ද?

6. දියනෙත  උදා වත සිය කිරණින්  මහරු
මෙදියත  දිවා බිහි දුරු වෙයි ගන  අඳුරු
සිරිමත  රජ තුමකු දුටු පමණින්  සොඳුරු
ඇතුළත  පිටත දිව රෑ හැරෙය  දුක'ඳුරු

| | | | |
|---|---|---|---|
| දියනෙත | - සූර්යයා | මහරු කිරණින් | - මාහැඟි රශ්මියෙන් |
| උදා වත | - උදා වන කල්හි | මෙදියත | - මේ ලෝකයෙහි |
| දුක'ඳුරු | - දුක (නමැති) අන්ධකාරය | | |

**අදහස:**

සූර්යයා තම මාහැඟි රශ්මියෙන් යුක්ත ව උදා වන කල්හි මේ ලෝකයේ දාවල් කාලයේ පිටතින් පවතින ගන අඳුර දුරු වෙයි. ශ්‍රීමත් වූත් යහපත් වූත් රජතුමකු දුටු පමණින් ම දවාලෙහිත් රාත්‍රියෙහිත් ඇතුළත හා පිටත පවතින දුක නමැති අඳුර පහ වී යයි.

7. රු දු රු  ගිනි කඳක් ගත් සඳෙහි  වන'තුරු
මි තු රු  වේ ය දිගතින් හමන මඳ  මරු
මි තු රු  නැසීමට එ ම වෙයි  පසමිතුරු
මි තු රු  නෑ කෙනෙක් නිවතුන් හට  කවුරු

| | | | |
|---|---|---|---|
| වනතුරු | - වනාන්තරයේ | දිගතින් | - දිශා කෙළවරින් |
| මඳ මරු | - හෙමින් එන සුළඟ | පසමිතුරු | - සතුරු |
| නිවතුන් | - දුප්පතුන් | | |
| මිතුරු නෑ කෙනෙක් - යහළුවෙක් හෝ නෑදැයෙක් | | | |

**අදහස:**

වනාන්තරයෙහි රෞද්‍ර වූ ගිනි කඳක් හට ගත් විට දිශා කෙළවරින් හමන්නා වූ මඳ සුළඟ ඒ ගින්න සමඟ මිත්‍ර වේ. (එනම්, පැතිරීමට උදවු වේ.) ඒ සුළඟ ම පහන නිවීමෙන් (ඊට) සතුරු වෙයි. දුප්පතුනට මිත්‍ර වන්නා වූ, හෝ ඥාති වන්නා වූ හෝ අය කවරහු ද?

8. න පු රු  කලට සත හට පැමිණෙත  වෙහෙස
එ දු රු  නො වෙයි කළ පව් පල දෙවා  මිස
ත ඹු රු  වනය මුකුලිත වන බව  සවස
ක වු රු  විසින් වැළකිය හැකි මෙ දිය  කුස

| | | | |
|---|---|---|---|
| නපුරු කලට | - නරක කාලයට | තඹුරු වනය | - නෙලුම් විල |
| මුකුලිත | - පරවීම | මෙ දිය කුස | - මේ ලෝකය තුළ |

අදහසඃ

නරක කාලයට සත්ත්වයාට දුක් කරදර පැමිණෙන විට, කරන ලද පව්වලට විපාක ලබා දී මිස ඒ (දුක් කරදර) දුරු නොවේ. නෙලුම් වනය සවස් කාලයෙහි හැකිළී යෑම මේ ලෝකයෙහි කවරකු විසින් නම් වැළැක්විය හැකි ද?

9. කු රි රු ගොර සපුන්ගේ දළ'ගෙහි විසය
ම දු රු මැසි කැලන්ගේ තුඬ'ගෙහි විසය
රු දු රු නුහුසුවන්ගේ වල'ගෙහි විසය
න පු රු දුදනන්ගෙ සියල'ගෙහි ම විසය

| | | | |
|---|---|---|---|
| තුඬ'ගෙහි | - තුඩ කෙළවර | නුහුසුවන් | - ගෝනුස්සන් |
| වල'ගෙහි | - වලිගය අග | සියල'ගෙහි ම | - සියලු ශරීරයේ ම |

අදහසඃ

කෲර වූ ඝෝර සර්පයන් ගේ දළ කෙළවර විෂ ඇත. මැසි මදුරු සමූහයාගේ තුඩ කෙළවර විෂ ඇත; රෞද්‍ර වූ ගෝනුස්සන්ගේ වලිගය අග විෂ ඇත; නපුරු දුර්ජනයන්ගේ ශරීරය මුළුල්ලේ ම විෂ ඇත.

10. ප ර සි ඳු පබු දනන් සෙවි පමණින් මහරු
බෙලෙනිඳු මඳ වුවත් නො කෙරෙති රුපුන් සරු
බ ර ණි ඳු ගෙල වසන නා රද වෙමින් ගරු
ගු රු ළි ඳු අතින් ඇසි කිම යහළු තොරතුරු

| | |
|---|---|
| මහරු | - පිදිය යුතු වූ |
| පබු දනන් | - ප්‍රභූ ජනයා |
| සෙවි පමණින් | - ඇසුරු කළ පමණින් |
| රුපුන් සරු | - සතුරන් වැඩි කර ගැනීම (සතුරන් හට සැලකීම) |
| බරණිඳු ගෙල | - ඊශ්වරයාගේ බෙල්ලේ |
| ගරු වෙමින් | - ආඩම්බර වෙමින් |
| ගුරුළිඳු අතින් | - ගුරුළාගෙන්, ගුරුළු රාජයාගෙන් |

අදහසඃ

ප්‍රසිද්ධ වූත් පිදිය යුතු වූත් ප්‍රභූ ජනයා ඇසුරු කළ තරමින් (දුබලයෝ) බලයෙන් අඩු වුවත් සතුරනට නො සලකති. ඊශ්වරයාගේ බෙල්ලෙහි වසන නාග රාජයා අහංකාර වෙමින් ගුරුළු රාජයාගෙන් 'මිත්‍රය, දුක සැප කෙසේ දැ'යි ඇසූ පරිද්දෙනි.

11. නැණැති   දනන් හට මඳ ගුණයක්   කළ ද
    පවති   ගල කෙටූ අකුරක් මෙන්   නිබඳ
    විමති   දනන් හට කළ කිසි ගුණ   නොමඳ
    එනැති   වේය දිය පිට ඇඳි ඉරක්   ලෙද

| | |
|---|---|
| විමති දනන් | - අනුවණ මිනිසුන් |

**අදහස:**

නුවණැති ජනයාට යම්තම් යහපතක් කළත් එය ගලෙහි කෙටූ අකුරක් මෙන් නො කඩවා පවතී. අඥාන ජනයාට විශාල යහපතක් කළත්, එය දිය පිට ඇන්දා වූ ඉරක් මෙන් නැති වී යයි.

12. අමිත   ගුණ නුවණ යුතු උතුමෝ   පබඳ
    අනත   වෙහෙස ලදුවත් නො ම වෙති   දුහද
    දිගත   පතළ සුවඳැති සොඳ සඳුන්   කඳ
    සිඳිත   මඬිත එක ලෙස පැතිරෙයි   සුවඳ

| | |
|---|---|
| අමිත | - අප්‍රමාණ |
| පබඳ උතුමෝ | - ප්‍රසිද්ධ පුද්ගලයෝ |
| අනත | - අනන්ත වූ/ කෙළවරක් නැති |
| දුහද නොම වෙති | - දුෂ්ට හදවත් ඇති කර නොගනිති |

**අදහස:**

අප්‍රමාණ වූ ගුණයෙන් හා නුවණින් යුත් සුප්‍රකට උත්තමයෝ කෙළවරක් නැති හිරිහැරවලට පාත්‍ර වුවත්, දුෂ්ට සිතක් ඇති කොට නොගනිති. දස දිශාවෙහි පැතුරුණා වූ සුවඳින් යුත් යහපත් සඳුන් දණ්ඩ කපන විටත්, කුඩු කරන විටත්, එක් විදියට ම සුවඳ පැතිරි යයි.

13. කොතෙක්   ගුණ කළත් දුදනන් හට   අසුබ
    අකක්   පමණ වත් නොම කෙරෙති   පිළිලබ
    එ උක්   රසෙහි සැදුවත් නිඹ බිජු   කිරඹ
    උදක්   තිත්තමය පසඟ ම තුරෙහි   නිඹ

| | | |
|---|---|---|
| අකක් පමණ වත් | - | මඳක් වත්/ අක් ගෙඩියක් පමණ වත් |
| පිළිලබ | - | ප්‍රතිලාභයක් |
| කිරඹ | - | කිරි හා ජලයෙන් |
| නිඹ බිජු | - | කොහොඹ ඇට |
| නිඹ තුරෙහි | - | කොහොඹ ගසෙහි |

**අදහස:**

අයහපත් අසත්පුරුෂයන් හට කොතරම් යහපතක් කළත් (ඔවුහු) අක් ගෙඩියක් පමණවත් ආපසු දීමක් නො කරති. උක් පැණිවල බහා කිරි හා ජලය වත් කොට කොහොඹ ඇටයක් පැළ කළත් කොහොඹ ගසෙහි (නම්) පංචාංගය ම තනි කර තිත්ත ම ය.

14. ස ඳු න්    කපුරු සමඟින් පිනි දිය    නොමඳ
සොඳින්    කලල් කරමින් සුවඳ මුව    මද
නිතින්    හිම'ඹ ඉස ඉස ලුහුනු වැව්ව    ද
තමන්    ගුණය නො හරින වැනි දුදන    හද

| | | | |
|---|---|---|---|
| ලුහුනු වැව්ව ද | - ලූනු වැව්වත් | හිම'ඹ | - හිම ජලය |

**අදහස:**

සඳුන් හා කපුරු ද සුවඳැති කස්තුරි ද යන මේවා පිනිදිය බොහෝ ප්‍රමාණයක් සමග කලතා (එයත් සමඟ) හිම ජලය ඉසිමින් ලූනු වැව්වත් ලූනුවල ගුණය අත් නො හැරේ. අසත්පුරුෂයාගේ හදවතත් එ බඳු ය.

15. මි   නි   ස්    හට සොඳුරු ගුණ සහ නුගුණ    ඇත
නි   දො   ස්    කෙනකු මෙදියත උපදනේ    නැත
වෙ   සෙ   ස්    සිනිඳු මුවරඳ බර සහස්    පත
කො   රො   ස්    නළින් යුතු වෙයි කටු පෙළිනි    යුත

| | | | |
|---|---|---|---|
| මෙදියත | - මේ ලෝකයේ | වෙසෙස් | - විශිෂ්ට වූ |
| මුවරඳ බර | - මල් පැණියෙන් බර | සහස්පත | - නෙලුම් මල |
| කොරොස් නළින් - කොරසැඩි දණ්ඩකින් | | | |

**අදහස:**

මිනිසා තුළ යහපත් ගුණ මෙන් ම අයහපත් ගුණ ද ඇත්තේ ය. දොස් නැති පුද්ගලයකු මෙලොව උපදින්නේ නැත. විශේෂයෙන් ම මොළොක් වූ මල් පැණියෙන් බර වූ නෙලුම් මල, කටු සහිත කොරසැඩි දණ්ඩකින් යුක්ත වෙයි.

16. ලොවින්    එකෙක් එක දෙයකට වෙයි    සමත
වෙනින්    අනෙක් දෙයකට අනෙකෙක්    සමත
නොමින්    සුළඟ ලදුවත් තද ගිම්    සැපත
ගොඩින්    නැව දියෙන් රතය ද    නොයනු ඇත

| | | | |
|---|---|---|---|
| සමත | - දක්ෂ | නොමින් | - අප්‍රමාණ ලෙස |
| තද ගිම් සැපත | - දැඩි ග්‍රීෂ්ම සම්පත්තිය | | |


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

අදහස:

ලෝකයෙහි එක් තැනැත්තෙක් එක දෙයකට දක්ෂ වෙයි. අනෙක් තැනැත්තෙක් වෙනත් දෙයකට දක්ෂ වෙයි. බොහෝ සෙයින් සුළං හැමුවත් ඉතා තද ග්‍රීෂ්මයක් ඇති වුවත් නැව ගොඩබිමෙන් වත් රථය ජලයෙන්වත් නො යයි.

17. නො හි මි   සුවඳ විහිදෙන කස්තුරි   නිමල
උ තු මි   මුව නැබෙහි තැබි බඹ නැණ   විකල
වි න මි   මෙ මට මහ බඹු පදවි යම්   කල
ත බ මි   බොරු කියන දුදනන්ගෙ දිව   මුල

| | | | |
|---|---|---|---|
| නොහිමි | - සීමාවක් නොමැති | මුව නැබෙහි | - මුවාගේ නාභියෙහි |

අදහස:

සීමාවක් නැති සුවඳක් විහිදුවන පිරිසිදු කස්තුරි, මහා බ්‍රහ්මයා විසින් උතුම් වූ මුවන්ගේ නාභියෙහි තැන්පත් කොට ඇත්තේ විපරීත වූ බුද්ධියෙනි. යම් කලෙක මට මහා බ්‍රහ්ම පදවිය ලැබුණොත් (එම කස්තුරි) බොරු බස් කියන අසත්පුරුෂයන්ගේ දිව මුලෙහි තබමි.

18. තිරසර   ගුණෙන් යුතු උතුමකු හට   පවර
සමුදුර   සියල් කිඳලෙක තුඹසෙක   සුනෙර
පුවතර   මෙ දඹදිව මළුවෙක සිය   ගෙදොර
ඔහුකර   නො වන සැපතෙක් එ බැවින්   කවර

| | |
|---|---|
| කිඳලෙක | - කුඩා දිය වළෙකි |
| සුනෙර | - මහාමේරු පර්වතය |
| මළුවෙක | - මිදුලෙක |
| ඔහු කර නො වන | - ඔහුගේ අතට පත් නො වන |

අදහස:

උතුම් වූ ස්ථිරසාර ගුණයෙන් යුක්ත වූ උතුමකුට මුළු මහත් සාගරය කුඩා දිය කඩිත්තකි. මහා මේරුව තුඹසකි. සුප්‍රසිද්ධ ජම්බු ද්වීපය තමාගේ ගෙදර මිදුල ය. එ බැවින් ඔහු අතට පත් නො වන සැපතක් නැත.

19. එන කල   සතුන්හට සිරි සැපත මන   කල
කස පල   තුළෙහි දිය ලොඳ මෙන් වෙයි   විපුල
යන කල   එසිරි සම්පත් වැනසී   සියල
ගජ ගල   ඇතුළ මද සුන් දිවුල පල   තුල

| | |
|---|---|
| මනකල | - සිත් සතුටු කරවන |
| කස පල තුළෙහි | - කුරුම්බා ගෙඩිය තුළ |
| දිය ලොඳ මෙන් | - ජලය හා ලොඳ මෙන් |
| ගජ ගල | - ඇතා විසින් ගිලින ලද |
| ඇතුළ මද සුන් | - ඇතුළෙහි මද නැති |
| දිවුල් පල තුල | - දිවුල් ගෙඩිය වැනි ය |

අදහසඃ

සත්ත්වයන් හට සිත් සතුටු කරවන සැප සම්පත් ඇති වන විට කුරුම්බා ගෙඩිය තුළ ජලය හා ලොඳ මෙන් ය (ප්‍රමාණයෙන්) මහත් වේ. ඒ, සියලු යස ඉසුරු විනාශ වී යන විට ඇතා විසින් ගිලින ලද ගෙඩියේ මදය නැතිවන්නාක් මෙන් නැතිව යයි.

20. නො මි න් ලොව සියලු දේ දක්නා ඇසට
ත ම න් සැටි මඳක් වත් නොපෙනෙන ලෙසට
අ නු න් දොස දකිති අනුවණ දන කපට
එ මෙ න් සිය නුගුණ නො දකිති නියම කොට

| | | | |
|---|---|---|---|
| කපට | - කපටි | අනුවණ දණ | - මෝඩ ජනයා |
| නුගුණ | - නොහොඳ | නියම කොට | - නියම සැටියෙන් |

අදහසඃ

අප්‍රමාණ ලෙස ලෝකයෙහි ඇති සියලු දේ දකින්නා වූ ඇසට තමන්ගේ ම ස්වභාවය මඳක් වත් නො පෙනේ. කපටි මෝඩ ජනයා අනුන්ගේ වැරදි දන්නා නමුත් ඒ ආකාරයෙන් තමන්ගේ අගුණ නියම අන්දමින් නො දකිති.

## ලිඛිත අභ්‍යාස

1. අලගියවන්න මුකවෙටිතුමා සමාජ සාරධර්ම විවරණය කිරීම සඳහා ස්වාභාවික පරිසරයත් එහි සිද්ධීනුත් යොදාගෙන ඇති ආකාරය විමසුමට ලක් කරන්න.
2. විවිධ මිනිස් දුර්වලතා හාස්‍යය, උපහාසය ධ්වනිත වන ලෙස ඉදිරිපත් කර ඇති ආකාරය සුභාෂිතයේ නියමිත කවි තුනක්වත් යොදා ගනිමින් පහදන්න.
3. සුභාෂිත කතුවරයා සාරධර්ම සුරැකීම සඳහා දරා ඇති උත්සාහය නියමිත පද්‍ය කිහිපය ඇසුරෙන් සාකච්ඡා කරන්න.
4. අලගියවන්න මුකවෙටිතුමා උපදේශ පැහැදිලි කිරීම සඳහා සත්ත්ව චරිත හා ඒවායේ ක්‍රියාකාරකම් යොදාගෙන ඇති අයුරු නියමිත කවි තුනක්වත් දෙමින් විස්තර කරන්න.

# 4 වෙසක් පහන


## ජී.බී. සේනානායක (1913-1985)

ගුණතිලක බණ්ඩාර සේනානායක 1913 ජූලි මස මුල්ලේරියාවේ දී උපත ලැබුවේ, පිරිමි දරුවන් සිවුදෙනෙකුගෙන් යුතු පවුලක බාලයා ලෙස ය.

ඔහු කොළඹ ග්‍රැන්ඩ්පාස්හි ශාන්ත ජෝසප් විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා, ද්විතීය අධ්‍යාපනය සඳහා කොළඹ ආනන්ද විද්‍යාලයට ඇතුළත් කරනු ලැබී ය. එහෙත් ආර්ථික දුෂ්කරතා හේතු කොට ගෙන, දාහතරවැනි වියේ දී ඔහුට පාසල් අධ්‍යාපනය අත හැර දමන්ට සිදු විය.

ඉනික්බිතිව, ඔහු අධ්‍යාපනය ලැබුවේ ස්වෝත්සාහයෙනි. වයස අවුරුදු දහඅටක් පමණ වන විට, කොළඹ මහජන පුස්තකාලය ඇසුරු කරන්නට පුරුදු වූ ජී.බී. සේනානායක, එහි දී දහස් ගණනක් වූ ඉංගිරිසි සහ සිංහල පොතපත කියවන්ට වූයේ ය. තමාගේ විශ්වවිද්‍යාලය එය විණැයි ඔහු පසු කලෙක කියා සිටියේ ය.

වයස අවුරුදු දහනමයේ දී පුවත්පත්වලට කෙටිකතා ලිවීම අරඹන ලද වුව ද, ඔහුගේ එක දු කතාවක්වත් කිසිදු පුවත්පතක පළ නො වී ය. ඔහුගේ කෙටිකතාවක් තෝරා ගෙන මුලින් ම පුවත්පතක පළ කරන ලද්දේ, එවකට දිනමිණ පත්හි ප්‍රධාන කතුවරයාව සිටි මාර්ටින් වික්‍රමසිංහ විසිනි.



මෙම තරුණයාගේ ලේඛන කුසලතාව මැනවින් වටහා ගත් වික්‍රමසිංහ, ඔහුට ලේක්හවුසියෙහි පුවත්පත් කලාවේදියකු හැටියට රැකියාවක් ලබා දුන්නේ ය. කලක් දිනමිණ පුවත්පතේ උපකතුවරයකු ලෙස කටයුතු කළ ජී.බී. සේනානායක සිංහල බෞද්ධයා පුවත්පතෙහි ද වැඩ කළේ ය. අවිවාහකයකු වූ එතුමා ලේක්හවුසිය අත හැර ගොස් ස්වකීය ජීවිත කාලය ම සාහිත්‍ය කටයුතු උදෙසා යෙදවී ය. ජී.බී. සේනානායකගේ මුල් ම සාහිත්‍ය කෘතිය වූයේ, 1945 දී පළ කරන ලද **දුප්පතුන් නැති ලෝකය** යි.

ඊළඟ වසරේ දී ඔහුගේ දෙවැනි කෙටිකතා පොත වන **පළිගැනීම** නිකුත් විය. එම කෘතියෙහි එක් විශේෂත්වයක් වූයේ, කෙටිකතා අතර පළ කරන ලද නිදහස් හෙවත් නිසඳැස් පද්‍ය ය. සිංහල පද්‍ය සාහිත්‍යයේ නිසඳැස් යුගය ආරම්භ වූයේ එම පද්‍යයන්ගෙන් බැව්, අවිවාදිතව පිළිගැනේ. අඩසියයක් පමණ වූ ඔහුගේ කෘතීන් අතර **මේධා**, **චාරුමුඛ**, **වරදත්ත**, අවරගිර වැනි නවකතා ද **දැල් කවුළුව**, **විඳිමි** ආදි කොටගත් කාව්‍ය කෘතීන් ද **දුප්පතුන් නැති ලෝකය**, **පළිගැනීම**, **මිතුරිය** වැනි කෙටිකතා සංග්‍රහ ද, **විනිවිඳිමි අඳුර** නම් ස්වයංලිඛිත ආත්ම කතාව ද විශේෂ කොට දැක්විය හැකි ය.

ක්‍රමයෙන් ඇස් පෙනීම දුර්වල ව ගොස් අවසානයේ දී පූර්ණ අන්ධභාවයට පත් වුව ද, ජී. බී. සේනානායක ස්වකීය ලේඛන කටයුතු අත්හළේ නැත. ඔහුගේ පොතපත අතරින් විස්සක් පමණ වූ සාහිත්‍ය කෘතීන් ලියන ලද්දේ, එකී අන්ධභාවය තුළ දී ය. ඔහුගේ අවසාන ලේඛනය සේ සැලකෙන 'රාත්‍රිය' යන හිසින් වූ කවි පෙළ ලියා ඇත්තේ, මරණයට පැය පහකට කලිනි.

ජී.බී. සේනානායකගෙන් සිදු වූ සාහිත්‍ය මෙහෙවර වඩාත් ඉස්මතු වන්නේ කෙටිකතාව හා පද්‍යය යන ක්ෂේත්‍ර තුළ ය. සිංහල කෙටිකතාව වඩාත් සුගම සුඛනම්‍ය මාර්ගයකට පත් කිරීමට ප්‍රෝත්සාහී වූ ලේඛකයන් අතර ඔහුට හිමි වන්නේ අද්විතීය තැනකි. ජී.බී. සේනානායක බටහිර සාහිත්‍යයේ බොහෝ පොතපත ඇසුරු කළ අතර ඔහුගේ කෙටිකතා කෙරෙහි වඩාත් ම බලපා ඇත්තේ, ගී ද මෝපසාං නමැති ප්‍රංශ ලේඛකයාගේ කෘතීන් බැව් විචාරකයෝ පෙන්වා දෙති. එසේ ම, වර්තමාන සිංහල පද්‍යයේ නව නිදහස් රීතියේ පුරෝගාමියා හැටියට ද පිළිගැනෙනුයේ ජී. බී. සේනානායක ය. ඕමාර් ඛයියාම් නමැති පර්සියානු ලේඛකයාගේ සුප්‍රකට **රුබයියාට්** කාව්‍යය ද ඔහු විසින් සිංහලට නඟන ලද්දේ, යටකී නිසඳැස් හෙවත් නිදහස් පැදි රීතියෙනි. ඔහු විසින් ලියන ලද නවකතා සංඛ්‍යාව අතර **මේධා**, **චාරුමුඛ** සහ **වරදත්ත** යන කෘතීන් තුන පාඨක විචාරක දෙපාර්ශවයේ ම නොමඳ අවධානයට සහ ප්‍රශංසාවට බඳුන් විය. මෙම නවකතා ත්‍රිත්වය ම සර්වකාලීන වූ තේමාවන් මත පදනම් වූ සුවිශේෂ සාහිත්‍ය කෘතීන් සේ සලකනු ලැබේ.

සිංහල සාහිත්‍ය විෂයයට ඔහු විසින් කරන ලද සම්ප්‍රදානයන් අතර, සාහිත්‍ය සේසත්, සාහිත්‍ය විග්‍රහය සහ සාහිත්‍ය ධර්මතාව යන කෘතීන් ද, සාහිත්‍ය දර්ශන සිතුවිලි යන හිසින් අන්ධභාවයට පැමිණීමෙන් පසු ව ලියන ලද කෘතිය ද විශේෂ සම්භාවනාවට පාත්‍ර වෙයි.

ලේඛන කලාවෙහි විවිධ කුසලතා ගෙන හැර පෑ ජී. බී. සේනානායකගේ කෘතීන් අතර **මල් කුමාරි**, **හාල්මැස්සා**, **රත්හඳුන් රූපය**, **හීනය**, **අඹකතාව**, **මහලෝභයා** යන සුරංගනා කතා ද ඇති බැව් අමතක කරනු නොයෙදෙයි.

එසේ ම, **මගේ සිතුම් පැතුම්**, **මම එදා සහ අද**, යන චරිතාපදාන කෘතීන් ද, **නවකතා කලාව**, **බටහිර ශ්‍රේෂ්ඨ නවකතා**, **විචාර ප්‍රවේශය** යන ශාස්ත්‍රීය කෘතීන්ද, **රළ බිඳුම**, **මලපුඬුව**, **කැකෑරිල්ල**, **මුදුපාණි**, **කෙලෙස් සයුර**, **එකට එක**, යන නවකතා ද **ඇත බැලුම**, **ගමන**, **නැටුම** යන කෙටිකතා ද, ජී.බී. සේනානායකගේ අවශේෂ නිර්මාණයෝ වෙති.

මෙහි දී "වෙසක් පහන" යන හිසින් එන කෙටිකතාව උපුටා ගන්නා ලද්දේ 1945 වසරේ දී පළ වූ ජී.බී. සේනානායකගේ **දුප්පතුන් නැති ලෝකය** නමැති කෙටිකතා සංග්‍රහයෙනි.

මෙහි කියවෙන්නේ, වෙසක් පහනක් පිළිබඳ පුවතකි. කතාව කියන බාල සොහොයුරා, සිය අයියා විසින් සාදනු ලබන වෙසක් කූඩුව දෙස බලා සිටින්නේ ඉමහත් උනන්දුවෙනි. දෙදෙනාගේ ම බාල නැගණිය තුළ ඇති උනන්දුව හා කුතුහලය ඊට ද වැඩි ය. කතාව අවසන් වන්නේ, කථකයා වන බාල සොහොයුරා අතින් වෙසක් පහන ගිනි ගැනීමත්, ඒ හේතු කොට ගෙන ම, අයියාගේ අත පිළිස්සීමත් පිළිබඳ සිද්ධියකිනි. කතුවරයා එකී සිද්ධි පෙළ මනාව ගළපමින් දරුවන්ගේ ලෝකය සිත්තම් කරන ආකාරය ද, මේ දරුවන් එකිනෙකා අතර වන ආදර කරුණාව තියුණු ආකාරයෙන් විවරණය කොට දැක්වීම නිසා ම මේ කෙටිකතාව පාඨකයා තුළ චමත්කාරය දනවන අපූර්ව නිර්මාණයක් බවට පත් වී ඇත.

විශාල අට පට්ටම් කූඩුවක් සෑදීමේ අදහස පළමුවෙන් ඇති වූයේ අයියාගේ සිතෙහි ය. එවැනි වෙසක් පහනක් සෑදීමට අම්මා අනුබල නුදුන් නමුත් නංගීත් මමත් අයියා ඊට මෙහෙයවූවෙමු.

අයියා උණ කැබැල්ලක් ගෙනවුත් පහනෙහි මැද කූඩුව සාදන්නට වූයේ ය. ඔහු ගෙයි කෑම කන සාලයේ මේසය අසල බිම කඩදාසියක් එලා හිඳගෙන උණ කැබැල්ල පලා සිහින් පතුරුවලට ඉරන්ට විය. එකල අයියා වයසින් අවුරුදු දහහතරක් පමණ ද නංගී හයක් පමණ ද මම හතක් පමණ ද වීමු. උණ කැබලි එක් කොට අට පට්ටම් කූඩුවක් සාදන සැටි නංගී හෝ මම හෝ නො දැන සිටියෙමි. එහෙයින් අයියා උණ කැබැල්ල පතුරුවලට ඉරන සැටි අප බලා සිටියේ ඔහු විස්මය උපදවන දෙයක් කරනු බලා සිටින්නාක් මෙනි.

ඔහු පහන සාදන සැටි බලා සිටින නංගීත් මාත් අතර නොයෙක් විට කලහ ඇති විය. අයියා සැස මට්ටම් කොට පසකින් තබන උණ පතුරු ඔහු ළඟින් හිඳ සිටි මම මා අසලින් තබා ගතිමි. ඔහු කපන උණ පතුරු මා ළඟින් තබා ගැනීම නංගීට රුචි නො වී ය. අයියා සැස පසක තැබූ උණ පතුරක් මා දකින්නට පෙර නංගී තම දෙකකුල යටට කොට සඟවා ගත්තාය. මා අසල බිම හිඳ සිටි ඈ මා පතුරු දකිතියි සැකයෙන් තමා හැඳ සිටි ගවුමෙන් දෙකකුල් වසා ගැනීමට එය බිම විදහන්නට විය. ඇය තම දෙකකුල් වසා ගැනීමට තැත් කරන සැටි මගේ සැකයට හේතු විය. ඈ උණ පතුරක් සඟවා ගන්නට ඇතැයි මට සිතිණි. පතුරක කොනක් ඇයගේ දෙදණ අතරින් මැත් වී තිබෙනු මා දුටුවේ එවිට ය. මම එය ඇද දා අසලින් තබා ගතිමි. නැගණියගේ රත් පැහැති සිඟිති මුවෙහි යටි තොල කෝපයෙන් දික් විය. ඇයගේ නෙත් යුවළට කඳුළු පිරෙන්නා මට පෙනිණ.

සිත ද ඇස ද එක සේ යොදා සිටි අයියා නංගී උණ පතුර සඟවා ගත් සැටි හෝ මා එය උදුරා ගත් සැටි හෝ නුදුටුවේ ය. නංගීගේ දෙනෙතට පිරුණු කඳුළු ක්‍රමයෙන් කොපුල් ඔස්සේ පහතට බසින්නට විය. දෙනෙතින් කඳුළු වැගිරීම සොහොයුරියගේ කෝපය වැඩි වීමට හේතු විය. ඈ තමා හිඳ සිටි තැනින් නැගිට මා පිටිපසට අවුත් මගේ හිසට දැඩි සේ පහරක් ගසා ගෙට දිව ගියා ය. අම්මා මට බැණ ඇය සනසනු මට ඇසිණ.

අයියා උණ පතුරු එක් කොට විශාල සම සතරැස් රාමු සයක් සාදා ඒවා එක් කොට

බැඳීමෙන් අට පට්ටම් කුඩුවක් සෑදුවේ ය. එය විශාල කුඩුවකි. එය සාදන ලද්දේ කුඩා කුඩු විස්සක් ඇති විශාල පහනක මැද කුඩුව වශයෙනි. එය සාලයේ පිහිටි කෑම කන මේසය පමණ උස් විය. අයියා එය මේසය අසලින් ගෙන ගොස් කෑම කන සාලය ද ගෙයි මැද සාලය ද අසල පිහිටි බෝක්කුව යට තැබුවේ ය. කුඩුව එහි තැබූ ඔහු දිගහැරී එල්ලෙන තම කමිසයේ අතකින් නළලෙහි ඩහදිය බිඳු පිස දමමින් යළිත් මේසය කරා අවුත් කුඩුව දෙස බැලුවේ ය. නළලට වැටුණු දික් වූ කෙස් රොදකින් ද, එකිනෙකට තද වූ දෙතොලින් ද දෙනෙත වෙහෙස වීමෙන් දෝ රැළි කොට ගත් දෙබැමින් ද යුතුව ඔහු කුඩුව දෙස බැලුවේ බොහෝ කලක් වෙහෙස ගෙන නෙළා නිම කළ ප්‍රතිමාවක් දෙස බලන ප්‍රතිමා ශිල්පියකු මෙනැයි මට සිතේ.

නංගී මුළුතැන් ගෙට දිව ගොස් අම්මා කැඳවාගෙන ආවා ය.

අයියා වෙසක් කුඩුව සාදා නිම කරන තෙක් නංගීත් මාත් බලා සිටියේ නො ඉවසිල්ලෙනි. ඔහු ශාඛා කුඩු සඳහා පතුරු බඳින සැටි ද ඒවා සැස මට්ටම් කරන සැටි ද බලා සිටි මට ඔහු සෑහෙන පමණ ඉක්මන් නොවේ යැයි සිතිණ.

මැද කුඩුව වටේ එල්ලීමට කුඩා කුඩු හතරක් ද ඒ කුඩු වටේ එල්ලීමට ඊටත් කුඩා කුඩු දහයක් ද සාදන ලදි.

පොල් අතුවලින් හෙවුණු විශාල මඩුවක් අපේ ගෙයි වත්තේ වී ය. එය සාදන ලද්දේ ප්‍රධාන වශයෙන් ම අප පාඨශාලාවට ගෙන යන බක්කි කරත්තය තැබීම සඳහා ය. එහෙත් බක්කි කරත්තය හැරෙන්ට, කැඩුණු හාන්සි පුටුවක් හා සෝපාවක් ද ලී දඬු ගොඩක් එහි විය.

මැද කුඩුවට අතු සවි කළ විට එය ගෙයින් එළියට ගත නො හැකි වන තරම් විශාල වන හෙයින් අයියා අතු බැඳීමට එය වත්තේ පිහිටි මඩුවට ගෙන ගියේය. ඔහු මඩුවෙහි පැදුරක් එළා කුඩුව එහි තබාගෙන ඊට අතු බඳින්ට විය.

කුඩුවට අතු බැඳීම සඳහා අයියා ඇතැම් විට එය තුළට බැස්සේය. ඔහු උසින් මට අඟල් දහයකට වඩා ඇති නො වුව ද ඔහුට ඇතුළට බැස සිටිය හැකි වන තරම් කුඩුව විශාල වීම අපේ ප්‍රීතියට හේතු විය.

කුඩුවල කඩදසි ඇලවීමෙන් පසු එහි ඇලවීමට බීක්කු සෑදීම ආරම්භ කරන ලදී. බීක්කු සාදනු ලබන්නේ සතරැස් කොට කැපූ කුඩා කඩදාසි කැබලිවල කොන් දෙකක් නවා එක් කළ තැනු කුඩා සරුවපිත්තල කැබැල්ල ඇලවීමෙනි. මෙය අපට පහසුවෙන් ම කළ හැකි කාරියක් වූ හෙයින් බීක්කු සෑදීම අප දෙදෙනාට භාර කරන ලදී.

අපි පැය කීපයක් සහයෝගයෙන් වැඩ කළෙමු. නංගී සන්ධ්‍යාවෙහි මුහුණ සෝදා එහි පියරු තවරාගෙන වටේ රැලි ඇල්លූ අලුත් ගවුමක් හැඳ බීක්කු සෑදීමට මා අසලින් හිඳ ගත්තා ය. ඇගේ අලුත් ගවුම දැක මා තුළ උපන් ඊර්ෂ්‍යාවක් නිසා දෝ ඇය කෝප කරවීමට මට සිතිණ.

මම අලවමින් සිටි කඩදාසි කැබැල්ල පසකින් තබා නහය රැලි ගස්වා “හරි ගඳයි” කීවෙමි. පියරු තවරා තිබුණු මුහුණ මා දෙසට හරවා නංගී විමසුම් සහිතව බැලුවා ය.

“පියරු දැම්මට මුහුණේ ගඳ යනවාදැ?” යි මම කීවෙමි. නැගණියගේ සිඟිති මුහුණ කෝපයෙන් ඇද විය.

“කටේ හැටි කිරි අප්පුගෙ හොඹු කට වගෙයි” මම කීමි.

ඈ තමා හිඳ ගත් තැනින් පැන අවුත් මට පහරක් ගැසුවා ය. මම ද ඇයට පහරක් ගැසුවෙමි. ඈ මගේ දෙවුරෙහි එල්ලී

නොම්ලේ බෙදා හැරීම සඳහා ය.

මගේ මුහුණ පතුරු ගහන්නට වූයෙන් අපි දෙදෙනා බිම පෙරලෙමින් පොර අල්ලන්ට වීමු. සාදා පසක ගොඩ ගසා තිබුණු බීක්කු සෑදීමට කපා තිබුණු කඩදාසි හා සරුව පිත්තල කොළ ද පොර අල්ලන අපට යට වී පොඩි විය. අප පොර අල්ලන ශබ්දය අසා අයියා ද දිව ආවේ ය. අම්මා කෑ ගසාගෙන එන හඬ අසා අපි දෙදෙන පොරය නවත්වා මඩුවෙන් පිටතට දිවීමු.

අම්මාගෙන් තැලුම් කා හඬන්ට වූ අපි ආලින්දයේ මුලු දෙකකට වීමු. මුල්ලට වී පැයක් පමණ කඳුළු පිසිමින් සිටි නංගී සෙමින් මා ළඟට අවුත් "අයියේ කූඩුව බලන්ට යමු" යි කීවා ය.

මම කිසිවක් නො කියා හිඳ සිටි තැනින් නැගිට අම්මා ඇද්දැයි වටපිට බලා නංගී සමඟ මිදුලට බැස්සෙමි. අයියා අප එළවා ගනිති යි අපි මඩුවට යාමට බිය වීමු. ඉතා කුඩා ගෙඩි මුත් ප්‍රයෝජනයට ගත හැකි ගෙඩි හට නො ගන්නා උස්ව වැඩුණු දෙහි ගසක් මඩුව අසල ඇත. හඬ නැගෙති යි සෙමින් සෙමින් පා තබමින් දෙහි ගස යටට ගිය අපි අයියා විශාල කූඩුව ඉදිරියෙහි හිඳගෙන එහි බීක්කු අලවන සැටි බලා සිටියෙමු.

මඩුවෙහි ලන්තෑරුමක් එල්ලාගෙන එදින රාත්‍රියෙහි ද අයියා පහන සෑදූ නමුත් අපට මඩුවට යාමට ඉඩ නො දෙන ලදී. අප නින්දට යන විට ද අයියා මඩුවෙහි පහන සෑදීමෙහි යෙදී සිටියේ ය.

නංගීත් මාත් එක ම ඇඳක නිදි කරවීම අම්මාගේ සිරිත විය. "අපේ කූඩුව තරම් ලස්සන කූඩුවක් වෙන කොහේ වත් නෑ නේ ද අයියේ?" යි අඳුරේ යහනෙහි මා අසල වැතිර සිටි නංගී ඇසුවා ය.

"ඔව්, නංගී අපේ කූඩුව තරම් ලස්සන කූඩුවක් නැහැ"යි නිදා ගැනීමට ඇස් පියා ගනිමින් මම පිළිතුරු දුන්නෙමි.

පසු දින වෙසක් පොහෝ දිනය විය. එදින අම්මා වෙනදාට වඩා උදෑසනින් අප අවදි කළාය. අම්මා අප අවදි කරත් ම ගමේ පන්සලෙහි වයන බෙර හඬ අපට ඇසිණ. වෙසක් පහන් එල්ලීමෙන් ද කොඩි වැල් හා ගොක් රැහැන් ඇදීමෙන් ද ගම මුළුල්ලම සරසා ඇතැයි මට සිතුණේ ය. අප දෙදෙන ඇඳෙන් නැගිටි සැටියේ ම පහන බැලීමට මඩුවට දිවූ නමුත් විශාල කූඩුව ද කුඩා කූඩු ද එක්තැන් කොට නො තිබිණ.

වෙසක් පහන එල්ලීමට මහා මාර්ගයට ගෙන එන ලදී. අපේ ගෙදර මෙහෙකරුවෙක් වූ කිරා උස තරුණයෙකි. විශාල කූඩුව මඩුවෙන් ගෙන එන ලද්දේ ඔහු විසිනි. කුඩා කූඩු කිරාත් අයියාත් කීප ගමනකින් මාර්ගයට ගෙන ආහ. විශාල කූඩුවෙහි අතු සතරෙහි කුඩා කූඩු සතර ද ඒවායේ අතුවල ඊටත් කුඩා කූඩු ද එල්ලන ලදී. පහන බැලීමට ආ කොල්ලන්ට ද කෙල්ලන්ට ද ඊට අත තැබීමට ඉඩ නො දීම නංගීගේත් මගේත් විශේෂ කාරිය විය.

පෙර දින රාත්‍රියෙහි කිරා විසින් මාර්ගය අයිනේ උස උණ ගසක් සිටවා තිබුණේ ය. මාර්ගයෙහි විශාල කොටසක් වසාගෙන තිබුණු කූඩු සමූහයකින් යුත් වෙසක් පහන උණ ගසෙහි කෙළවර දවටන ලද ලණුවකින් උඩට ඇද එල්ලන ලදී.

දිලිසෙන සරුව පිත්තල කැබලි වලින් ද සුළං වැදී සර සර යන හඬ නගමින් ඔවුනොවුන් වැළඳ ගන්නා සුදු කඩදාසි පටිවලින් ද යුත් විශාල පහන පැටවුන් විසින් වට කරන ලද විශාල සුදු පක්ෂි ධේනුවක වැන්නැයි මට සිතිණ. වෙසක් පහන්වල අතුවල එල්ලෙන කුඩා පහන්වලට පැටවුනැ යි කීම සාමාන්‍ය සිරිත හෙයින් කූඩු සමූහය පක්ෂි සමූහයක් වැන්න යන අදහස මගේ සිතෙහි ඇඳිණ.

දවස මුළුල්ලේ ම නංගීත් මමත් විටින් විට මාර්ගයට දිව අවුත් අහසෙහි එල්ලෙන පහනෙහි සෞන්දර්යය බලා ප්‍රීති වීමු.

වෙසක් පහනක සුන්දරත්වය පරිසමාප්තියට පැමිණෙන්නේ එහි ඉටිපන්දම් දැල්වූ විට ය. පහනෙහි ඉටිපන්දම් දැල්විය හැකි වන සේ අඳුරු වැටෙන තෙක් නංගී ද මා ද බලා සිටියේ මහත් නො ඉවසිල්ලෙනි.

රාත්‍රී අන්ධකාරය පැතිරෙන්නට විය.මල්තෙල් ගෙන පන්සලට යන්නවුන්ගෙන් මාර්ගය ගැවසුණේ ය. අයියා කිරා ද කැඳවාගෙන පහනෙහි ඉටිපන්දම් දැල්වීමට සැරසුණේ ය. නංගීත් මමත් ආලින්දයෙහි තිබුණු ඉටිපන්දම් මාර්ගයට ගෙන ආවෙමු. කිරා පහන පහතට බෑවේ ය. පළමු කොට කූඩුවල ඉටිපන්දම් දැල්වීම ආරම්භ කරන ලද්දේය.

අයියා විශාල කූඩුවෙහි ඉටිපන්දම් දල්වා අතුවල කූඩුවල ද ඉටිපන්දම් දල්වන්ට විය. දැල්වූ ඉටිපන්දමක් අතෙහි ඇතිව සිටි මට කුඩා ම කූඩුවක ඉටිපන්දම් දැල්වීමට සිතුණේ ය. මම අයියාට නො දන්වා කූඩුවක ඉටිපන්දමක් දැල්වූවෙමි. මා තවත් කූඩුවක ඉටිපන්දමක් දැල්වීමට තැත් කරන විට එහි කඩදාසි පටියකට ගිණි ඇවිලිණි. කටින් පිඹ එය නිවීමට මා කළ උත්සාහය සාර්ථක නො වී ය. කඩදාසි පටියෙන් කූඩුවට ගිනි ඇවිලුණේ ය. මම බියපත් වී කෑගසන්ට වීමි. මට මදක් ඈතින් සිට කිරා ගිනිගත් කූඩුව නිවීමට දිව ආ නමුත් ඔහුට එය වහා කළ නො හැකි විය. ඒ කූඩුවෙන් තවත් කූඩුවකට ගිනි ඇවිලුණේ ය.

එවිට අයියා දිව අවුත් ගිනි ගත් කූඩු සෙසු කූඩු අතරින් වෙන් කිරීමට උත්සහ කළේ ය. අයියා නැඹුරු වී කූඩුවක් මහ කූඩුවේ අත්තකින් ඉවත් කිරීමට තැත් කරන විට ඔහු ඇඳසිටි බැනියමෙහි අතට ගිනි ඇවිලුණේ ය. ඔහු කූඩු අතරින් මෑත් ව අනික් අතින් ගසමින් බැනියම් අත නිවීමට තැත් කළ නමුත් ඔහුට එය නිවා ගන්නට නො හැකි විය. අයියාගේ බැනියමට ගිනි ඇවිලෙනු දැක අප කෑ ගසන ශබ්දය අසා අම්මාත් තාත්තාත් ගෙයි සිට දිව ආහ.

තාත්තා අයියාගේ බැනියම ඉරා ඉවත් කළේ ය. අප අයියාගේ බැනියම් අත නිවීමට තැත් කරන අතර ගිනිගත් කූඩුවකින් ගින්න පැතිරීමෙන් විශාල කූඩුව ද ගිනි ගත්තේ ය. ඊට පසු කූඩු නිවීමට කිසිවෙක් වෙහෙස නො වී ය.

අයියාගේ බැනියමට ගිනි ඇවිලුණු විට නංගීත් මාත් ආරම්භ කළ ඇඬුම අපි නො නැවැත්වීමු. අයියාගේ අත පිළිස්සී තිබුණු හෙයින් ඔහු දොස්තර ගෙදරට ගෙන යා යුතු යැයි තාත්තා කීවේ ය. අත පිළිස්සීම නිසා අයියා මිය යා හැකැයි මා තුළ බියක් ද ශෝකයක් ද ඇති විය. පහනට ගිනි ඇවිලුණේ මා අතින් බව සිහිවීම මගේ ශෝකය තවත් වැඩි වීමට හේතු විය. කිරා අපේ බක්කි කරත්තය මිදුලට ගෙනාවේ ය. තාත්තා අයියා කරත්තයේ නංවා දොස්තර ගෙදරට ගෙන ගියේ ය.

පහනට ගිනි ඇවිලුණේ මා අතින් බව අම්මා දත් නමුත් ඈ මට බැනීමට නො සිතුවා ය. ඈ එසේ නො කළේ බියපත් වී සිටි මා තවත් බිය ගැන්වීම නුසුදුසු යැයි සිතු හෙනැයි හඟිමි. හඬමින් සිටි නංගී නිශ්ශබ්දව සිටි අම්මාට තුරුලු වී නිදා ගත්තා ය. දොස්තර ගෙදර යයි ගම් වැසියන් කියන ඇපෝතිකරිගේ ගෙදර පිහිටියේ අප ගෙදරින් සැතැප්ම දෙකකට පමණ ඈතිනි. එහි ගොස් ඒම සාමාන්‍යයෙන් පැයකට වඩා නොයතත් අයියා ආපසු එන තෙක් ආලින්දයේ කණුවකට හේත්තු වී සිටි මට පැය ගණනක් ගතවූවාක් මෙන් දැනිණ. පන්සලේ වයන බෙර හඬ මහත් කරදරයක් විය. බෙර හඬ නැවතුණු විට මාර්ගයෙන් එන හඬ වලට කන් තියුණු කොට යොමු කළෙමි.

කරත්තය පමා වන්නේ අයියා දොස්තර ගෙදරදී මළ හෙයිනැයි මට සිතිණ. මේ

අදහස ඇති වත් ම වියළී තිබුණු මගේ ඇස් වලට යළිත් කඳුළු නැගිණ. මාර්ගයට කන් යොමු කොට සිටි මම ආලින්දයේ හාන්සි පුටුවේ හිඳ සිටි අම්මා දෙස බැලීමි. ඈ නිකටට අත තබා ගෙන නිසලව සිටියා ය.

ගොනකුගේ කර බැඳි ගෙජ්ජි හඬක් ඇසෙන්නාක් මෙන් මට දැනිණ. මම වඩාත් වුවමනාකමින් මාර්ගයට කන් යොමු කළෙමි. එය ගෙජ්ජි හඬකි. දිවන ගොනෙකුගේ කුර බිම ගැටෙන හඬ ද කරත්තයක රෝද පාරේ ගල් උඩින් දිව යන හඬ ද මට ඇසෙන්නට විය. "චිං ගොනා" යි කිරා රළු හඬින් හඬ ගා ගොනාට කෙවිටෙන් පහරක් ගසන ශබ්දය ඉක්බිතිව ඇසිණ. අයියා මිය යන්ට ඇත යන බිය කරත්තය ළං වෙත් ම මා තුළ දියුණු විය. අයියාගේ මළ කඳ කරත්තයෙහි ගෙන එනු ලැබෙතැයි ද මට සිතිණ.

අම්මා අයියා කරත්තයෙන් බස්වාගෙන ගෙයි ඇතුළු කාමරයකට ගෙන ගියාය. අයියාගේ අතෙහි වැලමිටෙන් පහත කොටස පුළුන් තබා රෙදි පටකින් වෙලා තිබිණ. මම ගෙට නො ගොස් ආලින්දයේ හාන්සි පුටුවේ නිදා සිටි නැගණිය අසල බොහෝ වෙලාවක් හිඳ සිටියෙමි. අයියා මිය යා හැක යන බිය මට සිතින් පහ කොට ගත නො හැකි විය.

මම හාන්සි පුටුවෙන් නැගිට අයියා සිටි කාමරයට ගියෙමි. කාමරයෙහි විශාල සෝපාවෙහි අයියා වැතිර සිටියේ ය. අම්මා ද සෝපාවෙහි හිඳ ඔහුගේ වෙලා තිබුණු අත තම ඇකයෙහි තබා ගෙන සිටියාය.

"ඩිංගිරිගෙන් බත් ඉල්ලාගෙන කාලා නිදාගන්න" යි මා කාමරයට ඇතුල් වනු දුටු අම්මා පහත් ස්වරයකින් කීවා ය.

ඈ කීවා නොඇසුණාක් මෙන් මම සෙමින් සෙමින් ගොස් ඇයගේ දෙපය ළඟ බිම හිඳ ගත්තෙමි. අයියා විටින් විට කෙඳිරිගාන ශබ්දය ඔහු මිය යා හැක යන බිය මා තුළ තවත් වැඩි කළේ ය. මම අම්මාගේ කකුල් දෙක වැළඳගෙන මගේ මුහුණ ඇගේ දෙදණ අස්සේ රඳවාගෙන හඬන්නට වීමි.

අයියා වෙලා තිබුණු තම අත අම්මාගේ ඇකයෙන් ගෙන මගේ හිස පිරිමදින්නට වීය.

"මල්ලී"යි හිස පිරිමදිමින් ඔහු මා ඇමතුවේ ය."මල්ලී කුඩුව පිලිස්සුනාට අඬන්නට එපා. අපි එන අවුරුද්දේ ඔයිටත් ලොකු කුඩුවක් හදමු."

ඔහු මිය යා හැකැ යි මා තුළ වූ බිය ද ශෝකය ද අයියා තම අතෙහි වේදනාවක් ගැන හෝ තමා මිය යන බවක් හෝ නොකියා වෙසක් පහන ගැන කථා කිරීම නිසා දෝ පහ විය.

මිදුලේ දෙල් ගසෙහි බඳින ලද ගොනා තම කරෙහි බැඳි ගෙජ්ජි සොලවා හිස සලනු මට ඇසිණ. "ටිකක් හිටුයි" කිරා ගොනාට ඇමතුවේ ය. ඒ හාම බෙලෙක් පනිට්ටුවක් කිසිවක හැපී පෙරළුනේය. මහා මාර්ගයෙහි බල්ලෙක් බුරාගෙන දිවුවේ ය.

දැවී යාමෙන් පසු ඉතිරි වූ කුඩුවේ කළු වූ උණ කැබෙලි කිසි විශාල සතකුගේ ඇට සැකිල්ලක් මෙන් මහා මාර්ගයෙහි පසක තිබෙන සැටි මගේ සිතට නැගිණ. දල්වන්නට පෙර වෙසක් පහන පිළිස්සී ගියේ යයි මා තුළ ශෝකයක් ඇති විය.

## ලිඛිත අභ්‍යාස

1. වෙසක් පහන සාර්ථක කෙටිකතාවකි. කෙටි කතා ලක්ෂණ ඇසුරෙන් විමසන්න.
2. වෙසක් පහන කෙටිකතාවෙහි චරිත නිරූපණය පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.
3. 'ළමා සිතිවිලි හා ළමා මනස ක්‍රියාකරන අන්දම වෙසක් පහන කෙටිකතාවේ මනාව නිරූපණය කෙරේ' විමසන්න.
4. වෙසක් පහන කෙටිකතාවේ අවස්ථා හා සිද්ධි නිරූපණය පිළිබඳ ඇගයීමක් කරන්න.
5. රසවත් කෙටිකතාවක් නිර්මාණය කිරීමට එක් සුළු සිදුවීමක් ප්‍රමාණවත් වේ. වෙසක් පහන කෙටිකතාව ඇසුරෙන් මේ කියමන පැහැදිලි කරන්න.

# 5

# තුංමං හංදිය

**මහගම සේකර (1929 - 1976)**

සිංහල නවකතා වංශය තුළ මහගම සේකරගේ **තුංමං හංදිය** සහ **මනෝමන්දිර** අපූර්ව නිර්මාණද්වයයක් හැටියට සැලකේ. නිර්දිෂ්ටව ඇති තුංමං හංදිය අධ්‍යයනයේ දී සහ රසවින්දනයේ දී සැලකිය යුතු විශේෂ කාරණා කිහිපයක් ම ඇත්තේ ය.

තුංමං හංදිය, පසුගිය සියවසේ මුල් භාගයේ ශ්‍රී ලංකාවේ ගමක ජීවත් වූවන්ගේ තතු අව්‍යාජ විලාසයෙන් හෙළි කරන නවකතාවකි. එම කෘතිය වඩාත් ම වැදගත් වනුයේ, ලේඛකයාගේ ජීවිත අත්දැකීම් මැදි කොට ගත් ආත්මකථන ස්වරූපයේ නවකතාවක් වන නිසා ය. මෙම කතාවේ කථකයා වන රණතුංග ආරච්චිගේ සිරිසේන, කතුවරයා වන මහගම සේකර ම බැව් හඳුනා ගැනීම අපහසු නැත.

සිරිසේනත්, ඔහුගේ දෙමාපියනුත්, ඔහුගේ මාමලා දෙදෙනා සහ පුංචි අම්මාත් මෙම කෘතියෙහි ඉස්මතුව දැක්වෙන ප්‍රධාන චරිත වේ. ඊට අමතරව, කිසියම් ප්‍රමාණයකට නිරූපණය වන අවශේෂ චරිත ද රැසකි. එහෙත් වැදගත් ම කාරණය නම්, ඒ සියලුදෙනා ම අතරින්, කථකයාගේ ලොකු මාමා වන අබිලිං සිඤ්ඤෝගේ චරිතය වඩාත් ම ඉස්මතු කොට පෙනෙන්ට සැලැස්වීම ය. ඒ හේතු කොට ගෙන ම, මේ ප්‍රබන්ධය මගින් සිරිසේනගේ චරිතය පමණට ම අබිලිංගේ ද චරිතය ද විවරණය වන බව පාඨකයාට පැහැදිලි වනු ඇත

නවකතාව හඳුනා ගැනීමේ දී, චරිත පිළිබඳ එම කාරණය ගැන සැලකිලිමත් වීම මැනවි. අනෙක් විශේෂත්වය වනුයේ, මේ කතාව ගොඩ නගන බස ය. සිංහලය ද කතුවරයා විසින් භාවිත කර ගෙන ඇත. කතාව ඉදිරියට ගලාගෙන යන්නේ සිරිසේන තමන්ගේ කතාව කියන ආකාරයෙන් වුව ද, කතුවරයා යොදා ගන්නා විශේෂ උපක්‍රම නිසා, එය පිටස්තරයකුගේ දැසට පෙනෙන විලාසයක් ද ගනී. එය මේ නවකතාවේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයකි.

අනෙක් විශේෂත්වය වනුයේ, කතුවරයා යොදා ගන්නා අතිශය සජීවී ආඛ්‍යාන රීතිය හෙවත් කතාව ගොඩ නැඟීමේ පිළිවෙළ යි. එහි දී සජීවි ආකාරයෙන් කථන බස යොදා ගන්නා අපූර්ව විලාසය දැක්ක හැකි ය. භාවිත සජීවි භාෂා විලාසය ද, සංවාද ද විමසා බැලීමෙන්, කතුවරයාගේ කතා කලාව මැනවින් හඳුනාගත හැකි ය.

තුංමං හංදිය නවකතාව අවසන් වන්නේ, සිරිසේනගේ ලොකුමාමාගේ මරණයෙනි. එම අවස්ථාව වන විට, සිරිසේන කොළඹ මරදානේ කාර්මික විද්‍යාලයේ උගනිමින් සිටී. සිරිසේනගේ ජීවිතයේ ඊළඟ අවධිය විකාශනය කෙරෙන්නේ, මනෝමන්දිර නම් දෙවැනි කෘතියෙනි. සැබැවින් ම, එය තුංමං හංදියේ දෙවැනි කොටස ය. සිරිසේනගේ තරුණ ජීවිතය නිර්ව්‍යාජ ආකාරයෙන් විවරණය කෙරෙන මනෝමන්දිර අවසන් වන්නේ, ඔහුගේ පොඩි මාමා වන සේතන් සිඤ්ඤෝ මුදලාලි උමතුබවට පැමිණ ඉක්බිතිව ඔහු සියදිවි නසාගන්නා සිද්ධියකිනි.

එම නවකතාව ද කියවා බැලීම, තුංමං හංදියේ නිරූපිත සිරිසේනගේ චරිතය වඩාත් හොඳින් අවබෝධ කරගැනීමට හේතු වනු නො අනුමාන ය.

## ලිඛිත අභ්‍යාස

1. නවකතාවක මූලික අංග තුංමං හංදිය නවකතාව තුළ කොතෙක් දුරට දක්නට ලැබේදැයි නිදර්ශන ඇසුරෙන් විමසන්න.
2. තුංමං හංදිය නවකතාවේ ලොකු මාමාගේ චරිතය පිළිබඳ විවරණයක් කරන්න.
3. තුංමං හංදිය නවකතාවේ භාෂා භාවිතය පිළිබඳව නිදසුන් සහිත ව අගයන්න.
4. තුංමං හංදිය නවකතාවේ සාර්ථකත්වයට එහි මනා සිද්ධි ගැළපීම ඉවහල් වී ඇත. විමසන්න.
5. තුංමං හංදිය නවකතාවේ භාවිත දෘෂ්ටි කෝණය එහි සාර්ථකත්වයට ඉවහල් වී ඇති දැයි විමසන්න.

# 6

# සිංහල ජන කවිය

කුමන භාෂාවකට අයත් සාහිත්‍යයක් වුව ද එය 'විදග්ධ සාහිත්‍යය' හා 'ජන සාහිත්‍යය' වශයෙන් ප්‍රභේද ද්වයයකින් යුක්ත ය. උගතුන් විසින් නිර්මාණය කරනු ලැබෙන සාහිත්‍ය කෘති විදග්ධ සාහිත්‍යයටත්, සාමාන්‍ය ජනයා විසින් කරනු ලැබෙන සාහිත්‍ය නිර්මාණ ජන සාහිත්‍යයටත් අයත් කොට සැලකේ.

ඒ කුමන සාහිත්‍යයක වුව ද, කාව්‍යයට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි. එක් එක් අවධිවල දී උගතුන් විසින් හඳුන්වා දෙනු ලැබ ඇති කාව්‍ය රචනය පිළිබඳ විවිධ ශිල්ප ක්‍රම, නීතිරීති, හා සම්මත සම්ප්‍රදාය අනුව උගතුන් විසින් සම්පාදනය කෙරෙන විදග්ධ කාව්‍ය නිර්මාණ හැරුණු විට විධිමත් අධ්‍යාපනයක් නො ලැබූ සාමාන්‍ය ජනයා විසින් තම නිසග හැකියාව මත කෙරෙන ජන කාව්‍ය නිර්මාණ ද කාව්‍ය සාහිත්‍යයෙහි දක්නට ලැබේ.

ජනයා අතරේ ම නිර්මාණය වී ජනයා අතරේ ම ආරක්ෂා වෙමින් මුඛපරම්පරාගතව පැවතෙන කාව්‍ය සාමාන්‍යයෙන් හැඳින්වෙන්නේ 'ජන කවි' නමිනි. විදග්ධ සාහිත්‍යයක් නැති ජන කොටසක් අතර ද ජන කවි පහළ වී තිබීම මෙන් ම වියතුන් කවි ලිවීමට පෙර සිට ම ජන කවි පහළ වී තිබීම ජන කවියෙහි දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ දෙකකි.

සිංහල ජන කවියට ඇත්තේ ඉතා දිගු ඉතිහාසයකි. සිංහල උගතුන් කාව්‍ය ග්‍රන්ථ රචනා කිරීමට පෙර කාලයේ පටන් ජන කවිය ජනයා අතර පැවති බවට සාධක බුද්ධඝෝෂ හිමියන්ගේ පාළි අටුවාවලින් හමු වේ. ගොයම් රක්නා ළඳුන් පිරිසක් විසින් ගායනා කරන ලද ජාති, ජරා, මරණ යන දහම් කරුණු ඇතුළත් හෙළ ගීයක් අසා භික්ෂූන්වහන්සේලා සැට නමක් රහත් ඵලයට පත් වූ පුවත එක් නිදර්ශනයකි. විලක නෙලුම් මල් නෙළමින් සිටි දැරියක විසින් ගයන ලද අනිත්‍යය සිහිපත් කෙරෙන ගීයක් අසා තිස්ස නම් තෙරුන් වහන්සේ කෙනෙකු රහත් ඵලයට පත් වූ පුවත ද තවත් නිදර්ශනයකි.

කාව්‍ය නිර්මාණ කුසලතාව අතීත සිංහල ජනයාට නිසගයෙන් ම උරුම වූවක් බව පෙනේ. "සෑම සිංහලයෙකු ම තරමක පාහේ කවියෙකි. යටත් පිරිසෙයින් ඔවුනට කවි යැයි කියන ලද දෙය රචනා කළ හැකි ය" යනුවෙන් ජෝන් ඩේවි සඳහන් කර ඇත්තේ එබැවිනි.

වර්තමානයේ ජන කවි දක්නට ලැබෙන්නේ ලේඛනගතව වුවත් අතීතයේ ඒවා පැවතියේ ජනයාගේ මතකයෙහි ය; ඒවා ව්‍යාප්ත වූයේ මුඛපරම්පරාගතව ය. එක් පුද්ගලයකු විසින් රචනා කොට කියන ලද කවියක් අසන තවත් පුද්ගලයෙකු හෝ පුද්ගලයන් සමූහයක් හෝ විසින් එය භාවිතයට ගැනෙන්නේ තමන්ට ඇසෙන ආකාරයෙනි. ඒ අනුව ඒ කවිය භූගෝලීය හා සමාජීය සීමා මායිම් පසු කරගෙන මුළු මහත් සමාජය පුරා ම ව්‍යාප්ත වේ. එහි දී ඒ කවියේ මුල්

ස්වරූපය යම් යම් වෙනස්කම්වලට භාජනය වීම ස්වාභාවික සංසිද්ධියකි. බොහෝ විට ප්‍රාදේශික ව්‍යවහාර මිශ්‍ර වීමෙන් එක ම කවිය විවිධ ස්වරූපයෙන් දක්නට ලැබෙන අවස්ථා බොහෝ ය. ඊට නිදර්ශනයක් ලෙස පහත දැක්වෙන කවියෙහි කළු අකුරින් දැක්වෙන 'එන්ඩ', 'එන්න', 'එන්ට' යන වචන ප්‍රාදේශීය ව්‍යවහාර අනුව වෙනස් වී ව්‍යවහාර වන ආකාරය දක්වා ඇත;

"ඉර පායා ඉර මුදුනට **එන්ඩ** එපා
සඳ පායා සඳ මුදුනට **එන්ඩ** එපා"

"ඉර පායා ඉර මුදුනට **එන්න** එපා
සඳ පායා සඳ මුදුනට **එන්න** එපා"

"ඉර පායා ඉර මුදුනට **එන්ට** එපා
සඳ පායා සඳ මුදුනට **එන්ට** එපා"

එසේ ම මේ කවියෙහි 'මුදුනට' යන වචනය වෙනුවට 'අවරට' යන වචනය ව්‍යවහාර වන අවස්ථා ද තිබේ;

"ඉර පායා ඉර අවරට එන්න එපා
සඳපායා සඳ අවරට එන්න එපා"

ජන කවිය පූර්ව නිශ්චිත වස්තු විෂයයන් තේමා කොට ගත් නිර්මාණයක් නො වේ. ජන දිවි පෙවෙත හා බැඳි ඕනෑ ම කාරණයක් ජන කවියට වස්තු විෂය වේ. ජීවිතයේ විවිධ අවස්ථා, රැකීරක්ෂා, පුද්ගල මනෝභාව, විනෝදය හා ශෘංගාරය, කෙළිසෙල්ලම්, උපහැරණ, ඇදහිලිවිශ්වාස, තේරවිලි ආදි නොයෙකුත් කරුණු ජන කවියට තේමා වී ඇත.

සිංහල ජන සමාජය කෘෂිකාර්මික අර්ථ ක්‍රමය හා බුදුදහම පදනම් කොට ගත් සරල ජීවන රටාවකට අනුගතව සකස් වූවකි. ප්‍රධාන ජීවනෝපාය වූ ගොවිතැන ආශ්‍රිත කරුණු ජන කවියට බෙහෙවින් වස්තු කොට ගෙන ඇත. සී සෑම, වැපිරීම, පැළ නෙළීම, අස්වනු නෙළීම, වන සතුන්ගෙන් වගා ආරක්ෂා කරගැනීම සඳහා පැල් රැකීම ආදි ගොවිතැන ආශ්‍රිත කාර්යයන් ජන කවියට තේමා වී තිබීම මෙන් ම එවැනි කාර්යයන්හි දී වෙහෙස නිවා ගැනීමේ හා විනෝදය සැපයීමේ ප්‍රධාන මාධ්‍යය වශයෙන් ජන කවිය භාවිත කිරීම ද විශේෂ ලක්ෂණයකි. ඒ අනුව 'කමත් කවි', 'නෙලුම් කවි', 'පැල් කවි' ආදී වශයෙන් එක් එක් ගොවිතැන් කාර්යයට අදාළ වූ ජන කවි බිහි වී ඇත.

එසේ ම, ජනයා නියැළි සෙසු සියලු වෘත්තීන් හා කර්මාන්ත සමග ද ජන කවිය දැඩි සේ බද්ධ වී පැවතිණි. ඒ අනුව ගැල්කරුවන්, ඔරුපාරු පදවන්නන්, කම්මල්කරුවන්, කුඹල්කරුවන්, පතල්කරුවන්, පන් කර්මාන්තකරුවන් ආදි සෑම වෘත්තියකට ම අයත් ජන කොටස් අතර ජන කවිය භාවිත විය. "කවිය උපයෝගී කර නොගත් කිසි ම වැඩක් සිංහලයාට නැත. වෙලේ දී කමතේ දී, පැලේ දී, ගැලේ දී, පතලේ දී, හේනේ දී, යකඩ තැලීමේ දී සිංහලයාට කවියක් නො කියා ම බැරිය. මේවා වැඩිහරියක් පිරිමින් කළ කාර්යයන් නිසා, කවිය පුරුෂ පක්ෂයට පමණක් සීමා කිරීමට නො හැකි ය. ස්ත්‍රිය ද දර කැඩීම, වී කෙටීම, දරුවන් නැළවීම, පන් නෙළීම, පැදුරු විවීම ආදී කාර්යයන්හි නිරත වීමේ දී කවිය භාවිත කළා ය" යනුවෙන් බද්දේගම විමලවංශ හිමි සඳහන් කර ඇත්තේ එහෙයිනි. ඒ අනුව එක් එක් වෘත්තියට විශේෂ වූ ජන කවි බිහි වී ඇත. ඊට නිදසුන් වශයෙන් 'පතල් කවි', 'කරත්ත කවි', 'පාරු කවි', 'පන් කවි' ආදිය දැක්විය හැකි ය.

පුද්ගල මනෝභාවයන් ප්‍රකාශනයට ද ජන කවිය අගනා මාධ්‍යයක් විය. ආදරය, ශෘංගාරය වැනි මනෝභාව සෘජුව මෙන් ම ව්‍යංගයෙන් ඉදිරිපත් කෙරෙන ජන කවි බහුලව දැකිය හැකි ය. විශේෂයෙන් තරුණ පරපුර අතර බෙහෙවින් ප්‍රචලිතව පැවති එවැනි ජන කවිවල ව්‍යංගයාර්ථවත් ප්‍රේමාරාධනා හා ශෘංගාරාත්මක ප්‍රකාශන ඇතුළත් වේ.

මවුපිය,වැඩිහිටියන් ආදීන්ගේ ගුණ, කුසගින්න, දරිද්‍රතාව, දරුවන් හා ඥාතීන් විසින් නො සලකා හරිනු ලැබූවන්ගේ දුක් අඳෝනා, අපේක්ෂා භංගත්වය, අවමාන විඳීම්, අනපේක්ෂිත ව්‍යසන, අඹුසැමි ආරාවුල් වැනි කරුණු ද තේමා වූ ජන කවි සුලබ ය.

ඉසිඹුවක් ලද සැණින් කවි කියා, නටා විනෝද වීම ගැමි ජනයාගේ සිරිත විය. ඒ අනුව විවිධ ජන ක්‍රීඩාවල දී භාවිත කවි ද ජන කවි අතර විශේෂ තැනක් ගනී. ලී කෙළිය, ඔළිඳ කෙළිය, අං කෙළිය, කළගෙඩි නැටුම, ඔන්චිලි පැදීම වැනි ජන ක්‍රීඩා සම්බන්ධව බිහි වී ඇති ජන කවි රැසකි. 'කළගෙඩි මාලය' හා 'ඔන්චිලි වාරම්' යන ජන කවි රචනා ඊට නිදසුන් ය.

සිංහල සංස්කෘතිය ගොඩ නැඟීමෙහිලා පදනම් වූ බුදුදහමින් ජන සමාජයේ යහපැවැත්ම කෙරෙහි ඉවහල් වන ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා අගනා උපදේශ සැපයිණි. ඒ සඳහා ද ජන කවිය තරම් ප්‍රබල මාධ්‍යයක් තවත් නො වී ය. සමාජය යහමග යැවීමේ අරමුණ මෙන් ම වැරදි, අඩු ලුහුඬුකම් ඇති තැන් විවේචනය කිරීමට හා ඒවා මතු කොට පෙන්වීමට ජන කවිය උපයෝගී කර ගෙන තිබේ.

ස්වාභාවික හේතු නිසා ඇති වන නියගය, වසංගත, ගොවිතැන් පාළුවීම් ආදිය නිවාරණය සඳහා සිදු කෙරෙන බලි-තොවිල්, සෙත්-ශාන්ති ආදියේ දී මෙන් ම ගොවිතැනෙන් ඵලදාව ලබා ගත් පසු ව දෙවියන් සතුටු කිරීම සඳහා පුදපූජා පැවැත්වීමේ දී ද ජනයා භාවිත කෙළේ ජන කවිය යි. ඇතැම් දෙවිදේවතාවන් මුල් කරගෙන පැවැත්වෙන ශාන්තිකර්මවල දී ගායනා කෙරෙන ජනකවි විශේෂ ද වේ. දෙවොල්මඩු හා ගම්මඩු ආදී පූජාවන්හි ගැයෙන 'කෝල්මුර කවි' ඊට නිදසුනකි.

තේරවිලි කවි ද ජන කවි අතර කැපී පෙනෙන කවි විශේෂයකි. තේරවිලි සිව්පද වශයෙන් ද හැඳින්වෙන මේ කවිවල විශේෂත්වය නම් එක් කවියකින් ගැටලුවක් ඉදිරිපත් කිරීමත්, ඒ ගැටලුවට විසඳුම තවත් කවියකින් ඉදිරිපත් කිරීමත් ය.

ජීවිතයේ විවිධ සංක්‍රාන්ති අවස්ථා වන උපත, රන්කිරි කටගෑම, අකුරු කියවීම, වැඩිවිය පැමිණීම, විවාහය, මරණය වැනි සෑම අවස්ථාවක් ම හා සම්බන්ධ ඇදහිලිවිශ්වාස, සිරිත්විරිත්, වත්පිළිවෙත් මුල් කරගත් ජන කවි ද තිබේ. මේ අනුව ජන කවියේ වස්තු විෂය, ජනයාගේ අවශ්‍යතා මත ජන ජීවිතය හා සබැඳි සියලු අංශයන් ස්පර්ශ කරන පුළුල් පරාසයක පවතින ආකාරය හැඳින ගත හැකි ය.

බොහෝ විට විදග්ධ කාව්‍යයක දී රචකයා නිශ්චිතව හඳුනා ගැනීමේ හැකියාව ඇතත් ජන කවියක රචකයා නිශ්චිත ව හඳුනාගැනීමට හැකියාවක් නැත. ඇතැම් විට අන්දරේ වැනි ප්‍රකට කවීන් කියා ඇති කවි ජනයා අතර ජන කවි ලෙස ප්‍රචලිත වී ඇති විශේෂ අවස්ථා ඇතත් ජන කවියේ සාමාන්‍ය ලක්ෂණය නම් එහි අයිතිය සමස්ත ජන සමාජය ම සතු වීම ය.

ජන කවිය හුදෙක් නූගත් ජනයාගේ අව්‍යක්ත රචනා ලෙස බොහෝ විචාරකයන් විසින් සලකනු ලැබූවත් සාහිත්‍යයික අගය සහිත අර්ථපූර්ණ හා රසපූර්ණ රචනා සිංහල ජන කවි අතර පවතින බව සඳහන් කළ යුතු ය. විශේෂයෙන් ම ජන කවියේ විශේෂ ගුණාංගයක් නම් ඒවායේ පවතින අව්‍යාජත්වයයි. අව්‍යාජත්වය පැවති පමණින් කවිය සාර්ථක නො වන නමුත් රසවත් බව උදෙසා අව්‍යාජත්වය ඉතා වැදගත් වේ.

සංකීර්ණ අත්දැකීම් හා මනෝභාවයන් ඉතා සරල, සුගම බසකින් ඉදිරිපත් කිරීම ද ජන කවියේ විශේෂ ගුණාංග යකි. ජීවිතයට හැකි තාක් සමීප වන සේ උපමාදි අලංකාර භාවිතය සහ ගැඹුරු ජීවන අර්ථ ධ්වනිත කරමින් සරල ව නිර්මාණය කිරීම මගින් ජන කවියේ සාහිත්‍යයික අගය තහවුරු කෙරෙයි. චිරන්තන කවිසමයට වහල් වෙමින්, ගතානුගතික උපමා ද අලංකාර භාවිත කිරීම වියත් කවීන්ගේ සම්ප්‍රදාය විය. එහෙත් ජන කවිවල ඇත්තේ ජනයා විසින් තමා ජීවත් වන පරිසරය ආශ්‍රයෙන් ග්‍රහණය කර ගනු ලැබූ රමණීය සංකල්ප රූප බව සිංහල ජන කවි විමසන විට පෙනී යයි.

ඕනෑම සාහිත්‍යකරුවකු තම නිර්මාණයෙන් උත්සාහ කරනුයේ පාඨකයාට හෝ ශ්‍රාවකයාට හැඟීම් දනවෙන පරිදි තම අත්දැකීම ප්‍රකාශ කිරීමට ය. එහෙත් පරිණත, නිර්මාණාත්මක බුද්ධියකින් හෙබි කවියා සිය හැඟීම් ඉදිරිපත් කරන්නේ සංයත ස්වරයකිනි. මේ ලක්ෂණය බොහෝ ජන කවිවල ද දක්නට ලැබේ.

බොහෝ ජන කවිවල යෙදෙන වචනමාලාව භාවපූර්ණ, අර්ථ රසයෙන් මෙන් ම ශබ්ද රසයෙන් ද අනූන වූවකි. එමෙන් ම ධ්වනිතාර්ථවත් වන බව ද දැකිය හැකි ය. ඒ ඒ අවස්ථාවට හා භාවයන්ට උචිත පරිදි විවිධ වෘත්ත නිරායාසිකව ම උපයෝගී කර ගැනීමට ජන කවීහු සමත් වූහ. දරු නැළවිලි, ඔංචිලි වාරම්, කළගෙඩි නැටුම්, ගොයම් කවි යනාදිය පරීක්ෂා කිරීමේ දී මෙය මැනවින් හඳුනාගත හැකි ය. එවැනි කවි හා සම්බන්ධ වන අවස්ථාවන්ට ගැළපෙන රිද්මයන් ඒ කවිවල ගැබ් වී තිබෙන්නේ එහෙයිනි.

ජන කවි භාෂාවේ විශේෂ ලක්ෂණයක් නම් කථා ව්‍යවහාරයට සමීප වචන භාවිත කිරීම යි. ලේඛන භාෂාව හැඩ ගැසෙන්නේ උගත් ලේඛක පිරිසකගෙනි. පොදුජනයාට ලේඛන භාෂා ප්‍රයෝග ගෝචර නොවුණ ද දෛනික ජීවිතයේ දී අන්‍යයන් හා සන්නිවේදන අවශ්‍යතා සපුරා ගන්නා කථා ව්‍යවහාරය ජන කවි නිර්මාණය සඳහා උචිත පරිදි ගළපා ගැනීමට ද මනා හැකියාවක් තිබිණි. කථා ව්‍යවහාර භාෂාව භාවිතය සිදුව ඇත්තේ උච්චාරණයේ හා ප්‍රකාශනයේ පහසුව මුල් කරගෙන බව පෙනේ. ඒ අනුව ජන කවියේ පද රටා, ශබ්ද රටා මෙන් ම වාක්‍ය රටා සියල්ල ම පාහේ කථා ව්‍යවහාරයට බෙහෙවින් සමීප වේ. එමගින් කවියට තේමා වන අත්දැකීම් හා හැඟීම් දැනීම් ආදිය වඩාත් මැනවින් ප්‍රතිනිර්මාණය කිරීමට හැකි වී ඇත. බොහෝ විට කථා ව්‍යවහාර භාෂාව ව්‍යාකරණ රීතිවලට අනුකූල නොවන නමුත් එයින් කිසිදු ආකාරයකින් රස වින්දනයට බාධාවක් ඇති නො වේ.

මේ අනුව ජන කවිය විදග්ධ කාව්‍යයෙන් වෙනස් වූ ඊට ම සුවිශේෂී වූ අනන්‍ය ලක්ෂණ සහිත වූ පොදුජන සාහිත්‍යාංගයක් බව පැහැදිලි වෙයි.

ජන කවිය පිළිබඳ අධ්‍යයනය කිරීම වැදගත් වන්නේ එය ජන ජීවිතය පිළිබඳ වැදගත් කරුණු අනාවරණය කරගත හැකි විශේෂ සාහිත්‍යයික මූලාශ්‍රයක් වශයෙන් මෙන් ම මානව විද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක මූලාශ්‍රයක් ද වන හෙයිනි.

රිදියෙන් තනලා රත්රන් ඔබලා
කැරලි කෙටුවයි දැකැත්තේ
සුරතට රන්වන් රැලි නංවා ලා
කදිමට දිලිසෙයි දැකැත්තේ
අඩියෙන් අඩියට තාල කියන්නට
සබයෙන් අවසර ලැබගත්තේ
සතරවරම් දෙවියන්ගේ බලයෙන්
ගොයම් කපමු අපි දැකැත්තේ

ඉරට ඉරක් නැත මෙහෙම ඉරක් නැත ඉරිදා පායන ඉර වාගේ
සඳට සඳක් නැත මෙහෙම සඳක් නැත සඳුදා පායන සඳ වාගේ
දියට දියක් නැත මෙහෙම දියක් නැත කැලණි ගඟේ දියවර වාගේ
කෙතට කෙතක් නැත මෙහෙම කෙතක් නැත ගොයම් නෙළන මේ කෙත වාගේ

ලස්සන හිමවතේ මා වී පැසෙන්නේ
දුක් දෙන අලි ඇතුන් පන්නා හරින්නේ
රැක්මෙන් දෙවියනේ වෙල බත් බුදින්නේ
දුප්පත්කම නිසයි මම පැල් රකින්නේ

බෝඹු ඉඳල දලු ලා දෝ නො ලා දෝ
කෙකටිය මලේ වක යා දෝ නො යා දෝ
කැලණි ගඟේ ඔරු යා දෝ නො යා දෝ
කළුගෙ නගා මෙහි ඒ දෝ නො ඒ දෝ

කන්ද උඩින් එන කිකිළිය ගෝමරියේ
නළල් වටින් එන දාඩිය මුතු කැටියේ
අත පාමුදු පය පාමුදු වයිරොඩියේ
මට පිටුපා ගෙට යනවද සුරතලියේ

අල්ලා ගෙන නෙරිය අතකින් කිම් ද නගෝ
වසාගෙන දෙතන අතකින් කිම් ද නගෝ
හිමියෙක් නැති ගමන් තනි මඟ කිම් ද නගෝ
අම්බලමේ ඉඳලා අපි යම් ද නගෝ

බඩගිනි වෙලා මම ගිය කල පුතුගෙ ගෙට
මැනලා වී දෙකක් දුන්නයි මල්ලකට
ගන්දෝ නොගන්දෝ කියලා සිතුණි මට
මැනල ද පුතේ කිරි දුන්නේ මං නුඹට

දොඩම් කපාලා ඇඹුල් තනාලා
නාන්ඩ යන හැටි බලන් කලූ
සේලේ ඇඳලා නෙරිය තියාලා
මිදුලේ සක්මන් කරයි කලූ
දහසක් දීලා වළලු තනාලා
දෑතේ අතලා බලයි කලූ
දුනුකේ මල සේ උළු ගෙයි ඇඳ පිට
ඔළිඳ කෙළින සැටි බලන් කලූ

ලත් පමණට මැටි ඉදි කරවා ගෙන
පත් බැඳලා කළගෙඩි තනවා ගෙන
අත් නෑර ම කළගෙඩි තෝරා ගෙන
සිත් සතොසින් කළ පිඹින්ට වෙන වෙන

යසසින් වැඩි පත්තිනි කඳ තෙදිනේ
නුවරට ළඟ පස් නිරිඳුගෙ උයනේ
වට කොට දස දහසක් පිරිවරිනේ
අකලට අඹයක් පල ගති උයනේ

## ලිඛිත අභ්‍යාස

1. ජන කවියෙහි පොදු ජන ජීවිතය මැනවින් නිරූපණය වී ඇත. පාඩමේ දැක්වෙන කවි ඇසුරෙන් විමසන්න.
2. ජීවන වෘත්තීන් හා බැඳුණු අත්දැකීම් ජන කවියාට වස්තු විෂය වී තිබේ. නිදසුන් සහිතව විමසන්න.
3. ජන කවිය අව්‍යාජ ලක්ෂණ පෙන්වන සාහිත්‍යාංගයකි. පාඩමේ ඇතුළත් කවි ඇසුරෙන් විග්‍රහ කරන්න.
4. ජන කවි බසෙහි විශේෂතා පාඩමේ ඇතුළත් ජන කවි ඇසුරෙන් පැහැදිලි කරන්න.

# 7 යුතුකම

### ඇස්. මහින්ද හිමි (1901-1951)

නූතන යුගයේ මුල් වකවානුවට අයත් කවීන් අතර ජාත්‍යාලය හා ජාතිකාභිමානය ඔප් නැංවීමෙහි ලා මහත් මෙහෙවරක් ඉටු කළා වූ කවියකු ලෙස සැලකෙන ඇස්. මහින්ද හිමියෝ ජාතික ආගමික පුනර්ජීවන ව්‍යාපාරයෙහි පුරෝගාමී චරිතයක් වූහ.

ළමා පරපුර කේන්ද්‍ර කර ගනිමින් නිදහස් හා නිවහල් චින්තනයක් ළමා මනස්හි ජනිත කරවමින් ජාත්‍යාලය වර්ධනයෙහි ලා තම කවි ශක්තිය මෙහෙයවූ මහින්ද හිමියෝ **කව්මිණි, කව්මුතු, ළමා කවි කළඹ** වැනි පොත් ද දරු නැලවිල්ල **හෙවත් ජාතික තොටිල්ල, නිදහස් මන්ත්‍රය, නිදහස් දැහැන, ලංකා මාතා** වැනි ග්‍රන්ථ ද රචනා කළහ.



කාලීන අවශ්‍යතා උදෙසා කවිය මෙහෙය වූ කොළඹ යුගයේ මුල් පරපුරේ බොහෝ කවීන් මෙන් ම උද්වේගකර වූ ඍජු බවක් හා ආවේග ශීලීත්වයක් මහින්ද හිමියන්ගේ නිර්මාණ වෙතින් ද ප්‍රකට වුව ද ඉතා සූක්ෂ්ම වූ නිසග කවීත්වයක්, ළමා පරපුර උදෙසා එ හිමියන් නිර්මාණය කළ ඇතැම් පද්‍යවලින් පිළිබිඹු වනුයේ භාෂා භාවිතයේ අපූර්වත්වය ද ප්‍රකට කරමිනි. ජාත්‍යාලය වඩවනු වස් විශාල සමාජ වගකීමක් තමන් වෙත පවරා ගනිමින් කාව්‍යකරණයෙහි යෙදුණු උන් වහන්සේ තමන් විසූ යුගය තම කවිවල නිරූපණය කරමින් කාව්‍යකරණයෙහි නිමග්න වූවකු ලෙස සැලකිය හැකි ය.

උ ප   න් නෙත් මැරෙන්නෙත් තනියම යි   ලොවේ
එ යි   න් පිටත්තර වෙන විදියකින්   නොවේ
එ යි   න් එහෙම නම් තම යුතුකම   හමුවේ
බි යෙ න් තැති ගැනුම අපහට තරම්   නොවේ

නම් බුව කැමති අය ඇති නම් නො වී මුළා
ග ම් මුන් සැවොම ගම්මුන්ට ම එකතු වෙලා
ලො ම් සිදුරක තරම් වත් අඬ දබර නොලා
පි ම් මක් පනිමු ගම්මුන්ගේ ජය ම බලා

උ ප න් ගමේ බල උරුමය රැක ගන්ට
ස ට න් කෙරුම සතුටක් නම් වැසි යන්ට
බියෙ න් නොගොස් අහු මුළුවල රිං ගන්ට
ඉ ති න් යමව් ගම්මුන්ටම එක් වෙන්ට

ව ඳි න් නේ නැතිව ලොකු නිලධාරින් ට
ත ම න් ගේ බලය උරුමය රැක ගන් ට
හි ති න් වත් කැමති නම් එය කර ගන් ට
ඉ ති න් අඬ ගසව් තම හිත මිතුරන් ට

ඇතොත් ගමට ආදරයක් සිතින් සිපා
අ ත ත් පයත් ඔලුවත් වෙන වෙන ම කපා
ක ත ත් කමක් නැහැ බියසුලු ගතිය පපා
අ යු ත් තකට අත් දෙක ඔසවන්ට එපා

අ පේ රට අපේ ජාතිය අපේ ගම
අ පේ අසල්වැසියා යන සියල් ලම
අ පේ අතට අවනත කර ගෙන වහම
අ පේ නමට සලකන දිවි දෙමු මෙහෙම

මුල බැස තිබෙන ගම්මුන්ගේ සමඟි සැපා
සොලොවා මරා වළලන්නට යොදා උපා
කුල මල උගුල් අටවන බොරු බණක් පපා
නිලධාරින්ට විස්වාසය දෙන්ට එපා

## ලිඛිත අභ්‍යාස

1. යුතුකම පද්‍ය පන්තියේ භාෂා භාවිතය පිළිබඳ ඇගයීමක් කරන්න.
2. 'යුතුකම' පැදිපෙළ ඇස්.මහින්ද හිමි විසූ යුගයේ සමාජ අවශ්‍යතාවක් කුළු ගැන්වෙන පරිදි ලියැවී ඇත. විමසන්න.
3. අදීන මිනිසකු ලෙස සමාජයේ ජීවත් වීමේ දී කෙනෙකු විසින් සිය සිතුම් පැතුම් හැඩගසා ගත යුතු ආකාරය යුතුකම පද්‍ය පංතියෙන් ඉදිරිපත් කෙරේ. පැහැදිලි කරන්න.
4. සිවුපද ආකෘතිය සාර්ථකව යොදාගත් නිර්මාණයක් ලෙස යුතුකම පැදි පෙළ සැලකිය හැකිය. මේ ප්‍රකාශය නිදසුන් ඇසුරෙන් විමසන්න.

# 8 උතුරෙන්

**සාගර පලන්සූරිය (1910-1961)**

නූතන යුගයේ මුල් පරපුරට අයත් වන ජනප්‍රිය කවීන් කිහිපදෙනා අතර ප්‍රමුඛයකු වූ සාගර පලන්සූරිය කවියා 'කේයස්' යන අන්වර්ථ නාමයෙන් පුවත්පත් හා සඟරා සඳහා නිර්මාණ ඉදිරිපත් කළේ ය. ප්‍රවීණ ලේඛකයකු, කවියකු, දේශකයකු පමණක් නොව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ද වූ හෙතෙම ගුරුවරයකු ලෙස ද සේවය කළේ ය.

ටෙනිසන් නැමැති ඉංග්‍රීසි කවියාගේ (ඊනොක් ආර්ඩන්) නමැති කාව්‍යය ආශ්‍රයෙන් රචනා කරන ලද 'සුදෝසුදු' මොහුගේ ප්‍රකට ම කෘතිය වන අතර **මල්හාමි, කාලකණ්ණියා, කන්දේ ගෙදර, විසිවුණු තරු, කැලණි විත්ති, පිළිරුව** හා **අපේ ඇත්තන්ගෙ විත්ති** ආදි කෘති ද එතුමගේ නිර්මාණ වේ.

කාව්‍ය නිර්මාණ සඳහා විදේශ කාව්‍ය නොමඳ ව ඇසුරු කළා වූ යුගයක ඇතැම් කවීන් මෙන් ජීවිතයේ ශෘංගාරාත්මක හා ප්‍රේමණීය පක්ෂය නිරූපණය කිරීමට වඩා කේයස් යොමු වූයේ මානව දයාව හා ප්‍රේමය කුළුගැන්වීම කෙරෙහි ය.



පවත්නා සමාජ ක්‍රමය පිළිබඳ සියුම් විරෝධාකල්පමය මතවාදයක් කුළුගැන්වෙන මොහුගේ කවිය කෙරෙහි මධ්‍යස්ථ විචාරක අවධානයක් නො වීම කරණ කොට සෙසු බොහෝ කවීන්ට මෙන් ම සාධාරණ අවධානයක් සහ ඇගයීමක් සිදු නොවී ය.

දකුණේ මෙන් ම උතුරෙත් හිරු නඟියි උදේ
රන් තරු රිදී තරු සවසට පෙළට ඇදේ
හඳ ඇති දාට රසබර රැස් දහර හදේ
පොල් ගස් මුදුනෙ මෙන් තල් ගස් මුදුනෙ වැදේ

ගෙන එයි මිහිරි ගී මඳනල හමන විට
වැටහෙයි නො වැටහුණු සැඟවුණු කරුණු මට
නිල් පැහැයක් නැතත් මේ වැලි පොළොව පිට
උදයට පෙනේ බොල් පිනි බිඳු පබලු ඇට

තනි බව දැනේ එහි කවුතුක රසය ඇත
මා පිට ගෙයක බව සලකනු පුරුදු නැත
හැම මොහොතක ම ඇති උණුසුම් ගතිය මත
උගතිම් කිම ද මිනිසා සතු දෙ නෙත තෙත

ඩහදිය හෙළන අය හිරිහැර අතර වැටී
දකුණේ මෙන් ම උතුරෙත් හැම තැනම සිටී
විමසා බලමි ඔවුනගෙ හදවතෙහි හැටී
කළුගල් යකඩ නො ව උණු වී හැළෙන ඉටී

බැඳ ඇති විලංගුව පා මිණි සලඹ කොට
සලකා වැටෙන එය බැන්දහු ඉදිරි පිට
මිනිසුන් දකුණෙ මෙන් උතුරෙත් පෙනෙන විට
සිහියෙන් තුරන් වෙයි හෙට යන දවස මට

මිනිහා වෙතින් මිනිහා වෙන් කරන රිසින්
බැඳ ඇති පවුරු පදනම් කිසි කෙනකු විසින්
ඒවා කඩා බිඳගෙන එහි පිරුණු පසින්
පාලම බැඳෙනු ඇත දවසක උතුරු දෙසින්

පැයක දි එකට හමු වන දුර ඇත දෙතැන
මෙය වෙන් කරනු හැකි කිසිවකු වෙ ද කොතැන
සුරුට්ටුවට එක් වී උතුරේ ඔතන
බේදය පිළිස්සී හමු වේවා දකුණ

## ලිඛිත අභ්‍යාස

1. ‘උතුරෙන්’ කාව්‍ය නිර්මාණයට පාදක වී ඇති තේමාව විග්‍රහ කරන්න.
2. උතුරෙන් පැදි පෙළ කාලීන වටිනාකමකින් යුක්ත නිර්මාණයකි. ඔබේ අදහස් දක්වන්න.
3. සිය නිර්මාණය සඳහා සාගර පලන්සූරිය යොදා ගෙන ඇති කාව්‍යෝක්ති එහි සාර්ථකත්වයට ඉවහල් වී ඇති ආකාරය විමසන්න.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

# 9 ආගන්තුක සත්කාරය

## විමලරත්න කුමාරගම (1919-1962)



නූතන යුගයට අයත් දීප්තිමත් කවියකු වූ විමලරත්න කුමාරගම ලිපිකරුවකු ලෙස වෘත්තීය ජීවිතය ආරම්භ කර පසු ව ප්‍රාදේශීය ආදායම් පාලක ධූරයට පත් විය. මොහු බිම්තැන්න, කොළොන්න, වන්නි හත්පත්තුව වැනි ඉතා නොදියුණු හා දුෂ්කර ප්‍රදේශවල සේවය කිරීමෙන් ලත් නිර්ව්‍යාජ ජීවන අත්දැකීම් දයානුකම්පාවෙන් යුතුව ප්‍රතිනිර්මාණය කිරීමට උත්සාහ ගත් කවියෙකි. ගතානුගතික ආකල්පවලින් ඈත්ව සංයමශීලීව හා මධ්‍යස්ථ මුහුණුවරකින් අත්දැකීම් ප්‍රතිනිර්මාණය කිරීමට පෙළඹුණු කවියකු ලෙස ඔහු ඇගයුමට පාත්‍ර වෙයි.

**සංවේග වේදනා** (1946), **නිල් සීනය** (1941), **ඔරුව** (1942), **හපුමලී** (1946), **සුරතල්ලු** (1961) යන පද්‍ය කෘති කුමාරගමගේ කාව්‍ය සංග්‍රහ අතර වේ. කලක් අගනුවර තරුණ කවි සමාජයේ සංස්කාරකවරයා ලෙස ද ඔහු කටයුතු කර තිබේ. අනවශ්‍ය භාවාත්මක බවින් මිදුණු ඉතා සංවේදී සංයමශීලී බව ද මුහුකුරා ගිය කවි ශක්තිය ද උචිතානුචිත භාවයෙන් පරිපූර්ණ භාෂා හා අලංකාර භාවිතය මොහුගේ කවියෙහි දක්නට ලැබෙන ගුණ ලෙස සැලකිය හැකි ය. මානව ජීවිතයෙහි හා ස්වාභාවික පරිසරයේ අන්‍යෝන්‍ය බැඳීම නිර්ව්‍යාජ ලෙස සියුම් නිරීක්ෂණාක්ෂියකින් යුතුව ප්‍රතිනිර්මාණය කිරීම කරණ කොට සමකාලීන සෙසු කවීන් අතුරින් මොහු සුවිශේෂ කොට හැඳින්වේ. රාජ්‍ය සේවයෙහි පිළිගත් වෘත්තිකයකු ලෙස මොහු විසින් ගොඩ නඟා ගන්නා ලද සමාජ භූමිකාව ඒ සඳහා මොහුට මහෝපකාරී විය.

ගන්තුන තුලානේ අලියා වැටුණු වැ වේ
සුන්දර හාමි එතරම් පොහොසතෙක් නො වේ
තුන්ලාහකම බිම වැඩකර දියෙන් වැ වේ
රන් වන් කරල් බරවී දැන් බිමට නැ වේ

ඔහුගේ ගමට මා ගිය ඒ පළමු වර
තවමත් සිතේ ඇත අමතක නො වන යුර
හේනට ගොසින් ගෙන් හූවක් තරම දුර
එනවා දිටිමි මිටි බැඳ ගෙන වියලි දර

දරටික තබා සෙවණැති පලු ගසක යට
පිස දම දමා දාඩිය එන නළල පිට
මා එන තුරුම සිට පෙන්වූ සිනහ කට
තවමත් පෙනේ දුක් දොම්නස් අතර මට

පෙර දැක නොමැති මුත් සුන්දර හාමි විසින්
මගෙ තොරතුරු ඇසූ හැටි හිතවතකු ලෙසින්
ගෙඩියක් කඩාගෙන ගෙමිදුල තැඹිලි ගසින්
පිළිගැන්වීය මට සොම්නස පිරුණු ඇසින්

පොල් දෙහි දොඩම් ගස් තුන හතරකි වත්තේ
දුප්පත් කමයි හැම තැන ලකුණුව ඇත්තේ
කෙලෙසද කියා කළ ගුණ සැලකිය යුත්තේ
දුන් සත පණහවත් ඔහු නැත පිළි ගත්තේ

ආගන්තුකව එන කෙනෙකුට පුරුදු නැති
හිතවත් කමින් සැලකූ යුතුකමය සිතී
ඔහු වෙත මුදලකින් මා කළ හැටිය තුතී
සිහිවී මගේ කම්මුල රතු පැහැය ගතී

## ලිඛිත අභ්‍යාස

1. 'ආගන්තුක සත්කාරය පැදි පෙළ සාර්ථක නිර්මාණයකි.' අදහස් දක්වන්න.
2. විමලරත්න කුමාරගමගේ කවි ප්‍රතිභාව 'ආගන්තුක සත්කාරය' පද්‍ය පංතිය ඇසුරෙන් විමසන්න.
3. මේ පැදි පෙළට වස්තු විෂය වී ඇති අත්දැකීම කෙටියෙන් විවරණය කරන්න.

# 10 ඇත් ගාලේ දරු පෙම

### ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ (1913-1964)



ලේඛකයකු, පුවත්පත් කලාවේදියකු, කවියකු හා ගීත රචකයකු ලෙස කීර්තියක් අත්පත් කර ගත් ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ නූතන යුගයට අයත් වන ප්‍රකට කවියෙක් වෙයි. පුවත්පත් මාධ්‍ය ඔස්සේ කවිය ජනප්‍රිය අංගයක් බවට පත් කළ පිරිස අතර ප්‍රමුඛයකු වීමට මොහු ලංකාදීප පුවත්පතේ සංස්කාරක මණ්ඩලයෙහි සේවයෙහි නියුක්ත වීම ද පිටිවහල් වූ බව පෙනේ.

සමාජ වටපිටාව සියුම් ලෙස උපහාසාත්මක ව විවේචනයට ලක් කරමින් සකසන ලද පාඨක ප්‍රජාව අතර බෙහෙවින් ජනප්‍රියත්වයට පත් 'වගතුග' තීරු ලිපි සංග්‍රහය මානවසිංහගේ ඉදිරිපත් කිරීමකි. එතුමා 1955 දී ප්‍රථම සිංහල ගීත නාටකය වූ **'මනෝහාරී'** රචනා කළ අතර 1957 දී **'කෝමල රේඛා'** නමින් ගීත සංග්‍රහයක් ද පළ කළේ ය. මෙම ගීත සංග්‍රහයෙහි කවි පන්ති කිහිපයක් ඇතුළත් වූ නමුත් කේවල කාව්‍ය සංග්‍රහයක් මුද්‍රණය නො වී ය. **'ගොළු දැරිය'** (1962) නමින් කුඩා කෙටිකතා සංග්‍රහයක් ද පළ විය. මොහුගේ අභාවයෙන් කලකට පසු **'සාහිත්‍ය රසය'** නමින් ලිපි එකතුවක් ද, **'හදවත් නැත්තෝ'** නමින් කෙටිකතා සංග්‍රහයක් ද, **'ඉහිරුණු කිරිබත'** නමින් ළමා ගී පොතක් ද **'මානවසිංහ සාහිත්‍යය'** නමින් ගද්‍ය පද්‍ය රචනා සමුච්චයක් ද එළි දැක්විණි.

මෙතුමා අතින් ලියැවුණු **මී කිරි, වෙසක් මිහිර, ගුරු ගෙදරට යන අතරමග, ඇත් ගාලේ දරු පෙම, මගේ රට, මහබෝ වන්නම** වැනි රචනා සරල හා සුගම ජීවන සෞන්දර්යයෙන් අනූන නිර්මාණ ලෙස සැලකිය හැකි ය. නිරුත්සාහක හෘදයංගම වූ පද ගැළපුම, හදවතට ගෝචර වූ සරල බස් වහරක් භාවිත කිරීම, නිර්ව්‍යාජ ජීවන සෞන්දර්යය පිළිබිඹු කිරීම ඔහුගේ නිර්මාණකරණයෙහි අනන්‍ය ලක්ෂණ වන අතර සමකාලීන සෙසු කවීන් අතර මානවසිංහගේ සුවිශේෂත්වය ඉස්මතු කර දැක්වෙන මූලිකාංග ද ලෙස සැලකිය හැකි ය.

මොකටද අම්මේ
අම්මට ගැහුවේ
මාමල දෙන්නෙකු
වටකරලා

ඇඟ පත තැළිලා
රිදෙනව ඇතිනේ
කොච්චර ගැහුවද
බැඳ දමලා

දෙපා සතාගේ
ළඟ කා බී ගෙන
සිටියම ගතිගුණ
වෙනස් වෙලා

මාමල ඔහොමයි
උන්ගේ බහටම
හැරනව නෑකම
අත් හැරලා

අම්මල කන කොට
වතුර නාන කොට
තිප්පලෙ නිදියන
කොට වැටිලා

කැලේ මාමලා
ඉඩ දී අයිනට
වෙලා ඉන්නවා
නොවැ රැකලා

මිනිහයි කියනා
දෙපා සතාගේ
ළඟින් ගියත් ඇති
පොඩි පුතුනේ

ළෙහි පපු කම් නෑ
හරි ගති ගුණ නෑ
ඒ බව කවුරුත්
දන්නවනේ

අම්මට කිරි නෑ
වෙන අම්මල අර
එහෙ මෙහෙ දුවනව
බැදි ගොන්නේ

බඩගිනි එනවා
නිදිමත එනවා
කොහොමද අම්මේ
මා ඉන්නේ

අනේ පුතේ මට
කන්න බොන්න නෑ
ඒ හින්ද නෑ
කිරි එරුණේ

අයිනක ඉඳලා
දුවන අම්මලා-
ගෙන් කිරි බීපන්
පොඩි පුතුනේ

දරුවන් නැති අම්ම-
ලටත් කිරි නම්
තියෙනව හරියට
බුරුලු පුරා

ඒවා අම්මල
බෙදු ගන්නවද
අපට බොන්න
හැමවිටම උරා

එක දරුවෙක් ඇති
වුණොත් රැළේ අපෙ
කාටත් කිරි එරි
ලා එනවා

වෙනස් කමක් නෑ
එක සෙනෙහසමයි
කාගෙත් දරුවොයි
සැලකෙනවා

දැක්කද අම්මේ
හරි පොරයක් නේ
අපෙ නායකයට
පටලැවුණේ

ලොකු තුන් දෙනෙකුට
හිටි අඩියෙම සිට
ඊයේ ගහලයි
වල් වැදුණේ


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

නායකයා අපෙ
පැනලා යන්නෙ නෑ
වැට බැඳලා මිස
අප හැරලා

උන්දැත් එක්කල
ගහගන්නට බෑ
ඔක්කොම හිටලත්
අර ගොල්ලා

අම්මෙ අම්මෙ අර
බලන්නකෝ හැටි
දෙපා සතුන් පැන
ගෙන එනවා

අන්න අන්න අපෙ
නායකයා අද
ලේ දගෙන බිම
පෙරළෙනවා

බුද්දන් සරණයි
දෙයියන් සරණයි
තව තව ගස් ගස්
වල සරණයි

ගහගෙන බැරි වුණු
තැන මිනිසුන් හට
චී! චී! ගිනි ගුණ්-
ඩුවෙ සරණයි

නායකයා අපෙ
මළා නේද දූන්
දෙපා සතුන් ළං
වී සිටිති

දුටුවද අම්මේ
පොර කා ගෙන ඇද
වලිගේ ලොම් ගල-
-වා ගනිතී

බුදු සරණෙත් මදි
දෙවි සරණෙත් මදි
මයිල් ගහේ සර-
-ණෙත් පතතී

දෙපා සතුන් ඔය
ආරක්ෂාවට
රන් කෙන්දෙන්
ඕවා බඳිතී

අනිත් මල්ලිලා
නංගිල දුවනව
පුංචි කකුල් රිදෙනව
ඇතිනේ

කිරි උගුරක් බී
ගන්න බැරුව අර
දඟලන හැටි දුටු
-වද දුකිනේ

බෝසත් මුත්තල
ඉස්සර හිටියලු
අපේ කුලෙත් හොඳ
නම දුන්නේ

දළ දත් දුන්නලු
බුදු බව ලැබුවලු
ඒ ගැනවත් නැහැ
සලකන්නේ

අම්මෙ අම්මෙ අර
දෙපා සතුන් හෙම
ඔය තොරතුරු නැතු-
-වද දන්නේ

බෝසත් මුත්තල-
ගේ නාමෙට වත්
කිරි උගුරක් නැහැ
නොවැ දෙන්නේ

මිනිසුන් අතරේ
සමගිය නැති වී
බුදු හාමුදුරුවො
එදා අනේ

පාරෙලෙයිය වන-
යට වැඩි ද අපෙ
මුත්ත කෙනෙකි
උපකාර වුණේ

දලු ලන කාලේ
ගස් වැල් හෙවණේ
ගංගාවල සුදු
වැලි ගොල්ලේ

ඇවිද ඇවිද අප
ආයෙත් කවදද
රංචුවෙ යන්නේ
එක එල්ලේ

කුරුල්ලන්ගෙ ගී
සුළඟෙ යනව ඇති
කඳු රැළි හෙමිහිට
බැස යද්දී

විල්වල මල් හැම
පුබුදු දිනවා ඇති
අපි මෙහි සුසුමෙන්
පසුවෙද්දී

## ලිඛිත අභ්‍යාස

1. 'ඇත් ගාලේ දරු පෙම' දරු සෙනෙහස පිළිබඳ අපූරු චින්තාවක් මවන පැදි පෙළකි. විමසන්න.
2. මිනිසාගේ ඇතැම් ක්‍රියාකාරකම් සත්ත්ව සංහතියේ පැවැත්මට ද තර්ජනයක් වී ඇති ආකාරය මෙම පැදි පෙළේ විස්තර කෙරෙයි. පැහැදිලි කරන්න.

# 11 වැහි වලා කුළ

## කුමාරතුංග මුනිදාස (1887-1944)

සිංහල භාෂා හා සාහිත්‍ය ක්ෂේත්‍රයේ විප්ලවීය වෙනසක් සිදු කළ අමරණීය චරිතයක් ලෙස කුමාරතුංග මුනිදාසයන් සැලකිය හැකි ය. මොහු ලේඛකයකු, භාෂා ප්‍රවීණයකු, විචාරකයකු, පුවත්පත් කතුවරයකු මෙන් ම කවියකු ලෙස ප්‍රකට ද්විභාෂක උගතකු වූ අතර පාඨශාලාචාර්යවරයකු ලෙස සිය වෘත්තීය ජීවිතය ඇරඹී ය. 1917 දී **සාමාන්‍ය දැනීම පිළිබඳ ප්‍රශ්න** මැයෙන් ග්‍රන්ථයක් පළ කරමින් ග්‍රන්ථකරණයට අවතීර්ණ වූ කුමාරතුංග **කව්සිළුමිණ, නිකාය සංග්‍රහය** ආදි සම්භාව්‍ය ගද්‍ය, පද්‍ය ග්‍රන්ථ ගණනාවක් සංස්කරණය කරමින් ද කාව්‍ය ගීත හා ප්‍රබන්ධකරණය උදෙසා උපදෙස් සපයමින් **කව් ශික්ෂාව, විරිත් වැකිය, හෙළ මියැසිය** හා **ප්‍රබන්ධෝපදේශය, ප්‍රබන්ධ සංග්‍රහය** පළ කරමින් ද ස්වකීය ප්‍රඥා මහිමය ප්‍රකට කළේ ය.



සිංහල භාෂාවේ ව්‍යාකරණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ මොහු, භාෂාව ශුද්ධ වස්තුවක් ලෙස සලකමින් මිශ්‍ර සිංහලය බැහැර කරමින් සම්භාව්‍ය යුගයේ ග්‍රන්ථ ඇසුරින් සිංහල ව්‍යාකරණයේ සැඟවී පැවති රීති සම්ප්‍රදායන් අනාවරණය කරමින් ඊට අනුරූපව වත්මන් භාෂා භාවිතය සකස් විය යුතු ය යන දැඩි මතයෙහි එල්බ ගනිමින් සිංහල භාෂා පුනර්ජීවනයෙහි නියැලුණේ ය. 'හෙළහවුල' නම් වූ භාෂා ප්‍රේමීන්ගේ එකමුතුව ගොඩ නගා ගත් කුමාරතුංග 1939 දී 'සුබස' සඟරාවේත්, 1931 දී 'ලක්මිණි පහන' පුවත්පතේත් සංස්කාරක ධුරය ඉසිලී ය. මොහුගේ නිර්මාණාත්මක ප්‍රතිභාව වඩාත් විශද වන්නේ කාව්‍ය නිර්මාණ ඇසුරිනි. **ගීත්සැරය, හත්පණ, මගුල් කෑම, කුමාර ගී** යන කෘති ළමා පරපුර අතර බෙහෙවින් ජනප්‍රිය ළමා ග්‍රන්ථ වන අතර '**පියසමර**' මොහුගේ කවීත්වයේ අග්‍ර ඵලය ලෙස සැලකිය හැකි වේ. ළමයින් සඳහා මෙන් ම වැඩිහිටියන් සඳහා කළ මොහුගේ කාව්‍ය නිර්මාණවල වූ අපූර්වත්වය හා සාරවත් බව පාඨකයා කෙරෙහි එලෙසින් ම සන්නිවේදනය නො වීම කෙරෙහි හෙළ හවුලේ දැඩිතර භාෂා මතවාද ප්‍රබල පවුරක් විය.

1. වැහි වලා කුළ, පෑ කළු යැ යි ඔබේ
නො හොබිති යි කිසි ලෙස් නො සතොස් නො වන්
සිරුරු පැයෙනු'ගත් සුදනෝ ලොවේ
නො හඳුනත් උතුමන් ගුණයෙන් විනා.

2. පැනැ - නැඟී අහසේ පැතිරී ගොසින්,
මහ ගිමන් සිඳුවා සත සිත් තොසින්,
කුඹුරු - වැව් - පොකුණුත් පුරවා දියෙන්,
ලොවට දෙන්නා ඔබ යි අහරත් පැනුත්.

3. නද අසා ඔබ ගේ පැහැයත් බලා,
මොනරු පිල් විදහා රඟ දෙත් නදින්.
අමුතුයෙන් පණවත් බව ලත් සෙයින්,
තුරු ලියත් ලිය-ලයි සැනැසී දියෙන්.

4. සුදු වලා කුළු බෝ මැ අහස් කුසේ
ඉහළ යෙයි; ඔබ යැම පහත් වැ මැ යි
එ පුදුමෙක් ද? උසස් නැණවත් දනෝ
ගුණ බරින් නැමුණෝ'ව් පවතිත් නිතින්

5. කටට ගැන්ම ද බෝ මැ අමාරු වූ
කර දියත් ඔබ ගත් කලැ සාගරෙන්
මිහිරි වෙයි උතුමන් සහ වාසයෙන්
නිවටයෝ ද උසස් වෙති බෝ සෙයින්.

6. ගුණ බලා ඔබ ගේ ලො සබා දහම්
'ඔබැ'රැ අන් කිසිවෙක් නිසි නෑ' කියා
විදුලියත් පැහැ පත් රන දම් සෙයින්
පළඳවන්නෙ ඔබේ ගෙලෙ මැ යි බලන්.

**කියවන නුවණ**

## ලිඛිත අභ්‍යාස

1. වැහි වලා කුළ ඇසුරෙන් කුමාරතුංග කවියා උසස් මානව ගුණ ධර්ම නිරූපණය කරයි. ඒවා පහදන්න.
2. "කළු පැහැය පිළිබඳව සමාජයේ පවතින ආකල්පය නිෂේධනය කිරීමට වැහි වලා කුළ නිර්මාණය සමත් වෙයි" විමසන්න.
3. වැහි වලා කුළ පැදි පෙළ සාර්ථක නිර්මාණයකි. ඔබගේ අදහස් දක්වන්න.
4. පරිසරයේ විවිධ අවස්ථා ස්වකීය නිර්මාණයේ සාර්ථකත්වය සඳහා යොදා ගැනීමට කවියා දක්වා ඇති ප්‍රතිභාව 'වැහි වලා කුළ' ඇසුරෙන් විමසන්න.

# 12 අලුත ගෙනා මනාලිය

**ජී.බී සේනානායක (1913-1985)**

ජී.බී සේනානායක මහතා 'දිනමිණ' පුවත්පතෙහි සංස්කාරකවරයකු ලෙස කලක් කටයුතු කළ අතර ස්වෝත්සාහයෙන් දැනුම ගවේෂණය කළ අයෙකි. 1945 දී මුල් ම කෘතිය ලෙස **දුප්පතුන් නැති ලෝකය** නැමති කෙටිකතා සංග්‍රහය මොහු විසින් පළ කරන ලදි. 1946 දී **පළිගැනීම** නැමති කෙටිකතා සංග්‍රහයට ගද්‍ය හා පද්‍ය අතර වන රචනා විශේෂයක් ලෙස හඳුන්වමින් ඇතුළත් කළ 'නිදහස්' ආකෘතියට අයත් කාව්‍ය රචනා කිහිපය නිසඳැස් කාව්‍ය සම්ප්‍රදායේ ආරම්භය ලෙස සැලකේ. අනතුරුව ලියා පළ කළ කෘති අතර **දැල් කවුළුව, විදිමි, සෙවණැලි** යන කවි පොත් ද **මේධා, චාරුමුඛ, වරදත්ත, අවරගිර, රළබිඳුම, කැකෑරිල්ල, මල පුඩුව, ජල ගැල්ම, බැඳුම, රුව, උරගල, මධුපාණී, කෙලෙස් සයුර, එකට එක** යන නවකතා පොත් ද **මිතුරිය, ගමන, ඇත බැලුම, නැටුම** යන කෙටිකතා පොත් ද **මල් කුමරා, රත්හඳුන් රූපය, මහලෝභයා, හාල්මැස්සා, හීනය හා අඹකතාව** යන ළමා පොත් ද වේ. **රුබයියාට්** නම් පද්‍ය ග්‍රන්ථය ප්‍රථම වරට සිංහලයට පරිවර්තනය කළ සේනානායක **නවකතා කලාව, විචාර ප්‍රවේශය** (1945), **බටහිර ශ්‍රේෂ්ඨ නවකතා** (1955), **සාහිත්‍ය සේසත්** (1957), **සාහිත්‍ය විග්‍රහය** (1961), **සාහිත්‍ය ධර්මතාව** (1963), **සාහිත්‍ය දර්ශන සිතුවිලි** (1982) ආදි සාහිත්‍ය විචාර ග්‍රන්ථ රැසක් ද රචනා කර ඇත. සිංහල සාහිත්‍යයට අනල්ප සේවයක් කර ඇති මොහුට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් 'සාහිත්‍ය සූරී' සම්මානය පිරිනැමිණි.

එතෙක් සිංහල කවිය තුළ වූ සාම්ප්‍රදායික ආකෘතිය, වස්තු විෂය, භාෂාව හා අලංකාර භාවිතය මුළුමනින් ම වෙනස් මගකට ප්‍රවේශ කළ මොහු අර්ථය පදනම් කර ගත් ඛණ්ඩනයකට අනුව නිදහස් ආකෘතියක් ඔස්සේ ස්වකීය කවි රචනා කළේ ය. එතෙක් පැවතියා වූ සීමාසහිත කාව්‍ය වස්තු විෂය පථය අබිබවමින් පුළුල් හා සියුම් වූ පුද්ගල චෛතසික විවරණයක් කිරීමෙහි ලා ප්‍රථම වරට පෙලඹුණු කවියා ලෙස ජී. බී. සේනානායක සැලකිය හැකි වෙයි. බටහිර සමාජීය සභ්‍යත්වය කරණ කොට සිංහල සමාජයේ සිදු වූ සංකීර්ණත්වය වටහාගනිමින් බටහිර 'Free verse' යන කාව්‍ය සම්ප්‍රදායේ නොමඳ ආභාසයත් පැරණි සාහිත්‍යයෙන් ලද ජීවිත පරිඥානයත් සම්මිශ්‍රණය කරමින් කවියට වෙනස් මුහුණුවරක් ලබා දුන් සේනානායක නූතන සිංහල කවිය වෙනස් මගකට ප්‍රවේශ කළා වූ ආරම්භකයා ලෙස සැලකිය හැකි ය.

හිස නමා ගති ඈ
සිහින් රතැඟිලි පටලවා ගති,
සතියකට පෙර ගෙනා වර
විළිබරය මගෙ රන්වන් මනාලිය.

දැල් තිර අස්සෙන්
පෙනෙයි ඈ
ඔබ යනු මොබ එනු
පට පිළී ගෙන අබරණ පෙට්ටි ගෙන.

ඇසෙයි නොපෙනෙන විටත්
සාලයෙන් කාමරයට
කාමරයෙන් සාලයට
යන පා හඬ

මා වෙත එතත් ඈ
වුවමනාවක් කිසිත් නැතිවද
නො රැඳෙයි, පලා යෙයි.

ගෑ විලවුනෙහි,
නැත, රන්වන් සමෙහි
හෙළන සුස්මෙහි සුවඳය ඒ
ඈ බඳ සුවඳ
දැනෙන්නෙ මට විතර ද?

පෙනෙයි ඈ
ඇසෙයි
දැනෙයි
මට ගේ හැම තැන

## ලිඛිත අභ්‍යාස

1. චිත්ත රූප මැවීමට ජී.බී. සේනානායක කවියා සතු වූ දක්ෂතාව ‘අලුත ගෙනා මනාලිය’ පැදි පෙළ ඇසුරෙන් විමසන්න.
2. සිව් පද ආකෘතියට නැඹුරුව තිබූ සිංහල කවියේ ආකෘතිය නව මගකට යොමු කිරීමට ජී.බී. සේනානායකගේ දායකත්වය, අලුත ගෙනා මනාලිය නිර්මාණය ඇසුරෙන් අගය කරන්න.
3. ඉහත සඳහන් කාව්‍ය නිර්මාණයේ වස්තු විෂය සරලව පැහැදිලි කරන්න.

# 13 නන්ද මහ තෙරුන් වහන්සේගේ වස්තුව

**ධර්මසේන හිමි (දඹදෙණි අවධිය)**

දඹදෙණි සාහිත්‍ය සමය සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ ප්‍රාමාණික වර්ධනයක් ඇති කළ යුගයකි. පාලි, සංස්කෘත වියරණ සත්‍ය පොත් රැසක් ම මෙකල ලියවී තිබීමෙන් එය තහවුරු වේ. අනවමදර්ශි සංඝරාජ මාහිමි විසින් **දෛවඥ කාමධේනුව**, **පරෝපකාරය** වැනි සංස්කෘත පොත් ද සංඝරක්ෂිත හිමි විසින් **සුබෝධාලංකාරය** ද, වෛදේහ මහ ස්ථවිරයන් විසින් **රසවාහිනිය** වැනි පාලි පොත් ද මයුරපාද පිරිවෙන්පති බුද්ධපුත්‍ර හිමි පූජාවලිය ද, පතිරාජ පිරිවෙන්පති හිමි **සිදත් සඟරාව** ද, දෙවන පැරකුම්බාවන් **කව්සිළුමිණ** ද රචනා කර ඇත්තේ මේ දඹදෙණි සමයේ දී ය. ධර්මසේන හිමියන්ගේ **සද්ධර්මරත්නාවලිය** මෙකල රචනා කරනු ලැබූ සුවිශේෂ කෘතියකි.

සද්ධම්මට්ඨිති මිච්ඡන්තො - ධම්මසේන යතිස්සරො
ආකාසි පවරං එතං - සද්ධම්මරත්නාවලිං

ග්‍රන්ථාවසානයේ සඳහන් මේ ගාථා පාඨයෙන් කතුවරයා ධර්මසේන හිමි බව තහවුරු කර තිබේ. මේ මාහැඟි කෘතිය රචනා කිරීමට හේතුව ග්‍රන්ථාරම්භයේ සඳහන් වේ;

"එසේ හෙයින් යම් කෙනෙක් නුවණ මඳවත් කුසලච්ඡන්දය ඇති ව ධර්මාභියෝගයට උපදෙස් ලදින් බණ දැන පින්කම් හැසිර නිවන් සදාගනිත් නම්, එසේ වූ සත් පුරුෂයන්ට වැඩ සඳහා සද්ධර්මරත්නාවලිය නම් වූ ප්‍රබන්ධය කරම්හ"

සද්ධර්මය නැමැති මැණික් අමුණන ලද මාලය යන අරුතින් කෘතිය **සද්ධර්මරත්නාවලිය** යනුවෙන් නම් කර ඇත. පාලි ධම්මපදයේ ගාථාවලට බුද්ධඝෝෂ හිමි පාලියෙන් සංග්‍රහ කළ කතා වස්තු, දේශීය ගැමි ජීවන අත්දැකීම් හා මුසු කරමින් කියවීමෙන් මෙන් ම ශ්‍රවණයෙනුත් එක ලෙස රස විඳිය හැකි ආකාරයට සද්ධර්මරත්නාවලියෙහි ඉදිරිපත් වේ. පාලි ධම්මපදට්ඨ කථාවේ ඇතැම් කොටස් අත්හරිමින් ද අලුත් කතා එක් කරමින් ද උපමාවෙන් හා පිරුළෙන් අලංකාර කොට ඉදිරිපත් කිරීමට කතුවරයා සමත් ව ඇත.

මිලින්ද රජුගේ කතා පුවතේ එන නාගසේන කතාව ද සුත්ත නිපාත අටුවාව ඇසුරෙන් ලියූ කාෂ්ඨවාහන කතාව ද සාතාගිර හේමවත කතාව, සූවිසි විවරණ කතා හා බුදු සිරිත ද ධම්මපදට්ඨ කථාවේ සඳහන් කථාවලට අමතරව අලුතෙන් එක් කළ කොටස් ය. ධම්මපදට්ඨ කතාවේ එන පදගත විස්තර ආදිය මෙහි ඇතුළත් කොට නො මැත.

ධර්මෝපදේශ දානය පරමාර්ථ කරගෙන පාලියෙන් තිබූ කතා සිංහල ජනයාට ගැළපෙන පරිදි රචනා කරන ලද මේ බණ කතා පොත ස්වාධීන මඟක් ගත්තකි.

ධර්මසේන හිමියන්ගේ භාෂා පරිචයක්, අවස්ථා හා සිද්ධි නිරූපණයත් චරිත විවරණයත්, උපමා භාවිතයත් ග්‍රන්ථයේ විශේෂත්වයට හේතු වේ. කතු හිමියන්ගේ බහුශ්‍රැත භාවයත් ගැමි පරිසරයෙන් උකහාගත් මානව දයාවත් කෘතියෙහි අන්තර්ගත සෑම කතාවකින් ම වාගේ පිළිබිඹු කෙරේ. පිටු ගණනාවකින් විස්තර කළ යුතු ඇතැම් කරුණු එක් උපමාවකින් ඉදිරිපත් කර තිබීම ද සුවිශේෂ වේ. කතා වස්තු 308ක් හා මංගල සූත්‍ර ආදී සූවිසි විවරණ කතා ඇතුළු කතාන්දර තිස්තුනකුත් මීට ඇතුළත්ව ඇත.

ගැඹුරු දහම් කොටස් රස බර කතාන්දරවල දවටා කතා රසය ද දහම් රසය ද එක විට විඳගත හැකි වන ආකාරයට ඉදිරිපත් කර තිබීම වැදගත් ය. ඒවා කියවීමෙන් ද කියවන විට අසා සිටීමෙන් ද එක ලෙස රස විඳිය හැකි ය.

සද්ධර්මරත්නාවලියේ එන 'නන්ද' මහ තෙරුන් වහන්සේගේ කතා වස්තුවේ අරමුණු වී ඇත්තේ අනුශාසනා නැති වීමෙන් ශාසනයට ආශා නොමැති ව පිළිවෙත් පමාව නිවන් ලබාගත නො හැක්කවුන්ට ශාසනය කෙරෙහි ඇල්මක් ඇති කරගැනීමට මඟ පෙන්වා දීම ය. විටෙක මුවගට සිනාවක් නංවන හාස්‍ය රසයකින් ද තවත් විටෙක බුද්ධිගෝචර පණ්ඩිතමානී බවකින් ද යුතු නන්ද වස්තුව කවර පුද්ගලයෙකුට වුව ද යහපත් දිවියක් සඳහා ගුරු කොට ගත හැකි කතා වස්තුවකි.

තව ද අනුශාසනා නැති වීමෙන් ශාසනාභිරති නැතිව පිළිවෙත පමා වීමෙන් නිවන් සාධා ගත නො හෙන්නවුන්ට ශාසනාභිරතියට උපදෙස් නිසා නන්ද මහ තෙරුන් වහන්සේගේ වස්තුව කියමු.

හේ කෙ සේ ද යත්

බුදුහු බුදුවලා බිම්සර මහ රජුගේ අයදමෙන් රජගහා නුවර වැඩ වෙළුවන වෙහෙර වසන සේක් පිය රජ්ජුරුවන්ගේ ආරාධනාවෙන් කිඹුල්වත් නුවරට වැඩ නිග්‍රොධ නම් අරම සැතපීලා දෙවන දවස් සිඟා ඇතුළු කිඹුල්වත් නුවරට වැඩි සේක් නැතක් දවසින් දුටු පිය රජ්ජුරුවන්ට උපන්නක් දෙන්නාක් මෙන් ගාථා පමණෙකින් සෝවාන් කරවා මිනිස් ලොව උපදිතොත් සත් වරෙකින් වඩාත් නොහොත් දෙතුන් වරෙකින් වඩාත් නැත. එක වරෙකින් වඩාත් නූපදනා ලෙස කොට ලා අනික් ගාථාවෙකින් මහා ප්‍රජාපතී ගෝතමී නම් කුඩා මෑණියන්දෑගෙන් පූ තන කිරෙහි කිරි මිල ගෙවාලන්නාක් මෙන් උන්දෑ සෝවාන් කරවා, පියරජ්ජුරුවන් තනතුරෙන් වඩාලන්නා සේ සෙදගැමි කරවා, එම දවස් වළඳා අන්තයෙහි බිම්බා බිසොවුන්ගේ ගුණයෙහි තරම මහෞෂධ පණ්ඩිත අවස්ථාවෙහිත් විමසා තුබූ හෙයින් වදාරනු නිසා චන්දකිණ්ණර ජාතකය වදාරා, ඊට දෙවන දවස් නන්ද කුමරුන්ට වොටුනු මඟුලත් ගෙවදනා මඟුලත් විවාහ මඟුලත් තුන එක අවධියට පැමිණි කල්හි, මේ මඟුල් තුනට වඩා නිවන් මඟුල උතුම් බැවින් ඒ උන්ට පමුණුවා ලමී නුවරට සිඟා වැඩ සිඟා අන්තයෙහි නිවන් අත් පත් වන ලෙසින් පාත්‍ර ධාතුන් වහන්සේ අතට දීලා

ආදියෙන් යන ගමනට ඉෂ්ට සූචක කොට දුන් පාත්‍රය හෙයින් පාත්‍රය අතට හැර නො ගත් සේක.

නන්ද කුමරු ද බුදුන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන් ‘පාත්‍රය හැර ගත මැනව’යි නො කියා රජ ගෙන් වඩනා ගමන හෙයින් හිණි හිස කෙරෙහි දී හැරගන්නා සේකැ යි සිතූහ. බුදුහු එතන දීත් පාත්‍රය හැර නොගත් සේක් හිණි පා මුල දී හැර ගන්නා සේක් වනැ යි සිතා යන කලට එතන දීත් හැර නො ගන්නා රඳනු කැමැති වත් අභිප්‍රායකින් ම නොව බුදුන් කෙරෙහි ගෞරවයෙන් පාත්‍රය හැර ගත මැනව යි කියා ගත නොහී මෙතනදී හැර ගන්නා සේක. මෙතන දී හැර ගන්නා සේක් වනැ යි සිතා ම නො සිතින් ගියත් සිතින් ම සසර ගමනින් නවත්නා හෙයින් යෙත් ම ය.

ඒ වේලෙහි නන්ද කුමරුවන්ගේ දනවු කලණ නම් වූ කුමාරයන්ට සරණ තිල වූ මුල් නෑ කම කවරේ වුවත් රජ කම් හෙයින් බැදෑණියන් ළඟට මිනිස්සු ගොසින් බුදුහු පිය රජ්ජුරුවන්ගේ මාළිගාවට වැඩි ගමනේ මුඹදෑගෙන් වෙන් කොට නන්ද කුමරුන් වහන්සේ කැඳවා ගෙන වඩනා සේකැ යි කිවු ය. එ බස් අසමින් ඕ ද හිස සෝධමින් සිටි තැනැත්තෝ සෝධා නො නිමි හිස කේ නො බැඳ, වහා අවුත් ‘ගියත් සුළු ගෙයි, වහා එව’ යි කිවු ය. උන් කියා ලූ බස නන්ද කුමරුන් සිත දිවුල් ලාටු මුසු වයිති තරව වැද ගන්නා සේ තරයේ ම වැද ගත. බුදුනුත් පාත්‍රය අතින් නොගෙන වෙහෙරට ගෙන ගොසින් නන්ද කුමරුනි, මහණ වවු දැ’යි වදාළ සේක.

බුදුන් වදාළ බස මඟුලෙන් හෙළා ලූ කප උගුළුවන්ට බැරියා සේ උගුළුවා ලන්ට බැරි හෙයින් ‘මහණ නො වෙමි’යි නො කියා ‘යහපත මහණ වෙමි’ කියා ගිවිස්සාහ. එබැවින් තුලුන් මහණ කරව’යි වහන්දෑට භාර කොට කිඹුල්වත් නුවරට වැඩි තුන් වැනි දවස් නන්ද කුමරුන් මහණ කොට සත් වන දවස් බිම්බා බිසොවුන් විසි දහසක් රහතුන් පිරිවරා නුවරට සිඟා වැඩි තමන් වහන්සේ පෑ ලා ‘හෙම්බා පුත, තුලුන් දුටු ද තුලුන් සිඟා ඇවිදිනා පමණක් මුත් ගවු දෙගවු සතරගවු පමණ මුවවිට පළල ඇති පොළොව බොළ විතර උස ඇති නිධාන සැළ සතරෙක් ඇත. මුන් මහණ වන්ට ගිය තැන් පටන් නො දකුම්හ. තොප සක්විති වන නියාව දෙතිස්මහ පිරිමිනී ලකුණු නැමැති නිමිත්ත දන්නා දෙතිස් දෙනකු කියා සිටුත් වස්තුත් වුවමනා වේ ද? තෙපි තුලුන් කරා ගොසින් නිධාන පාවා ගනුව’යි රහල් කුමරුන් සරහා යවූ කල්හි කුමාරයෝත් දායාද ඉල්වමින් පසු පස්සෙහි ගමන් ගත්හ. බුදුහුත් නො නැවතූ සේක. කැටි ව යන්නෝත් ගමන් ගත්හ. බුදුහුත් නොනැවතූ සේක. කැටි ව යන්නෝත් බුදුන් හා කැටි ව යන ගමන නවතන්ට යුක්ති නැති වන්නා නො නැවතුහ. රහල් කුමරුහු ද සඳ හා කැටි ව නික්මුණු නකත් තරුවක් මෙන් නික්ම වෙහෙරට ගියහ.

බුදුහු ‘මේ තෙමේ සන්තක වස්තුවට තමා ආවේණිකව හිමි හෙයින් ඉල්වයි. ඒ සම්පත් තරමටත් ඒ මුල් වන ආදීනව මහත. මා සර්වඥතා ඥාන නමැති එක ධනය දී ලා ලත් ධන සතෙක් ඇත. මූටත් ඒ ධන සත ම දෙමි’යි සිතා වදරා සැරියුත් මහතෙරුන් වහන්සේ කැඳවාලා ‘හෙම්බා ශාරිපුත්‍රයෙනි, තෙල රහල් කුමරු අප අතින් වස්තු ඉල්වති. මහණ වන්ට එන ගමනේ අප ලා ලා ආ රකවල් නැති හෙයින් මුන් ඉල්වන සම්පත් තුබුවා නැත. හැමත් ධනයෙක් ම වේ ද? අපට ඒ ඇති ව තුබූ ධන සත ම දෙන නියායෙන් තුලුන් මහණ කරව’යි විධාන කොට මහණ කැරවූ සේක. මහණ වීමෙන් සිවුරෙනුත් එක් වැනි වූ සේක.

රහල් කුමරුන් මහණ වන්නා ම සුදොවුන්

මහරජ්ජුරුවන්ට ශෝක බලවත් විය. රජ්ජුරුවෝ ශෝක ඉවසා ගත නොහී බුදුන්ට දන්වන්නෝ 'මුඹ වහන්සේ මහණ වන්ට නික්මුණු දවස් ඇති ශෝකය නන්ද කුමර-රහල් කුමර දෙන්නාගේ මුහුණු දක්නා හෙයින් නිවිණ. නන්ද කුමරුන් මහණ වූ ශෝකය තනි රහල් කුමරුන් මුහුණ දක්නා හෙයින් සන්හුණ. උන් මහණ වූ ශෝකය අනික් සන්හිඳුවන්නෝ කවුරු ද? දරුපෙම් මුණුබුරුපෙම් ඇත්තේ මට මතු නො වන්නේ වේ ද කාටත් සරි ය. මේ කටයුත්ත මා පිළිබඳ හෙයින් කෙළේ ම ය. ඊට කිම් ද? මෙවක් පටන් මහණ වන්ට දෙමවුපියන් අනුනොදත් දරුවන් මහණ නො කරන්ට විධානයක් ඇත මැනැවැ'යි දැන් වූ ය. බුදුහුත් යහපතැ යි ගිවිසි සේක.

එක් දවසක් තිලෝගුරු බුදුන් සුදොවුන් රජ්ජුරුවන්ගේ රජ ගෙට වැඩ වළඳන්ට වැඩ හුන් වේලාවට සුදොවුන් රජ්ජුරුවෝ "ස්වාමිනී, මුඹ වහන්සේ බුදු බව සාධා ගන්ට දුක් ගන්නා සමයේ ගන්නා දුක් බලවත් හෙයින් එක් දෙවතාවෙක් මා ළඟට අවුත් මුඹ වහන්සේ මළැ යි යන්නක් කී ය. මම් ඒ අසා 'මපුතණුවෝ කලට පිපෙන මල් පිපී මුත් නො නවත්නා සේ බුදු වුවොත් මුත් නො මියෙති'යි කියා දේවතාවාගේ බස් මා හදහා ගත්තේ නැතැ"යි කිවු ය.

'මහ රජ, දැන් තෙපි බුදු වන කෙනෙකුන්ට මුත් පහළ නොවන දෙතිස් මහපිරිමිනී ලකුණු දැක සිටි තැනැත්තෝ, නැවත උපන් දවස් පහළ වූ දෙතිසක් විතර පෙළහරත් දැක කෙසේ හදහවු ද? යට ගිය දවස මහ දම්පල් කුමරු ව උපන් කල්හි මළ නියාව සාධන්ට එළුවන්ගේ ඇට ගෙනවුත් පෑලා කීවත් 'අපගේ කුලයෙහි උපන්නවුන්ගෙන් පරමායු ගෙවා මියන්නවුන් මුත් අතුරෙක මියන කෙනෙක් නැතැ'යි නො ගිවිස්සා ම ය' යි එතැන්හි මහදම්පල් දා වදාරා රජ්ජුරුවන් අනැගැමි

නොම්ලේ බෙදා හැරීම සඳහා ය.

කරවා, රහත් වීම අතුරෙක නො ව මියන දවස් ශ්‍රී යහනෙහි සැතපී හෙව රහත් වන ලෙස වූ කල්හි බුදුහු මහණ ගණා පිරිවරා නැවත කළමනා බුද්ධ කෘත්‍යය නොනිමි හෙයින් අඩුව සපයනු නිසා, රජගහ නුවර වැඩ අනේපිඬු මහ සිටුහු විසින් දෙව්රම් වෙහෙර කරවා නිමවා වඩනට ආරාධනා කොට යැවූ කල්හි සහ පිරිවරින් සැවැත් නුවරට වැඩ දෙව්රම වසන සේක.

මෙසේ බුදුන් දෙව්රම්හි වසන කලට ආයුෂ්මත් වූ නන්ද තෙරුන් වහන්සේ බැදෑවන් බිසොවුන් කියා ලූ බස් නමැති වයිති පෙම් නමැති දිවුළු ලා මුසු කොට, සිත් නමැති බිතත ඇඳලූ හෙයින්, ඒ බලා ශාසනයෙහි උකටලීව, 'මා ශාසනයෙහි ඇලුම් නැත. සිවුරු හරිමි'යි හිතමිත්‍ර වහන්දෑට කී සේක. බුදුහු ඒ පවත් අසා නන්ද මහතෙරුන් වහන්සේ කැඳවාලා 'සැබෑ ද නන්දයෙනි, භික්ෂූන්ට මෙබන්දක් කිවුදැ'යි විචාරා වදාරා 'සැබව ස්වාමීනී' යි උන් වහන්සේ කී කල්හි 'නන්දයෙනි, සිවුරු හරණේ කුමක් නිසා දැ'යි විචාරා වදාළ සේක. එසේ විචාරා වදාළ බුදුන්ට 'ස්වාමීනී, මා මහණවන්ට සිතින් නොසිතින් එන ගමනේ දනවුකලණ බිසවු සෝධාපූ හිසකේ හිණි නො ගන්නා තෙක් අවුත් 'වහා අව මැනැවැ'යි යන බසක් කිවූ ය. මම ඒ බස එක් වන් සඳහන් කරන්නෙම් මෙබන්දක් සිතමි'යි කී සේක.

එකල බුදුහු තිබී බලවත් වන ලෙඩක් බෙහෙදක් දී සන්හිඳුවන කලක් මෙන් ඔබගේ එබඳු අනුභාවයක් නැතත් තමන් වහන්සේගේ අනුභාවයෙන් අත අල්වා ගෙන තව්තිසා දෙව්ලොවට වඩනා සේක් අතුරුමග නවදැලි සේනක් මවාලා ඒ සේනේ දා ගිය කණුවෙක දා වක ගැසී ගිය වැදිරිමැල්ලක මවාලා තවුතිසා දෙව් ලොවට වැඩ සක්දෙවිඳුහුගේ පන් සියයක් පමණ දෙවඟනන් පෑලා 'කුමක් ද

නන්දයෙනි, රුවින් වූ කලී මේ දෙවඟනෝ යහපත්තු ද නොහොත් දනවු කලණ බිසවු යහපත්තු දැ'යි විචාළ සේක.

'ස්වාමීනී, කුමක් වදාරන සේක් ද මේ දෙවඟනන් දුටු කලට ඒ දනවුකලණ බිසවු නම් අතුරුමඟ නවදැලි සේනේ අප දුටු දා වක ගැසී ගිය වැදිරිමැල්ලත් වටිත් දැ'යි කී සේක. ඒ අසා බුදුහු 'එසේ වී නම් නන්දයෙනි, ශාසනාභිරතිය ඇති ව සිල් රක්ෂා කෙළේ නම් කෙලෙසුන් ගෙවා ගන්ට නුවූවොත් දෙව්ලොව ඉපද දෙවඟනන් ලබන නියාවට මම ඇපයෙමි'යි වදාළ සේක. ඒ අසා නන්ද තෙරුන් වහන්සේ 'එසේ වී නම් දෙවඟනන් ලබන නියාවට මෙ තරම් ඇපත් ඇති බැවින් බඹසර හැසිරෙමි' යි කී සේක. මෙලෙසින් සස්නෙහි ඇලුම් ඇති කරවා හැදහිලි නැති කෙනෙකුන් ප්‍රසිද්ධ ස්ථානයට ගෙන ගොස් තරය කරවා රුචි දෙය කරවා ගන්නා සේ සිල් රක්ෂා කිරීමට දෙව්ලොව ගෙන ගොසින් තරය කරවා ගෙන නන්ද තෙරුන් වහන්සේ හැර ගෙන දෙව්ලොව වැඩ උන් වහන්සේට ඇප වූ නියාව නො හඟවන්නට කරන්නාක් මෙන් දෙව්ලොව දී අතුරුදන්ව

"බොධනෙය්‍යං ජනං දිස්වා - සතසහස්සෙහි යොජනෙ

ඛණෙන උපගන්තවාන - බොධෙති තං මහාමුනි"

යනු හෙයින් ඇසිල්ලකින් දෙව්රම පහළ වූ සේක. වහන්දෑ මෙ පවත් අසා 'නන්ද තෙරුන් වහන්සේ නම් බුදුන්ගේ කුඩා මෑණියන්දෑගේ පුත් සේක. මහණව කරන සංකමුත් ගෙය කඹුරන්නා සේ දෙවඟනන් නිසාල. එයිත් ඇපයකට නො නිසි බුදුන්ගෙන් ඇප ඇතිව ලැ'යි නන්ද තෙරුන් වහන්සේ ළඟට ගොසින් මෙ හැම කියා වෙහෙසන සේක.

නන්ද තෙරුන් වහන්සේ ද වහන්දෑගේ කතාවෙන් තරයේ ම ලජ්ජා ඇතිව දෙවඟනන් කෙරෙහි කළ ආලය හැරී, පෙරළි හන්ට තුබූ දෙයක් නො හෙන ලෙස තනා තබා ගන්නා සේ පෙරළා මහණ දමට ම සිත්සතන් යොමු කොටලා රජ සිරි හැර අවුත් නිවන් සිරි නො වරදනා නිසා නො පමාව වසන සේක. යම් සේ ලේනෙක් තමා තරම් කෙනෙකුන් තමාට සතුරුව ආ කල තමාගේ නඟුට කුප්පවාලා එයින් ගසාලා පහ කෙරේ ද, එමෙන් ළං වූ කෙලෙස් සතුරු කෙනෙක් ඇත් නම් සතර සීවටන් නමැති මුගුරෙන් මරා පලවමින් යම් සේ දිවි දෙනෙක් කෙතෙක් වුවත් එක වරෙක වදන පැටවුන් මුත් දෙවන මුරයේ නො වද ද, එක මුරයෙන් ම වඳ වේ ද, එපරිද්දෙන් උපන් ජාති විනා භවෝත්පත්ති නැති වීමට අදහස් ඇතිව යම් සේ දිවියෙක් තණ කැළෑ ආදිය යට වැදලා හිඳ ගොදුරු අල්වා ගනී ද, එසේ ම අර්හත් ඵල නමැති ගොදුරු නිසා ගම්භීරාරණ්‍ය රුක් මුල්, ගල්පාවුළු, කඳුරැලි, ගල්ගුහා සොහොන අබවස යනාදියට එළඹ, යම් සේ දිවියා ගොදුරු අල්වා ගත් කලට වමැළැයෙන් හුණු ගොදුරු නො කා ද එ පරිද්දෙන් එක් විසි අන්වේෂණ වශයෙන් වේවයි' වාග් විඥප්ති වශයෙන් වේවයි, උපන් දෙයක් ඇත්නම් විෂ මිශ්‍රයක් පරිද්දෙන් හැර විදසුන් වඩා රහත් ඵල නමැති වොටුනු පැළඳීමෙන් හැර ආ රාජාභිෂේකයට රාජ්‍යාභිෂේකයක් ලදින් හැර පියා ආ ගෙමඟුලට නිවන් ගෙමඟුල් කොට හැර ආ විවාමඟුලට පලසමවත් විවාමඟුල් කොට, බුදුන් සන්තක නිවන් රට තමන් වහන්සේටත් හිමි කළ සේක.

එක් දේවතාවෙක් රාත්‍රි වේලෙහි දෙව්රම වසන බුදුන් කරා ගොසින් වැඳලා 'ස්වාමීනී, මුඹ වහන්සේගේ මල් වූ නන්ද මහතෙරුන් වහන්සේ රහත් වූ සේකැ'යි කිවූ ය. ඔහු නොකියන තෙක් ම බුදුහුත් දෙව්ලොව ගිය ගමනින් ම සසර ගමන් නිමවා රහත් වූ

නියාව විමස විමසා හිඳිනා සේක් එසේ ම දත් සේක. නන්ද මහ තෙරුන් වහන්සේ ද රාත්‍රිය පාන් වූ කල්හි බුදුන් කරා ගොසින් වැඳලා 'ස්වාමීනී, මුඹ වහන්සේ දෙව් ලොව වැඩි ගමනේ දෙවඟනන් පන් සියයක් මා ලබන නියාවට වූ ඇපයෙක් ඇත්තේ වේ ද, මෙ වක් පටන් දෙවඟනන් තබා කිසිවකත් මාගේ ඇල්මක් නැති හෙයින් ඒ ඇප නැතැ'යි කී සේක. බුදුහු ඒ අසා වදාරා 'නන්දයෙනි, තොප රහත් වූ නියාව අපිත් දතුම්හ. දේවතාවකුත් අවුත් අපට කිව. එ සේ හෙයින් තොප කීවත් නො කීවත් අපි ඒ ඇපයෙන් මිදුණුම්හ' යි වදාරා රහත්ව ශෝභාවත් වූ මුහුණ ඊම තබා ශෝභාමත් කරවූ සේක. වහන්දෑ ද ගොසින් රහත් නියාව නොදැන 'කුමක් ද? පෙර සිතන්නේ සිවුරු හරනට වේ ද දැන් කුමක් දැයි විචාරා 'මා ගිහිවීමෙහි ආලයෙක් නැතැ'යි කී කල්හි මු ගිහි වීමෙහි ආලයක් නැති නියාව කියති. මුන් බොරු කියන නියා වේ දැ යි බුදුන්ට එ පවත් දැන් වූ සේක.

බුදුහු ඒ අසා 'මහණෙනි, යම් සේ සෙවිලි නො දැන්මෙන් නපුරු කොට සොයාලූ ගෙය වැසි නැති විටෙක මුත් වැස්ස වට විට ම තෙමේ ද, එ පරිද්දෙන් සමථ භාවනා, විදර්ශනා භාවනා නැමැති සෙවිල්ල නො දන්නා හෙයින් තදංග විමුක්ති නැමැති එක් තරම් සෙවිල්ලකින් සොයාලූ සිත් නැමැති ගෙයක් කෙලෙස් නැමැති එක් තරම් වැස්සක් වටත් තෙමී මුත් නො හරණේ ය. යම් සේ සෙවිල්ල දන්නවුන් යහපත් කොට සොයාලූ ගෙය එක්තරා වැස්සකින් තබා මහත් වැස්සකිනුත් නො තෙමේ ද එ පරිද්දෙන් ද්විප්‍රකාර භාවනා නැමැති තර සෙවිල්ලෙන් සොයා ලූ සිත් නැමැති ගෙය සසර මහ මුහුදු පුරන තරම් වූ කෙලෙස් මග වැසි වටත් නො තෙමෙ'යි වදාළ සේක.

ඒ අසා නන්ද තෙරුන් වහන්සේගේ නුගුණ කියන්ට ගිය වහන්දෑ සෝවාන් ඵලාදියට පැමිණීමෙන් ලොවුතුරා ගුණය ලත් සේක. සත්‍ය අසත්‍ය නොදත් වහන්දෑ චතුස්සත්‍යය දත් සේක. ධර්ම සභායෙහි ද කථාවෙක් උපදනේ. බුදුවරුන් වහන්සේ නම් ඉතා ආශ්චර්ය සේක. ජනපද කල්‍යාණීන් නිසා නිවන් සම්පතින් පිරිහෙන්ට සිටි මලණුවන් වහන්සේට එක් තරම් දෙයක ඇවිටි ඇත්තවුන්ට වැඩියුරු දෙයක් පැලා ඇවිටි කළ එක් තරම් දෙයෙහි ඇවිටි හරවන්නා සේ දනවුකලණ බිසොවුන් කෙරෙහි කළ ඇවිටිය දෙව්ලොවට ගෙන ගොසින් දෙවඟනන් පැලා අරවාලූ සේක. මේ අනික් කාට පිළිවන් දැ'යි යන කථාව ය.

බුදුහුත් වහන්දෑ කරන කරන කතාව දිවකනින් අසා වදාරා, 'භික්ෂූහු නන්දයන් ශාසනයෙහි ඇලුම් කරවා ගත් නියාව අරභයා කතාව කෙරෙති. මම එ තෙනට ගියෙම් නම් 'හෙම්බා මහණෙනි, ඒ දැන් මතු නොවන්නේ වේ ද යටගිය දවසත් තෙල ලෙස ම උන්ට ඇති වූ ඇවිටියක් හැරවීම් කියාලා ඒ හඟවන්ට ජාතක කතාවක් ගෙන හැර දක්වමි. මාගේ මේ ජාතක දේශනාව පස්වා දහස මුළුල්ලෙහි බොහෝ දෙනාට බොහෝ ප්‍රයෝජන සාධා දෙන්නේ ය'යි සිතා වදාරා ධර්ම සභාවට වැඩ සුවිනීතව සුශික්ෂිතව වැඩහුන් පර්ෂද බලාපියා 'රන් නැවක් මධ්‍ය කොට පිපී වැනී ගිය රත් නෙලුම් වනයක් සේ මේ භික්ෂු පර්ෂද ඉතා හොබිති. මම පළමු කොට කතාවට ආරම්භයක් කෙළෙම් නම් මින් පෙරාතු කොට බසක් බැණ නැගෙන කෙනෙක් නැත. මම් ම පළමු කොට කථාව උපදවමි යි සිතා 'මහණෙනි, මා එන්නාට පෙරාතු කොට කෙසේ වූ කථාවක් කොට කොට හුණු දැ'යි විචාරා වදාරා මේ කතාව නියාව දැන්වූ කල්හි 'මහණෙනි, ඒ දැන් මතු නොවෙ'යි වදාරා භික්ෂූන් වහන්සේ

විසින් ආරාධිත වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ භස්ම ප්‍රච්ඡන්න ජාත වේදයක් සේ භවයෙන් සැඟවී තුබූ ඉකුත් වත් කථාව දක්වන සේක්

"මහණෙනි, යටගිය දවස බරණැස් නුවර බඹදත් නම් රජකු රජ කරන කල්හි එම බරණැස් නුවර කප්පට නම් වෙළඳාණ කෙනෙක් වූහ. උන්ගේ එක් කොටළුවෙක් දසාමුණක් විතර බර උසුලයි. දවසකට එතෙක් බර උසුලාගෙන අටවිසි ගව්වක් විතර යෙයි. එක් සමයෙක ඒ වෙළඳාණෝ කොටළුවන් උසුලන්නාවූ ගැල්වලින් බඩු ගෙන්වාගෙන තක්සලා නුවර ගොසින් ගෙන ගිය බඩු විකපත් වන තෙක් කොටළුවාණන් තණ පත් කන්ට හළවු ය. ඉක්බිත්තෙන් ඒ කොටළුවාණෝ ද අගළ පිට කා ඇවිදිනා තෙනැත්තෝ එක් කොටළු දෙනක දැක ඈ ළඟට ගියහ. ඔයිත් උන් හා සාදසාමීචි කථා කරන්නී 'කොයි සිට අවුදැ'යි විචාරා බරණැස් නුවර සිට යයි කී කල්හි 'කුමක් නිසා මෙතෙක් කතර අවුදැ' යි විචාළීය.

'වෙළඳාම් පිට ආමි' කී කල්හි 'උසුලන්නේ කෙතෙක් බර දැ'යි විචාළීය. 'දසමුණක් විතර බර උසුලමි' කී කල්හි 'මෙතෙක් බර උසුලාගෙන දවස කෙතෙක් තැන් යවු දැ'යි විචාළීය. 'අට විසි ගව්වක් විතර යෙමි' කී කල්හි 'ඒ වන්නා මෙතෙක් තැන් නිකමුත් නොව බර උසුලාගෙන යව. ගිය තැන ගමන් ඇවිදින පය මිරිකන කෙනෙක් ඇද්ද, නැද්දැ' යි ඊට පිටලා අනික් විතාරන දෙයක් විචාළීය. 'නැතැ'යි කී කල්හි තිරිසන් වුවත් ස්ත්‍රී කලට ස්ත්‍රී මායමෙහි අඩුවක් නැති හෙයින් තමා කෙරෙහි ඇලුම් කරවා ගන්නා පිණිස තිරිසනුන්ට පා මැඬීම නැතැත් 'එ විතරකුත් නැත්නම් දුක් නියා වේ දැ'යි තමා උන්ට සම්භ වුවොත් ඉන් මුට්ටුවක් නැති ලෙසට උන්ට හඟවා කී ය. කොටළුවාණෝ සැබෑ බසකැයි සිතා එ බසෙහි ම එලී ගත්හ.

වෙළඳාණෝ ද ගෙනා බඩු විකපත් කොට ගෙන කොටළුවා ළඟට අවුත් 'ගෙනා බඩු විකපත් කොට ගතුම්හ' යි කිවූ ය. 'මුඹ දැන් ගිය මැනව. මම රඳමි'යි කොටළුවාණෝ කිවූය. නැවත නැවත පෙරැත්ත කීවත් කොටළුවාණෝ යන්ට මැළි වූ ම ය. ඒ අනිකක් නිසා නො වෙයි. කොටළු දෙනගේ බස් නමැති මලෙහි බැඳී ය. වෙළඳාණෝ ද තොප මැළි ම බැවින් :-

'පතොදන්තෙකරිස්සාමි - සොළසංගුලකණ්ටකං
සඤ්ඡින්දිස්සාමි තෙ කායං - එවං ජානාහි ගද්‍රභ'

යනු හෙයින් 'කැවිටි හුල ම සොළසඟුලක් පමණ වූ කැවිටක් කරවාලා කැවුටුවම් කොටත් ගෙන යෙමී' කී කල්හි 'එසේ කළොත් පෙර පා දෙක තරයේ බිම ඔබා ගෙන, පස්සා පයින් අඬෙන් ගසා දත් වගුරුවා පියමී' කීහ. වෙළඳාණෝ ඒ අසා 'මුන් මෙතෙක් කලෙක මෙසේ වූ බසක් කී විරූ නැත. කාරණා කිම් දෝ හෝ' යි ඈත මෑත බලා කොටළු දෙන දැක 'මෑ නිසාය මෙ ලෙසට කරවා ගත්තේ ය'යි සිතා අට තැනකින් වක්ව තුබූ මැණිකෙහි ලණුව අවුණා ලන්ට නිසි නුවණ ඇති වන මහා පුරුෂයාණ කෙනකුන් හෙයින් 'තෙපි රඳන්ට නොසිතව. ඔබ ගිය කල,

'චතුප්පදිං සංඛමුඛිං - නාරිං සබ්බංගසොභිනිං,
භරියං තෙ ආනයිස්සාමි - එවං ජානාහි ගද්‍රභ,

යනු හෙයින් 'සකක් හා සමාන සොඳ මුහුණක් ඇති තමාගේ ජාතියට ඉතා රූපත් වූ කොටළු දෙනක ගෙනවුත් පාවා දෙමි'යි කීහ. එ බස් අසා බලවත් සේ සතුටු ව ගොසින් බල බලා සිටි කොටළු දෙන කෙරෙහි ආලය නැති ව, බසින් ඇසූ කොටළු දෙන කෙරෙහි ආලය බලවත්ව 'එසේ වී නම් පටවාලූ බරත් හැර ගෙන මෙතෙක් කල් යන අටවිසි ගව්වට අනෙක් අටවිසි ගව්වකුත් පිටලා ලා ස පණස් ගව්වක් යෙමී' කිවූ ය.

වෙළඳාණෝ ද යහපතැ' යි ගිවිස කැඳවා ගෙන සිය තැනට ගොසින් කීප දවසකින් කොටළුවාණන් කොටළු දෙනගේ ස්වරූප සඳහන් කරවූ කල්හි 'ආදි එසේ කියා ලා නොගෙනෙන්නේ නැත. ගෙනවුත් පාවා දෙමි. බල එකෙක් ඇත. උන් ඇතත් වැටුප් වියදම් තොප පමණකට දෙමි. උන් මට කරන මෙහෙයක් නැති හෙයින. එසේ දුන් දෙය තොප දෙන්නාට ඇති වෙයි, මඳ වෙයි. මම ඒ නො දනිමි. උඉ පසුව තොපට බොහෝ දරුවනුත් වදති. දරුවන් වුවත් අඹුවන් වුවත් උන් බොහෝ වුවයි අපගෙන් රැකෙන්නන් බොහෝ හෙයින් වැටුප් බොහෝ නො කෙරෙමි. සැහේ නමුත් මඳ වේ නමුත් සුප්පාරක ජාතකයෙහි කරනවැම්යාට දා රජ්ජුරුවන් කවර තරම් දස්කමක් දැකත් අට මස්සක් ම දෙන්නා සේ තොප කෙතෙක් දෙනා වුවත් තොප පමණකට දෙමි'යි කිවූය. ඒ අසා කොටළුවාණෝ කොටළු දෙනුන්ට කළ ආලය වැටුපට කොළෝ ය. බුදුහු මේ ජාතක දේශනාව නිමවූ සේක.

එ හෙයින් නුවණැත්තවුන් විසින් කෙලෙස් විසින් පවත්නා අකුසලින් දුරුව භාවනා කුසල් පිහිටා තදංගාදී වශයෙන් සිත් සතන් පිරිසිදු කටයුතු.

## අරුත් පැහැදිලි කිරීම

| | | |
|---|---|---|
| ශාසනාභිරති | - | බුදු සසුන පිළිබඳ ඇල්ම |
| පිළිවෙත පමා වීමෙන් | - | ප්‍රතිපත්ති පිරීමට ප්‍රමාද වීම නිසා |
| බුදු ව ලා | - | බුද්ධත්වයට පැමිණ |
| අයදමෙන් | - | ආයාචනා කිරීමෙන් |
| නැතක් දවසින් | - | බොහෝ දවසකින් |
| උපන්නක් දෙන්නාක් මෙන් | - | තමන්ට ලැබුණු යමක් දෙන්නාක් මෙන් |
| සත්වරෙකින් වඩාත් | - | උපරිම වශයෙන් වාර හතක් |
| දෙතුන් වරෙකින් වඩාත් නැත | - | වාර දෙක තුනකට වඩා නැත |
| වඩා ලන්නා සේ | - | උසස් කරන්නාක් මෙන් |
| සෙද ගැමි කරවා | - | සකෘදාගාමී තත්ත්වයට පත් කොට |
| ආදියෙන් යන ගමනට | - | මුලින් ම යන අවස්ථාවට |
| ඉෂ්ට සූචක කොට | - | යහපත් දෙයක් අඟවා |
| හිණි හිස | - | පඩිපෙළ මුදුනෙහි |
| රඳනු කැමති වත් | - | නැවතීමට කැමති වූවත් |
| අභිප්‍රායකින් | - | බලාපොරොත්තුවකින් |
| සිතින් ම සසර ගමනින් නවත්නා හෙයින් | - | සිත කරණ කොට ගෙන සසර ගමන නවතින බැවින් |
| සරණ නිල වූ | - | විවාහයට නියමිත වූ |
| බැදෑණියන් | - | ඥාති සහෝදරිය/විවාහ වීමට නියමිත කාන්තාව |
| මුඹ දෑගෙන් | - | ඔබතුමියගෙන් |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

| | | |
|---|---|---|
| සුළුගෙයි | - | ඥාති සහෝදරයා/විවාහ වීමට නියමිත පුද්ගලයා |
| වයිති | - | චිත්‍රයක් ඇඳ එය දිගුකල් පැවැත්ම සඳහා මතු පිටින් තවරන ආලේපය |
| මහණ වවු දැයි | - | පැවිදි වන්නෙහි දැයි |
| මඟුලෙන් හෙළා ලූ කප | - | මංගල නැකතකින් සිටු වන ලද කණුව |
| තුලුන් | - | මේ තැනැත්තා |
| පැලා | - | පෙන්වා |
| මුව විට පළල | - | කිසියම් වටකුරු භාජනයක මුදුනේ විෂ්කම්භය |
| පොළොව බොළ විතර උස ඇති | - | පොළොවේ ඝනත්වයේ තරමට උස තිබෙන |
| සැළ සතරෙක් | - | හැළි හතරක් |
| දෙතිස් මහ පිරිමිනී ලකුණු | - | මහා පුරුෂයකුට අයත් වන පුරුෂ ලක්ෂණ තිස් දෙක |
| දෙතිස් මහා පිරිමිනී ලකුණු නැමැති නිමිත්ත දන්නා දෙතිස් දෙනෙකු කියා සිටුත් වස්තුත් වුවමනා වේද | - | දෙතිස් මහා පුරුෂ ලක්ෂණ යනුවෙන් නිමිති තිස් දෙකක් කියා ඇතත් වස්තුවක් වුවමනා වේ ද? |
| ආවේණිකව හිමි හෙයින් | - | පරම්පරාගතව අයිති නිසා |
| වාග් විඥප්ති | - | වචනවලින් කරන ලද ඉල්ලීමක් |
| විදසුන් වඩා | - | විදර්ශනා භාවනාව දියුණු කොට |
| හැර ආ රාජාභිෂේකයට | - | අත් හැර දමා පැමිණි රජකම වෙනුවට |
| රාජ්‍යාභිෂේකයක් ලදින් | - | රාජ්‍ය ගණනාවකට ම රජ පදවියක් ලැබීම නිසා |
| ගෙමඟුලට | - | ගෘහ මංගල්‍යය/ගෙට ගෙවදීම වෙනුවට |
| නිවන් ගෙමඟුල් | - | නිර්වාණය නැමැති ගෘහයට ඇතුළු වීමේ මංගල උත්සවය |
| විවා මඟුලට | - | විවාහ මංගල්‍යය වෙනුවට |
| පල සමවත් විවා මඟුල් | - | ඵල සමාපත්තිය නැමැති විවාහ මංගල්‍යය |
| ඊම තබා | - | එහි ම තබා |
| සිවුරු හරනට | - | සිවුරු හැර යෑමට |
| සෙවිලි නො දැන්මෙන් | - | අතු සෙවිලි නො කිරීම නිසා |
| නපුරු කොට | - | වැරදි ලෙස |
| සොයා ලූ ගෙය | - | අතු සෙවිලි කළ නිවස |
| වට විට ම | - | වැසි වැටුණු අවස්ථාවෙහි ම |
| සෙවිල්ල | - | සෙවිලි කිරීම/වසා දැමීම |
| තදංග විමුක්ති | - | ඒ අවස්ථාවට පමණක් කෙලෙස්වලින් අත්මිදීම |
| එක් තරම් සෙවිල්ලකින් | - | එක් ආකාරයක සෙවිලි කිරීමකින් |
| සොයා ලූ | - | අතු සෙවිලි කළ |
| එක් තරම් වැස්සක් වටත් | - | එක් ආකාරයක වැස්සක් වැටුණත් |

| | | |
|---|---|---|
| තෙමී වුත් නො හරනේ ය | - | තෙමී මිස අත් හැරීමක් නො වේ (ඒකාන්තයෙන් ම තෙමෙයි යන අදහසයි) |
| ද්විප්‍රකාර | - | දෙයාකාර |
| තර සෙවිල්ලෙන් සොයා ලූ | - | නිවැරදි ලෙස අතු සෙවිලි කළ |
| එක් තරම් දෙයක ඇවිටි ඇත්තවුන්ට | - | එක් දෙයක් ලබා ගැනීමට කැමැත්ත පළ කළ අයට |
| වැඩි යුරු දෙයක් පැලා | - | ඊට වඩා වැඩි ප්‍රතිඵලයක් ලැබෙන දෙයක් පෙන්වා |
| ඇවිටි කළ එක් තරම් දෙයෙහි | - | කැමැත්ත දැක්වූ වස්තුව පිළිබඳ |
| ඇවිටි | - | කැමැත්ත/ආශාව |
| හරවන්නා සේ | - | ඉවත් කරන්නාක් මෙන් |
| පස් වා දහසක | - | අවුරුදු පන් දහසක් |
| සුශික්ෂිත | - | මනා ලෙස හික්මවන ලද |
| පර්ෂද | - | පිරිස |
| භස්ම ප්‍රච්ඡන්න ජාතවේදයක් | - | අළුවලින් වැසී ගිය ගිනි පුපුරක් |
| විකපත් | - | විකිණී අවසන් |
| මෙතෙක් කතර | - | කාන්තාරයේ මෙතෙක් දුර |
| ඒ වන්නා | - | එය එසේ වේවා! |
| විතාරන දෙයක් | - | විමසන යමක් |
| මුට්ටුවක් | - | අඩුපාඩුවක්/වරදක් |
| මලෙහි | - | මලපුඬුවෙහි/උගුලෙහි |
| කැවිටි හුල | - | කෝටු රාශිය |
| සොළොසඟුලක් | - | අඟල් දහසයක් |
| කැවිටක් | - | හරකුන් දක්කා ගෙන යෑම සඳහා යොදා ගැනෙන කෙවිටක් |
| කැවුටුවම් | - | කෙවිටෙන් ඇනීම |
| සකක් | - | හක් ගෙඩියක් |
| ආදි | - | මුල දී/මුලින් |
| තදංගාදි වශයෙන් | - | ඒ අවස්ථාවට පමණක් යටපත් වීම් වශයෙන් |
| මස්සක් | - | රන් කලඳක් බර කාසියක් |

## ලිඛිත අභ්‍යාස

1. "යම් සේ සෙවිල්ල දන්නවුන් යහපත් කොට සොයා ලූ ගෙය එක්තරා වැස්සකින් තබා මහත් වැස්සකිනුත් නො තෙමේ" යන්න නන්ද හිමිගේ චරිතය ඇසුරෙන් විමසන්න.
2. 'කප්පට' වෙළෙන්දාගේ උපාය ඥානය පිළිබඳ විමසීමක් කරන්න.
3. සද්ධර්මරත්නාවලියේ සුවිශේෂ ලක්‍ෂණය වූයේ රසවත් කතාන්දරයක ගැඹුරු දහම් අන්තර්ගත කර තිබීම යි. නන්ද වස්තුව ඇසුරෙන් විමසන්න.
4. ප්‍රස්තුතයට උචිත ලෙස උපමා භාවිතයට ධර්මසේන හිමි දැක්වූ කුසලතාව උපමා පහක් ඇසුරෙන් විමසන්න.
5. ධර්මසේන හිමි කතා පුවත රසවත්ව ඉදිරිපත් කිරීම සඳහා අවස්ථා නිරූපණයන් කෙතෙක් දුරට සාර්ථක ව යොදාගෙන ඇති ද යන්න නන්ද වස්තුවේ අවස්ථා තුනක් යොදා ගනිමින් පහදන්න.

# 14 වැලපීම

## ඇන්තන් පවුලොවිච් චෙකෝෆ් (1860-1904)

ඇන්තන් පවුලොවිච් චෙකෝෆ්, 1860 ජනවාරි 17 වැනිදා දකුණු රුසියාවේ තන්ග්රෝග්හි උපන්නේ ය. ඔහුගේ පියා කුඩා වෙළඳසල් හිමියෙක් විය. පුංචි ඇන්තන්ට ජීවත් වන්නට සිදු වූයේ, දැඩි විනයකට යටත්ව ය. දිනපතා යාඥා ගීත කියවන්නටත්, පල්ලි යන්නටත් ඔහුට සිදු විය. වයස අවුරුදු පහේ දී ඔහු තම පියාගෙන් දඬුවම් ලැබී ය. ඔහුගේ ළමා විය කිසිසේත් ම සුන්දර වූයේ නැත. තමාට ළමා කාලයක් නොතිබුණේ යැයි මේ මහා ලේඛකයා පසු කලෙක කියා සිටියේ, ඒ නිසා විය හැකි ය.

චෙකෝෆ්ගේ වයස අවුරුදු පහළොව පමණ වන විට, පියා බංකොලොත්ව සිටියේ ය. ඔවුහු මොස්කව් නුවරට පැමිණ දුෂ්කර ජීවිතයක් ආරම්භ කළහ. මොස්කව් විශ්වවිද්‍යාලයට ඇතුළු වූ ඇන්තන් චෙකෝෆ්, වෛද්‍ය විද්‍යාව හදාරන්නට වන්නේ ය. ජීවනෝපාය සඳහා හෙතෙම මොස්කව් නුවර පත්තරවලට හාස්‍යජනක කතා ලියන්නට පටන්ගත්තේ ය. ඇන්තන් චෙකෝෆ්ගේ ලේඛන කලාව ආරම්භ වූයේ ඒ ආකාරයට ය.

ලෝක සාහිත්‍යයේ මහා කෙටිකතාකරු වශයෙන් හැඳින්විය හැකි චෙකෝෆ් **තුන් අවුරුද්ද, හයේ වාට්ටුව** වැනි කෙටි නවකතා ද ලියුවේ ය. එහෙත් ඔහුගේ දීර්ඝ නිර්මාණ අතර, වඩාත් ප්‍රශස්ත වන්නේ නාට්‍ය රචනා ය. ඔහු



නාට්‍ය රචනා කළා පමණක් නො වේ. ඒ නාට්‍ය වේදිකාව සඳහා නිෂ්පාදනය ද කළේ ය. **චෙරිවත්ත, සහෝදරියන් තිදෙනා, වන්යා මාමා, මුහුදු ලිහිණියා** යන නාට්‍ය හතර චෙකෝෆ්ගේ පරිණත සාහිත්‍ය නිර්මාණ අතර වෙයි.

රුසියානු සිරකරුවන් ගැන වාර්තාවක් ලියනු සඳහා ඔහු ඈත පෙරදිග සඛලින් දූපතට පැමිණියේ ය. එය ඉතා දුෂ්කර චාරිකාවක් වූ අතර, ලේඛකයාගේ ජීවන දෘෂ්ටිය කෙරෙහි ද මහත් සේ බලපෑ අත්දැකීමක් ද විය.

මෙම විස්මය එළවන තීරණයට හේතු කවරේදැයි පහදමින්, චෙකෝෆ් සිය මිත්‍රයකුට මෙසේ ලියා යැවී ය.

"වෛද්‍යවරයකු වන මගේ නීත්‍යනුකූල බිරිඳ වෛද්‍ය විද්‍යාවයි. ඇය අතහැර මම

සාහිත්‍යය නමැති අනියම් බිරිඳට පෙම් බැන්දෙමි. සාහිත්‍යය සමඟ ජීවත් වූ මට, මා අතහැර දමා පැමිණි වෛද්‍ය විද්‍යාව නමැති බිරිඳට ගෙවන වන්දියක් හැටියට, සබලින් දූපතට ගොස් විද්‍යාත්මක නිබන්ධයක් ලියන්නට මම තීරණය කළෙමි.''

1890 අප්‍රේල් මාසයේ දී සබලින් දූපතට ගොස් ආපසු යද්දී ඔහු ලංකාවට ද පැමිණියේ ය. ඒ, 1890 නොවැම්බර් 12 වැනිදා ය. 'ශාන්ත පීටර්ස්බර්ග්' නමැති නෞකාව කොළඹ වරායේ නැංගුරම් ලා තිබුණ කාලය අතරතුර දී ඔහු පැරණි ජී.ඕ.එච්. හෝටලයේ හෙවත් වර්තමාන 'තැප්‍රොබේන්' හෝටලයේ ලැගුම්ගත් බව දැන් ඉතිහාසගත ය. මේ ගමනේ දී ලේඛකයා මහනුවරට ද ගියේ ය. ඔහු දෙහිවල සත්තුවත්තේ දී මුගටියන් දෙදෙනකු මිලට ගත්තේ ය. සබලින් සිට ආපසු යද්දී ලංකාවට පැමිණි මේ ගමන ගැන සඳහන් කරමින් පසු කලෙක දී ඇන්තන් චෙකෝෆ් මෙසේ ලියා තැබී ය.

''මම අපායත්, දිව්‍ය ලෝකයත් දෙක ම දැක්කා.''

චෙකෝෆ්ගේ ගුසෙප් නමැති විශිෂ්ට කෙටිකතාව ලියවුණේ මේ සංචාරයෙන් පසුවය. එහි ආවේශය වූයේ, මළ සිරුරු දෙකක් නැවේ සිට මුහුදට විසි කිරීම ය.

ඔහුගේ ජීවිතයේ අවසාන භාගය ගෙවුණේ, ටෙලිකෝව් පළාතේ පිහිටි අක්කර 775ක් විශාල වූ වත්තේ ය. කුචුක්කෝයි නමැති පුංචි ගම්මානයේ පිහිටි ඒ වත්තේ ගොවිතැන් කරමින් ද, ලෙඩුන්ට ප්‍රතිකාර කරමින් ද, ඔහු ගත කෙළේ ඉතා සන්සුන් දිවියකි.

එකල්හි එහි පැමිණි මක්සිම් ගෝර්කි, චෙකෝෆ් ගැන අපූරු ස්මරණ සටහනක් ලියා තැබී ය. දෙදෙනා අතර සිදු වුණු කතාබහේ දී චෙකෝෆ්ගේ වැඩි අවධානය යොමු වුණේ එසමයෙහි කටුක ජීවිතයක් ගත කළ රුසියානු ගුරු පරපුර කෙරෙහි ය. ඔහු ගෝර්කිට පැවසූ වදන්වලින් බිඳක් මෙසේ ය.

''මට ඇති තරම් සල්ලි තියෙනව නම්, මම ගම්බද ජීවත්වන රෝගී ගුරුවරුන්ට සෞඛ්‍ය නිකේතනයක් හදල දෙනව. ඔව්, ලොකු ගොඩනැගිල්ලක් - ඇති පදම් ආලෝකය තියෙන - ඔබ දන්නවනේ - ලොකු ජනෙල් තියල, සීලිම උසට ගහල, ලොකු මන්දිරයක් හදනව. මම ඒකෙ අලංකාර පුස්තකාලයක් හදනව. හැම වර්ගයෙ ම සංගීත භාණ්ඩ ගේනව. එළවළු වත්තකුයි, පලතුරු උයනකුයි හදනව. ඒ වාගෙ ම මීමැසි පෙට්ටිත් ගෙනැල්ල තියනව. මේ මන්දිරයෙ කෘෂි විද්‍යාව, කාලගුණ විද්‍යාව වාගෙ දේවල් ගැන දේශන පවත්වන්ඩ සලස්වනව. ගුරුවරු හැමදෙයක් ම දැනගෙන ඉන්ඩ ඕනෑ. ඔව්, ලොකු උන්නැහැ, හැම දෙයක් ම...''

''රුසියාවෙ ගම්බද පළාත්වලට හොඳ දක්ෂ උගත් ගුරුවරු මොන තරම් අවශ්‍ය ද කියල ඔබ දන්නව ද? මේ රුසියාවෙ, ගුරුවරුන් සඳහා අපි ඉතා හොඳ තත්ත්වයක් ගොඩනගල දෙන්ඩ ඕනෑ. ඒක ඉක්මනට ම කරන්ඩ ඕනෑ. ජනතාවට, හැම පැත්තෙන් ම පිරුණු සර්ව සම්පූර්ණ අධ්‍යාපනයක් ලැබුණෙ නැත්නම් එහෙම, රාජ්‍යය බිඳ වැටෙනව. හරියට, දඹු ගල්වලින් හදාපු ගෙයක් බිඳ වැටෙනව වාගෙ...''

ඇන්තන් චෙකෝෆ් ඔල්ගා නීපර් නමැති නිළිය හා විවාහ වන විට, ඔහුගේ වයස අවුරුදු හතළිහක් විය. ක්ෂය රෝගයෙන් පෙළුණු මේ ලේඛකයාගේ මහා සාහිත්‍ය ජීවිතය අවුරුදු 44ක් තරම් කෙටි කලක දී

කෙළවර වීම ලෝක සාහිත්‍ය ඉතිහාසයේ ඉතා ම දුක්ඛිත සිද්ධියක් විය.

1904 ජූලි 02 වැනිදා ඔහු අවසන් හුස්ම හෙළී ය.

ඇන්තන් චෙකෝෆ් විසින් ලියන ලද කෙටිකතා සංඛ්‍යාව ද අනල්ප ය. ඔහුගේ මුල්කාලීන කෙටිකතාවලට නිමිති වී ඇත්තේ හාස්‍යෝත්පාදක සරල සිද්ධීන් ය. එවන් සරල සැහැල්ලු කෙටිකතා මාලාවක් ඔහු විසින් ලියන ලද්දේ, එදවස රුසියාවේ පළ වූ පුවත්පත් සහ වාර ප්‍රකාශන උදෙසා ය.

එහෙත් ඔහුගේ පසුකාලීන කෙටිකතා වඩාත් ගැඹුරු මානුෂික තේමාවන් විෂය කොටගෙන ඇති බැව්, අවිවාදිත කරුණකි. නිර්දිෂ්ට ව ඇති "වැලපීම" නමැති කෙටිකතාව ද එවන් ගැඹුරු තේමාවක් විෂයය කරගත් නිර්මාණයකි.

මෙම අපූරු කෙටිකතාව, ඉංග්‍රීසි පරිවර්තනය ආශ්‍රයෙන් සිංහලට නඟන ලද්දේ, සුප්‍රකට සිංහල ලේඛකයකු වන අමරදාස වීරසිංහ මහතා විසිනි. ඔහු විසින් සිංහලට නඟන ලදුව, "කාත්‍යා" යන පත්හිඳ නාමයෙන්, එකී කෙටිකතාව මුලින් ම පළ වන්නේ 1954 ජූලි - සැප්තැම්බර් සංස්කෘති ත්‍රෛමාසික කලාපයෙහි ය.

ඇන්තන් චෙකෝෆ් සිය නිර්මාණය සඳහා විෂයය කරගන්නේ, එදවස රුසියාවේ ජීවත් වූ ඉයෝනා පොටපොෆ් නමැති අසරණ අශ්ව කරත්තකාරයෙකි. ජීවිකාව සඳහා අස් රිය පදවන්ට සිදු වී ඇති නමුදු, මෙම කතාව කියන අවස්ථාව වන විට, ඉයෝනාගේ පුතා සන්නිපාත උණෙන් මිය ගොසිනි. තමාගේ අස් රියට ගොඩ වන හැම මගියකුට ම, ඒ සතියේ දී තම පුතු මළ පුවත කියන්ට ඔහු උත්සාහ කළ ද, කිසිවකුත් ඔහුට සවන් දෙන්නේ නැත. අන්තිමේ දී අස්රියකරුට කුඡ්මා ඉයෝනිච් නමැති සිය පුතු මළ පුවත කියන්ට සිදු වන්නේ තමාගේ ම අශ්වයාට ය.

ඉතා සීරුවෙන් තෝරාගන්නා ලද සිද්ධීන් කිහිපයක් මගින් අනවශ්‍ය විස්තරවලින් ද තොර ව ඇන්තන් චෙකෝව්, ඉයෝනා නමැති අසරණ අස්රියකරුගේ චරිතය නිම වන අයුරු විමසා බැලීමෙන්, හොඳ කෙටිකතාවක ලක්ෂණ කවරේදැ යි හඳුනාගැනීමට පාඨකයාට අවස්ථාව සැලසෙනු ඇත.

ඇඳිරි යාමයයි. නොබෝ වේලාවකට පෙර වීදියේ දැල්වුණු පහන් සිසාරා ඝන හිමකැට වැටෙමින් ගෙවල්වල පියසිත්, අශ්වයින්ගේ පිටවලුත්, මිනිසුන්ගේ උරහිස් හා හිස්වැසුමුත් වසාගෙන තුනී තට්ටුවක්ව පවතියි. තනි සුදු පැහැය ගෙන සිටි ඉයෝනා පොටපොෆ් නම් රියකරු අවතාරයක් මෙන් පෙනෙයි. ඔහු සිරුර හැකිළීමට පුළුවන් තරම් දෙකට නැමී ආසනයේ නිශ්චල ව ඉඳගෙන සිටියි. ඔහු ඉන්නේ හිම කන්දක් තමා වෙත කඩා වැටුණත් ඉන් ගැලවීමට උවමනාවක් නැත්තකු ලෙසිනි. එසේ ම තනි සුදු පැහැති ඔහුගේ අශ්වයා ද නොසෙල්වෙයි. උගේ නිසොල්මන් ගතියත්, කෙට්ටු සිරුරත්, දළදඬු දික් කකුලුත් නිසා ඌ තඹයකට වඩා වටිනාකමක් නැති පාන්පිටි අශ්වයකුගේ ආකාරය උසුලයි. ඌ බර සිතිවිල්ලකින් පසුවන බවට සැකයක් නැත. පාළු පෙදෙසක පිහිටි කුඹුරක සී සෑම උදෙසා නගුලක යොදවා සිටි එකකු ඉන් මුදා, කලබලයෙන් ඒ මේ අත හැසිරෙන මිනිසුන්ගෙන් හා තොරතෝන්චියක් නැතිව නැඟෙන ශබ්දයෙන් යුත් මේ බිය උපදවන එළිය සහිත හිම වගුරට දැක්කුවොත් ඌට මෙලෙස සිතිවිල්ලකට නො වැටී සිටීම දුෂ්කර වෙයි.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ඉයෝනාත් ඔහුගේ කුඩා අශ්වයාත් බොහෝ වෙලාවකින් එතනින් සෙලවුණේ නැත. ඔවුන් රිය නැවතුම් පොළින් පිටත්වූයේ සැන්දෑවේ ය. එතෙක් මෙතෙක් ඔවුන්ට එක ම කුලියකුදු නො ලැබිණ. සැදෑ මීදුම නගරය වෙත ගලා යමින් බැබළෙමින් පැවති පහන් එළිය සුදුමැලි කරයි. වීදියේ ඝෝෂාව ද අධික වෙයි. "විබෝර්ග් පාරට යන්නට කරත්තයක්",යි ඉයෝනාට හදිස්සියෙන් ඇසෙයි. "ඕයි කරත්තේ" ඉයෝනා තිගැස්සෙයි. ලොකු කබායක් ඇඟ ලාගෙන, හිස් වැස්මක් පැළඳ සිටි යුද්ධ නිලධාරියකු ඔහුට හිමෙන් වැසුණු ඇහි පිහාටු අතරින් පෙනෙයි. "විබෝර්ග් පාරට," යි නිලධාරියා නැවතත් කියයි. "ඒයි, උඹ නිදි ද? විබෝර්ග් පාරට යමන්"

ඉයෝනා කැමැත්ත හැඟවීමට හිස සොලවා, තෝන්පට අතට ගත්තෙන් අශ්වයාගේ බෙල්ලෙන් හා පිටෙන් හිම තට්ටු ගැලවී වැටෙන්ට වෙයි. නිලධාරියා හිම කරත්තයෙහි ඉඳගනියි; රියැදුරා "ජඃ" කියා කොකකු මෙන් ගෙල දික් කොට, දළදඬු කකුල් නවා, අවිනිශ්චිතව ගමන් කරන්නට මෙන් සැරසෙයි.

ගමන පිටත් වූවාත් සමග ම, "කොහේ ද යකෝ යන්නේ? යනුවෙන් අඳුරෙන් නැඟුණු කෑ ගැසීමක් ඉයෝනාට ඇසෙයි.

"කොහේද යකෝ යන්නේ? ද-කු-ණ-ට උඹ දක්කන්න දන්නෙ නෑ. දකුණෙන් පලයන්," යි නිලධාරියා කෝපයෙන් කෑ ගසයි. වාහනයක් තුළින් රියකරුවෙක් ඔහුට ශාප කරයි. පාර හරහා ගමන් කළ මගියෙක්, තමාගේ උරහිස අශ්වයාගේ නාසයෙහි හැපුණෙන් අශ්වයා වෙත වියරු බැල්මක් හෙලා කමිස අතෙහි වූ හිම පිසදමා ගනියි. ඉයෝනා කඩි කෑවාක් මෙන් ආසනයෙහි ඒ මේ අත ඇඹරෙයි. තව ද ඔහු ආසනයෙන් නො වැටී සිටින්නට තැත් කරන්නාක් මෙන් වැලමිට සොලවයි. තමා එහි කුමක් නිසා සිටින්නේ දැයි තේරුම් ගැනීමට නොහැකි වූවකු මෙන් ද අන්දුන් කුන්දුන් වී හුස්ම හිර වූවකු මෙන් ද ඔහු මුව අයාගෙන බලා සිටියි.

"උන් ඔක්කෝම නැහැදිච්ච තක්කඩි!" යි නිලධාරියා විහිළු කරයි. "මට පේන්නේ උන් කතාවෙලා උඹේ කරත්තේ හැපෙනවා, නැත්නම් අශ්වයා ඉදිරියේ බිම පෙරළෙන්නට හදනවා වගෙයි."

ඉයෝනා නිලධාරියා දෙසට හැරී තොල් මතුරයි. ඔහුට කිසිවක් කීමට උවමනා බව පැහැදිලි කරුණකි. එහෙත් ඔහුට පිට කළ හැකි වූයේ සුසුමක් පමණි.

"මොනවා?"යි නිලධාරියා අසයි.

ඉයෝනා විරිත්තමින් සිනාසී, අමාරුවෙන් රළු හඬකින් කතා කරයි. "මගේ පුතා මේ සුමානේ මැරුණා"

"හ්ම්! මොනවා වෙලා ද මැරුණේ?"

ඉයෝනා නිලධාරියා දෙසට මුළුමනින් ම හැරී කථා කරයි.

"අනේ කවුද දන්නේ සමහරු කියන්නේ සන්නිපාත උණෙයි කියලා දවස් තුනක් ඉස්පිරිතාලේ හිටියා... ඒත් මැරුණා. අපේ කරුමෙ තමයි."

"බලාගෙන පලයන් යකෝ," යි අඳුරෙන් හඬ නැගෙයි."උඹ මැරිල ද බොල, නාකියෝ? පාර බලාගෙන පලයන්."

"යමු යමු", යි නිලධාරියා කියයි. "මෙහෙම ගියොත් අපට හෙටවත් යන්න වෙන්නේ නැහැ. ටිකක් ඉක්මන් කරපන්."

රියකරු නැවතත් ගෙල දික් කොට, කෙළින් වී ඉඳගනිමින්, නොකැමැත්තෙන් මෙන් කස ලෙලවයි. ඔහු කීපවරක් ම නිලධාරියා දෙස හැරී බලයි. එහෙත් ඇස් පියාගෙන සිටි නිලධාරියා තුළ කථාවට ඇහුම්කන් දීමට කැමැත්තක් නො තිබිණ. විබෝර්ග 'හි දී නිලධාරියා රියෙන් බස්වා, තැබෑරුම

අසල රිය නවත්වා, ඔහු තමාගේ ආසනයේ උණ්ඩි වී, නැවතත් නො සෙල්වී සිටියි. පැයක්... දෙකක්... ගත වෙයි. අඩිපාර ඔස්සේ තරුණයන් තිදෙනෙක් රණ්ඩු වෙමින් හිම සපත්තු "ක්‍රීස්" යනුවෙන් අද්දාගෙන එති. ඔවුන්ගෙන් දෙදෙනෙක් උසයි, හීන්දෑරියි, අනෙකා මිටියි, කුදුයි.

"ඒයි, කරත්තේ, පොලිස් පාලමට!" යි ගොරෝසු හඬකින් කුදා කෑ ගසයි. "අපි තුන්දෙනාට ම ග්‍රිවෙනික් දෙකක් දෙන්නම්!" ඉයෝනා තෝන්පට ගෙන තලු මරයි. ග්‍රිවෙනික් දෙක ගමනට නොසෑහේ. එහෙත් රූබලයක් වුවත් කොපෙක් පහක් වුවත් ඔහුට නම් වෙනසක් නැත. ඔහුගේ රියෙන් කිසිවකු යන්ට කැමති නම් දූන් ඔහුට කෝකත් එකයි. තරුණයෝ හරුපබස් කියමින්, එකිනෙකාගේ ඇඟේ හැපෙමින් හිම කරත්තය වෙත ගොස් තිදෙනා ම එක් වර ආසනයේ ඉඳගන්ට තැත් කරති. අනතුරුව, කවරකු ඉඳගත යුතු ද, කවරකු නැඟිට සිටිය යුතු දැයි විවාදයක් පැන නගී. ඔවුන් එකිනෙකා බොහෝ වේලාවක් අඩදබර කර ගැනීමෙන් හා බැන ගැනීමෙන් පසු අන්තිමේ දී කුදු මිටි බැවින් නැගිට සිටිය යුතු බවත් අනෙක් දෙදෙනා ඉඳගත යුතු බවත් තීරණය වෙයි.

"දැන් ඉතින් ඉක්මන් කරපන්," යි කුදා රියකරු අසල සිට ගනිමින් ඔහුගේ බෙල්ල දෙසට සුසුම් හෙළා, නහයෙන් කොඳුරයි. "නාකි රාළ, උඹේ තොප්පියේ හැටි මුළු පීටර්ස්බර්ග් නුවර ම නෑ ඔච්චර කබල් තොප්පියක් හොයා ගන්න..!

"ඉහි...ඉහි...ඉහි..."යි ඉයෝනා විරිත්තයි. මෙහෙම..."

"උඹේ 'මෙහෙම' කතාව නවත්තලා ඉක්මන් කරපන්. උඹ ගමන එහෙමපිටින් ම යන්නේ මේ විදියට ද? ඈ මිනිහෝ ?.....උඹට මොකුත් ඕනෑ වෙලා ද?"

"මගේ ඔළුව පැලෙන්ට හදනවා!" හීන්දෑරි තරුණයන්ගෙන් එකෙක් කියයි. "ඊයේ රෑ ඩොන්ක් මොසොෆ්ප්ලයි ගෙදර දී, වස්කාත් මාත් බ්‍රැන්ඩි බෝතල් හතරක් ම හිස් කළා."

"මට තේරෙන්නේ නෑ උඹ මේ තරම් මොනවට බින්න ගහනව ද කියලා." යි අනෙක් හීන්දෑරි එකා තරහෙන් කියයි. "උඹ තිරිසනෙක් වාගේ බොරු කියනවා."

"දෙවියන් පල්ලා, මම කියන්නේ ඇත්ත."

"ඒක යස ඇත්ත. ඉබ්බෙක් පියෑඹුවා වගෙයි"

"ඉහි, ඉහි," යි ඉයෝනා විරිත්තයි. "මෙහෙම සෙල්ලක්කාර මහත්තුරු."

"ශප්,කට වහගෙන ඉන්න බැරි ද?" කුදා කේන්තියෙන් අසයි.

"කරච්චලේ, ඉක්මනට යනව ද නැද්ද? ඔහොම ද මිනිහො දක්කන්නෙ ? ඔය කසය ටිකක් පාවිච්චි කරපන්. යමන් යකෝ, යමන්, ඕකට හොඳ හැටි දීපන්."

පිටිපසින් සිටි කුදා ඇඹරෙන සැටිත්, කථා කරන විට කට වෙව්ලන සැටිත්, ඉයෝනාට දැනෙයි. ඔහු තමා වෙත එල්ල කරන ලද අපහාසවලට ඇහුම්කන් දෙයි. මිනිසුන් දකියි. ටිකින් ටික ඔහුගේ හුදකලා ගතිය පහ වී යයි. කුදා නොනවත්වා ම කළ අවලාදය නැවතුණේ දිග ශාපයක් කරන්ට ගොස් එය පටලවා ගැනීමෙන් හෝ කහින්ට ගොස් හුස්ම හිරවීමෙන් හෝ පමණි. හීන්දෑරි තරුණයින් දෙදෙනා කිසියම් නජේඩා පෙට්‍රොව්නා නම් තරුණියක ගැන කථා කරන්ට වෙති. ඉයෝනා ඔවුන් දෙස කීප විටක් ම හැරී බලයි. ඔහු ඔවුන් මොහොතකට නිහඬ වන තුරු බලා සිට, නැවතත් ආපසු හැරී කොඳුරයි.

"මගේ පුතා... මළේ... මේ සුමානෙ."

"අපි කවුරුත් මැරෙනවා," යි කුදු කැස්සකින් පෙළෙන්ට වී තොළකට පිස දමා, සුසුම් හෙළයි. "ඉතින් ඉක්මන්



නොම්ලේ බෙදා හැරීම සඳහා ය.

කරපන්! මහත්තුරුනි, මට නම් තවත් මේ විදියට ඉන්න බෑ. මේ මිනිහා අපි කොයි වෙලාවක එක්ක යාවි ද?"

"එහෙම නම් මිනිහගෙ බෙල්ලට පොඩ්ඩක් කුත්තු කරනවා!"

"ඒයි වධකයා, උඹට ඇහුණ ද, උඹේ බෙල්ල කඩනවා උඹට ඕනවට වැඩිය සලකන්න ගියොත් අපිට පයින් යන්නයි වෙන්නෙ"

ඉයෝනා වෙත එල්ල කරන ලද මේ පහරවල් ඔහුගේ සිතට වඩා කයට දූනෙයි. "ඉහි, ඉහි,"යි ඔහු සිනාසෙයි. "මුන්නැහැලා සෙල්ලක්කාර තරුණ මහත්තුරු උන්නැහැලාට දෙයියන්ගේ පිහිටයි."

"ඈ මිනිහො උඹ කසාද බැඳල ද?" යි හීන්දෑරි එකෙක් අසයි.

"මම? ඉහි, ඉහි, සෙල්ලක්කාර මහත්තුරුනේ මට දැන් ඇත්තේ මගේ ගෑනිත් තෙත පොළවත් විතරයි... ඉහි, ඉහි,.. ඒ කියන්නෙ මගේ හෝම්පළයි. මගේ පුතා මැරුණා. මම තාම පණ පිටින්... එහෙම පුදුම දෙයක් මරුවට පාර වැදුණා. මා ළඟට එනවා වෙනුවට උං පුතා ළඟට ගියා..."

ඉයෝනා තම පුතා මැරුණ හැටි කීමට පිටුපසට හැරුණ නමුත් මේ වෙලාවේ දී ද කුදු සුසුමක් හෙළා, "දෙයියන්ගේ පිහිටෙන්, යම්තම් අපි බලාපොරොත්තු තැනට ආවේ" යි දන්වයි. අඳුරේ අතුරුදහන්ව යන ඔවුන් දෙස ඉයෝනා බලා සිටියි. නැවත වරක් නිසංසල භාවය හුදකලා වූ ඉයෝනා ගිල ගනියි. මොහොතකට යටපත් වී පැවති ඔහුගේ ශෝකය නැවතත් පැන නඟී. ඔහුගේ හදවත දැඩි වේගයෙන් පහරවයි. ඔහු උත්සුක මුහුණකින් වහා වටපිට බලා වීදියේ එහා මෙහා යන ජනයා අතර තමාට ඇහුම්කන් දීමට කැමති එක තැනැත්තකු වත් සිටී දැයි සොයයි. එහෙත් ජනයා ඔහු ගැනවත් ඔහුගේ දුක ගැනවත් කිසිදු තැකීමක් නැතිව ඉක්මන් කොට යති. එසේ වුවත් එය අනන්ත අප්‍රමාණ දුකකි. ඔහුගේ හදවත බිඳී, ශෝකය ගලා ගියොත්, එය ලෝකය පුරා පැතිරී යන්නට තරම් වන බව ඔහුට දැනෙයි. එහෙත් එය කිසිවෙක් නො දනිති. නො වැදගත් කුඩා සිප්පි කටුවක් තුළ සැඟවී සිටින්නට සමත් වූ බැවින් එය කිසිවකුට දවල් කාලයේ පහන් එළියකිනුදු නො පෙනෙයි.

ඉයෝනා හණ රෙදි වගයක් පොරවාගෙන සිටි ගෙවල් මුරකරුවකු දැක, ඔහු සමඟ කතා බහට සැරසෙයි.

"යාළුවා දැන් වෙලාව කීයට ඇද්ද?" යි ඔහු අසයි.

"නමය පහුවෙලා උඹ මොකද නැවතිලා ඉන්නෙ. පලයන් යන්න."

ඉයෝනා අඩි කීපයක් ඉදිරියට ගොස්, උණ්ඩි වී, ශෝකයට තමා ගිල ගන්නට ඉඩ හරියි. මිනිසුන්ගෙන් උපකාර බලාපොරොත්තු වීමෙන් පලක් නැති බව ඔහු දකියි. මිනිත්තු පහක් ගත වීමට පෙර කෙළින් වූ ඔහු හිසේ කැක්කුමක් ඇති වූවාක් මෙන් හිස ඔසවා ගනියි. අනතුරුව ඔහු තෝන්පට ගස්වා අදියි. ඔහුට එය තවත් ඉවසිය නොහැකි ය. "ඉස්තාලය", යි ඔහු සිතයි. කුඩා අශ්වයා ඔහුගේ සිතුවිල්ල තේරුම් ගත්තාක් මෙන් හෙමින් ඉදිරියට ගමන් කරයි.

පැය එකහමාරකට පමණ පසු, ඉයෝනා විශාල, අපිරිසිදු ගිනි උදුනක් අසල වැද හොව්යි. ගිනි උදුන අසල බිමත්, බංකු උඩත් මිනිස්සු ගොරවමින් සිටිති. ඒ අවට සන, උණුසුම්, අපිරිසිදු වාතය නිසා හුස්ම ගැනීම පවා අපහසුයි. ඉයෝනා නිදන්නවුන් දෙස බලා, ඇඟ කසා ගනියි. මෙපමණ වේලාසනින් ආපසු මෙතැනට පැමිණීම ගැන ඔහු කණගාටු වෙයි.

"මට තාම කඩල මිලවත් හොයා ගන්න බැරි වුණා," යි ඔහු සිතයි. "ඒක තමයි මට වෙලා තියෙන්නෙ. මිනිහෙකුට තමන්ගෙ

රස්සාව හොඳට කරන්න පුළුවන් නම් නිදහසේ නිදන්ට පුළුවනි.''
මුල්ලක වැතිරී සිටි තරුණ රියකරුවෙක්, මදක් නැඟිට නිදිමතේ කාරමින් වතුර පනිට්ටුව දෙසට ඇදෙයි.
''උඹට වතුර බොන්න ඕනෑ ද?'' යි ඉයෝනා ඕනෑකමින් අසයි.
''නැත්නම්''
''හුම්, හොඳ සීතල වතුර නේද? මේ මල්ලී, උඹ දන්නවා ද? මගේ පුතා මැරිල දැන්... උඹට ඇහුණ ද? මේ සුමානෙ. ඉස්පිරිතාලෙ... ආ, ඒක දිග කතාවක්.''

ඉයෝනා තමා පැවසූ වචනවලින් කුමන ප්‍රතිඵලයක් ඇති වූයේ දැයි දැන ගැනීමට තරුණයා දෙස බලයි. එහෙත් ඉන් කිසි ම පලක් නැති බව ඔහු දකියි. තරුණයා මූණ වසා ගෙන, නැවතත් තද නින්දෙන් පසුවෙයි. මහල්ලා සුසුම් හෙළා හිස කසයි. තරුණයා වතුර බීම සඳහා යම් බඳු පිපාසයකින් පෙළුණේ ද, මහල්ලා කතා කිරීම සඳහා එබඳු ම පිපාසයකින් පෙළෙයි. ඔහුගේ පුතා මැරී සුමානයක් පිරෙන්ටත් යයි. එහෙත් ඒ ගැන කිසිවෙකු සමඟ නිවීහැනේ කථා කරන්ට ඔහුට අවස්ථාවක් නො ලැබිණ. ඔහුගේ පුතා රෝගී වූ හැටිත්, ඔහු දුක් වින්ද හැටිත්, ඔහු මැරෙන්ට පෙර කී දේත්, ඔහු මැරුණ හැටිත් විස්තර සහිතව හීන්සැරේ, සාවධානව කිව යුතු ය. භූමදානය පිළිබඳ සියලු විස්තරත්, ගිය ගමනත් දක්වා ලිය යුතු ය. ඔහුගේ ඇනීෂියා නම් දුවණිය ගමේ නැවතුණු හැටි, ඇ ගැනත් කථා කළ යුතු ය. ඔහුට කියන්ට මොකුත් ම නැද්ද? යි නිසැකයෙන් ම තමාගේ කථාව අසා සිටින්නා ශෝකයෙන් මුව අයාගෙන සිටින්ටත්, සුසුම් හෙළන්ටත්, අනුකම්පාව පළ කරන්ටත් වේවි. ගෑනුන් සමඟ ඒ ගැන කථා කළොත් වඩාත් හොඳයි. උන් මෝඩයන් වුණත් වචන දෙක කියන විට කඳුළු හෙලාවි.

''ගිහින් මගේ අශ්වයා බලන්ට ඕනෑ,'' යි ඉයෝනා සිතයි. ''නිදා ගැනීමට ඕනෑ තරම් වෙලා තියෙනවා. ඒ ගැන බයවෙන්න දෙයක් නෑ.''

ඔහු කබාය ලාගෙන, අශ්වයා සිටින ඉස්තාලයට යයි. ඔහු කඩල, පිදුරු හා කාලගුණය ගැන සිතයි. ඔහු තනි වූ විට පුතා ගැන සිතීමට තරම් ශක්තියක් ඔහු තුළ නො වෙයි. ඔහු ගැන ඕනෑ ම කෙනකු සමඟ ඔහුට කථා කරන්ට පුළුවනි. එහෙත් ඔහු ගැන සිතා ඔහුගේ රූපය සිතෙහි මවා ගැනීම නම් ඔහුට දැරිය නො හැකි වේදනාවකි.
''ඇ බොල, උඹ බඩ පුරවා ගන්නවා දැ?'' යි ඉයෝනා ඔහුගේ අශ්වයාගේ දීප්තිමත් නෙත් යුවල දෙස බලා අසයි. ''කමක් නෑ, බඩ පුරවා ගනින්. කඩල ගැනීමට තරම් මුදලක් හොයා ගන්ට බැරි වුණත් අපට ඕනෑ තරම් පිදුරු තියෙනව නේද? හැබෑට, මම දැන් කරත්ත දක්කන්න නාකි වැඩියි. මගේ පුතාට නම් පුළුවන්. මට බෑ, එයා නම් කියාපු කරත්තකාරයා. ආ එයා ජීවත් ව හිටියා නම්''
ඉයෝනා මොහොතක් නිහඬව සිට නැවතත් කියයි.

''එහෙම තමයි, ඕවා වෙන්නෙ, නේද බොල, දැන් ඉතින් කුෂ්මා ඉයෝනිච් ඉවරයි. එයා අපට ජීවත් වෙන්ට ඉඩහැරලා ගියා. එයා නම් 'ඩොක්' ගාලා කම්මුතු උණා. හිතපන්. ඔන්න උඹට පොඩි පැටියෙක් හිටියා, ඒ පැටියාගේ අම්මා උඹයි. ඌ හිටි හැටියෙ උඹව තනි කරලා උඹව අතැරලා ගියා. ඒක දුකයි, නොවෙද බොල?''

කුඩා අශ්වයා පිදුරු හපයි. ඇහුම්කන් දෙයි. හාම්පුතා දෙසට හුස්ම හෙළයි...

ඉයෝනා තුළ ඇත්තේ උසුලා ගත නො හැකි ශෝකයකි. ඔහු කුඩා අශ්වයාට මුළු කතාව ම කියයි.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ලිඛිත අභ්‍යාස

1. වැලපීම කෙටි කතාව පිළිබඳව කෙටිකතා ලක්ෂණ ඇසුරෙන් විමසීමක යෙදෙන්න.
2. අවස්ථා හා සිද්ධි මනාව නිරූපණය කිරීම වැලපීම කෙටිකතාවේ සාර්ථක භාවයට හේතු විය. විමසන්න.
3. වැලපීම කෙටිකතාවේ ඇතුළත් පරිසර වර්ණනා එම නිර්මාණයේ සාර්ථකත්වයට ඉවහල් වී ඇති ආකාරය විමසන්න.
4. අර්ථ රසය හා භාවාත්මක හැඟීම් මතුවන පරිදි සජීවී ආකාරයෙන් දෙබස් නිර්මාණය කර තිබීම වැලපීම කෙටි කතාවේ සාර්ථක භාවයට හේතු වී ඇත. පැහැදිලි කරන්න.
5. ඉයෝනා ශෝක වේදනා දරා ගනිමින් ජීවිතයේ යථාර්ථයට මුහුණ දෙන්නට වෙර දරන චරිතයකි. වැලපීම කෙටිකතාව ඇසුරෙන් විවරණය කරන්න.

15

# උදය

**සිරි ගුනසිංහ (1925-2017)**



නිසඳැස් කාව්‍ය සම්ප්‍රදාය ප්‍රචලිත කරමින් නූතන සිංහල පද්‍යයේ ගමන් මගෙහි විප්ලවීය වෙනසක් ඇති කළ සිරි ගුනසිංහ මහතා **මස් ලේ නැති ඇට, අබිනික්මන, රතු කැකුල** හා **ආලකමන්දාව** යනුවෙන් කාව්‍ය සංග්‍රහ හතරක් රචනා කළේ ය. කොළඹ යුගයේ මුල් පරපුරේ කවීන් හා ඔවුන්ගේ නිර්මාණ මොහු ඉතා ඍජු ලෙස විවේචනය කරයි. වෙනස් වන ලෝකය තුළ මානව හා සමාජ තත්ත්ව නිරූපණය උදෙසා නව්‍ය කාව්‍ය ආකෘතියක, භාෂාවක, අලංකාර භාවිතයක හා පුළුල් වස්තු විෂයයක අවශ්‍යතාව දිගින් දිගට ම ගෙනහැර දක්වයි. බටහිර කවියේ ආභාසය ලබමින් මානව ජීවිතයේ නිස්සාරත්වය කෙරෙහි අවධානය දක්වමින් කවිය විප්ලවීය වෙනසකට ලක් කළේ ය. කවියෙහි අර්ථ රසය වඩා උසස් ගණයෙහි ලා සැලකූ හෙතෙම, භාවමය සංකීර්ණතා කවියට ආදේශ කර ගනිමින් මානව ජීවිතයේ හා සමාජ දේහයේ එතෙක් කවීන්ට ඇස නො ගැසුණු තේමාවන් නව මානයකින් කවියට නැගීමට පෙළඹුණේ ය. ජීවිතයේ සෞන්දර්යාත්මක පක්ෂය පමණක් වර්ණනයෙහි ලා යෙදුණු පූර්ව යුගයේ කවීන් නිර්දය විවේචනයට ලක් කළ මොහු කවිය වනාහි මානව හා සමාජ ජීවිතවල ගැඹුරු ප්‍රකාශනයක් බවට පත් කරමින් එය නූතනය දක්වා ප්‍රවේශ කරවීමේ පුරෝගාමී චරිතයක් බවට පත් විය.

කවියකු පමණක් නොව,නවකතාකරුවකු, චිත්‍රකලා විචාරකයකු, චිත්‍රපට අධ්‍යක්ෂවරයකු ද වූ ගුනසිංහ නූතන සිංහල කාව්‍ය සම්ප්‍රදායේ විප්ලවීය චරිතයක් ලෙස පිළිගැනේ.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

පෙරදිග ගොරහැඬි රකුසෝ,
මගේ ධ්‍යානය ඇයි කඩන්නේ
නිදා ගන්න පොරොවාගත්ත
කලු රෙදි පොට
මොකටද මේ
තීරුවලට ඉරා දමන්නෙ.

කුරුල්ලන්ට ගල් ගහලා
උන් හොඳටම බිය කරලා
මල් පොහොට්ටු තිගැස්සිලා
කඳුලු හෙලනවා.

ඇස් දෙක මම අරින්නෙ නෑ
තුරුලු කරන් භාවනාව
නැවතත් යන්නට යනවා
මම
මගේ දැහැන ලෝකයටම

## ලිඛිත අභ්‍යාස

1. ‘උදය’ පද්‍ය පන්තියෙන් ඉදිරිපත් කෙරෙන අදහස විචාරාත්මකව විමසන්න.
2. නිර්මාණය සඳහා කවියා උපයෝගී කර ගෙන ඇති කාව්‍යෝක්ති පිළිබඳ ඇගයීමක් කරන්න.
3. අපූර්වත්වය නිර්මාණාත්මක සාහිත්‍ය කෘතියක සාර්ථකත්වයට ඉවහල් වන ආකාරය ‘උදය’ කවිපෙළ ඇසුරෙන් විමසන්න.

16

# වැස්ස

**ගුණදාස අමරසේකර** (1929)



වෘත්තියෙන් දන්ත වෛද්‍යවරයකු වන ගුණදාස අමරසේකර කවියකු ලෙස පමණක් නොව කෙටිකතාකරුවකු, නවකතාකරුවකු, සාහිත්‍ය හා සමාජ විචාරකයකු ලෙස ද ප්‍රකට ය. **භාව ගීත, උයනක හිඳ ලියූ කවි, ආවර්ජනා, අමල්බිසෝ, ගුරුළුවත** හා **අසක්දාකව** මොහු විසින් රචිත පද්‍ය ග්‍රන්ථ අතර වේ.

සාම්ප්‍රදායික කවි මග විවේචනය කරමින් බිහි වූ නිසඳැස් කවිය ද ඊට පූර්ව යුගයේ කවිය ද දැඩි විවේචනයට බඳුන් කළ මොහු, සම්ප්‍රදාය මත පිහිටමින් පැරණි කවියෙහි නොමඳ ආභාසයත් ජන කවියෙහි රිද්ම ලක්ෂණ හා නිර්ව්‍යාජත්වයත් හෘදයග්‍රාහී භාෂා හා අලංකාර භාවිතයත් ඇසුරින් සංකීර්ණ සමාජ හා මානව ධර්මතා විවරණය කරනු වස් කවිය මෙහෙයවිය යුතු බව දැඩි සේ පිළිගත් කවියෙකි. කවියෙහි භාෂාව, රිද්මය හා ආකෘතිය සම්ප්‍රදායෙන් උකහා ගත් සාරයෙන් පෝෂණය කිරීම මොහුගේ අනන්‍යතාව වේ. **'පස් මත් විරිත'** නූතන කවියට ප්‍රවේශ වන්නේ අමරසේකරගේ භාවිතය ඔස්සේ ය.

අමරසේකර ස්වකීය නිර්මාණ පිළිබඳ වුව ද ඉතා නම්‍යශීලී ආකල්පයක පසු වුණු කවියෙකි. පෘථුල ජීවන දෘෂ්ටියක් ප්‍රකාශ කළ හැකි මාධ්‍යයක් වන නිසඳැස් කවිය දේශීය රාමුවක් තුළ ස්ථාපනය කරමින් නූතන පද්‍ය කාව්‍ය ක්ෂේත්‍රයට මොහු දායාද කළ නව ප්‍රවණතා, වර්තමාන කවීන්ට අභිනව සම්ප්‍රදායන් පිළිබඳ අත් හදා බැලීම් සිදු කිරීමට ප්‍රබල දායකත්වයක් සැපයුවේ ය.

චිච්රි චිරි චිච්රි චිරි උදේ සිට ඇද හැලෙන
පොද නො කැඩී තෙත බරිව හිරිකිතෙන් කිලිපොලන
පාර තොට, ගහ කොල ද, වසාගෙන හැම අතින
වහින වැහි වහින වැහි නො පායන මුළු දවස

ගොහොරු මඩ ඇඟිලි කරු අතර චිරි චිරි ගාන
මඩ කඩිති හැම තැන ම මඩ පාට දිය රැඳුන
අළුත් පස් දැමූ පාර දනිහ තෙක් මඩ එරෙන
බැනියම ද ඇඟට ඇලි උදේ සිට තෙත බරිව

තෙමුන රෙදි ඇඟ ඇලුණ හබුරු කොල මලිපිටි ද
දෝර ගොස් හැම තැන ම වක්කලන් ඇලි හැදුන
හැට්ට අත් කඳ කලව තෙත රෙද්ද ඇඟ එතුව
වහින වැහි තද හුළඟ නො පායන මුළු දවස

ඔළුව කෙස් තෙත බරිව පිට දිගේ වැක්කෙරෙන
කාර් රෝදෙන් චිරිස් ඇඟ පුරා මඩ ඉහෙන
ආයිමත් හිටි ගමන් තද කරන් එන සැණින
වහින වැහි වහින වැහි නො පායන මුළු දවස

ගෙදර ගොස් ඇඳපු දේ මොහොතකින් ඉවර කොට
තුවායෙන් ඇඟ පත ද පිහ දමා හිස කෙස් ද
අලුත් සරමක් ඇඳන් උණට උණු තේ වතුර
ඇඳෙහි ඉඳ උණුහුමට බොන්නෙ කොයි මොහොතෙදැයි
වැහි පොදෙහි පෙඟුණ සිත හිත හිතා ලත වේ ය

## ලිඛිත අභ්‍යාස

1. ගුණදාස අමරසේකරයන්ගේ 'වැස්ස' පද්‍ය පන්තිය සරල අනුභූතියක් පාදක කර ගත්ත ද ගැඹුරු දෘෂ්ටියක් විවරණය කරන්නකි. මේ පිළිබඳ ඔබේ අදහස් විචාරාත්මකව දක්වන්න.
2. ගුණදාස අමරසේකරයන්ගේ ඉහත දැක්වුණු පද්‍ය පන්තිය සාර්ථක පද්‍ය පන්තියක් ලෙස අගය කළ හැකි ය. විමසන්න.
3. තේමාවට උචිත භාෂා භාවිතය මේ කවි පෙළේ විශේෂත්වයකි; නිදසුන් සහිතව පහදන්න.

# 17 පුතු ඉපදුණු මේ දෙරණේ

**මහගම සේකර (1929-1976)**



ප්‍රතිභාපූර්ණ කවියකු පමණක් නොව ගීත රචකයකු, නවකතාකරුවකු, චිත්‍ර ශිල්පියකු හා චිත්‍රපට අධ්‍යක්ෂවරයකු ද වූ මහගම සේකර විසින් රචනා කරන ලද කාව්‍ය සංග්‍රහ අතර **සක්වා ලිහිණි, හෙට ඉරක් පායයි, මක් නිසා ද යත්, රාජතිලක ලයනල් හා ප්‍රියන්ත, බෝඩිම, නොමියෙමි, ප්‍රබුද්ධ** ආදී කාව්‍ය නිර්මාණ රචනා කර ඇත.

සම්ප්‍රදාය හා නවීනත්වය සම්බන්ධ මධ්‍යස්ථ ආකල්පයක පසු වූ මොහු, කොළඹ කවියෙහි එනම් සඳැස් කවියෙහි හා නිසඳැස් කවියෙහි සාධනීය හා නිශේධනීය ලක්ෂණ මනාව අවබෝධ කර ගනිමින් චිරන්තන කාව්‍ය සම්ප්‍රදායෙහි සාරයත් බටහිර කාව්‍ය සම්ප්‍රදායෙහි ගැඹුරු චින්තනයත් ජනකවියෙහි නිර්ව්‍යාජ, සරල, සුබනම්‍ය භාවයත් ස්වකීය කවියෙහි නොමඳව භාවිත කරමින් නව්‍යතම කාව්‍ය ප්‍රවේශයක් පිළිබඳ අත්හදා බැලීමෙහි නිරත විය. 'ප්‍රබුද්ධ' මොහුගේ කාව්‍ය නිර්මාණ අතුරින් අග්‍රඵලය ලෙස සැලකෙන අතර වර්තමාන තත්වය දක්වා කවිය ප්‍රවේශ කරවීමේ හැරවුම් ලක්ෂ්‍යය ලෙස මහගම සේකර කවියා හැඳින්විය හැකි ය.

පුතු ඉපදුණු මේ පොළොවේ
උරුමය පුතුටයි
ඒ පොළොවේ ඔද තෙද ගුණ
පුතුහට පිහිටයි

විහාර මහ මැණිවරුන්
ඉපදුණු පොළොවයි
මද්දුම බණ්ඩාර පුතුන්
ඉපදුණු පොළොවයි
රාසිහ මහසෙන් දෙවිඳුන්
ඉපදුණු පොළොවයි
මින් මතුවට ඒ පොළොවේ
උරුමය පුතුටයි

මහ සෑ රන් කොත මුදුනේ
ගන රන් කිරණයි
සිරිමා බෝ මැඩ සෙවනේ
සිහිලැල් පවනයි
දළදා හිමි රැඳි විමනේ
බුදුරැස් දහරයි
හැමදා හැම දුක් දුරලා
පුතු සිත සනසයි

සතර අතින් මුහුද නැඟී
පවුරු සදාලයි
වෙරළ දිගින් මුතු මතුවී
යසස උදා වෙයි
පොළොව පලා මිණි රුවනින්
ඉසුරු ගලා එයි
පොළොව එවන් පුතු උරුමෙන්
ලැබුව නිදානයි

## ලිඛිත අභ්‍යාස

1. 'පුතු ඉපදුණු මේ දෙරණේ' දේශාභිමානී හැඟීම් දනවන නිර්මාණයකි. මේ අදහස තහවුරු කරන්න.

2. කවියා භාවිත කර ඇති රිද්මය මේ කවි පෙළේ සාර්ථකත්වයට ඉවහල් වී ඇති ආකාරය පැහැදිලි කරන්න.

# 18 දිසාපති කාමරේ දී ය

**මොනිකා රුවන්පතිරණ (1946-2004)**



මොනිකා රුවන්පතිරණ යනු 70 දශකයේ කවීන් අතර වූ ප්‍රකට ම කිවිඳිය යි. 1971 දී **අපි දෙන්නා සහ තවත් කිහිප දෙනෙක්** නම් කාව්‍ය සංග්‍රහය නිකුත් කරමින් කාව්‍ය ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ට වූ මොනිකා රුවන්පතිරණ **තහනම් දේශයකින්** (1972), **ඔබේ යෙහෙළිය ඇය ගැහැනිය** (1975), **අංගුලිමාලගේ සිහින** (1979), **විසි වසක ශේෂ පත්‍රය** (1992), **අසන් පත්තිනි දේවතාවී** (1999), **හිපොක්‍රටීස් සහ රෝගිනිය** (2003) සහ **අලුත් ම සිහිනය** (2003) යන කාව්‍ය ග්‍රන්ථ ඔස්සේ ස්වකීය කාව්‍ය ප්‍රතිභාව ප්‍රකට කළා ය. කෙටිකතා රචිකාවක මෙන් ම, සාහිත්‍ය විචාරිකාවක ද වූ ඇය ස්ත්‍රිය වෙනුවෙන් හඬක් නැගූ කිවිඳියකි.

පවත්නා සමාජ ක්‍රමය තුළ කලල අවස්ථාවේ සිට වියපත්ව මියැදෙන තුරු ස්ත්‍රියකට අත් විඳීමට සිදු වන අනේකවිධ අසාධාරණකම් පිළිබඳ හඬ නගමින් ස්ත්‍රියගේ ඉරණම ප්‍රශ්න කිරීම උදෙසා ඇය ස්වකීය කවිය මෙහෙය වූවා ය.

කාව්‍ය අන්තර්ගතයෙහි වන සර්වකාලීන අගය, පොදු බව, ඍජු සමාජ බලපෑම හේතුවෙන් ඇගේ කවිය වඩාත් ප්‍රබල ලෙස සහෘද හද සසල කරයි. ගජමන් නෝනාගෙන් පසු බිහි වූ ප්‍රශස්තම කිවිඳිය මොනිකා රුවන්පතිරණ ය යන්න බොහෝ විචාරකයන්ගේ මතයයි.

එක් යුගයක ජීවනයේ සරතස නිවූ මා සුමිතුර
දුර හිඳිනා ඔබ දකින්න ආයෙමි දිගු කලකට පසු

බමන විදුලි පංකාවෙන් වා ගැබ කැළඹෙන හඬ මිස
එ සඳ ඔබේ මුව'ග නැගුණු සාද තෙපුල් නැසේ මට

මේසය මත ලිපි ගොනු රැස සුළඟෙ නොයා දී රකිමින්
ඒ මත හිඳිනා ගල සේ මා අබියස නිහඬය ඔබ

බිත්තියෙ ඇති සේයා රූ එකිනෙක එබී එබී බලයි
නැතියෙන් ඔබෙ වත හසරැලි මදෙස බලා සිනා නගයි

බාලේ අපි ගම් දොර කෙළි මඬුලු මැදින් ආ ගමනේ
මහදේ ඇඳි ඔබෙ සිතුවම කොහි සැඟවිණි දැයි නොදැනේ

එක යුගයක ජීවනයේ සරතස නිවූ මා සුමිතුර
ඔබ අසලින් බැහැරට යමි කුමට ද ඔබගේ අවසර?

## ලිඛිත අභ්‍යාස

1. 'දිසාපති කාමරයේ දී ය' නිර්මාණයට පාදක වී ඇති අත්දැකීම පැහැදිලි කරන්න.

2. චිත්ත රූප මැවෙන භාෂාවක් යොදා ගනිමින් තම අදහස ගම්‍ය කිරීමට කිවිඳිය දැරූ උත්සාහය 'දිසාපති කාමරයේ දී ය' පද්‍ය පන්තිය ඇසුරෙන් විමසන්න.

3. " 'දිසාපති කාමරයේ දී' සාර්ථක පද්‍ය පන්තියකි." විමසන්න.

# 19 මඟ

## රත්න ශ්‍රී විජේසිංහ (1953)



මහගමසේකරගෙන් පසු කවිය හා ගීතය අරබයා පුළුල් නිර්මාණ දායකත්වයක් සැපයූ 70, දශකයේ කාව්‍ය නිර්මාණ ක්ෂේත්‍රයට අවතීර්ණ ව 80 දශකයේ දී ඉස්මතු වූ ප්‍රබල කවියෙකු ලෙස රත්න ශ්‍රී විජේසිංහ සැලකිය හැකි ය. කවිය හුදු මනෝභාව නිරූපණයෙන් ඔබ්බට ගමන් ගත්, සමකාලීන සමාජ යථාර්ථය නිරූපණය කිරීමෙහි මෙවලමක් බවට පත්කරගත් රත්න ශ්‍රී, ලාංකේය සමාජ දේහය පරිණත දෘෂ්ටියකින් නිරූපණය කරන කවියෙකි. නව කවියෙහි දෘශ්‍යමය අවකාශය පුළුල් කිරීම, නව්‍ය ආකෘති, ප්‍රස්තුතයට උචිත භාෂා භාවිතය හා වඩා පෘථුල වූ අන්තර්ගතයක් කවියට හඳුන්වාදීම රත්න ශ්‍රී විජේසිංහගේ කවියේ විශේෂතා වෙයි.

1979 දී '**බිය නොවන් අයියණ්ඩි**' නම් කාව්‍ය සංග්‍රහය ඔස්සේ කාව්‍ය ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ට වූ මොහු **වස්සානේ** (1985) **සුබ උදෑසන** (1988) **සල් ගහ යට** (1996) **තරු ලකුණ** (1997) **මධ්‍යම යාමය** (2005) **සන්ධ්‍යා තීර්ථය** (2010) හා **නිකිණි** වැස්ස (2012) යන කාව්‍ය සංග්‍රහ ප්‍රකාශයට පත් කොට තිබේ.

80 දශකයේ පුරෝගාමී කවියකු වූ මොහු සිංහල කාව්‍ය ක්ෂේත්‍රයට මෙන් ම සිංහල ගීත ක්ෂේත්‍රයට වඩා ප්‍රබල නිර්මාණ දායකත්වයක් සැපයූ ගී පද රචකයෙකි. පරිභෝජනවාදී ආර්ථිකය අබිමුව ආතතිය හා තරගකාරිත්වය මත දිවි ගෙවන මානව ජීවිතවල භෞතික හා ආධ්‍යාත්මික යථාර්ථයත් මානව ප්‍රේමය ප්‍රමුඛ සකලවිධ පුද්ගල සබඳතාත් ඔහුගේ තියුණු විමසුමට ලක් වෙයි. ප්‍රචාරකවාදී ප්‍රවණතා අන්තර්ගත කලාවෙහි නිමග්න නොවූව ද සමාජ සාධාරණත්වය පිළිබඳ ගැඹුරු හා පෘථුල දෘෂ්ටියක් මොහුගේ නිර්මාණ වෙතින් ප්‍රකට වෙයි. සම්භාව්‍ය සාහිත්‍යය තුළින් ලත් ශික්ෂණයත් ජන සාහිත්‍යයෙන් උකහාගත් හෘදයග්‍රාහී බවත් එක්තැන් වූ සංයමශීලී ප්‍රබල කවියකු ලෙස මොහු සහෘදයාට සමීප වෙයි.

මඟක් නම්
පියවර මතින්
පියවර තබා
තැනූ මඟක් ම යි
අතර මඟ ළත නොවී
මුව දෙර සොයා යන
ගඟක් ම යි

සිය දහස්
කෝ වේ හමුවනා
මං සන්ධි පසුවන
අතවනා
දහසක් දෙනා
එක පියවරින්
දහසක් යොදුන් දුර
අරඹනා

මඟකට දෙසක් නොකියන්
නැත ඊට නිසි කාරණා

අම්බලම්
විසිතුරු සල්පිලෙන්
වටරවුම්
පදිකා මල් වැටෙන්
සෙවණලු සදන
තුරුලිය පෙළින්
සැදි දෙපස මනරම් - සෝබනා

මොහොතක ඉසිඹු
ලබනා විනා
නැත අතරමග
නතරවන වාසනා

මඟක් නම්
ඒ මඟක් ම යි
නොමඟක් නොවෙයි
මඟ නවතිනා

## ලිඛිත අභ්‍යාස

1. 'මඟ' කවි පෙළෙන් ඉස්මතු කෙරෙන ජීවන දෘෂ්ටිය පිළිබඳ පැහැදිලි කරන්න.
2. කාව්‍යාලංකාර භාවිතයේ දී කවියා දක්වා ඇති දක්ෂතාව 'මඟ' පද්‍ය පන්තිය ඇසුරෙන් විමසන්න.

# 20 කාන්තාර ගමක උපත

**නන්දන වීරසිංහ - 1954**

80 දශකයේ කාව්‍ය ක්ෂේත්‍රයට පිවිස 90 දශකයේ දී ප්‍රකට කවියකු වූ නන්දන වීරසිංහ වර්තමානය දක්වා අඛණ්ඩව කාව්‍යකරණයෙහි නිරත වන්නෙකි. **ගිංගඟේ විලාපය** (1984) නම් කාව්‍ය සංග්‍රහය ප්‍රකාශයට පත් කරමින් කාව්‍ය ක්ෂේත්‍රයට පිවිසි මොහු **කිරිසුවඳැති රාත්‍රියක්** (1990) **සත්‍යකාම නම් වෙමි** (1994) **ගිරග** (1997) **මහත් සඳ පිනි බිඳෙක** (2009) **සහස් රැස් යට** (2011) යන ස්වතන්ත්‍ර කාව්‍ය කෘති මෙන් ම **දිසි අදිසි** (2013) නමින් ඇමරිකා වකා කාව්‍ය පරිවර්තනයක් ද සිදු කර තිබෙයි.

ධනේශ්වර ක්‍රමයත් සමග සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික ප්‍රපංචයන්හි සිදු වූ වෙනස්කම් ඉතා සියුම්ව ග්‍රහණය කර ගනිමින් ගැඹුරු ජීවන දෘෂ්ටියකින් යුතුව මානව හා සමාජ ජීවිත විවරණයෙහි නිමග්න වන නන්දන වීරසිංහගේ පද්‍ය සියුම් දේශපාලනික දෘෂ්ටියකින් යුක්ත වීම විශේෂත්වයකි.



සංක්ෂිප්තතාව කවියට ආරෝපණය කරමින් නව්‍ය කාව්‍ය ආකෘති පිළිබඳ අත්හදා බැලීම්හි නිරත වන මොහු, බටහිර සංක්ෂිප්ත කවියෙන් ද ආභාසය ලැබූ කවියකු ලෙස හඳුනාගත හැකි ය.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ගොඩේ කන්දෙ මූකලාන කම්පා කරමින්නේ
රැස්සයෙකි රෑ පාළුව බිඳගෙන ඇද වැටුණේ
අඩ නින්දෙ ම පන් පැදුරට උණු කඳුළක් හැලුණේ
මූකලාන පස් වැටියක් වී හීනෙන් පෙනුණේ

යස දරුවන් ගෙන ඇකයෙන් කැපුවත් නොසැලෙන්නේ
දුක් කරදර කෝටියක් ම ගිලගෙන හිනැහෙන්නේ
සියතින් මර විපත කටින මිනිසුන් දකිමින්නේ
මහා පුරුෂයකු වාගේ කන්ද නැගී ඉන්නේ

පිරුණු ලොරිය ගම් දෙරකඩ පියමං කර යනවා
පාර වුණත් හිරිහැරයක් නෑ ඔහෙ නිදියනවා
පැලේ වහල ඇද හැළිලා මාසයක් ම වෙනවා
පරාල තුනකට අයියා හිරේ හුහුං ලනවා

පොරොව, කියත කලුවරේ ම පණ ආවා ලෙසිනේ
මගෙ ඇඟ උඩ පට්ටල් බැඳ කපනු ඉරනු වැන්නේ
දෙයියන්ගේ මල්ලිලාට දෙවියො ම රැවටෙන්නේ
කාන්තාර ගම මායිම් තවත් පුළුල් වෙන්නේ

## ලිඛිත අභ්‍යාස

1. ආර්ථික වාසි අපේක්ෂාවෙන් මිනිසුන් කරන ක්‍රියාකාරකම් නිසා ස්වභාව ධර්මයට වන හානිය අපූර්වත්වයෙන් ඉදිරිපත් කිරීමට නන්දන වීරසිංහ කවියාගේ 'කාන්තාර ගමක උපත' පද්‍ය පන්තිය සමත් වී ඇත. විමසන්න.

2. නන්දන වීරසිංහ කවියාගේ ප්‍රතිභාව 'කාන්තාර ගමක උපත' පද්‍ය පන්තිය ඇසුරෙන් විමසන්න.

3. 'කාන්තාර ගමක උපත' නිර්මාණයේ දී කවියා භාවිත කර ඇති ආකෘතිය හා භාෂා විලාසය පිළිබඳ ඇගයීමක් කරන්න.